# පළමු අර්ධ-වාර්ෂික වාර්තාව

(2024 නොවැම්බර්-2025 මැයි)

## 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්'

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම




**නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා වූ**
**ජනතා ක්‍රියාකාරීත්වය (පැෆ්රල් සංවිධානය)**
**මාර්තු 12 ව්‍යාපාරය**

2025 සැප්තැම්බර් මස ප්‍රකාශයට පත් කරන ලදී

PAFFREL

March 12 Movement

# පළමු අර්ධ-වාර්ෂික වාර්තාව
# (2024 නොවැම්බර්-2025 මැයි)

## ‘පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්’
## රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම

2025 සැප්තැම්බර් මස ප්‍රකාශයට පත් කරන ලදී

නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා වූ ජනතා ක්‍රියාකාරිත්වය (පැෆ්රල් සංවිධානය)
මාර්තු 12 ව්‍යාපාරය

*මෙම වාර්තාව පැෆ්රල් සංවිධානය සහ මාර්තු 12 ව්‍යාපාරය විසින් සිදු කරන ලද ස්වාධීන අධීක්ෂණ මුලපිරීමකි; එහි සොයාගැනීම් ප්‍රසිද්ධියේ ලබා ගත හැකි දත්ත මත පදනම්වන අතර, පුද්ගලයන්ගේ, සංවිධානවල හෝ ව්‍යාපාරයේ නිල ස්ථාවරයන් හෝ දේශපාලන ස්ථාවරයන් නියෝජනය නොකරයි.*

# පෙරවදන

ශ්‍රී ලංකා රජයේ ජාතික සංවර්ධන ප්‍රකාශනයවන *'පොහොසත් රටක්, ලස්සන ජීවිතයක්'*, ස්වාධීනව අධීක්ෂණය කිරීමෙන් ලබාගත් මූලික සොයාගැනීම් මෙම වාර්තාවෙන් ඉදිරිපත් කෙරේ. ජනාධිපතිවරණය (2024 සැප්තැම්බර්) සහ පාර්ලිමේන්තු මැතිවරණය (2024 නොවැම්බර්) හරහා පුරවැසියන් විසින් අනුමත කරන ලද මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනය, කැබිනට් අනුමැතියෙන් පසු ඉදිරි වසර පහ සඳහා ජාතික සංවර්ධන ප්‍රතිපත්තිය ලෙස විධිමත් ලෙස පිළිගෙන ඇත. ශක්තිමත් දේශපාලන කැමැත්ත සහ ආයතනික හිමිකාරිත්වය සංඥා කරමින්, එය ක්‍රියාත්මක කිරීම සමීපව අධීක්ෂණය කිරීමට ප්‍රතිඥා දීමෙන්, කැබිනට් මණ්ඩලය තම කැපවීම තවදුරටත් පෙන්නුම් කර ඇත.

ප්‍රජාතන්ත්‍රවාදී වගවීම ප්‍රගමනය කිරීම සඳහා වූ දිගුකාලීන මෙහෙවරට අනුකූලව, පැෆ්රල් සහ මාර්තු 12 ව්‍යාපාරය මෙම තෙවන පාර්ශ්වීය අධීක්ෂණ ක්‍රියාවලිය ආරම්භ කර ඇත. මෙම උත්සාහය වැරදි සෙවීමට නොව, ක්‍රියාත්මක කිරීමෙන් ලද නිමැවුම්, ප්‍රතිඵල සහ බලපෑම් පිළිබඳ වැඩදායක, සාක්ෂි මත පදනම් වූ තක්සේරුවක් සැපයීම සඳහා ය.

ජාතික ජන බල වේගය (NPP) රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය, විනිවිදභාවය, වගවීම සහ ජාතික සංවර්ධන ඉලක්ක සමග අනුකූලවීම සහතික කිරීමේදී ස්වාධීන අධීක්ෂණයේ වැදගත්කම අවධාරණය කරයි. අධීක්ෂණය යනු හුදෙක් ප්‍රගතිය නිරීක්ෂීමේ මාධ්‍යයක් පමණක් නොවේ; එය ප්‍රතිපත්ති ප්‍රකාශනය සඵලදායී ආණ්ඩුකරණය, තිරසාර සංවර්ධනය සහ පුරවැසි යහපැවැත්ම සඳහා දායක වන ආකාරය පිළිබඳ අවබෝධය ගැඹුරු කිරීමට අවස්ථාවකි.

මෙම වාර්තාව අදියර දෙකක අධීක්ෂණ උත්සාහයක පළමු අදියර නියෝජනය කරයි:

- **පළමු අදියර:** පුරවැසි-කේන්ද්‍රීය ක්‍රියාත්මක කිරීම පිළිබඳව හොඳම භාවිතාවන් හඳුනා ගැනීම සඳහා කැබිනට් තීරණ, 2025 ජාතික අයවැය, විධායක තීරණ සහ පාර්ලිමේන්තු ක්‍රියාමාර්ග සමලෝචනය කිරීම හරහා ඒවායේ අදාළත්වය තක්සේරු කිරීම.
- **දෙවන අදියර:** 2025 ජාතික අයවැයට අනුකූලව ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම් සමග, විශේෂයෙන් සම්පත් වෙන් කිරීමේ කාර්යක්ෂමතාව සහ සංවර්ධන සඵලතාවයට දායක වීම පළමු අදියර අඛණ්ඩව පවත්වාගෙන යාම සහ අමාත්‍යාංශ කාර්යසාධනය අධීක්ෂණය කිරීම.

මෙම කාර්යය හරහා, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අන්තර්ගත අභිලාෂයන් ශ්‍රී ලංකාවේ ජනතාවට සැබෑවට දැනෙන ප්‍රතිලාභ බවට පරිවර්තනයවන බව සහතික කරමින්, ආණ්ඩුකරණයේ විනිවිදභාවය, ආයතනික ඉගෙනුම සහ වගවීමේ සංස්කෘතියක් පෝෂණය කිරීමට පැෆ්රල් සංවිධානය සහ මාර්තු 12 ව්‍යාපාරය උත්සාහ කරයි.

# අන්තර්ගතය


පෙරවදන .......... III
අන්තර්ගතය .......... IV
වගු ලැයිස්තුව .......... VI
රූප සටහන් ලැයිස්තුව .......... VI
කෙටි යෙදුම් .......... VII
විධායක සාරාංශය .......... VIII
1. හැඳින්වීම .......... 1
1.1. ගෝලීය සන්දර්භය: මැතිවරණ ප්‍රකාශන අධීක්ෂණය සහ ඇගයීම .......... 1
1.2. දකුණු ආසියානු සන්දර්භය: මැතිවරණ ප්‍රකාශන අධීක්ෂණය සහ ඇගයීම .......... 2
1.3. ශ්‍රී ලාංකීය සන්දර්භය: මැතිවරණ ප්‍රකාශන අධීක්ෂණය සහ ඇගයීම .......... 3
1.4. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂවල මැතිවරණ ප්‍රකාශන: පශ්චාත්-යටත්විජිත තත්ත්වය .......... 3
1.5. ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ අධීක්ෂණ සහ ඇගයීම් පද්ධතිය .......... 5
1.6. නීතිමය රාමුව .......... 6
1.7. ශ්‍රී ලංකාවේ සිවිල් සමාජ සංවිධාන විසින් ප්‍රතිපත්ති ප්‍රකාශන අධීක්ෂණය කිරීම .......... 7
1.8. ස්වාධීන අධීක්ෂණය සහ පැෆ්රල් සහ මාර්තු 12 ව්‍යාපාරයේ කාර්යභාරය .......... 8
1.9. අරමුණ සහ විෂය පථය .......... 9
1.10. අධීක්ෂණය සඳහා මූලික ප්‍රශ්න .......... 9
1.11. මූලික ප්‍රශ්න හරහා ආමන්ත්‍රණය කරන ලද ක්ෂේත්‍ර .......... 9
1.12. පළමු අර්ධ-වාර්ෂික වාර්තාවේ අරමුණ .......... 9
2. අධීක්ෂණ ක්‍රියාවලිය .......... 10
2.1. අරමුණ සහ විෂය පථය .......... 10
2.2. මාර්ගෝපදේශක මූලධර්ම සහ නිර්ණායක .......... 10
2.3. ශ්‍රී ලංකාවේ කැපවීම සහ සම්මත කිරීම .......... 11
2.4. රටෙහි හිමිකාරිත්වය .......... 13
2.5. පාර්ශ්වකරුවන්ගේ හිමිකාරිත්වය .......... 14
2.6. මෙවලම්, ප්‍රවේශය, ක්‍රමවේදය, උපායමාර්ගය, වාර්තාකරණය සහ සීමාවන් .......... 14
2.6.1. මෙවලම් .......... 14
2.6.2. ප්‍රවේශය .......... 15
2.6.3. ක්‍රමවේදය .......... 16
2.6.3.1. විධායක තීරණ .......... 17
2.6.3.2. කැබිනට් තීරණ .......... 17
2.6.3.3. පාර්ලිමේන්තු ක්‍රියාකාරිත්වයන් .......... 18
2.6.3.4. ජාතික අයවැය වෙන් කිරීම් .......... 18
2.6.3.5. අමාත්‍යාංශ කාර්යසාධනය සහ අදාළ බලධාරීන්ගේ ක්‍රියාකාරකම් .......... 18
2.6.3.6. නිරීක්ෂණය .......... 19
2.6.4. උපාය මාර්ගය .......... 19
2.6.5. පැෆ්රල් සංවිධානයේ සහ මාර්තු 12 ව්‍යාපාරයෙහි වාර්තාකරණ සහ ප්‍රතිපෝෂණ යාන්ත්‍රණ .......... 19
2.6.6. සීමාවන් .......... 20
3. රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ව්‍යුහය .......... 21
4. අධීක්ෂණ ක්‍රියාවලිය - පළමු අදියර: විධායක තීරණ එදිරිව ප්‍රතිපත්ති ප්‍රකාශනය .......... 24
5. අධීක්ෂණ ක්‍රියාවලිය - පළමු අදියර: ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව කැබිනට් තීරණ අධීක්ෂණය කිරීම .......... 26
5.1. 2024 නොවැම්බර් සිට 2025 මැයි දක්වා කාලය තුළ අමාත්‍ය මණ්ඩල තීරණ පිළිබඳ විශ්ලේෂණය .......... 26
5.2. කැබිනට් තීරණ සමග අනුකූලවීමේ උචිතබව පිළිබඳ සොයාගැනීම් .......... 26
5.3. ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර සම්බන්ධයෙන් කැබිනට් තීරණ පිළිබඳ සොයාගැනීම් .......... 28
6. අධීක්ෂණ ක්‍රියාවලිය - පළමු අදියර: ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව පාර්ලිමේන්තු ක්‍රියාකාරිත්වයන් අධීක්ෂණය කිරීම. 31
7. අධීක්ෂණ ක්‍රියාවලිය - පළමු අදියර: ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව අයවැය අධීක්ෂණය කිරීම .......... 35
7.1. 2025 ජාතික අයවැය පිළිබඳ විශ්ලේෂණය .......... 35

7.2. අයවැය යෝජනා සමග අනුකූලවීමේ උචිතබව පිළිබඳ සොයාගැනීම්....35
8. අධීක්ෂණ ක්‍රියාවලිය - පළමු අදියරඃ නිරීක්ෂණ....36
9. සාරාංශය සහ ඉදිරි ගමන් මග....48
10. නිර්දේශ....51
11. මූලාශ්‍ර....53
ඇමිණුම I දත්ත විස්තරයඃ ප්‍රතිපත්ති ප්‍රකාශනය එදිරිව කැබිනට් තීරණ....55
ඇමිණුම II- දත්ත විස්තරයඃ ප්‍රතිපත්ති ප්‍රකාශනය එදිරිව කැබිනට් තීරණ සහ අයවැය....117
ඇමිණුම III - දත්ත විස්තරයඃ ප්‍රතිපත්ති ප්‍රකාශනය, 2025 ජාතික අයවැය යෝජනා සමග සමාලෝචනය....126

# වගු ලැයිස්තුව

වගුව 1 රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර, උප ක්ෂේත්‍ර සහ ක්‍රියාකාරකම්වල සංයුතිය ........23
වගුව 2 අනුකූලතා තක්සේරුවේ සාරාංශය ........26

# රූප සටහන් ලැයිස්තුව

රූප සටහන 1 ඇගයීම් නිර්ණායක මාර්ගෝපදේශය ........12
රූප සටහන 2 ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය ........16
රූප සටහන 3 රාජ්‍ය අංශ කළමනාකරණ (PSM) චක්‍රය ........19
රූප සටහන 4 එක් එක් මෙහෙයුම/ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය යටතේ දක්වා ඇති ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ක්‍රියාකාරකම් ........23
රූප සටහන 5 අනුකූලතා තක්සේරුවේ ප්‍රතිශතය ........26
රූප සටහන 6 ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර සමග කැබිනට් තීරණවල අනුකූලතාව ........27
රූප සටහන 7 ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර සමග කැබිනට් තීරණවල අනුකූලතාවයේ ප්‍රතිශතය ........28
රූප සටහන 8 හඳුනාගත් අංශ සමග අනුකූලතාව දක්වන කැබිනට් තීරණ ගණන ........29

# කෙටි යෙදුම්

| | |
|---|---|
| **CIABOC** | Commission to Investigate Allegations of Bribery or Corruption (අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කොමිෂන් සභාව) |
| **COPA** | Parliamentary Committee on Public Accounts (රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව) |
| **COPE** | Parliamentary Committee on Public Enterprises (පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව) |
| **COPF** | Parliamentary Committee on Public Finance (රජයේ මුදල් පිළිබඳ කාරක සභාව) |
| **CSOs** | Civil Society Organizations (සිවිල් සමාජ සංවිධාන) |
| **DPMM** | Department of Project Management and Monitoring (ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව) |
| **ePMS** | electronic on-line Project Monitoring System (විද්‍යුත් මාර්ගගත ව්‍යාපෘති අධීක්ෂණ පද්ධතිය) |
| **KPIs** | Key Performance Indicators (ප්‍රධාන කාර්යසාධන දර්ශක) |
| **KRA** | Key Result Area (ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර) |
| **M&E** | Monitoring and Evaluation (අධීක්ෂණය සහ ඇගයීම) |
| **M12M** | March 12 Movement (මාර්තු 12 ව්‍යාපාරය) |
| **MfDR** | Management for Development Results (සංවර්ධන ප්‍රතිඵල සඳහා කළමනාකරණය) |
| **MP** | Member of Parliament (පාර්ලිමේන්තු මන්ත්‍රී) |
| **MPMS** | Ministry Performance Monitoring System (අමාත්‍යාංශ කාර්යසාධන අධීක්ෂණ පද්ධතිය) |
| **NEP** | National Evaluation Policy (ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය) |
| **NGOs** | Non-Governmental Organizations (රාජ්‍ය නොවන සංවිධාන) |
| **NKRAs** | National Key Result Areas (ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර) |
| **NPP** | National People's Power (ජාතික ජන බලවේගය) |
| **OECD – DAC** | Economic Corporation and Development-Development Assistance Committee (ආර්ථික සහයෝගීතාව සහ සංවර්ධනය සඳහා වූ සංවිධානයේ සංවර්ධන ආධාර කමිටුව) |
| **PAFFREL** | People's Action for Free and Fair Elections (නිදහස් සහ සාධාරණ මැතිවරණ සඳහා ජනතා ක්‍රියාකාරිත්වය) |
| **PSM** | Public Sector Management (රාජ්‍ය අංශ කළමණාකරණය) |
| **UNDG** | United Nations Development Group (එක්සත් ජාතීන්ගේ සංවර්ධන කණ්ඩායම) |

# විධායක සාරාංශය

නිදහස් සහ සාධාරණ මැතිවරණ පිළිබඳ ජනතා ක්‍රියාකාරිත්වය (පැෆ්රල් සංවිධානය), මාර්තු 12 ව්‍යාපාරය සමඟ එක්ව, පිරිසිදු දේශපාලන සංස්කෘතියක් සහ අදාළ පාර්ශ්වවල වැඩි වගවීමක් ඇති කිරීම සඳහා මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශන ස්වාධීනව අධීක්ෂණය කිරීම ආරම්භ කර ඇත. 2019 සිට, මෙම මුලපිරීම මගින් මැතිවරණ ප්‍රකාශන සමාලෝචනය කර ඇති අතර, 2022 සිට, මාධ්‍ය සහ මහජන සංවාදය හරහා 2024 ජනාධිපතිවරණයට පෙර ප්‍රවර්ධනය කරන ලද විශ්වසනීය, ජනතා කේන්ද්‍රීය ප්‍රතිපත්ති ප්‍රකාශන සඳහා රාමුවක් ස්ථාපිත කිරීම වෙනුවෙන් පක්ෂ, සිවිල් සමාජය සහ විශේෂඥයින් සම්බන්ධ කරගෙන ඇත.

2024 ජනාධිපතිවරණ සහ පාර්ලිමේන්තු මැතිවරණවලට පෙරාතුව, දේශපාලන පක්ෂවල ප්‍රතිපත්ති ප්‍රකාශන ඡන්දදායකයින්ගේ සහ පුරවැසියන්ගේ අපේක්ෂාවන් සමඟ අනුකූලවීම තක්සේරු කිරීමෙන් වගවීම සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම කෙරෙහි පැෆ්රල් සංවිධානය සිය උනන්දුව ප්‍රකාශකොට ඇත. මැතිවරණයෙන් පසුව, පැෆ්රල් සංවිධානය, මාර්තු 12 ව්‍යාපාරය සමඟ සහයෝගීත්වයෙන්, තේරී පත් වූ රජය, එහි ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දක්වා ඇති කැපවීම්වලට අනුගත වන්නේ ද යන්න තක්සේරු කිරීම සඳහා අධීක්ෂණ ක්‍රියාවලියකට මුල පුරන ලදී.

වගකිවයුතු සිවිල් සමාජ සංවිධාන සාමූහිකයක් ලෙස, ජාතික සංවර්ධන ප්‍රතිපත්ති රාමුව ලෙස තම මැතිවරණ ප්‍රකාශනය යොදා ගැනීමට රජය ගත් තීරණය අපි අගය කරමු. ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිරීක්සීම  සඳහා තමන්ගේම අධීක්ෂණ සහ ඇගයීමේ යාන්ත්‍රණ ස්ථාපිත කිරීමට රජය ගෙන ඇති පියවර ද අපි හඳුනා ගනිමු.

ඊට සමගාමීව, පැෆ්රල් සංවිධානය සහ මාර්තු 12 ව්‍යාපාරය, ස්වාධීන තෙවන පාර්ශ්වීය අධීක්ෂණ මුලපිරීමක් ක්‍රියාත්මක කර ඇත. මෙම අභ්‍යාසයේ අරමුණ වන්නේ රජය සිය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් සමඟ අනුකූලවී සිටින බව සහතික කිරීම සඳහා ප්‍රයෝජනවත් සහයෝගයක් ලබාදීමයි. මෙම අධීක්ෂණ ක්‍රියාවලිය විනිවිදභාවය, වගවීම සහ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය ශක්තිමත් කිරීම සඳහා ධනාත්මක දායකත්වයක් ලෙස සකස් වී ඇත.

අපගේ අධීක්ෂණ රාමුව මෙහෙවනු ලබන්නේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම්වලට සමගාමීව රජයේ ක්‍රියාමාර්ග තක්සේරු කිරීම සඳහා සැලසුම් කරන ලද මූලධර්ම, උපකල්පන, උපන්‍යාසයන්  සහ නිර්ණායක සමූහයක් මගිනි. මුල් අදියරේදී, අපි කැබිනට් තීරණ, 2025 ජාතික අයවැය යෝජනා, විධායක ජනාධිපතිවරයාගේ ප්‍රධාන තීරණ සහ පාර්ලිමේන්තු ක්‍රියාවන් විශ්ලේෂණයකොට ඇත. මෙම වාර්තාව රජයේ මැතිවරණ ප්‍රකාශනයේදී ලබාදී ඇති කැපවීම්වලට සාපේක්ෂව තක්සේරු කරන ලද, රජයේ ධුර කාලයේ පළමු මාස හය තුළ එහි කාර්ය සාධනය පිළිබඳ දළ විශ්ලේෂණයක් ඉදිරිපත් කරයි.

මීට අමතරව, ඊළඟ අදියරේදී එහි අඛණ්ඩ ක්‍රියාකාරකම් සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම් නිරීක්ෂණය කිරීම සඳහා පාර්ලිමේන්තුව, අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධ වීමට අපි සැලසුම් කරමු.

තිරසාර මහජන වගවීම සහතික කිරීම සහ විනිවිදභාවය සහ ප්‍රතිඵල මත පදනම් වූ ආණ්ඩුකරණ සංස්කෘතියක් පෝෂණය කිරීම සඳහා මෙම අධීක්ෂණ උත්සාහය අඛණ්ඩව කරගෙන යාමට පැෆ්රල් සංවිධානය සහ මාර්තු 12 ව්‍යාපාරය කැපවී සිටී.

රෝහණ හෙට්ටිආරච්චි  
විධායක අධ්‍යක්ෂ, පැෆ්රල් සංවිධානය  
සම-කැඳවුම්කරු, මාර්තු 12 ව්‍යාපාරය

# 1. හැඳින්වීම

මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශන යනු මැතිවරණ ප්‍රචාරක ලියකියවිලි වලට වඩා වැඩි දෙයකි; ඒවා දේශපාලන පක්ෂ හෝ සන්ධාන සහ ජනතාව අතර ඇතිවන සමාජ ගිවිසුම්වන අතර, තේරී පත් වුවහොත් රජයක් නොනවත්වා ඉටුකරගෙන යාමට කැපවන දැක්ම, ප්‍රමුඛතා සහ ක්‍රියාමාර්ග ගෙන හැර දක්වයි. ප්‍රතිපත්ති ප්‍රකාශන අනුව ක්‍රියා කිරීම ක්‍රමානුකූලව අධීක්ෂණය කිරීම විනිවිදභාවය, වගවීම සහ විශ්වාසය ශක්තිමත් කර, පුරවැසියන්ට සහ පාර්ශ්වකරුවන්ට රජය එහි ප්‍රකාශිත ඉලක්ක මුදුන්පත් කර ගන්නේද යන්න තක්සේරු කිරීමට ඉඩ සලසයි.

## 1.1. ගෝලීය සන්දර්භයඃ මැතිවරණ ප්‍රකාශන අධීක්ෂණය සහ ඇගයීම

ලොව පුරා, සමාජ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ මගින් නිවැරදි උපදෙස්, සාක්ෂි මත පදනම් වූ සැලසුම් කිරීම සහ කාර්යක්ෂම අයවැය වෙන් කිරීම වැඩි වැඩියෙන් අවධාරණය කරයි. එහෙත් යළි යළිත් ඇතිවන අභියෝගයක් ඉතිරිව පවතීඃ එනම්, මෙම කැපවීම් මැනිය හැකි සංවර්ධන ප්‍රතිඵල බවට පරිවර්තනය කිරීම ය. බොහෝ රජයයන් ඔවුනට ඇති අතිමහත් අභිලාෂ සහිත **ප්‍රතිපත්ති** රාමු සහ දෘශ්‍යමාන, කල් පවතින **ප්‍රතිඵල** අතර හිඩැස/පරතරය පියවීමේදී දුෂ්කරතාවයන්ට මුහුණ දෙයි.

මැතිවරණ ප්‍රකාශන අධීක්ෂණය කිරීම සහ ඇගයීම යනු රජයන් විසින් සෘජුවම සිදු කරනු ලබන ක්‍රියාවලියක් නොවන අතර, ඒ වෙනුවට, එය මෙහෙයවනු ලබන්නේ ස්වාධීන ආයතන, සිවිල් සමාජ සංවිධාන, පර්යේෂණ ආයතන සහ මාධ්‍ය විසිනි.

විශේෂයෙන් මැතිවරණ අතරතුර, දේශපාලන පක්ෂවල මැතිවරණ ප්‍රකාශන සහ ප්‍රතිපත්ති ප්‍රකාශ සියුම් ලෙස පරීක්ෂා කිරීම, අධීක්ෂණය කිරීම සහ ඇගයීම සඳහා වඩාත් පිළිගත් භාවිතාවන් සමහර රටවල තිබේ.

එක්සත් රාජධානියේ ස්වාධීන සංවිධානවන Institute for Fiscal Studies (IFS)[1] සහ Institute for Government (IfG)[2] විශේෂයෙන් මහ මැතිවරණවලදී, පක්ෂ ප්‍රතිපත්ති ප්‍රකාශන නිතිපතා විශ්ලේෂණය කරයි. ඔවුහු පක්ෂ විසින් දෙන ලද පොරොන්දු වල මූල්‍ය ශක්‍යතාව, ප්‍රතිපත්තිමය අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීමේ ධාරිතාව ඇගයීමට ලක් කරති. BBC's Reality Check වැනි මාධ්‍ය ආයතන ද ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දු වල නිරවද්‍යතාවය සහ ප්‍රායෝගිකත්වය සඳහා පරීක්ෂා කරයි. මෙම සියලු උත්සාහයන්ගෙන් අදාළ පාර්ශ්ව අපේක්ෂා කරන්නේ ඡන්දදායකයින්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීම, යථාර්ථවාදී නොවන පොරොන්දු හෙළිදරව් කිරීම, සහ කැපවීම් සාධාරණීකරණය කිරීම සඳහා පාර්ශවයන්ට බලපෑම් කිරීම යි.

දකුණු අප්‍රිකාවේ, Institute for Security Studies (ISS)[3] සහ South African Institute of Race Relations [4] වැනි සංවිධාන ප්‍රධාන පක්ෂවල ප්‍රතිපත්ති ප්‍රකාශන විශ්ලේෂණය කරයි. ඔවුන්ගේ අවධානය බොහෝ විට ප්‍රතිපත්තිමය ගැළපීම, ආර්ථික තිරසාරභාවය, සහ ප්‍රජාතාන්ත්‍රික වගවීම කෙරෙහි වේ. මේ අනුව, මෙම උත්සාහය ප්‍රතිපත්ති ශක්‍යතාව පිළිබඳ විවාදය දිරිමත් කරන අතර ක්‍රියාත්මක කිරීමේදී පවතින හිඩැස් ඉස්මතු කරයි.

එක්සත් ජනපදයේ මැතිවරණ සඳහා විධිමත් "ප්‍රතිපත්ති ප්‍රකාශන" නොමැති අතර, පක්ෂ වේදිකා සහ අපේක්ෂකයින්ගේ පොරොන්දු FactCheck.org[5], PolitiFact[6], සහ Washington Post Fact Checker[7] වැනි සංවිධාන විසින් නිරීක්ෂණය කරනු ලැබේ. PolitiFact's Promise Tracker වැනි ආයතන මැතිවරණ ප්‍රචාරක පොරොන්දු සියුම් ලෙස පරීක්ෂා කර, තේරී පත්වූ නියෝජිතයින් බලයට පත් වූ පසු, ඒවා ඉටු කරන්නේද යන්න නිරීක්ෂණය සිදු කරයි. මෙම ප්‍රයත්නය අඛණ්ඩ අධීක්ෂණයක් ලබාදී, නායකයින් වගවිය යුතු ලෙස තබාගෙන, ඡන්දදායකයින්ට හිමිකම් සත්‍යාපනය කිරීමට උපකාරී වේ.

පිලිපීනයේ, සිවිල් සමාජය සහ අධ්‍යාපන ආයතන, ජනාධිපති සහ පළාත් පාලන වේදිකා ඇගයීම සඳහා සහයෝගයෙන් කටයුතු කරයි. උදාහරණයක් ලෙස, Philippine Centre for Investigative Journalism (PCIJ)[8] වැනි සංවිධාන, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු වල ශක්‍යතාව පරීක්ෂා කර, ඒවා සැබෑ ලෙස ඉටු කිරීම

---

[1] https://ifs.org.uk/
[2] https://www.instituteforgovernment.org.uk/
[3] https://issafrica.org/
[4] https://irr.org.za/
[5] https://www.factcheck.org/
[6] https://www.politifact.com/factchecks/list/
[7] https://www.washingtonpost.com/politics/fact-checker/
[8] https://pcij.org/

පිළිබඳව පසු විපරම් සිදු කරයි. මෙය මහජන අධීක්ෂණය ශක්තිමත් කරන අතර, ඉටු නොකළ පොරොන්දු ඉස්මතු කරමින්, සහ රජයේ ප්‍රතිචාරාත්මක බව ප්‍රවර්ධනය කරයි.

දකුණු කොරියාවේ, ජාතික මැතිවරණ කොමිසම[9], මාධ්‍ය සහ නිරීක්ෂණයෙහි නියුතු රාජ්‍ය නොවන සංවිධාන මැතිවරණ ප්‍රකාශන අධීක්ෂණය කරයි. මේ අනුව, දේශපාලන පක්ෂවල ප්‍රකාශිත ප්‍රතිපත්ති ඉදිරිපත් කිරීම නීත්‍යානුකූලව අවශ්‍ය වේ. පොදු දත්ත සමුදායන්, පොරොන්දු නිරීක්ෂීම සිදුකර ක්‍රියාත්මක කිරීම හා සංසන්දනය කිරීම සිදු කරයි.

The Canadian Broadcasting Corporation (CBC)[10], Fraser Institut වැනි බුද්ධි මණ්ඩල සහ ස්වාධීන රාජ්‍ය නොවන සංවිධාන, ප්‍රධාන මැතිවරණ පොරොන්දු පිළිබඳ පූර්ව සහ පශ්චාත්-මැතිවරණ විශ්ලේෂණයන් සිදු කරයි. කැනඩාවේ පාර්ලිමේන්තු යාන්ත්‍රණයන් රජයේ ක්‍රියාත්මක කිරීම නිරීක්ෂීමට ඉඩ සලසන අතර, ජර්මනියේ MARPOR (ප්‍රතිපත්ති ප්‍රකාශන ව්‍යාපෘතිය)[11] විසින්, බුද්ධි මණ්ඩල සහ විශ්වවිද්‍යාල හරහා ප්‍රතිපත්ති ප්‍රකාශනවල අන්තර්ගතයන්ගේ ක්‍රමානුකූල විශ්ලේෂණයක් සිදු කරයි. ජර්මනියේ, මෙම මහජන සහ ශාස්ත්‍රීය සියුම් පරීක්ෂාව ඉතා ඉහළ මට්ටමක පවතින අතර, දේශපාලන පක්ෂ ඔවුන්ගේ ප්‍රකාශිත ප්‍රතිපත්ති මත පදනම්ව දෘෂ්ටිවාදාත්මකව ස්ථාවරව සිටීම අපේක්ෂා කෙරේ. ස්වීඩනයේ රජයේ අරමුදල් මත යැපෙන ආයතන, විශ්විද්‍යාල සහ පර්යේෂණ සංවිධාන ප්‍රතිපත්ති ප්‍රකාශන අධීක්ෂණය කරයි.

ඊට අමරතව, European Parliamentary Research Service (EPRS)[12] විසින් මැතිවරණ අතරතුර කරන ලද කැපවීම් සහ ඒවා යුරෝපීය සංගමයේ ප්‍රතිපත්ති වලට පරිවර්තනය කරන ආකාරය නිරීක්ෂීම සිදු කරනු ලබයි. සිවිල් සමාජ ජාල මගින්, දේශගුණික ප්‍රතිපත්ති, ආණ්ඩුකරණ ප්‍රතිසංස්කරණ සහ සමාජ ආරක්ෂණවලට අදාළ පොරොන්දු ද අධීක්ෂණය කරයි. The International IDEA[13] සහ International Foundation for Electoral Systems (IFES)[14] යන සංවිධාන, බොහෝ විට සංක්‍රාන්ති ප්‍රජාතන්ත්‍රවාදයේ පොරොන්දු සහ කාර්යසාධනය අධීක්ෂණය කිරීමේදී දේශීය ක්‍රියාකාරීන්ට සහායවන අතර, ඔවුහු ඉහළ මට්ටමේ විනිවිදභාවයක් සහ මහජන ප්‍රවේශයක් අපේක්ෂා කරති. තවද, සන්ධාන තුළ කතිකා කර ගැනීම් සහ පාර්ලිමේන්තු නිරීක්ෂීම් වලදී ප්‍රතිපත්ති ප්‍රකාශන භාවිතා කරනු ලැබේ.

ලොව පුරා, ව්‍යුහගත මැතිවරණ ප්‍රකාශන නිරීක්ෂීම පිළිගත් ආණ්ඩුකරණ මෙවලමකි. එක්සත් රාජධානිය තුළ, IfG විසින්, 'මුදුන්පත්/ළඟා කරගත්', 'ක්‍රියාත්මක වෙමින් පවතී' සහ 'ආරම්භ කර නැත' වැනි විනිවිද පෙනෙන මිනුම් කාණ්ඩ භාවිතා කරමින් සෑම පොරොන්දුවකම ප්‍රගතිය විශ්ලේෂණය කරයි. පිලිපීනයේ, සිවිල් සමාජය, ජනාධිපතිවරයාගේ වාර්ෂික 'ජාතියේ තත්ත්වය' යන දේශනය, මැතිවරණ පොරොන්දුවලට එරෙහිව නිරීක්ෂීම සිදුකර, මහජන ලකුණු පුවරු ප්‍රකාශයට පත් කරයි. දකුණු අප්‍රිකාවේ, පාර්ලිමේන්තු අධීක්ෂණ කණ්ඩායම, මැතිවරණ ප්‍රකාශනයන්ට අනුකූලව නීති සම්පාදක හා ප්‍රතිපත්ති මට්ටමේ ප්‍රතිඵල තක්සේරු කරමින්, ප්‍රවේශ විය හැකි, පක්ෂග්‍රාහී නොවන යාවත්කාලීන කිරීම් ලබා දෙයි.

## 1.2. දකුණු ආසියානු සන්දර්භයː මැතිවරණ ප්‍රකාශන අධීක්ෂණය සහ ඇගයීම

දකුණු ආසියාවේද, මේ හා සමානව අදාළ උදාහරණ ඇත. ප්‍රාන්ත සහ ජාතික මැතිවරණ අතරතුර, ප්‍රතිපත්ති ප්‍රකාශන අධීක්ෂණය කරන Association for Democratic Reforms (ADR)[15], ඉන්දියාවේ Election Watch by Civil Society නම් ආයතනය සතුව පවතී. ඔවුහු ආණ්ඩුකරණ ප්‍රමුඛතා, විනිවිදභාවය, සහ වගවීමට අනුකූලව පොරොන්දු තක්සේරු කරන අතර, නිල දත්ත සහ පුරවැසි සමීක්ෂණ මත පදනම්ව, වරින් වර 'වාර්තා කාඩ්පත් (Report Cards)' නිකුත් කරයි. තවද, ADR විසින් ප්‍රධාන පොරොන්දු ඉටු කිරීම නිරීක්ෂීම සිදු කරනු ලබන අතර, පුරවැසියන් දැනුවත් කිරීම සඳහා මහජන වාර්තා ප්‍රකාශයට පත් කරයි. මේ අනුව, ඔවුන් විනිවිදභාවය ප්‍රවර්ධනය කරමින්, සාක්ෂි මත පදනම් වූ වාර්තා සමඟ පුරවැසියන් සවිබල ගන්වන අතර, වගවීම ශක්තිමත් කරයි. එපමණක් නොව, ඉන්දීය මැතිවරණ කොමිසම ප්‍රතිපත්ති ප්‍රකාශන සඳහා ආදර්ශ චර්යා සංග්‍රහයක් පිළිපැදීමේ නියෝගයක් පනවා ඇත. නේපාලයේ නිරීක්ෂක කණ්ඩායම්, ෆෙඩරල් ආණ්ඩුකරණය සහ සමාජ අන්තර්කරණය සම්බන්ධ පොරොන්දු නිරීක්ෂණය කරන අතර, පකිස්ථානයේ බුද්ධි මණ්ඩල විසින් ආර්ථික ප්‍රතිසංස්කරණ සහ සමාජ සුභසාධනය වැනි ක්ෂේත්‍රවල ඉටුකිරීම් නිරීක්ෂීම සිදු කරයි. මෙම යාන්ත්‍රණ සහ සිද්ධිවලින් පෙන්වන්නේ ක්‍රමානුකූල, සාක්ෂි මත පදනම් වූ නිරීක්ෂීම, ආණ්ඩුකරණය කෙරෙහි විශ්වාසය ශක්තිමත් කරන අතර, දේශපාලනිකව සිත්ගන්නා සුළු ප්‍රකාශ හා යථාර්ථය අතර පරතරය අඩු කරන බවයි.

[9] https://www.nec.go.kr/site/eng/main.do
[10] https://www.cbc.ca/
[11] https://manifesto-project.wzb.eu/
[12] https://www.europarl.europa.eu/at-your-service/en/stay-informed/research-and-analysis
[13] https://www.idea.int/
[14] https://www.ifes.org/
[15] https://adrindia.org/

තවත් සුවිශේෂී උදාහරණයක් ලෙස, භූතානයේ, මැතිවරණ ක්‍රියාවලියේ සාධාරණත්වය සහ වගවීම සහතික කිරීම සඳහා භූතාන මැතිවරණ කොමිසම විසින් දේශපාලන ප්‍රකාශන දැඩි ලෙස නියාමනය කර නිරීක්ෂණය කිරීම දැක්විය හැකිය. ඒ තුළ, දේශපාලන පක්ෂ මගින් නියමිත කාල සීමාවක් තුළ තම ප්‍රතිපත්ති ප්‍රකාශන ඉදිරිපත් කිරීමට අවශ්‍යවන අතර, ඉන්පසුව අදාළ ක්ෂේත්‍රවල විශේෂඥයින්ගෙන් සමන්විතවන ස්වාධීන ඇගයීම් කමිටුවක් විසින් මෙම පොරොන්දුවල යථාර්ථවාදීබව, ශක්‍යතාව සහ ජාතික අවශ්‍යතා සමග අනුකූලවීම පරීක්ෂා කිරීම සඳහා සමාලෝචනය කරනු ලබයි. මෙම සියුම් පරීක්ෂාව මගින් පක්ෂවලට ජනහිතවාදී හෝ මූල්‍යමය වශයෙන් තිරසාර නොවන පොරොන්දු ලබාදීම වළක්වයි. මන්දයත්, ඔවුන් ප්‍රධාන මූල්‍ය පොරොන්දු සඳහා මුදල් සපයාගන්නේ කෙසේද යන්න ද ඒ තුළ හෙළි කළ යුතු බැවිනි. සමාලෝචන ක්‍රියාවලිය අවසන් වූ පසු, භූතාන මැතිවරණ කොමිසම මගින් ප්‍රතිපත්ති ප්‍රකාශන විධිමත් ලෙස අනුමත කරන අතර, පක්ෂ අතර සමානාත්මතාවයක් ඇති කරමින් මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාර අතරතුර තවදුරටත් වෙනස්කම් සිදුකිරීමට හෝ අමතර පොරොන්දු ලබාදීමට ඉඩ නොදේ.

## 1.3. ශ්‍රී ලාංකීය සන්දර්භයඃ මැතිවරණ ප්‍රකාශන අධීක්ෂණය සහ ඇගයීම

ශ්‍රී ලංකාව සඳහා, එවැනි අධීක්ෂණ භාවිතාවන් අනුගමනය කිරීම කාලෝචිත හා අවශ්‍ය වේ. පසුගිය මැතිවරණවලදී ඉමහත් අභිලාෂයන්ගෙන් යුත් ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දු ලබා දී ඇතත්, ස්ථාවර සහ විනිවිද බවින් යුත් පසු විපරම්, ඒවා තුළ සීමා වී ඇති අතර, එමගින් මහජන විශ්වාසය දුර්වල කර ඇත. අනෙක් අතට, එලදායී **ආණ්ඩුකරණය** සහ **වගවීම** සඳහා මහජන අපේක්ෂාවන් ඉහළ යමින් ඇත.

පසුගිය දශක කිහිපය තුළ, රජයයන් මගින් සැළකිය යුතු ලෙස දරිද්‍රතාවය අඩු කිරීම, සමානාත්මතාවය සහ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම ඉලක්ක කර ගෙන ඇත. වර්ධනය පැවති කාල පරිච්ඡේද තිබියදීත්, ආර්ථික ජයග්‍රහණ තිරසාර ලෙස දරිද්‍රතාවය අඩු කිරීම දක්වා පරිවර්තනය කිරීම ස්ථාවර අන්දමින් සිදුවී නොමැත. නිමැවුම් කේන්ද්‍ර කරගත් (output-focused) ආණ්ඩුකරණයේ සිට ප්‍රතිඵල සහ බලපෑම් කෙරෙහි දිශානත (results- and impact-oriented) වූ ආණ්ඩුකරණයක් දක්වා මාරුවීමක් සහතික කිරීම සඳහා සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම, සහ ඇගයීම් ක්‍රමවේද ශක්තිමත් කිරීමේ හදිසි අවශ්‍යතාවය මෙයින් අවධාරණය කෙරේ.

## 1.4. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂවල මැතිවරණ ප්‍රකාශනඃ පශ්චාත්-යටත්විජිත තත්ත්වය

ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂවල ප්‍රතිපත්ති ප්‍රකාශන දශක ගණනාවක් පුරා සැළකිය යුතු ලෙස පරිණාමය වී ඇති අතර, නිදහස සහ සමාජවාදයේ සිට ජනවාර්ගික අයිතීන්, ආර්ථික ප්‍රතිසංස්කරණ සහ ආණ්ඩුකරණය දක්වා ජනතාවගේ වෙනස් වෙමින් පවතින ප්‍රමුඛතා ඒවායින් පිළිබිඹු කරයි. ලංකා සම සමාජ පක්ෂය (සසප) දේශපාලන ප්‍රකාශනයක් නිකුත් කළ පළමු පක්ෂය බවට ඉතිහාසයේ පත් වී ඇත. එහි මුල් ප්‍රකාශිත ප්‍රතිපත්තිය මගින් පූර්ණ ජාතික නිදහස, නිෂ්පාදනය සහ බෙදා හැරීම ජනසතු කිරීම සහ සමානාත්මතාවය ඉල්ලා සිටින ලදී.

1950 සිට 1970 ගණන් දක්වා කාලය තුළ, ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ (TULF), 1977 මහා මැතිවරණ ප්‍රකාශනය තුළ ජනවාර්ගික ඉල්ලීම් සහ ෆෙඩරල්වාදී අභිලාෂයන් පිළිබිඹු විය.

1960 දශකයේ මුල් භාගයේදී, සිරිමාවෝ බණ්ඩාරනායකගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලංනිප), දිවංගත එස්.ඩබ්ලිව්.ආර්.ඩී.බණ්ඩාරනායකගේ දැක්මෙහි අඛණ්ඩතාව අවධාරණය කරමින්, ජනසතු කිරීම සහ රාජ්‍ය පාලනය, භාෂාව සහ අනන්‍යතාවය, විදේශ ප්‍රතිපත්තියේ නොබැඳි පිළිවෙත, සහ සමාජ-ආර්ථික ප්‍රතිව්‍යාප්තිය සහ සංවර්ධන සැලසුම්කරණය පිළිබඳ නිශ්චිත කැපවීම් සහිතව ප්‍රතිපත්ති ප්‍රකාශනයක් ඉදිරිපත් කළේය.

සිරිමාවෝ බණ්ඩාරනායකගේ 1970 මැතිවරණ ප්‍රකාශනය ඇයගේ දස අවුරුදු සැලැස්ම (1970-1980) සමග සමීපව අනුකූල වූ අතර, එය ක්‍රියාවට නැංවීම සඳහා දේශපාලන සැලැසුම් පිටපතක් එමගින් සපයන ලදී. ජනසතු කිරීම, ඉඩම් ප්‍රතිසංස්කරණ, රාජ්‍යය විසින් මග පෙන්වන කාර්මික සංවර්ධනය, සහ පරිපාලන ප්‍රතිසංස්කරණ සඳහා ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පැවති කැපවීම්, ආර්ථික ස්වයංපෝෂිතභාවය, සමාජ සාධාරණත්වය සහ විමධ්‍යගත ආණ්ඩුකරණය යන සැලැස්මේ ඉලක්කවලට සහාය දක්වා ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිසංස්කරණ සහ නොබැඳි විදේශ ප්‍රතිපත්තියක්, මැතිවරණ පොරොන්දු සෘජුවම දිගුකාලීන උපායමාර්ගික සැලසුම්කරණයට සම්බන්ධ කරමින්, දස අවුරුදු සැලැස්මේ ජාතික ස්වෛරීභාවය සහ ස්වාධීන සංවර්ධනය අවධාරණය කිරීම තවදුරටත් පිළිබිඹු කළේය.

එක්සත් ජාතික පක්ෂ (එජාප) යේ මුල් අදියරේ දී, ජේ. ආර්. ජයවර්ධන විසින් විධායක ජනාධිපති ක්‍රමයක් ස්ථාපිත කිරීම, ආර්ථික ලිබරල්කරණය (නවීකරණය, පෞද්ගලික අංශය ප්‍රවර්ධනය කිරීම සහ ශක්තිමත් කිරීම ඇතුළත් විවෘත ආර්ථික ප්‍රතිපත්ති) හඳුන්වා දීම, ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම, සහ ජාතික සමගිය සහ ආරක්ෂාව ආමන්ත්‍රණය කිරීම යන අපේක්ෂාවන් සමගින් තම ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කරන ලදී.

මේ අතර, ලංකා සම සමාජ පක්ෂය (සසප) සහ ජනතා විමුක්ති පෙරමුණ (ජවිපෙ) වැනි වාමාංශික කණ්ඩායම් පන්ති අරගලය, වාර්ගිකත්වයට විරුද්ධ වීම කෙරෙහි අවධානය යොමු කරමින් සහ කප්පාදු පියවරවලට විරුද්ධ වීම තුළින් තම ප්‍රතිපත්ති ප්‍රකාශන ප්‍රකාශයට පත් කළහ. ජවිපෙ විසින් 'නව සමාජවාදය' ප්‍රවර්ධනය කළ අතරම, ව්‍යාපාරික ප්‍රජාවට ඔවුන්ගේ වර්ධනය කෙරෙහි සිට පක්ෂපාතී ස්ථාවරය සහතික කිරීමට උත්සාහ කළේය.

පොදු ජන එක්සත් පෙරමුණෙහි ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අවධානය යොමු වූයේ ප්‍රජාතන්ත්‍රවාදය, ආණ්ඩුකරණයේ ආධිපත්‍යය සහ මානව හිමිකම් යථා තත්ත්වයට පත් කිරීම, අඩු සංඛ්‍යාවක් සහිත කැබිනට් මණ්ඩලයකින් සමන්විත, පිරිසිදු හා වගවිය යුතු රජයක් ස්ථාපිත කිරීම, දෙමළ දේශපාලන නියෝජිතයන් සමග සංවාදය හරහා සාමය ප්‍රවර්ධනය කිරීම, සහ ග්‍රාමීය සංවර්ධනය සහ දරිද්‍රතාවය පිටුදැකීම කෙරෙහි අවධානය යොමු කරමින් ආර්ථික යුක්තිය සඳහා ප්‍රතිපත්ති හඳුන්වා දීමයි.

'යළි පුබුදමු ශ්‍රී ලංකා' උපාය මාර්ගය, 2002 දී හිටපු අගමැති රනිල් වික්‍රමසිංහගේ එක්සත් ජාතික පෙරමුණ (UNF) රජය යටතේ හඳුන්වා දුන් ප්‍රධාන සංවර්ධන ප්‍රතිපත්ති රාමුවකි. එය සාම ක්‍රියාවලිය හා ආර්ථික ප්‍රතිසංස්කරණ සමග සමීපව සම්බන්ධ විය. මෙම රාමුව සාමය සහ ස්ථාවරත්වය, ආර්ථික ලිබරල්කරණය, යහපාලනය, දරිද්‍රතාවය අවම කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය සහ විදේශ ආයෝජන සහ වෙළඳාම කෙරෙහි අවධානය යොමුකොට ඇත.

2005 දී, '**මහින්ද චින්තන**' ප්‍රතිපත්ති ප්‍රකාශනය ස්වෛරීභාවය සහ භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කිරීම (බෙදුම්වාදය අවසන් කිරීම), ශ්‍රී ලාංකික අනන්‍යතාවය, සංස්කෘතිය සහ වටිනාකම් ආරක්ෂා කිරීම, ග්‍රාමීය-කේන්ද්‍රීය සංවර්ධනය-'ගම නැගුම', යටිතල පහසුකම් පුළුල් කිරීම (මාර්ග, විදුලිය, වාරිමාර්ග) සහ සමාජ සුභසාධනය-සහනාධාර, සමෘද්ධි වැඩසටහන ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කළේය. 2010 දී 'මහින්ද චින්තන ඉදිරි දැක්ම' මගින් පශ්චාත් යුධ සමයේ ඉදිකිරීම් (උතුරු සහ නැගෙනහිර), මහා පරිමාණ යටිතල පහසුකම් ව්‍යාපෘති; වරාය, ගුවන්තොටුපළ, අධිවේගී මාර්ග, විදුලි බලාගාර, සංහිඳියාව සහ සංවර්ධනය හරහා ජාතික සමගිය, ශ්‍රී ලංකාව ආසියාවේ ආර්ථික මධ්‍යස්ථානයක් ලෙස ස්ථානගත කිරීම, උසස් අධ්‍යාපනය සහ තාක්ෂණය පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කළේය.

2010 ජනාධිපතිවරණයේදී, එක්සත් ජාතික පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ සහ දෙමළ ජාතික සන්ධානය යන කණ්ඩායම්වලින් සමන්විත සන්ධානයක පිටුබලය සහිතව 'පොදු අපේක්ෂක' සරත් ෆොන්සේකා විසින් 'විශ්වාසනීය වෙනසක්' යන ඔහුගේ මැතිවරණ ප්‍රකාශනය එළිදක්වනු ලැබීය. මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කරුණු 10 කින් යුත් සැලැස්මක් ඉදිරිපත් කර ඇත. ඒවාට, ප්‍රජාතන්ත්‍රවාදය යථා තත්ත්වයට පත් කිරීම සහ කල් පවතින සාමය සුරක්ෂිත කිරීම, වංචාව සහ දූෂණය තුරන් කිරීම, පවුල් වලට මූල්‍යමය වශයෙන් සුරක්ෂිත වීමට උපකාර කිරීම, ජීවන වියදම අඩු කිරීම, ජාතික සංහිඳියාවට මුලපිරීම, සෞඛ්‍ය සේවා වැඩි දියුණු කිරීම, අධ්‍යාපනය යළි ප්‍රාණවත් කිරීම සහ වැඩි දියුණු කිරීම, කාන්තාවන් සවිබල ගැන්වීම, තරුණ තරුණියන් සඳහා රැකියා නිර්මාණය කිරීම, සාධාරණ හා විනයගරුක සමාජයක් ගොඩ නැගීම සහ ජාතික ආරක්ෂාව සහතික කිරීම යනාදිය ඇතුළත් විය. 2015 ජනාධිපතිවරණයේදී මෛත්‍රීපාල සිරිසේන විසින් 'මෛත්‍රී පාලනයක්-ස්ථාවර රටක්' ප්‍රතිපත්ති ප්‍රකාශනය දියත් කළේය. විධායක ජනාධිපති ධුරයේ අධික බලතල මැඩපැවැත්වීම සහ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ශක්තිමත් කිරීම සඳහා නිර්මාණය කළ, දින 100 ක ප්‍රතිසංස්කරණ වැඩසටහනක් කෙරෙහි කේන්ද්‍රගත අවධානයක් යොමු කරමින්, ප්‍රජාතන්ත්‍රවාදී, විනිවිදභාවයකින් යුතු සහ සියලු දෙනා අන්තර්කරණය කරන ශ්‍රී ලංකාවක් සඳහා දැක්මක් මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් ඉදිරිපත් කරන ලදී.

2019 ජනාධිපතිවරණයේදී ඒ සඳහා තරග කළ ප්‍රධාන අපේක්ෂකයින් විසින් ඔවුන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශන ඉදිරිපත් කරන ලදී. ගෝඨාභය රාජපක්ෂගේ 'රට හදන සෞභාග්‍යයේ දැක්ම-දස ප්‍රතිපදා ප්‍රතිපත්තිමය සම්මුතිය' ප්‍රතිපත්ති ප්‍රකාශනය ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළේ ජාතික ආරක්ෂාව සහ ස්වෛරීභාවය, ආර්ථික ප්‍රතිසංස්කරණ, පාලනය සහ දූෂණ විරෝධී පියවර, අධ්‍යාපනය සහ මානව සම්පත් සංවර්ධනය, සමාජ සුභසාධනය සහ රාජ්‍ය සේවය, යටිතල පහසුකම් සහ සංවර්ධනය සහ පාරිසරික කළමනාකරණය කෙරෙහිවන අතර, සජිත් ප්‍රේමදාසගේ නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ (NDF) යටතේ 'ශ්‍රී ලංකාවේ ඉදිරි ගමනට සීමාවක් නැත' යන ප්‍රතිපත්ති ප්‍රකාශනය ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළේ නිවාස සහ යටිතල පහසුකම්, ආර්ථික සංවර්ධනය, අධ්‍යාපනය සහ රැකියා නියුක්තිය, ජාතික ආරක්ෂාව සහ පාලනය සහ දූෂණ විරෝධී යන අංශ කෙරෙහි ය.

2020 පාර්ලිමේන්තු මැතිවරණයේදී, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ (SLPP) විසින් දියත් කරන ලද ගෝඨාභය රාජපක්ෂගේ 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්තිය මගින් ආණ්ඩුකරණය, සංවර්ධනය සහ ආරක්ෂාව සඳහා ඔහුගේ දැක්ම ඉදිරිපත් කළේය. එය 2020-2025 සඳහා පුළුල් ජාතික ප්‍රතිපත්ති රාමුවක් ලෙස ස්ථානගත කරන ලද අතර, ප්‍රථමයෙන් ජාතික ආරක්ෂාව, ශක්තිමත් සහ කාර්යක්ෂම රජය, ආර්ථික පුනර්ජීවනය, යටිතල පහසුකම් සහ නාගරික සංවර්ධනය, කෘෂිකර්මාන්තය සහ ග්‍රාමීය ආර්ථිකය, තාක්ෂණය සහ නවෝත්පාදනය, පාරිසරික ආරක්ෂාව, සමාජ සුභසාධනය සහ සමානාත්මතාවය සහ ජාතික අනන්‍යතාවය සහ සංස්කෘතිය කෙරෙහි අවධානය යොමු කළේය.

2020 දී, එක්සත් ජාතික පක්ෂයේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනය, ජාතික හා ගෝලීය මට්ටමින් කොවිඩ්-19 වසංගතයෙන් බලපෑමට ලක් වූ ආර්ථිකය පුනර්ජීවනය කිරීම සඳහා විසඳුමක් ලෙස වැදගත් කරුණු කිහිපයක්

කෙරෙහි අවධානය යොමු කළේය. ඔවුන්ගේ ප්‍රධානතම සැළකිල්ල වූයේ දෙවන වසංගත රැල්ලකට රට ගොදුරු නොවන බව සහතික කිරීමයි.[16] ව්‍යවසායයන් කෙරෙහි සහායවන යෝජනා ක්‍රම, නව ආයෝජන කලාප සහ ජාත්‍යන්තර අරමුදල් පිළිබඳව මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනය බෙහෙවින් සැළකිලිමත් වී ඇත.

2019 ජනාධිපතිවරණයේදී සහ 2020 පාර්ලිමේන්තු මැතිවරණයේදී, අනුර කුමාර දිසානායකගේ ජවිපෙ/ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය වූ, 'දේශයේ අපේක්ෂාව' මගින් විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීම, කැබිනට් මණ්ඩලය අඩු කිරීම සහ අමාත්‍ය මණ්ඩල ප්‍රතිසංස්කරණ, මැතිවරණ සහ දේශපාලන ප්‍රතිසංස්කරණ, නීතියේ ආධිපත්‍ය සහ දූෂණ විරෝධී පියවර, නොබැඳි විදේශ ප්‍රතිපත්තිය සහ මූලික අයිතිවාසිකම් අයදුම්පත් සඳහා සහාය දැක්වීම කෙරෙහි අවධානය යොමුකොට ඇත. මෙම ප්‍රතිපත්ති රාමුව 2024 ජනාධිපතිවරණ සහ පාර්ලිමේන්තු මැතිවරණ දක්වාම ඔවුන් විසින් පවත්වාගෙන යනු ලැබීය.

ජාතික ජන බලවේගය (NPP) දේශපාලන සන්ධානයක් ලෙස 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' ලෙස එහි දැක්ම දියත් කළ අතර, පොරොන්දු ඉටු කිරීම සහ වගවීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින් පුළුල් සංවර්ධන න්‍යාය පත්‍රයක් සහිත විපරිවර්තනීය ප්‍රතිපත්ති ප්‍රකාශනයක් මත බලයට පත්විය. මෑතකාලීනව, රජය විසින්, ජනාධිපති ලේකම් කාර්යාලයේ 2025 මාර්තු මස 24 වැනි දිනැති චක්‍රලේඛය[17] හරහා, එහි ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා අභ්‍යන්තර ක්‍රමවේදයක් ද ස්ථාපිත කරනු ලැබීය.

## 1.5. ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ අධීක්ෂණ සහ ඇගයීම් පද්ධතිය

ශ්‍රී ලංකාවේ අධීක්ෂණ සහ ඇගයීම් රාමුව ක්‍රියාත්මක වන්නේ අග්‍රාමාත්‍යවරයාගේ සභාපතිත්වයෙන් යුත් ඉහළම අධිකාරියවන, **ජාතික සංවර්ධන ක්‍රියාකාරී කමිටුව (NDAC)** විසින් මෙහෙයවනු ලබන ව්‍යූහගත ආයතනික සැකසුමක් හරහාවන අතර, එය අමාත්‍යාංශ හරහා ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කරන සහ ප්‍රතිපත්ති ගැටළු විසඳන ඉහළම අධිකාරිය වේ. එයට සහාය දක්වමින්, **ජාතික සැලසුම් කවුන්සිලය (NPC),** එහි අධීක්ෂණය සහ ඇගයීම් (M&E) අංශය හරහා, ජාතික මෙන්ම ප්‍රදායකයින් (donors) විසින් අරමුදල් සපයන ව්‍යාපෘති අධීක්ෂණය කරමින්, මධ්‍යම අධීක්ෂණ ආයතනය සහ ලේකම් කාර්යාලය ලෙස ක්‍රියා කරයි. අමාත්‍යාංශ මට්ටමින්, අංශ භාර අමාත්‍යවරුන්ගේ සභාපතිත්වයෙන් යුත්, **අමාත්‍ය සංවර්ධන ක්‍රියාකාරී කමිටු (MDACs),** වැඩසටහන් ප්‍රගතිය සමාලෝචනය කර, NDAC වෙත නොවිසඳුනු කරුණු යොමු කරන අතර, **අමාත්‍යාංශ තුළ ඒ වෙනුවෙන් ක්‍රියාකරන අධීක්ෂණ සහ ඇගයීම් ඒකක** ව්‍යාපෘති කාර්යසාධනය නිරීක්ෂණය සිදුකර, **අමාත්‍ය සංවර්ධන ක්‍රියාකාරී කමිටු සහ ජාතික සැලසුම් කවුන්සිලය** යන දෙකටම වාර්තා කරයි. කලාපීය මට්ටමින්, කාර්යාල සහ අධ්‍යක්ෂ මණ්ඩල වැඩසටහන් ප්‍රාදේශීය මට්ටමින් අධීක්ෂණය කර මධ්‍යම බලධාරීන්ට සොයාගැනීම් ඉදිරිපත් කර, සියලු මට්ටම් හරහා සම්බන්ධීකරණ කළ තොරතුරු ප්‍රවාහයක් සහ වගවීම සහතික කරයි.

ශ්‍රී ලංකාවේ ජාතික අධීක්ෂණ සහ ඇගයීම් ක්‍රමවේද රජයේ සැලසුම්කරණය සහ ක්‍රියාවට නැංවීම තුළ පරිපාලන අධීක්ෂණ සඳහා නිර්මාණය කර ඇත. ආයතනික රාමුව තුළ, ජාතික සංවර්ධන ක්‍රියාකාරී කමිටුව (NDAC) ශ්‍රී ලංකාවේ ඉහළම මට්ටමේ අධීක්ෂණ සහ ඇගයීම් ආයතනය වේ. ජාතික සැලසුම් කවුන්සිලයේ (NPC) අධීක්ෂණ සහ ඇගයීම් අංශය සංවර්ධන සැලසුම්කරණය පිළිබඳ උපදෙස් ලබාදෙන අතර, මධ්‍යම අධීක්ෂණ අධිකාරිය ලෙසද සේවය කරයි. අංශ භාර අමාත්‍යවරුන් සභාපතිත්වය දරන අමාත්‍ය සංවර්ධන ක්‍රියාකාරී කමිටු (MDAC) යටතේ ඇති කමිටු වලට, මූල්‍ය, පරිපාලනය සහ අනෙකුත් අදාළ දෙපාර්තමේන්තුවල නියෝජිතයෝ ඇතුළත් වෙති. සෑම අමාත්‍යාංශයකම සාමාන්‍යයෙන් අමාත්‍යාංශයේ ව්‍යාපෘති අධීක්ෂණය කිරීම සහ ඔවුන්ගේ අමාත්‍ය සංවර්ධන ක්‍රියාකාරී කමිටුව සහ ජාතික සැලසුම් කවුන්සිලයේ අධීක්ෂණ සහ ඇගයීම් අංශය යන දෙකටම වාර්තා කිරීම සඳහා වගකිව යුතු අතර, මේ සඳහා නම් කරන ලද අධීක්ෂණ සහ ඇගයීම් අංශයක් හෝ සැලසුම් ඒකකයක් අඩංගු වේ. ප්‍රාදේශීය කාර්යාල සහ අධ්‍යක්ෂ මණ්ඩල ඔවුන්ගේ මට්ටමින් වැඩසටහන් අධීක්ෂණය කර ඇගයීමට ලක් කරන අතර, මධ්‍යම අමාත්‍යාංශ සහ ජාතික සැලසුම් කවුන්සිලය යන දෙකෙහි ඉහළට වාර්තා කරයි.

ශ්‍රී ලංකාවේ **සංවර්ධන ප්‍රතිඵල සඳහා කළමනාකරණය (MfDR)**[18] සම්මත කිරීම, අඛණ්ඩ කළමනාකරණ චක්‍රයක් අවධාරණය කරමින්, දිශානතිය සැකසීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ප්‍රතිඵල සමාලෝචනය කිරීම හරහා අධීක්ෂණය සහ ඇගයීමෙහි සැලකිය යුතු වෙනසක් සනිටුහන් කරයි. සමාලෝචන අදියර, ක්‍රියාවලියට ප්‍රතිපෝෂණය ලබාදෙන අතර, අනාගත සැලසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීම සඳහා අඛණ්ඩ ඉගෙනුම සහ වැඩි දියුණු කිරීම බලදායී කරයි. ''ශ්‍රී ලංකාවේ සම්මත කරන ලද **සංවර්ධන ප්‍රතිඵල සඳහා කළමනාකරණ**

[16] UNP unveils election manifesto, July 16, 2020, The Morning, https://www.themorning.lk/articles/92303

[17] Circular No. PS/SB/Circular/03/2025 on March 24, 2025, Monitoring the Performance of the Government Manifesto *A Thriving Nation - A Beautiful Life*, Presidential Secretariat, https://www.presidentsoffice.gov.lk/wp-content/uploads/2025/08/PS_SB_Circular_3_2025-e.pdf

[18] P, 348, Sivagnanasothy,V. and Anushyanthan, V., 2010. The national monitoring and Evaluation system in Sri Lanka: Experiences, good practices, Challenges and the way forward in Segone, M. (Ed.). *From Policies to Results: Developing capacities for country monitoring and evaluation systems*.

ප්‍රවේශය ජාතික, ආංශික සහ ආයතනික සහ ව්‍යාපෘති මට්ටම ආවරණය කරන ''සමස්ත රජයේ'' ප්‍රවේශයකි. ජාතික සංවර්ධන උපායමාර්ගය, ආංශික සැලසුම්, අමාත්‍යාංශ සහ ව්‍යාපෘති තුළ ප්‍රතිඵල කෙරෙහි අවධානයක් ගොඩනැගෙමින් පවතී''.

ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය (මූල්‍ය/භෞතික) සහ සියලුම සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන්වල ප්‍රතිඵල[19] නිරීක්ෂීම සඳහා, සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාංත්‍යාංශයේ විදේශ ආධාර සහ අයවැය අධීක්ෂණ දෙපාර්තමේන්තුව තුළ, දේශීයව ගොඩනඟන ලද, පරිශීලක-හිතකාමී ජාතික, වෙබ්-පාදක ඉලෙක්ට්‍රොනික මාර්ගගත ව්‍යාපෘති අධීක්ෂණ පද්ධතියක් (ePMS)[20] ස්ථාපිත කිරීම සැළකිය යුතු හා වැදගත් අංගවලින් එකකි. තර්ක රාමු, පූර්ව අනතුරු ඇඟවීමේ සංඥා, ප්‍රදායකයින් සහ අංශ ගැන සොයබැලීම් සහ පුරවැසි ප්‍රතිපෝෂණය භාවිතයෙන් සංවර්ධන ව්‍යාපෘති තත්‍යකාලීනව නිරීක්ෂීමට මෙම පද්ධතිය සැලසුම් කර ඇති අතර, MfDR ප්‍රවේශය අමාත්‍යාංශ තුළ ප්‍රතිඵල කෙරෙහි නැඹුරු සැලසුම්කරණය සහ වගවීම ගැබ්ව ඇත. මෙම උත්සාහයන්ට සහාය වෙමින්, **ජාතික මෙහෙයුම් කාමරය National Operations Room (NOR)** සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීම සඳහා MfDR-ආකාරයේ උපකරණ පුවරු හරහා අමාත්‍යාංශ හරහා දත්ත ඒකාබද්ධ කරයි. කෙසේවෙතත්, ePMS වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක නොවේ.

## 1.6. නීතිමය රාමුව

ප්‍රතිපත්ති ප්‍රකාශන අධීක්ෂණය සිදු කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ ඍජු නීතිමය රාමු නොමැති නමුත්, පහත සඳහන් ප්‍රතිපත්ති, පනත් කෙටුම්පත් සහ ප්‍රතිපත්ති රාමුව අධීක්ෂණ සහ ඇගයීම් ක්‍රියාවලියට සහාය වේ:

### 1. අමාත්‍ය මණ්ඩලය විසින් 2018 දී පනවන ලද ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය:

2018 දී අමාත්‍ය මණ්ඩලය විසින් සම්මත කරන ලද ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ( National Evaluation Policy (NEP))[21] රජයේ සියලු මට්ටම් හරහා ඇගයීම ආයතනගත කිරීම සහ සාක්ෂි මත පදනම් වූ ආණ්ඩුකරණය ශක්තිමත් කිරීම සඳහා හඳුන්වා දෙන ලදී. රජයේ වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රමානුකූලව ඇගයීම සහතික කිරීම මගින් විනිවිදභාවය, වගවීම සහ සම්පත් සඵලදායී ලෙස භාවිතා කිරීම ඉහළ නැංවීමට මෙම ප්‍රතිපත්තිය උත්සාහකොට ඇත.

### 2. 2019 දී පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් විසින් කෙටුම්පත් කරන ලද ජාතික ඇගයීම් පනත් කෙටුම්පත

2019 දී, ශ්‍රී ලංකාවේ ජාතික ඇගයීම් ධාරිතාව අධ්‍යයනය කර සහතික කිරීම සඳහා එහි නිර්දේශය පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත් කරන ලදී. ජාතික ඇගයීම් ධාරිතාව ශක්තිමත් කිරීමේ අරමුණින් මෙම කාරක සභාව විසින් ජාතික ඇගයීම් පනත් කෙටුම්පත[22] කෙටුම්පත් කරන ලදී. රජයේ සියලුම ස්ථර හරහා  ක්‍රමානුකූල, සාක්ෂි මත පදනම් වූ ඇගයීම සඳහා නීතිමය රාමුවක් සැපයීමට මෙම පනත් කෙටුම්පත උත්සාහ කළේය. එහි අවධානය යොමු වූයේ, රාජ්‍ය ප්‍රතිපත්ති සහ වැඩසටහන් ඒවායේ සඵලතාව, කාර්යක්ෂමතාව සහ වගවීම සඳහා නිතිපතා සමාලෝචනය කරන බව සහතික කිරීම කෙරෙහි ය. ව්‍යවස්ථාදායක ක්‍රම හරහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුකරණ රාමුව තුළ ඇගයීමේ භාවිතාවන් ඇතුළත් කිරීම සඳහා මෙම මුලපිරීම සැලකිය යුතු පියවරක් සනිටුහන්කොට ඇත.

### 3. 2023 දී ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව (Department of Project Management & Monitoring (DPMM)) විසින් ජාතික ඇගයීම් ප්‍රතිපත්තියේ නීතිමය රාමුව ව්‍යාප්ත කිරීම

2023 දී, මුදල් අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව , ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය පුරා ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ප්‍රවර්ධනය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සැළකිය යුතු පියවර ගත්තේය. රාජ්‍ය ආයතන තුළ ඇගයීමේ භාවිතාවන් ආයතනගත කිරීම සඳහා අත්‍යවශ්‍ය උපායමාර්ග සහ

---

[19] P, 364, ibid

[20] P, 364, Sivagnanasothy,V. and Anushyanthan, V., 2010. The national monitoring and Evaluation system in Sri Lanka: Experiences, good practices, Challenges and the way forward in Segone, M. (Ed.). *From Policies to Results: Developing capacities for country monitoring and evaluation systems*.

[21] National Evaluation Policy of Sri Lanka, 2018, https://www.treasury.gov.lk/api/file/5e2100ba-71e7-4cbb-8579-afa4478018b3

[22] Interim Report of Select Committee of Parliament its recommendation to ensure National Evaluation Capacity in Sri Lanka, Parliament of Sri Lanka, 2020, https://www.parliament.lk/uploads/comreports/1582522763007696.pdf

තාක්ෂණික මාර්ගෝපදේශ ගෙනහැර දක්වන ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ රාමුව[23], ව්‍යාප්ත කිරීමට ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පහසුකම් සැලසීය. සංවර්ධන මුලපිරීම් වල සඵලතාව සහ තිරසාරභාවය සහතික කිරීම සඳහා සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණ ක්‍රියාවලීන් ඉහළ නැංවීම මෙම රාමුවේ අරමුණයි.

## 1.7. ශ්‍රී ලංකාවේ සිවිල් සමාජ සංවිධාන විසින් ප්‍රතිපත්ති ප්‍රකාශන අධීක්ෂණය කිරීම

ජාත්‍යන්තර රාමු සමග අනුකූලවීම තුළින් සංවර්ධන සහයෝගීතාවයේ සඵලතාව ඉහළ නැංවීමට ශ්‍රී ලංකාව කැපවී සිටී. පැරිස් ප්‍රකාශනය (Paris Declaration (2005)) යටතේ, හිමිකාරිත්වය, අනුකූලවීම, සුසංගතවීම (harmonizing), ප්‍රතිඵල සඳහා කළමනාකරණය සහ අන්‍යෝන්‍ය වගවීම යන මේවා රට අවධාරණය කරයි. ක්‍රියාකාරිත්වය සඳහා වූ ඇක්‍රා න්‍යාය පත්‍රය (Accra Agenda for Action (2008)) අනුගමනය කරමින්, ශ්‍රී ලංකාව ජාතික ආයතන ශක්තිමත් කිරීම, විනිවිද පෙනෙන සහ පුරෝකථනය කළ හැකි ආධාර ප්‍රවර්ධනය කිරීම, සහ සිවිල් සමාජ සහභාගීත්වය දිරිමත් කිරීම සිදු කළේය. බුසාන් හවුල්කාරිත්වය (Busan Partnership (2011)) හරහා, අන්තර්කරණය කරන හවුල්කාරිත්වයන්, ප්‍රතිඵල මත පදනම් වූ ප්‍රවේශයන්, සහ බහු-පාර්ශ්වකරුවන් හා සම්බන්ධවීම ඉහළ නංවන අතර, සංවර්ධන ආධාර ජාතික ප්‍රමුඛතා සමඟ අනුකූල වන බවත් තිරසාර සමාජ-ආර්ථික සංවර්ධනයට සඵලදායී ලෙස දායක වන බවත් සහතික කරයි.

මෑතකාලීන බුසාන් ප්‍රකාශනයේ දැක්වෙන පරිදී, සිවිල් සමාජ සංවිධානවලට රාජ්‍ය අයවැය වෙන් කිරීම සහ වියදම් කිරීමේදී විනිවිදභාවය සඳහා උද්දේශනය කිරීම, රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා වගවීම, සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්ති සම්පාදනය දැනුවත් කිරීම සඳහා ඇගයීමේ ඉල්ලුම සහ භාවිතය ශක්තිමත් කිරීම, ජාතික සහ ජාත්‍යන්තර ඇගයීම් ප්‍රමිතීන් මත පදනම්ව, විශ්වසනීය හා ප්‍රයෝජනවත් ඇගයීම් උපදවීම සඳහා සුදුසුකම් ලත් ඇගයුම්කරුවන්ගේ ධාරිතාව ශක්තිමත් කිරීම කෙරෙහි ප්‍රධාන කාර්යභාරයක් ඉටුකළ හැකිවාක් මෙන්ම, ඉටුකළ යුතුය.[24]

මෙම සන්දර්භය තුළ, ශ්‍රී ලංකාවේ සිවිල් සමාජ සංවිධාන සහ පර්යේෂණ ආයතන, මැතිවරණ ප්‍රකාශන නිරීක්සීම සහ අධීක්ෂණය කිරීම සඳහා වැදගත් කාර්යභාරයක් කළ යුතුය. එමගින් වගවීම ශක්තිමත් කිරීම, පුරවැසි සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම සහ දේශපාලන කැපවීම් අර්ථවත් සංවර්ධන ප්‍රතිඵල බවට පරිවර්තනය වීම සහතික කරයි.

වෙරිටේ රිසර්ච් (Verité Research) ආයතනය විසින් [Manthri.lk](Manthri.lk) මහ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශන ප්‍රගති නිරීක්ෂක මෙවලම මගින් 'යහපාලන' පොරොන්දු නිරීක්සීමේ පද්ධතියක් ක්‍රියාත්මක කරන ලදී. මෙම ප්‍රගති නිරීක්ෂක මෙවලම, 2015 යහපාලනය සඳහා වූ එක්සත් ජාතික පෙරමුණේ (UNFGG) සහ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ (UPFA) පාර්ලිමේන්තු ප්‍රතිපත්ති ප්‍රකාශන වලින් ක්‍රියා කළ හැකි පොරොන්දු 80 ක පමණ ප්‍රගතිය තක්සේරු කළේය. Verité Research ආයතනයට අනුව ''මෙම ප්‍රගති නිරීක්ෂක මෙවලම, සෑම පොරොන්දුවක්ම තේමාත්මක ක්ෂේත්‍රයක් යටතේ වර්ගීකරණය කරන අතර, එහි ප්‍රගතියේ වත්මන් අවධිය අනුව එය ලකුණු කර ඇත. 'ක්‍රියාවක් නැත', 'දුර්වල ප්‍රගතිය', 'සිදුවෙමින් පවතී' සහ 'සම්පූර්ණය' යන මාතෘකා යටතේ ඇති අදියර හතරක් මගින් පරිශීලකයින්ට සමස්ත කාර්යසාධනය පිළිබඳ සරල මාර්ගෝපදේශයක් ලබාදෙන අතර, තනි පොරොන්දුවල ප්‍රගතිය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ද ලබාගත හැකිය. මෙම ක්‍රියාත්මක කළ හැකි පොරොන්දු, පොදු වසමෙහි ඇති නිල මූලාශ්‍ර භාවිතා කරමින් Manthri.lk විසින් නිරීක්සීමට ලක් කර ඇත.''[25]

මෑතකදී, වෙරිටේ රිසර්ච් ආයතනය, අනුර මීටරය හරහා, රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ප්‍රධාන පොරොන්දු 22 ක ප්‍රමාණාත්මක, සාක්ෂි මත පදනම් වූ නිරීක්සීමක් සපයන අතර, එමගින් මහජනතාවට විනිවිද පෙනෙන සහ ප්‍රවේශ වියහැකි ප්‍රගති වාර්තාවක් ලබාදේ. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (Center for Policy Alternatives) මගින් ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දුවලට සම්බන්ධ ආණ්ඩුකරණය, සංහිඳියාව සහ වගවීමේ ගැටළු පිළිබඳ තේමාත්මක විශ්ලේෂණ සහ කෙටි විස්තර නිෂ්පාදනය සපයමින් වඩාත් ගුණාත්මක ප්‍රවේශයකට දායක වේ. (https://www.cpalanka.org/manifesto-tracker/). ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා (Transerancy International Sri Lanka) ආයතනය, දූෂණ-විරෝධී සහ ආණ්ඩුකරණ ප්‍රතිසංස්කරණ,

[23] National Evaluation Policy Implementation Framework of Sri Lanka, 2023, Department of Project Management and Monitoring Ministry of Finance, Economic Stabilization, and National Policies, https://www.treasury.gov.lk/api/file/d34f560f-0bfa-49c7-8a9e-49ab27c9685d

[24] P, 18, Segone, M, Heider, C, Oksanen, R, de Silva, S, and Sanz, B. 2010. Towards A Shared Framework for National Evaluation Capacity Development in Segone, M. (Ed.). From Policies to Results: Developing capacities for country monitoring and evaluation systems.

[25] Tracking the Promises of 'Yahapalanaya', https://www.veriteresearch.org/press_releases/tracking-the-promises-of-yahapalanaya/?utm_source=chatgpt.com

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ආණ්ඩුකරණය ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම (https://www.tisrilanka.org/government-action-plan-tracker/) සහ ජාතික දූෂණ-විරෝධී ක්‍රියාකාරී සැලැස්ම (2025-2029) මෙහෙයුම් කමිටුව පිහිටුවීම කෙරෙහි විශේෂිත වශයෙන් අවධානය යොමු කරයි (https://www.tisrilanka.org/tisl-appointed-to-national-anti-corruption-action-plan-steering-committee/).

## 1.8. ස්වාධීන අධීක්ෂණය සහ පැෆ්රල් සහ මාර්තු 12 ව්‍යාපාරයේ කාර්යභාරය

පිරිසිදු දේශපාලන සංස්කෘතියක් පෝෂ්‍ය කිරීම සහ ජනතාවට වග වන්නා වූ දේශපාලන ක්‍රමවේදයක් ප්‍රවර්ධනය කිරීම සඳහා පැෆ්රල් සංවිධානය සහ මාර්තු 12 ව්‍යාපාරය බහුවිධ මුලපිරීම් සිදුකොට ඇත. මෙම ප්‍රයත්නයේ කොටසක් ලෙස, පැෆ්රල් සංවිධානය, ශ්‍රී ලංකාවේ ජාතික මැතිවරණවලදී නිකුත් කරන ලද මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශන ස්වාධීනව අධීක්ෂණ්‍ය කිරීමෙහි නිරත වී ඇත. මෙම මුලපිරීම මගින් ප්‍රතිපත්ති ප්‍රකාශන හුදෙක් ලේඛන හෝ පොරොන්දු වලින් ඔබ්බට ගොස්, පුරවැසියන් සවිබල ගන්වන සහ රටේ සමස්ත සංවර්ධනයට දායකවන ක්‍රියාකාරී වැඩසටහන් බවට පරිවර්තනය කිරීම සහතික කිරීමට උත්සාහ දරයි. මෙම ක්‍රියාවලිය හරහා, පැෆ්රල් සංවිධානය විසින් අපේක්ෂකයින්, දේශපාලන පක්ෂ සහ සන්ධාන වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී වගකීමක් සහ වගවීමක් ලඟාකර ගැනීමට දිරිමත් කරනු ලැබ ඇත.

2019 දී තම මැතිවරණ ප්‍රකාශනයේ පොරොන්දු ඉටු කිරීමේදී රජය ලබාගත් ප්‍රගතිය සමාලෝචනය කිරීමට මාර්තු 12 ව්‍යාපාරය උත්සාහ දැරීය. මෙම මුලපිරීමේ කොටසක් ලෙස, මාර්තු 12 ව්‍යාපාරය මගින් දේශපාලන පක්ෂ විසින් ඉදිරිපත් කරන ලද සියලුම ප්‍රතිපත්ති ප්‍රකාශනවලට මහජනතාවට ප්‍රවේශය ලබා දීමට කටයුතු කරන ලදී. 2022 වසරේ සිට, පැෆ්රල් සංවිධානය මෙම කාරණය සම්බන්ධයෙන් දේශපාලන පක්ෂ සහ කණ්ඩායම්වල නියෝජිතයන් සමග ක්‍රියාකාරීව සංවාදයක නියැලී සිටී. මෙම ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීම සහ විධිමත් කිරීම සඳහා, පැෆ්රල් සංවිධානය විසින් විද්වතුන්ගෙන් සමන්විත උපදේශක මණ්ඩලයක් ස්ථාපිත කළ අතර, සිවිල් සමාජ සංවිධාන, වෘත්තීය සමිති, ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව, ශාස්ත්‍රඥයින්, වෘත්තිකයන්, කාන්තා සහ තරුණ කණ්ඩායම් සහ සමාජයේ අනෙකුත් අංශ සමග පුළුල් ලෙස අදහස් විමසීම් ආරම්භ කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, මැතිවරණ ප්‍රකාශන සැකසීමේ පදනම, මැතිවරණ ප්‍රකාශන සැදීමේදී සළකා බැලිය යුතු කරුණු, මැතිවරණ ප්‍රකාශන වල අන්තර්ගතය සහ ව්‍යුහය, ජනතාව වෙත මැතිවරණ ප්‍රකාශන නිකුත් කිරීම, ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාත්මක කිරීම සහ එහි අධීක්ෂණය සහ ඇගයීම වැනි කරුණු මත පදනම්ව, මැතිවරණ ප්‍රකාශන වල ඇතුළත් කළ යුතු ප්‍රධාන අංග ගෙනහැර දක්වන මූලික රාමුවක් සකස් කිරීමට පියවර ගන්නා ලදී.

2024 ජනාධිපතිවරණය කෙරෙහි අවධානය යොමු කරමින්, මෙම මූලික රාමුව කෙරෙහි ඔවුන්ගේ අවධානය සහ එකඟතාවය ලබාගැනීම සඳහා පැෆ්රල් සංවිධානය දේශපාලන පක්ෂවල නායකත්වය සමග ක්‍රියාකාරීව සම්බන්ධ විය. යෝජිත රාමුව සහ එහි මූලික මූලධර්ම පිළිබඳව එකඟතාවයක් ලබාගැනීම සඳහා එක්සත් ජාතික පෙරමුණ, සමගි ජන බලවේගය සහ ජාතික ජන බලවේගය සහ ඔවුන්ගේ නියෝජිතයන් ද සමග සාකච්ඡා පවත්වන ලදී. පුරවැසියන්ගේ අවශ්‍යතාවලට ප්‍රායෝගික සහ ප්‍රතිචාරාත්මක මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශන සකස් කිරීමේ ක්‍රම ඉස්මතු කරමින්, ජනමාධ්‍ය සහ සමාජ මාධ්‍ය හරහා මෙම මුලපිරීම තවදුරටත් ප්‍රවර්ධනය කරන ලදී. විශේෂයෙන්, 2024 ජනාධිපතිවරණ අපේක්ෂයින්ගේ මැතිවරණ ප්‍රකාශනවල ඇතුළත් කර ඇති ආණ්ඩුකරණ මූලධර්ම සහ ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ විශේෂ සාකච්ඡා වැඩසටහන් මාලාවක් ස්වාධීන රූපවාහිනී ජාලය (Iindependant Television Network) සමග සහයෝගීත්වයෙන් පැෆ්රල් සංවිධානය විසින් මෙහෙයවන ලදී.

මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනවල වගවීම, ප්‍රායෝගික බව සහ යථාර්ථවාදී බව සහතික කිරීම සඳහාවන පියවර සම්බන්ධයෙන් ජාතික ජන බලවේගය සමග ඇතිකරගත් මූලික එකඟතාවයෙන් පසුව, පැෆ්රල් සහ මාර්තු 12 ව්‍යාපාරය මැතිවරණ ප්‍රකාශන අධීක්ෂණය සහ ඇගයීම සම්බන්ධ ක්‍රියාවලිය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ජාතික ජන බලවේගයේ සහ ජනතා විමුක්ති පෙරමුණේ නියෝජිතයින් සමග සම්බන්ධ විය. ජාතික ජන බලවේගය නව රජයක් පිහිටුවීමෙන් පසු පවත්වන ලද මෙම සාකච්ඡාවලදී, අධීක්ෂණ සහ ඇගයීමේ මූලධර්ම සහ ක්‍රියාවලීන් පිළිබඳ මූලික හැඳින්වීමක් සිදු විය.

රජයේ ක්‍රියාකාරිත්වයන් ප්‍රකාශිත අරමුණු සමග අනුකූල ද යන්න නිර්ණය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට ඉඩ සලසන හෝ බාධා කරන සාධක හඳුනා ගැනීමට ස්වාධීන අධීක්ෂණය අත්‍යවශ්‍ය වේ. එය අනාගත සැලසුම්කරණය සහ අයවැයකරණය සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා පාඩම් ද නිර්මාණය කරයි. විනිවිදභාවය සහ ප්‍රජාතන්ත්‍රවාදී වගවීම ප්‍රවර්ධනය කිරීමේ දිගුකාලීන අත්දැකීම් සහිතව, පැෆ්රල් සංවිධානය විසින් මෙම තෙවන පාර්ශ්වීය අධීක්ෂණ මුලපිරීමට නායකත්වය ලබා දෙයි.

## 1.9. අරමුණ සහ විෂය පථය

මෙම අධීක්ෂණ අදියරේදී පහත දෑ අපේක්ෂා කරයි:

- ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිළිබිඹුවන පරිදි, **රජයේ ක්‍රියාකාරීත්වයන් නිරීක්ෂණය සහ විශ්ලේෂණය කිරීම**.
- රජය වගවන ලෙස තබා ගැනීම සඳහා **පුරවැසියන් සම්බන්ධ වීම** දිරිමත් කිරීම.
- රජය විසින් **කාර්යක්ෂමව හා සඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම** සඳහා තෙවන පාර්ශ්වීය කොටස්කරුවන් ලෙස වාර්තා කිරීම.
- ප්‍රතිපත්ති ප්‍රකාශන අධීක්ෂණයේ සිට **අධීක්ෂණය සහ ඇගයීම** දක්වා යාම මූලික කටයුතු සිදු කිරීම.

## 1.10. අධීක්ෂණය සඳහා මූලික ප්‍රශ්න

- ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු රජයේ ක්‍රියාකාරීත්වයන්ගෙන් ප්‍රමාණවත් ලෙස පිළිබිඹු වේද?
- පොරොන්දු වූ ප්‍රතිඵල මුදුන්පත් කර ගැනීම සඳහා සම්පත් කාර්යක්ෂමව වෙන් කර භාවිතා කරන්නේද?
- ප්‍රධාන ප්‍රතිපත්ති ප්‍රකාශන වැඩසටහන්වල මැනිය හැකි නිමැවුම් (outputs), ප්‍රතිඵල (outcomes) සහ බලපෑම් (impacts) මොනවාද?

## 1.11. මූලික ප්‍රශ්න හරහා ආමන්ත්‍රණය කරන ලද ක්ෂේත්‍ර

- **ප්‍රතිපත්ති කාල පටිපාටි නිරීක්ෂණය:** ප්‍රතිපත්ති ප්‍රකාශනයට අදාළ ප්‍රධාන ප්‍රතිපත්ති නිවේදනවල කාල නියමය දේශපාලන, ආර්ථික, සමාජ සංවර්ධනය සහ ආණ්ඩුකරණය සමග සැසඳීම.
- **ආයතනික ධාරිතාව:** අමාත්‍යාංශ/නියෝජිතායතනවලට කැපවීම් ක්‍රියාත්මක කිරීමට ක්‍රමවේදයක් තිබේද යන්න විමසීම.
- **මූල්‍ය අවකාශය:** අයවැය ප්‍රතිපාදන, අරමුදල්වල ඇති පරතර සහ ආදායම් සීමාවන් තක්සේරු කිරීම.
- **දේශපාලන අභිලාෂය:** නායකත්ව ප්‍රමුඛතාගත කිරීම, ප්‍රසිද්ධ ප්‍රකාශ හෝ ඇතැම් කැපවීම්වලට සම්බන්ධ දේශපාලන අවදානම් සොයා බැලීම.
- **නෛතික සහ ප්‍රතිපත්ති රාමුව:** බලදායී කරන නීති සම්පාදනය හෝ නියාමන වෙනස්කම් ස්ථානගත කර තිබේද යන්න නිර්ණය කිරීම.
- **අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණය:** කැපවීම් සඳහා අංශ අතර සහයෝගීතාවයක් අවශ්‍ය ද සහ එවැනි යාන්ත්‍රණ තිබේද යන්න හඳුනා ගැනීම.

## 1.12. පළමු අර්ධ-වාර්ෂික වාර්තාවේ අරමුණ

මෙම අර්ධ-වාර්ෂික වාර්තාව, පැෆ්රල් සංවිධානය සහ මාර්තු 12 ව්‍යාපාරය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ, ප්‍රතිපත්ති ප්‍රකාශන අධීක්ෂණයේ පළමු අදියරෙහි සාක්ෂි මත පදනම් වූ සාරාංශයක් ඉදිරිපත් කරයි. මෙම වාර්තාව ප්‍රධාන වශයෙන් පදනම් වී ඇත්තේ කැබිනට් තීරණ, 2025 ජාතික අයවැය සහ ජනාධිපති මාධ්‍ය අංශය, රජයේ තොරතුරු මධ්‍යස්ථානය විසින් නිකුත් කරන ලද මාධ්‍ය නිවේදන ඇතුළු නිල ලේඛනවල සමාලෝචනයක් මත ය. පළමු අදියර රජයේ ක්‍රියාකාරීත්වයන් විශ්ලේෂණය කිරීම සහ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු සමග ඒවා අනුකූලවීම කෙරෙහි අවධානය යොමු කරයි. දෙවන අදියර මගින්, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු සඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමෙන් මෙය තවදුරටත් පුළුල්වනු ඇත. ඊට අමතරව, පුළුල් සන්දර්භයක් සැපයීමට සහ විනිවිදභාවය ඉහළ නැංවීමට, මාධ්‍ය වාර්තා සහ අනෙකුත් ද්විතීයික මූලාශ්‍ර නිරීක්ෂණය කරනු ලබයි. මෙය ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මකවන මුල් අවධියේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා පාදමක් සපයමින්, ප්‍රතිපත්තිවල අනුකූලවීමේ ප්‍රවණතා හඳුනා ගන්නා අතර, දෙවන අදියර සඳහා අඩිතාලම ද සකස් කරනු ලබයි.

# 2. අධීක්ෂණ ක්‍රියාවලිය

අධීක්ෂණ යනු සංවර්ධන මැදිහත්වීමක ආරම්භයේ සිට අවසානය දක්වා සිදුවන අඛණ්ඩ ක්‍රියාවලියකි. ඕනෑම සංවර්ධන මැදිහත්වීමකට, ප්‍රතිඵල කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා අධීක්ෂණය අවශ්‍ය වේ. අධීක්ෂණයට ඕනෑම ක්‍රියාකාරකමක්, ව්‍යාපෘතියක්, වැඩසටහනක්, උපාය මාර්ගයක්, ප්‍රතිපත්තියක්, මාතෘකාවක්, තේමාවක්, අංශයක් හෝ සංවිධානයකට ප්‍රයෝජනවත් විය හැකිය. ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම සහ ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම යන දෙකම අධීක්ෂණය කළ යුතු වේ. පහත දැක්වෙන පරිදි අධීක්ෂණයේ අදියර දෙකක් තිබේ:

අ. **ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය** - පොරොන්දු ක්‍රියාත්මක කරන්නේද යන්න

ආ. **ප්‍රතිඵල පාදක කරගත් අධීක්ෂණය** - ප්‍රතිඵල මුදුන්පත් කර ගැනීම අධීක්ෂණය කිරීම (අමාත්‍යාංශ සහ ආයතනවල කාර්යසාධනය අධීක්ෂණය කිරීම)

මෙම අධීක්ෂණ ක්‍රියාවලිය ප්‍රධාන වශයෙන් රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම කෙරෙහි අවධානය යොමු කරන නමුත්, ප්‍රතිඵල ඇගයීමට ගැඹුරින් යොමු නොවේ. කෙසේ වෙතත්, අධීක්ෂණය සහ ඇගයීම අතර පැහැදිලි වෙන්වීමේ රේඛාවක් නොමැත. අධීක්ෂණයෙන් විමසන්නේ සැලසුම් කළ දේ නිවැරදිව සිදු කරන්නේ ද යන්නයි. ඇගයීම මගින්, ඇයි සහ කෙසේද වැනි වඩාත් ගැඹුරු ප්‍රශ්න අසයි.

## 2.1. අරමුණ සහ විෂය පථය

මෙම රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය 'ජාතික ප්‍රතිපත්ති රාමුවක්' ලෙස පිළිගෙන ඇති බැවින්, රටේ ජනාධිපතිවරයාගේ විධායක ක්‍රියාකාරීත්වයන්, අමාත්‍ය මණ්ඩලයේ කැබිනට් තීරණ, පාර්ලිමේන්තුවේ ක්‍රියාකාරීත්වයන්, අරමුදල් වෙන් කිරීම සමග අයවැය යෝජනා, අමාත්‍යාංශ කාර්යසාධනය සහ අදාළ බලධාරීන්ගේ ක්‍රියාකාරකම් හරහා එය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කරනු ලැබේ.

මෙම වාර්තාව 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' නමින්වන ශ්‍රී ලංකා රජයේ ජාතික සංවර්ධන ප්‍රතිපත්ති ප්‍රකාශනය ස්වාධීනව අධීක්ෂණය කිරීමේ පළමු අදියරෙහි සොයාගැනීම් ඉදිරිපත් කරයි. එහි මූලික අරමුණ වන්නේ 2024 නොවැම්බර් සහ 2025 මැයි මස අතර කාලය තුළ ගනු ලැබූ කැබිනට් තීරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දක්වා ඇති ප්‍රතිපත්තිමය ප්‍රමුඛතා සහ කැපවීම් පිළිබිඹු කරන මට්ටම තක්සේරු කිරීමයි. මෙම අදියරේ විෂයපථය, අඛණ්ඩ අධීක්ෂණය සඳහා මූලික පදනමක් ස්ථාපිත කරමින්, ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම් කැබිනට් තීරණ ගැනීම සමඟ අනුකූලවීම කෙරෙහි අවධානය යොමු කරයි.විශේෂයෙන්, එය ක්‍රියාත්මක කිරීමේදී මතුවන ප්‍රවණතා, රජයේ ක්‍රියාකාරීත්වයන් හට බලපාන සාධක, සහ ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීම පිළිබඳ මාර්ගෝපදේශක මූලධර්ම පහ තීරණ මගින් කොතරම් දුරට මූර්තිමත් කරන්නේද යන්න පරීක්ෂා කරයි.

## 2.2. මාර්ගෝපදේශක මූලධර්ම සහ නිර්ණායක

මෙම අධීක්ෂණ ක්‍රියාවලිය, ආර්ථික සහයෝගීතාව සහ සංවර්ධනය සඳහා වූ සංවිධානයේ සංවර්ධන ආධාර කමිටුව (Organization for Economic Co-operation and Development-Development Assistance Committee (OECD-DAC)) විසින් පහත මාර්ගෝපදේශක මූලධර්ම සහ නිර්ණායක සංක්ෂිප්ත කර දක්වා ඇත:

1. ආධාර සඵලතාව පිළිබඳ පැරිස් ප්‍රකාශනය (2005)[26]
2. ACCRA - ක්‍රියාකාරීත්වය සඳහා න්‍යාය පත්‍රය (2008, ඇක්‍රා, ඝානා)[27]
3. සඵලදායී සංවර්ධන සහයෝගීතාව සඳහාවන බුසාන් හවුල්කාරිත්වය (2011)[28]
4. OECD-DAC ඇගයීම් නිර්ණායක[29]

ආධාරවල ගුණාත්මකභාවය ඇගයීම වැඩි දියුණු කිරීම අරමුණු කරගත් හිමිකාරිත්වය, අනුකූලවීම, සුසංගතවීම, ප්‍රතිඵල සඳහා කළමනාකරණය සහ අන්‍යෝන්‍ය වගවීම යන මූලික මූලධර්ම පහක් ආධාර සඵලතාව පිළිබඳ පැරිස් ප්‍රකාශනය (2005) මගින් ස්ථාපිත කරන ලදී. මෙය මත පදනම්ව, ක්‍රියාකාරිත්වය සඳහා වූ ඇක්‍රා න්‍යාය

[26] https://www.oecd.org/content/dam/oecd/en/publications/reports/2005/03/paris-declaration-on-aid-effectiveness_g1g12949/9789264098084-en.pdf
[27] https://www.oecd.org/content/dam/oecd/en/publications/reports/2008/09/accra-agenda-for-action_g1g1294b/9789264098107-en.pdf
[28] https://www.oecd.org/content/dam/oecd/en/publications/reports/2011/12/busan-partnership-for-effective-development-co-operation_29eb4a17/54de7baa-en.pdf
[29] https://www.oecd.org/en/topics/sub-issues/development-co-operation-evaluation-and-effectiveness/evaluation-criteria.html

පත්‍රය (2008) මෙම කැපවීම් නැවත තහවුරු කළ අතර, සමස්තය ඇතුළත් කරන හවුල්කාරිත්වයන් සහ ධාරිතා සංවර්ධනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළේය. සඵලදායී සංවර්ධන සහයෝගීතාව සඳහා වූ බුසාන් හවුල්කාරිත්වය (2011) මගින්, නැගී එන ප්‍රදායකයින්, සිවිල් සමාජය සහ පෞද්ගලික අංශයේ කාර්යභාරය හඳුනා ගන්නා අතර, විනිවිදභාවය, වගවීම සහ සංවර්ධන ප්‍රතිඵල ප්‍රවර්ධනය කරමින් න්‍යාය පත්‍රය තවදුරටත් පුළුල් කරන ලදී. මෙම ගෝලීය කැපවීම් අනුපූරණය කරමින්, OECD-DAC ඇගයීමේ නිර්ණායක; උචිතබව, සඵලතාව, කාර්යක්ෂමතාව, බලපෑම, තිරසරභාවය සහ සංස්කෘතිය යන මේවා සංවර්ධන වැඩසටහන් තක්සේරු කිරීම සහ ආධාර දිගුකාලීන ජාතික ප්‍රමුඛතා සඳහා අර්ථවත් ලෙස දායකවන බව සහතික කිරීම සඳහා ජාත්‍යන්තරව පිළිගත් රාමුව සපයයි.

## 2.3. ශ්‍රී ලංකාවේ කැපවීම සහ සම්මත කිරීම

### 1. ආධාර සඵලතාව පිළිබඳ පැරිස් ප්‍රකාශනය

ශ්‍රී ලංකාව පැරිස් ප්‍රකාශනය අනුමත කරමින්, එහි හිමිකාරිත්වය, අනුකූලවීම, සුසංගතවීම, ප්‍රතිඵල සඳහා කළමනාකරණය සහ අන්‍යෝන්‍ය වගවීම යන මූලධර්ම පහ සම්බන්ධයෙන් කැපවී සිටී. පැවති රජයයන්, මහින්ද චින්තනය සහ පසුව ජාතික ප්‍රතිපත්ති රාමු වැනි ජාතික සංවර්ධන උපායමාර්ගවලට මෙම මූලධර්ම ඒකාබද්ධ කළ අතර, රට නායකත්වය සපයන ප්‍රමුඛතාවන්ට ප්‍රදායකයින්ගේ සහයෝගය අනුකූලවීම අවධාරණය කළේය. ශ්‍රී ලංකාව පැරිස් ප්‍රකාශනයට අත්සන් තබා ඇති බැවින්, ආධාර සඵලතා න්‍යාය පත්‍රය ඉදිරියට ගෙන යාමට කැපවී සිටී. කෙසේ වෙතත්, ආධාර කළමනාකරණය සහ බෙදා හැරීම සඳහා සඵලදායී මෙවලමක් බවට පත්වීමට පැරිස් ප්‍රකාශනය දේශීයකරණය කිරීම අවශ්‍ය වේ.[30]

### 2. ක්‍රියාකාරීත්වය සඳහා වන ඇක්‍රා න්‍යාය පත්‍රය

පැරිස් කැපවීම් මත පදනම්ව, ආධාර ක්‍රම මඟින් ජාතික පද්ධති සහ ආංශික උපායමාර්ග සඳහා සහායවන බව සහතික කරමින්, ශක්තිමත් රටක හිමිකාරිත්වය සහ සමස්තය ඇතුළත් කරන හවුල්කාරිත්වයන් සඳහා අවශ්‍යතාවය ශ්‍රී ලංකාව හඳුනා ගත්තේය. ක්‍රියාකාරීත්වය සඳහා වන ඇක්‍රා න්‍යාය පත්‍රය අනුගමනය කරමින්, ආධාර කළමනාකරණයේ ප්‍රතිසංස්කරණ වේගවත් කිරීම, රටේ හිමිකාරිත්වය ඉහළ නැංවීම සහ ජාතික ආයතනවල ධාරිතාව ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකාව සිය කැපවීම ශක්තිමත් කළේය. සංවර්ධන ක්‍රියාවලියේදී සිවිල් සමාජයේ සහ දේශීය ක්‍රියාධරයින්ගේ සහභාගිත්වය අවධාරණය කරමින්, පුරෝකථනය කළ හැකි, විනිවිද පෙනෙන සහ ප්‍රතිඵල කෙරෙහි නැඹුරු සංවර්ධන සහයෝගීතාවය රට ප්‍රමුඛතාගත කරයි.

### 3. සඵලදායී සංවර්ධන සහයෝගීතාව සඳහා වන බුසාන් හවුල්කාරිත්වය

ශ්‍රී ලංකාව, සමස්තය ඇතුළත් කරන සංවර්ධන හවුල්කාරිත්වයන්, විනිවිදභාවය, වගවීම සහ සංවර්ධන ප්‍රතිඵල කෙරෙහි අවධානය යොමු කිරීම යන බුසාන් මූලධර්ම සමග සංවර්ධන සහයෝගීතාවය අනුකූල කිරීමෙන් සිය කැපවීම නැවත තහවුරුකොට ඇත. සාම්ප්‍රදායික පරිත්‍යාගශීලීන්ගෙන් ඔබ්බට ගොස්, වඩා පුළුල් පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයක් සඳහා බුසාන්හි ඉල්ලීම පිළිබිඹු කරමින්, දකුණු-දකුණු සහයෝගීතාවය සහ ත්‍රිකෝණික හවුල්කාරිත්වයන් සමග සම්බන්ධ වීම වඩාත් දෘශ්‍යමාන විය. සංවර්ධන සහයෝගීතාව ජාතික වශයෙන් හිමිකාරිත්වය දරනු ලබන සහ මෙහෙයවනු ලබන බවට, ශ්‍රී ලංකාවේ දිගුකාලීන ස්ථාවරය බුසාන් හවුල්කාරිත්වය මඟින් ශක්තිමත් කළේය. රජයේ ප්‍රමුඛතා සමග ප්‍රදායකයින් අනුකූලවීම ඉල්ලා සිටීම, ජාතික පද්ධති (ePMS වැනි) ශක්තිමත් කිරීම සහ ආධාර පළමුවෙන් දේශීය පාර්ශ්වකරුවන්ට වගවන බව සහතික කිරීම පිළිබඳ ලංකාවේ ප්‍රවේශය විසින් එය තහවුරු කරන ලදී.

### 4. OECD-DAC ඇගයීම් නිර්ණායක

සංවර්ධන මැදිහත්වීම් තක්සේරු කිරීම සඳහා මාර්ගෝපදේශක ප්‍රමිතිය ලෙස, ශ්‍රී ලංකාව OECD-DAC ඇගයීම් රාමුව (උචිතබව-Relevance, සඵලතාව-Effectiveness, කාර්යක්ෂමතාව-Efficiency, බලපෑම-Impact, තිරසරභාවය-Sustainability සහ සංසක්තිය-Coherence) සම්මත කර ඇත. මෙම නිර්ණායක ව්‍යාපෘති ඇගයීම්, ජාතික අධීක්ෂණ රාමු සහ ප්‍රදායකයින්ගේ සහාය ලබන වැඩසටහන් තක්සේරු කිරීම් වලදී යොදාගනු ලබන අතර, එමගින් ජාත්‍යන්තර භාවිතයන් සමග සංසන්දනාත්මක බව සහතික කරයි.

[30] P, 124, Gunawardena,A., (2010). Evaluation of the Implementation of the Paris Declaration: Case study of Sri Lanka in Wood, B., Kabell, D., Sagasti, F., & Muwanga, N. Synthesis report on the first phase of the evaluation of the implementation of the Paris Declaration
https://assets.publishing.service.gov.uk/media/5a79ac57ed915d07d35b7425/Paris-Dec-Synthesis-Report.pdf




*රූප සටහන 1 ඇගයීම් නිර්ණායක මාර්ගෝපදේශය*

OECD-DAC ඇගයීම් නිර්ණායක යොදා ගැනීමේදී, ශ්‍රී ලංකාව ප්‍රදායකයින්ගේ අරමුදල් සහිත මැදිහත්වීම් ජාතික ප්‍රමුඛතා සමග අනුකූලවන බව සහ දිගුකාලීන සංවර්ධන ඉලක්කවලට දායකවන බව සහතික කිරීම දැඩිව අවධාරණය කර ඇත. ග්‍රාමීය සංවර්ධනය සහ උතුරු නැගෙනහිර පශ්චාත් ගැටුම් ප්‍රතිසංස්කරණය වැනි ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා ව්‍යාපෘති සහාය වන්නේද යන්න පරීක්ෂා කිරීමෙන් මෙම උචිතබව තක්සේරුකොට ඇත. වැඩසටහන් ප්‍රතිඵල ඇගයීම හරහා සඵලතාව මනිනු ලැබ ඇත. උදාහරණයක් ලෙස, අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීමේ මූලපිරීම්වල සාර්ථකත්වය මනිනු ලැබීය. කාර්යක්ෂමතාව, මාර්ග ජාලා සහ වාරිමාර්ග යෝජනා ක්‍රම ඇතුළුව, මහා පරිමාණ යටිතල පහසුකම් ආයෝජනවල පිරිවැය-සඵලතාව කෙරෙහි අවධානය යොමුකොට ඇත. විශේෂයෙන් ජීවනෝපාය වැඩසටහන් තුළ දරිද්‍රතාවය අඩු කිරීම සහ රැකියා උත්පාදනය සඳහා එහි දායකත්වය හරහා, ප්‍රදායකයින්ගේ ආධාරවල බලපෑම අධීක්ෂණය කරන ලදී. තිරසාරරභාවය සහතික කිරීම සඳහා, බාහිර අරමුදල්වලින් ඔබ්බට ආයතනික ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කරමින්, ව්‍යාපෘති මගින් සෞඛ්‍ය හා අධ්‍යාපනය වැනි අංශවල ධාරිතා ගොඩනැගීමේ සංරචක වැඩි වැඩියෙන් ඒකාබද්ධ කරයි. නව නිර්ණායකයක් ලෙස, සහයෝගීතාවය හඳුන්වාදීමත් සමග, ශ්‍රී ලංකාව තිරසාර සංවර්ධන ඉලක්ක (Sustainable Development Goals (SDGs)) යටතේ ඇති පුළුල් කැපවීම් සමග ප්‍රදායකයින්ගේ සහාය ලබන ව්‍යාපෘති අනුකූලවීම කෙරෙහි අවධානය යොමු කර ඇති අතර, එමගින් ජාතික හිමිකාරිත්වය සහ ගෝලීය වගවීම යන දෙකම ශක්තිමත් වේ. වගවීම, කාර්යසාධනය සහ දේශපාලන පක්ෂ සහ අපේක්ෂකයින් විසින් ලබාදෙන පොරොන්දුවල බලපෑම දෙස OECD-DAC ඇගයීමේ නිර්ණායක ප්‍රතිපත්ති විසින් අවධානය යොමු කරන බැවින්, ඒවා විශේෂයෙන් පැෆ්රල් සංවිධානය සහ මාර්තු 12 ව්‍යාපාරයේ ප්‍රතිපත්ති ප්‍රකාශන අධීක්ෂණයට සෘජුවම අනුවර්තනය කළ හැකිවන අතර, මෙම නිර්ණායක පහත පරිදි රාමුගත කළ හැකිය:

## 1. උචිතබව

- ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දු, පුරවැසියන්ගේ සැබෑ ප්‍රමුඛතා සපුරාලන්නේද යන්න තක්සේරු කිරීම.
- ජාතික අවශ්‍යතා සහ ජනතාවගේ අපේක්ෂාවන් සමග පොරොන්දුවල අනුකූලවීම තක්සේරු කිරීම.

## 2. කාර්යක්ෂමතාවය

- පොරොන්දු ඉටු කිරීමේදී සම්පත් (අයවැය වෙන් කිරීම, කාලය සහ ආයතනික ධාරිතාව) භාවිතා කළ ආකාරය ඇගයීමට ලක් කිරීම.
- පොරොන්දු ඉටු කිරීම, පිරිවැය ඵලදායීද නැතහොත් නාස්තියක්, නැවත නැවත කිරීමක් හෝ ඒ තුළ ප්‍රමාදයක් සිදුවී ඇත්ද යන්න ඉස්මතු කිරීම.

### 3. සඵලතාව

- පොරොන්දු, අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක කර ඇති ප්‍රමාණය මැන බැලීම.
- ප්‍රකාශිත ඉලක්ක සහ මුදුන්පත් කරගත් ප්‍රතිඵල අතර හිඩැස/පරතරය හඳුනා ගැනීම.

### 4. බලපෑම

- ජීවනෝපායන් වැඩි දියුණු කිරීම, ආණ්ඩුකරණය කෙරෙහි පුරවැසි විශ්වාසය, අසමානතාවය අඩු කිරීම හෝ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම වැනි ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාත්මක කිරීමේ පුළුල් සමාජීය බලපෑම් තක්සේරු කිරීම.
- පොරොන්දු, දිගුකාලීන ධනාත්මක වෙනස්කම් ඇති කළේ දැයි බැලීම.

### 5. තිරසරභාවය

- ක්‍රියාත්මක කරන ලද පොරොන්දුවල ප්‍රතිඵල, එක් රජයක කාලයෙන් ඔබ්බට පවත්වා ගත හැකිද යන්න පරීක්ෂා කිරීම.
- එක් වරක් පමණක් ජනහිතවාදී පියවර වීමට වඩා, ශක්තිමත් ආයතන, නීති සහ ප්‍රතිපත්ති මගින් මුලපිරීම්වලට පිටුබලය ලැබෙන්නේ දැයි පරීක්ෂා කිරීම.

### 6. සංසක්තිය

- ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු එකිනෙකට ගැළපේද යන්න සහ තිරසාර සංවර්ධන ඉලක්ක, මානව හිමිකම් සම්මුතීන් සහ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ වැනි පුළුල් ජාතික හා ජාත්‍යන්තර කැපවීම් සමඟ ගැළපේද යන්න ඇගයීමට ලක් කිරීම.

## 2.4. රටෙහි හිමිකාරිත්වය

හිමිකාරිත්වය යන්නෙන් අදහස් කරන්නේ සංවර්ධන මැදිහත්වීම් හරහා රජය තමන්ගේම ප්‍රතිපත්ති අධීක්ෂණය සහ ඇගයීම සඳහා නායකත්වය ලබා දීම සහ වගකීම කෙතරම් දුරට භාරගන්නේද යන්නයි. ශ්‍රී ලංකාවේ වත්මන් රජය විසින් තම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ හිමිකාරිත්වය පෙන්නුම් කරන ප්‍රධාන ක්‍රියාකාරීත්වයන් පහත පරිදි වේ:

- **ජාතික ප්‍රතිපත්ති රාමුව ලෙස ප්‍රතිපත්ති ප්‍රකාශනය:** 2025-03-03 දින කැබිනට් මණ්ඩලය විසින් 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' යන ප්‍රතිපත්ති ප්‍රකාශනය ජාතික ප්‍රතිපත්ති රාමුව ලෙස පිළිගෙන, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය ආයතන, පළාත් සහ පළාත් පාලන ආයතන ඒ අනුව ඔවුන්ගේ කාර්යයන් සැලසුම් කර ක්‍රියාත්මක කරන ලෙස යොමු කරන ලදී.

- **කාර්යසාධනය අධීක්ෂණ චක්‍රලේඛය:** ජනාධිපති ලේකම් කාර්යාලය විසින් 2025-03-24 දින අංක PS/SB/චක්‍රලේඛය/03/2025 දරණ චක්‍රලේඛය නිකුත් කරන ලද අතර, ප්‍රගති අධීක්ෂණ රාමුව සහ 2025-2029 උපායමාර්ගික සැලැස්ම මත පදනම්ව 2025 වසර සඳහා ඔවුන්ගේ ක්‍රියාකාරී සැලසුම් සකස් කරන ලෙස සියලුම අමාත්‍යාංශවලට උපදෙස් දෙන ලදී.

- **අනිවාර්ය/නිශ්චිතව කළ යුතු වාර්තාකරණය:** සියලුම අමාත්‍යාංශ තම ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම් ඇතුළත් ක්‍රියාකාරී සැලසුම් සහ උපායමාර්ගික සැලසුම් ඉදිරිපත් කළ යුතු අතර, අමාත්‍යාංශ කාර්යසාධන අධීක්ෂණ පද්ධතිය (MPMS) හරහා කාර්තුමය වශයෙන් ප්‍රගතිය වාර්තා කිරීම අවශ්‍ය බව අවධාරණය කරන ලදී.

- **ආයතනික යාන්ත්‍රණ:** රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳ උපායමාර්ගික තීරණ ගැනීම කඩිනම් කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 11 දෙනෙකුගෙන් සමන්විත රාජ්‍ය ආයෝජන අධීක්ෂණ සහ ඇගයීම් කමිටුවක් 2024-12-30 දින කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලදී.

## 2.5. පාර්ශ්වකරුවන්ගේ හිමිකාරිත්වය

ජාතික අධීක්ෂණ සහ ඇගයීමේ ධාරිතාව බොහෝ විට රජයේ ආයතනවල කාර්යයක් ලෙස සීමිත අර්ථයෙන් වටහාගෙන ඇතත්, එය සමස්ත රාජ්‍ය පුරා ඇති හැකියාවක් ලෙස සැලකිය යුතුය. මෙම පුළුල් දෘෂ්ටිකෝණයට, වෘත්තීය ඇගයීම සඳහාවන ස්වේච්ඡා සංවිධාන (Voluntary Organizations for Professional Evaluation (VOPEs)), විශ්වවිද්‍යාල, බුද්ධි මණ්ඩල සහ රාජ්‍ය නොවන සංවිධාන යනාදිය ඇතුළත් වේ. වැදගත් වන්නේ, ප්‍රධාන ගැටළු පිළිබඳ ඔවුන්ගේ අවබෝධය වැඩි දියුණු කිරීමට සහ ප්‍රතිපත්ති ක්‍රියාවලීන්හි අර්ථවත් සහභාගිත්වයක් ලබා ගැනීමට රාජ්‍ය නොවන සංවිධාන සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් යන පාර්ශ්ව දෙකටම අධීක්ෂණ සහ ඇගයීම් සඳහා ප්‍රවේශය අවශ්‍ය වීමයි.[31]

බුසාන් හවුල්කාරිත්වයේ අවධාරණය කර ඇති පරිදි, රාජ්‍ය අයවැය වෙන් කිරීම සහ වියදම් කිරීමේදී විනිවිදභාවය වෙනුවෙන් පෙනී සිටීම; රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා වගවීම සහතික කිරීම; සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්ති සම්පාදනය දැනුවත් කිරීම සඳහා ඇගයීම භාවිතා කිරීම සඳහා වන ඉල්ලුම ශක්තිමත් කිරීම; සහ ජාතික හා ජාත්‍යන්තර ඇගයීම් ප්‍රමිතීන් මත පදනම්ව, විශ්වසනීය හා ප්‍රයෝජනවත් ඇගයීම් උපදවීම සඳහා සුදුසුකම් ලත් ඇගයුම්කරුවන්ගේ ධාරිතාව වර්ධනය කිරීමේදී රාජ්‍ය නොවන සංවිධාන හට කේන්ද්‍රීය කාර්යභාරයක් ඉටුකළ හැකිවාක් මෙන්ම, එය ඉටුකළ යුතු ය.[32]

වගකිවයුතු රාජ්‍ය නොවන සංවිධාන ලෙස, පැෆ්රල් සංවිධානය සහ මාර්තු 12 ව්‍යාපාරය විසින්, ජාතික සංවර්ධන ප්‍රතිපත්තියේ මෙම තෙවන පාර්ශ්වීය අධීක්ෂණය ආරම්භ කළේ, වගවීම සහ විනිවිදභාවය ශක්තිමත් කිරීමේදී ස්වාධීන අධීක්ෂණයේ කාර්යභාරය පැහැදිලිව පිළිගන්නා ''සඵලදායී සංවර්ධන සහයෝගීතාව සඳහා හවුල්කාරිත්වය'' පිළිබඳ බුසාන් ප්‍රකාශනයට අනුකූලව ය.

## 2.6. මෙවලම්, ප්‍රවේශය, ක්‍රමවේදය, උපායමාර්ගය, වාර්තාකරණය සහ සීමාවන්

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධීක්ෂණ ක්‍රියාවලියට ක්‍රමානුකූල සහ බහු-මාන ප්‍රවේශයක් අවශ්‍ය වේ. මෙම ක්‍රම මගින් ප්‍රමාණාත්මක දත්ත සහ ගුණාත්මක අවබෝධයන් යන දෙකම ග්‍රහණය කර ගන්නා අතරම, පුරවැසි දෘෂ්ටිකෝණ සහ රජයේ වගවීම පිළිබිඹු කරයි. ආණ්ඩුකරණයේ ප්‍රගතිය තක්සේරු කිරීමට, අභියෝග හඳුනා ගැනීමට සහ සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීම ශක්තිමත් කිරීමට පහත මෙවලම් සහ ක්‍රියාවලීන් භාවිතා කරනු ලැබේ.

### 2.6.1. මෙවලම්

- **ලේඛන හා තොරතුරු සමාලෝචනය:** කැබිනට් තීරණ, අයවැය ලේඛන සහ ක්‍රියාත්මක කිරීමේ වාර්තා විශ්ලේෂණය කිරීම.
- **මාධ්‍ය අධීක්ෂණය:** මාධ්‍ය සහ අනෙකුත් අදාළ මූලාශ්‍ර නිරීක්ෂණය කිරීම.
- **කාර්යසාධනය නිරීක්සීමේ උපකරණ පුවරු:** ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) නිරීක්සීම.
- **ක්ෂේත්‍ර අධීක්ෂණය සහ ඇගයීම්:** ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ප්‍රතිලාභීන්ගේ ප්‍රතිපෝෂණ පිළිබඳ ස්ථානීය සත්‍යාපනය.
- **පාර්ශවකරුවන්ගේ අදහස් විමසීම:** සහභාගිත්ව අධීක්ෂණය සහතික කිරීම සඳහා පුරවැසියන්, සිවිල් සමාජය සහ මාධ්‍ය සමග සම්බන්ධ වීම.
- **කලින් කල ලබාදෙන ප්‍රගති වාර්තා:** කාර්තුමය සහ වාර්ෂික සමාලෝචන ලේඛනවලට සොයාගැනීම් සම්පාදනය කිරීම.

එක් එක් අදියරේදී යොදන ලද මෙවලම්, අනුරූප වාර්තාකරණ චක්‍රය සහ ප්‍රචාරණ සැලැස්ම සමග පහත දක්වා ඇත:

[31] P, 95, Segone, M and Sniukaite, I, (2013). Potential roles of the United Nations Evaluation Group in National Evaluation Capacity Development in Marco Segone, Jim Rugh (Eds.), Evaluation and Civil Society: Stakeholders' perspectives on National Evaluation Capacity Development, https://rbma.site/wp-content/uploads/mdocs/Evaluation%20and%20civil%20society_v9_final_web.pdf

[32] https://www.oecd.org/content/dam/oecd/en/publications/reports/2011/12/busan-partnership-for-effective-development-co-operation_29eb4a17/54de7baa-en.pdf

| අදියර | මෙවලම් | වාර්තාකරණ චක්‍රය | වාර්තා ජනගතවන කාලය |
|---|---|---|---|
| පළමු අදියර | • ලේඛන හා තොරතුරු සමාලෝචනය<br>• මාධ්‍ය අධීක්ෂණය<br>• පාර්ශ්වකරුවන්ගේ අදහස් විමසීම | පළමු අර්ධ-වාර්ෂික වාර්තාව (2024 නොවැම්බර් සිට 2025 මැයි දක්වා කාලය ආවරණය කරයි) | 2025 සැප්තැම්බර් |
| දෙවන අදියර | • මාධ්‍ය අධීක්ෂණය<br>• පාර්ශ්වකරුවන්ගේ අදහස් විමසීම<br>• ක්ෂේත්‍ර අධීක්ෂණය සහ ඇගයීම<br>• කලින් කලට ලබාදෙන ප්‍රගති වාර්තා | දෙවන අර්ධ-වාර්ෂික වාර්තාව (2025 ජුනි සිට දෙසැම්බර් දක්වා)<br>තෙවන අර්ධ-වාර්ෂික වාර්තාව (206 ජනවාරි සිට ජුනි දක්වා)<br>සිව්වන අර්ධ-වාර්ෂික වාර්තාව (2026 ජූලි සිට ඔක්තෝබර් දක්වා) | 2025 දෙසැම්බර්<br>2026 ජූනි<br>2026 ඔක්තෝබර් |

### 2.6.2. ප්‍රවේශය

මෙම අධීක්ෂණ ප්‍රයත්නය, ප්‍රතිපත්ති ප්‍රකාශනය සහ රජයේ ක්‍රියාවන් සමග සංසන්දනය කිරීමට වඩා, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දක්වා ඇති කැපවීම් සහ ප්‍රමුඛතා රජයේ ක්‍රියාකාරකම් සහ ක්‍රියාකාරීත්වයන් මගින් පිළිබිඹුවන ආකාරය අධීක්ෂණය කර විශ්ලේෂණය කරයි. මෙම ක්‍රියාවලිය වත්මන් රජය විවේචනය  කිරීමට හෝ ප්‍රසංශා කිරීමක් ලෙස නොව, දේශපාලන නියෝජිතයින් වගවන අන්දමින් තබා ගැනීමේ සිවිල් අයිතිය ක්‍රියාත්මක කරන ක්‍රියාකාරී පුරවැසියන්ගේ සාමූහිකයක් ලෙස සිදු කෙරේ.

ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු වූ ක්‍රියාකාරීත්වයන්, 2025-2029 දක්වා ක්‍රියාත්මක කිරීමට නියමිත බව පැෆ්රල් සංවිධානය සහ මාර්තු 12 ව්‍යාපාරය අවබෝධ කරගනී. එහි මුල් අදියරේදී, මෙම අධීක්ෂණ ක්‍රියාවලිය, රජයේ ධූර කාලයේ පළමු මාස හය තුළ (2024 නොවැම්බර් සිට 2025 මැයි දක්වා) ගනු ලැබූ ක්‍රියාමාර්ග සහ එහි ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීම තක්සේරු කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. ඊළඟ අදියරයන්හිදී, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු සඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමෙන් මෙය පුළුල්වනු ඇත.

ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු පහත සඳහන් ආකාරයෙන් ක්‍රියාත්මක කෙරේ:

අ. විධායක ජනාධිපති ධූරය මගින්

ආ. අමාත්‍ය මණ්ඩලය මගින්

ඇ. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව මගින්

ඈ. ජාතික අයවැය මගින්

ඉ. අමාත්‍යාංශ සහ අදාළ බලධාරීන් මගින්




*රූප සටහන 2 ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය*

### 2.6.3. ක්‍රමවේදය

මෙම අධීක්ෂණ ක්‍රියාවලිය ප්‍රමාණාත්මක සහ ගුණාත්මක යන නිර්ණායක දෙකම කෙරෙහි අවධානය යොමු කරයි. පළමු අදියරේදී, විධායක තීරණ, පාර්ලිමේන්තු ක්‍රියාකාරීත්වයන්, කැබිනට් තීරණ, අයවැය වෙන් කිරීම්, සහ අදාළ බලධාරීන්ගේ ක්‍රියාකාරකම් වැනි නිමැවුම් සහ ක්‍රියාකාරකම්වල නිර්ණායක පරීක්ෂා කරනු ලැබේ. දෙවන අදියරේදී, ව්‍යාපෘති (මුල පුරා ඇති/ඉටුකෙරෙමින් පවතින/සම්පූර්ණ කර ඇති), සේවා සැපයීමේ වැඩි දියුණු කිරීම්, ප්‍රතිලාභ ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව සහ නීති සම්පාදනය කිරීම පිළිබඳ අමාත්‍ය කාර්යසාධනය හරහා නිමැවුම් නිර්ණායක අධීක්ෂණය කරනු ලැබේ.

ප්‍රතිපත්ති ප්‍රකාශන අධීක්ෂණ ක්‍රියාවලියේ පළමු අදියර සඳහා, පැෆ්රල් සංවිධානය සහ මාර්තු 12 ව්‍යාපාරය, 'උචිතබව' නිර්ණායකය කෙරෙහි පමණක් අවධානය යොමු කරයි. ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු පුරවැසියන්ගේ සැබෑ අවශ්‍යතා සහ ප්‍රමුඛතා කෙතරම් හොඳින් සපුරාලන්නේ ද යන්න, සහ ජාතික සංවර්ධන අරමුණු සමග කෙතරම් හොඳින් අනුකූල වේද යන්න පිළිබඳ මූලික තක්සේරුවක් සිදු කිරීම මෙම ප්‍රවේශයේ අරමුණයි. එළඹෙන අධීක්ෂණ අදියරය මගින්, සෙසු OECD-DAC නිර්ණායක ඇතුළත් කිරීම සඳහා තක්සේරුව පුළුල් කරමින්, කාලයත් සමග ක්‍රියාත්මක කිරීම සහ ප්‍රතිඵල යන දෙකම පුළුල්ව අධීක්ෂණය කිරීමට ඉඩ සලසන කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය යන නිර්ණායක භාවිතා කරනු ඇත. ප්‍රධාන වශයෙන් කැබිනට් තීරණ සහ ප්‍රතිපත්ති පොරොන්දුවලට සමගාමීව අයවැය යෝජනාවල අනුකූලතාව තක්සේරු කිරීම යන්න වෘත්තිකයාගේ මාර්ගෝපදේශයඃ ශ්‍රී ලංකාවේ සංවර්ධන ඇගයීම පිළිබඳ පියවරෙන් පියවර ප්‍රවේශයක් (Practitioner's Guideline: A Step by Step Approach on Development Evaluation in Sri Lanka)[33] , යන්නෙහි සඳහන් කර ඇති පරිදි උචිතබවේ නිර්ණායක සඳහා ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදය, **අතිශයින් උචිත**, **උචිත**, **අර්ධ වශයෙන් උචිත**, සහ **උචිත නොවන** ලෙස පහත සඳහන් ව්‍යුහගත ප්‍රවේශයන් හරහා දක්වා ඇතඃ

[33] Sivagnanasothy, V. (2020). Development Evaluation in Sri Lanka. USAID/SDGAP.

### A. අතිශයින් උචිත

- කැබිනට් තීරණය හෝ අයවැය වෙන් කිරීම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුවක් සෘජුවම ආමන්ත්‍රණය කරයි.
- ප්‍රතිපත්ති පොරොන්දුව කිසිදු හිඩැසකින්/පතරයකින් තොරව අපේක්ෂිත ඉලක්කයට, ප්‍රමිතියට හෝ අවශ්‍යතාවයට සම්පූර්ණයෙන්ම අනුරූප වේ.

### B. උචිත

- කැබිනට් තීරණය හෝ අයවැය වෙන් කිරීම, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුවේ අභිප්‍රායට පුළුල් ලෙස සහාය දක්වන නමුත්, විස්තරාත්මකව සම්පූර්ණයෙන්ම අනුකූල නැත.
- ප්‍රතිපත්තිය/ක්‍රියාව සහ කැපවීම අතර පොදු අනුරූපතාවක් ඇති නමුත්, යම් අනුවර්තනයක් හෝ අර්ධ වශයෙන් ආවරණය කිරීම පැහැදිලිය.

### C. අර්ධ වශයෙන් උචිත

- කැබිනට් තීරණය හෝ අයවැය වෙන් කිරීම, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුවකට සීමිත සබඳතාවයක් දක්වයි.
- පොරොන්දුවේ ඇතැම් අංශ පමණක් ආමන්ත්‍රණය කරනු ලබයි, නැතහොත් බලපෑම වක්‍ර හෝ ප්‍රමාණවත් නොවේ.

### D. උචිත නොවන

- කැබිනට් තීරණය හෝ අයවැය වෙන් කිරීම, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුවට කිසිදු අර්ථවත් ආකාරයකින් සම්බන්ධ නොවේ.
- ප්‍රතිපත්තිය/ක්‍රියාව සහ ප්‍රකාශිත කැපවීම අතර කිසිදු අනුකූලවීමක් නොමැත.

ජනාධිපති ලේකම් කාර්යාලයෙන් හෙළිවන විධායක තීරණ, කැබිනට් අමාත්‍යවරුන්ගේ කැබිනට් තීරණ, පාර්ලිමේන්තු ක්‍රියාකාරීත්වයන්, ජාතික අයවැය ප්‍රතිපාදන, අමාත්‍යාංශ කාර්යසාධනය සහ අදාළ බලධාරීන්ගේ ක්‍රියාකාරකම්වලින් උකහා ගනිමින්, මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුවලට සමගාමීව වත්මන් රජයේ ප්‍රගතිය ක්‍රමානුකූලව සමාලෝචනය කරන මෙම වාර්තාව, ඉටුකර ඇති දේ සහ ක්‍රියාත්මක වෙමින් පවතින දේ මනින අතර, පොරොන්දුව; **ක්‍රියාත්මක කර තිබේද, අර්ධ වශයෙන් ක්‍රියාත්මක කර තිබේද, මුලපුරා තිබේද, තවමත් ක්‍රියාත්මක කර නොමැතිද** යන්න සහ **සත්‍යාපනය කළ යුතු නොපැහැදිලි කරුණු** හඳුනා ගනිමින්, මහජන විවාදය සහ ප්‍රතිපත්ති වැඩි දියුණු කිරීම සඳහා සාක්ෂි පදනමක් ලබා දෙයි.

### *2.6.3.1. විධායක තීරණ*

රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාවට නැංවීම සඳහා විධායක ජනාධිපතිවරයාගේ තීරණ ඉතා වැදගත් වේ, මන්දයත්, ඒවා රජය සඳහා සමස්ත දිශාව සහ ප්‍රමුඛතා සකස් කරන බැවිනි. කැබිනට් මණ්ඩලය සහ අමාත්‍යාංශවලට මග පෙන්වීමෙන්, ජනාධිපතිවරයා ප්‍රතිපත්ති සහ සම්පත් සඳහා ඇති කැපවීම් සමග අනුකූලවීම සහතික කරයි. මෙම මට්ටමේදී ශක්තිමත් නායකත්වයක් මගින් පොරොන්දු ඉටු කිරීම වේගවත් කරන අතර, වගවීම ශක්තිමත් කරයි.

ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාත්මක කිරීම සඳහා විධායක ජනාධිපතිවරයා විසින් ගනු ලබන විධායක තීරණ මෙම අධීක්ෂණ ක්‍රියාවලියේදී නිරීක්ෂණයකොට ඇත.

### *2.6.3.2. කැබිනට් තීරණ*

කැබිනට් තීරණ මගින් දේශපාලන කැපවීම්, විධිමත් ප්‍රතිපත්ති ක්‍රියාකාරීත්වයන් බවට පරිවර්තනය කරන බැවින්, රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයක් ක්‍රියාත්මක කිරීමේදී කැබිනට් තීරණ කේන්ද්‍රීය වේ. සාමූහික තීරණ ගැනීම හරහා, කැබිනට් මණ්ඩලය යෝජනා අනුමත කිරීම, සම්පත් වෙන් කිරීම සහ නීතිමය හෝ පරිපාලන රාමු ස්ථාපිත කිරීම සහතික කරයි. සඵලදායී කැබිනට් තීරණ, අමාත්‍යාංශ හරහා ඒකාබද්ධභාවය ඇති කරයි, අතිච්ඡාදනය වීම වළක්වයි, සහ වගවීම ඇති කරයි, ඒවා ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දු සහ ප්‍රායෝගික ආණ්ඩුකරණය අතර තීරණාත්මක සම්බන්ධයක් බවට පත් කරයි. මෙම අර්ධ-වාර්ෂික වාර්තාව පදනම් වී ඇත්තේ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ශ්‍රී ලංකා වෙබ් අඩවිය (https://www.cabinetoffice.gov.lk/) තුළ නිල මාධ්‍ය නිවේදන ලෙස ප්‍රකාශයට පත් කරන ලද කැබිනට් තීරණ මතවන අතර, එය ප්‍රසිද්ධියේ ලබාගත නොහැකි සත්‍ය කැබිනට් සංදේශ/සටහන් (cabinet memorandum) හෝ කැබිනට් පත්‍රිකා මත රඳා නොපවතී.

### 2.6.3.3. පාර්ලිමේන්තු ක්‍රියාකාරිත්වයන්

ප්‍රතිපත්ති ප්‍රකාශනයක් ක්‍රියාත්මක කිරීමේදී පාර්ලිමේන්තු ක්‍රියාකාරිත්වයන් ඉතා වැදගත් වන්නේ පාර්ලිමේන්තුව රජයේ කැපවීම් ක්‍රියාත්මක කරන නීති, ප්‍රතිපත්ති සහ ජාතික අයවැය අනුමත කරන බැවිනි. විවාද, අධීක්ෂණ සහ කාරක සභා කටයුතු හරහා, පාර්ලිමේන්තුව ක්‍රියාත්මක කිරීමේදී වගවීම සහ විනිවිදභාවය සහතික කරයි. ජනතාවගේ හඬ නියෝජනය කිරීමෙන්, පාර්ලිමේන්තුව නීත්‍යානුකූලභාවය ශක්තිමත් කරන අතර, රජය එහි ප්‍රතිපත්ති ප්‍රකාශ පොරොන්දු සමග අනුකූලවන ලෙස තබාගනී.

මෙම අධීක්ෂණ ක්‍රියාවලිය පාර්ලිමේන්තු ක්‍රියාකාරිත්වයන්, විශේෂයෙන් අයවැය නිවේදන, නීතිමය නිවේදන, කාරක සභා ක්‍රියාවලීන් සහ ප්‍රතිපත්ති තීරණ සමග ගනුදෙනු කරයි. පළමු මාස හය තුළ, ජාතික අයවැය, 2025 දෙසැම්බර් මාසය දක්වා ක්‍රියාත්මක කිරීම සඳහා 2025 අප්‍රේල් මාසයේදී පාර්ලිමේන්තුවේදී සම්මත කරන ලදී. රාජ්‍ය ගිණුම් පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාව (Parliamentary Committee on Public Accounts (COPA)), රාජ්‍ය ව්‍යවසායන් පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාව (COPE) සහ රාජ්‍ය මූල්‍ය පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාව (Parliamentary Committee on Public Finance (COPF)) ශක්තිමත් ප්‍රතිඵල කෙරෙහි අවධානය යොමු කරන ප්‍රධාන කාර්යසාධන දර්ශක පදනම් කරගත් තක්සේරු ක්‍රියාවලියක් භාවිතා කිරීම හරහා, කාර්යසාධන වගවීම සහ ප්‍රතිඵල සහතික කිරීම සඳහා, රාජ්‍ය නියෝජිතායතනවල කාර්යසාධනය පාදක කරගත්, රාජ්‍ය මූල්‍ය සියුම්ව සෝදිසි කිරීමේ ක්‍රමවේදයක් ආයතන ගත කිරීමෙන් වඩා හොඳ ප්‍රතිලාභ ලැබෙනු ඇත.

### 2.6.3.4. ජාතික අයවැය වෙන් කිරීම්

රජයක් තම දේශපාලන ප්‍රතිපත්ති ප්‍රකාශනය, ක්‍රියාවට නැංවිය හැකි වැඩසටහන් සහ සේවාවන් බවට පරිවර්තනය කරන ප්‍රධාන මෙවලම ජාතික අයවැයයි. එබැවින්, පොරොන්දු වූ කැපවීම් සඳහා ප්‍රමාණවත් ලෙස අරමුදල් ලබාදෙන බවත්, ඵලදායී ලෙස ක්‍රියාත්මක කරන බවත්, සහතික කිරීම සඳහා අයවැය අධීක්ෂණය කිරීම අත්‍යවශ්‍ය වේ. සම්පත් වෙන් කිරීම් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ප්‍රමුඛතා සමග අනුකූල වේද යන්න සත්‍යාපනය කිරීමට, ප්‍රතිපත්තිමය අභිප්‍රායයන් සහ සැබෑ වියදම් අතර හිඩැස් හඳුනා ගැනීමට සහ ප්‍රතිඵල සඳහා ආයතන වගකිව යුතුවන ලෙස තබා ගැනීමට එය උපකාරී වේ. අඛණ්ඩ අයවැය අධීක්ෂණය මගින්, විනිවිදභාවය ශක්තිමත් කරන අතර, මහජන විශ්වාසය වැඩි දියුණු කරමින්, මතුවන අභියෝග ආමන්ත්‍රණය කිරීම සඳහා කාලෝචිත සීරුමාරු කිරීම් බලදායී කරයි.

මෙම ප්‍රතිපත්ති ප්‍රකාශන අධීක්ෂණ ක්‍රියාවලිය, පහත නිර්ණායක තුන මත පදනම්ව, ප්‍රතිපත්ති ප්‍රකාශන යෝජනා සමග අනුකූල වීමේ මට්ටම තක්සේරු කිරීමට **2025 ජාතික අයවැය** විශ්ලේෂණය කරයි:

- **උචිතබව -** අයවැය වෙන් කිරීම නිශ්චිත ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම්වලට අනුරූප වේ.
- **කාර්යක්ෂමතාව** - පූර්ණ ක්‍රියාත්මක කිරීම සඳහා වෙන් කර ඇති මූල්‍ය සම්පත් ප්‍රමාණවත් වීම.
- **සඵලතාව** - ප්‍රතිපත්ති ප්‍රකාශන ඉලක්ක සමග අනුකූලවන පැහැදිලි කාල රාමු සහ මැනිය හැකි ඉලක්ක තිබීම.

කෙසේ වෙතත්, පළමු අදියර මගින්, ප්‍රධාන වශයෙන් නිමැවුම් කෙරෙහි අවධානය යොමු කරන්නේ අධීක්ෂණ කාල සීමාව 2024 නොවැම්බර් සිට 2025 මැයි දක්වා දිවෙන බැවිනි. දෙවන අදියර තුළ කාර්යක්ෂමතාවය සහ සඵලතාව මැනිය යුතු වේ.

### 2.6.3.5. අමාත්‍යාංශ කාර්යසාධනය සහ අදාළ බලධාරීන්ගේ ක්‍රියාකාරකම්

ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාවට නැංවීම සඳහා වගකිව යුතු ප්‍රධාන ආයතන වන්නේ අමාත්‍යාංශ බැවින්, රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමේදී අමාත්‍යාංශ විසින් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලබයි. සම්පත් වෙන් කරන බව, ක්‍රියාකාරකම් සිදුකරන බව, සහ ප්‍රගතිය මනිනු ලබන බව සහතික කරමින්, ආංශික කැපවීම් සඳහා සෑම අමාත්‍යාංශයක්ම සෘජුවම වගකිව යුතුය. අමාත්‍යාංශ විසින් සඵලදායී ලෙස අධීක්ෂණය කිරීම, ක්‍රියාත්මක කිරීමේදී ඇති හිඩැස්/පරතර, ප්‍රමාදයන් සහ අභියෝග හඳුනා ගැනීමට උපකාරීවන අතරම, රජයේ ආයතන හරහා සම්බන්ධීකරණය ද සහතික කරයි. කලට වේලාවට නිකුත් කරන වාර්තා සහ ප්‍රතිපෝෂණය ලබා දීමෙන්, අමාත්‍යාංශ, විනිවිදභාවය, වගවීම සහ සිය ප්‍රතිපත්ති ප්‍රකාශනය කෙරෙහි රජය දක්වන කැපවීම පිළිබඳ සමස්ත විශ්වසනීයත්වය ගොඩනැගීමට දායක වේ.

මෙම විශ්ලේෂණයේදී, පළමු අදියර මගින්, අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන යෝජනා අධීක්ෂණය කරන අතර, දෙවන අදියර තුළ අමාත්‍යාංශවල භෞතික කාර්යසාධනය අධීක්ෂණය කරනු ලබයි. 'ක්ලීන් ශ්‍රී ලංකා' (Clean Sri Lanka) මුලපිරීම සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව (Commission to Investigate Allegations of Bribery or Corruption-CIABOC) විසින් ක්‍රියාත්මක කරන දූෂණ විරෝධී ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම ද මෙම අධීක්ෂණ ක්‍රියාවලියට ඇතුළත් වේ.

#### 2.6.3.6. *නිරීක්ෂණය*

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීමේදී, විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම සඳහා මාධ්‍ය, පර්යේෂණ ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. රජයේ කාර්යසාධනය වාර්තා කිරීම, දැනුවත්භාවය ඇති කිරීම සහ මහජන කතිකාව උත්තේජනය කිරීම මගින්, මාධ්‍ය විසින් මහජනතාව දැනුවත් කරනු ලබයි. පර්යේෂණ සංවිධාන මගින් ප්‍රතිපත්ති විශ්ලේෂණ වාර්තා නිෂ්පාදනය කිරීම හරහ ස්වාධීන සාක්ෂි සහ විශ්ලේෂණ සපයන අතර, තක්සේරුව සත්‍යාපනය සඳහා පොරොන්දු සහ සැබෑ ප්‍රතිඵල අතර අනුකූලවීම නිරීක්සීම සිදු කරයි.

### 2.6.4. උපාය මාර්ගය

ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය තුළ ක්‍රියාත්මක කර ඇති විශේෂ ලක්ෂණයක් වන්නේ මෙම ආකෘතිය "සම්පූර්ණ රජයටම බලපැවැත්වෙන" යන ආකල්පය අරමුණු කරගැනීමයි. රාජ්‍ය අංශ කළමනාකරණ චක්‍රය (Public Sector Management Cycle) මගින් සැලසුම් කිරීම, අයවැයකරණය, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය (විගණනය සහ ඇගයීම) ආවරණය කරයි. මෙම අධීක්ෂණ ක්‍රියාවලිය ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහාවන රාජ්‍ය අංශ කළමනාකරණ චක්‍රයේ උපාය මාර්ගයට අනුකූල වේ.




*රූප සටහන 3 රාජ්‍ය අංශ කළමනාකරණ (PSM) චක්‍රය*

### 2.6.5. පැෆ්රල් සංවිධානයේ සහ මාර්තු 12 ව්‍යාපාරයෙහි වාර්තාකරණ සහ ප්‍රතිපෝෂණ යාන්ත්‍රණ

- **අභ්‍යන්තර වාර්තාකරණය:** පාර්ශ්වකරුවන් විසින් සත්‍යාපනය කිරීම සමග අධීක්ෂණ සොයා ගැනීම් වරින් වර ප්‍රකාශයට පත් කිරීම.
- **මහජන වාර්තාකරණය:** අර්ධ-වාර්ෂික සහ වාර්ෂික අධීක්ෂණ වාර්තා හරහා විනිවිදභාවය පවත්වා ගැනීම සහ පුරවැසි විශ්වාසය පෝෂ්‍ය කිරීම සඳහා අධීක්ෂණවල සොයා ගැනීම් වරින් වර ප්‍රකාශයට පත් කිරීම.
- **ප්‍රතිපෝෂණ චක්‍ර :** ප්‍රතිපත්ති සීරුමාරු කිරීම් සහ අනාගත සැලසුම්කරණයට උගත් පාඩම් ඒකාබද්ධ කිරීමේ යාන්ත්‍රණ.

### 2.6.6. සීමාවන්

- ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ව්‍යුහගත අංකන පද්ධතියක් නොමැති අතර, එය එහි විද්‍යාත්මක සංස්ථිතියට බලපාන අතර ක්‍රමානුකූල අධීක්ෂණය වඩාත් අභියෝගාත්මක කරයි.
- පොරොන්දු වූ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා පැහැදිලිව දක්වා ඇති කාල රාමු නොමැතිකම, ප්‍රගතිය තක්සේරු කිරීම සහ පාර්ශ්වයන් වගවන ලෙස තබා ගැනීම දුෂ්කර කරයි.
- වාර්තාව පදනම්වී ඇත්තේ මහජන ප්‍රවේශය තුළ ලබාගත හැකි, නිල මාධ්‍ය නිවේදන ලෙස ප්‍රකාශයට පත් කරන ලද කැබිනට් තීරණ මත පමණි.
- නිශ්චිත කාල රාමුව තුළ ගන්නා ලද තීරණ සහ අයවැය වෙන් කිරීම්වලට විශ්ලේෂණය සීමා වී ඇති අතර, ප්‍රතිපත්ති වල සම්පූර්ණ ක්‍රියාත්මක කිරීම හෝ බලපෑම ග්‍රහණය නොකරයි.
- කාලය සීමාවීම හේතුවෙන්, මාර්ගගත ප්‍රවෘත්ති නාලිකාවලට අධීක්ෂණය සීමා වී ඇති අතර, එමගින් ලබා ගත හැකි දෘෂ්ටිකෝණවල සහ තොරතුරුවල විවිධත්වය සම්පූර්ණයෙන්ම ග්‍රහණය කර ගැනීම නොහැකි විය හැක.
- ලේඛන හා තොරතුරු සමාලෝචන ප්‍රවේශය ප්‍රසිද්ධියේ ලබාගත හැකි ලේඛන සහ ද්විතීයික මූලාශ්‍ර මත රඳා පවතින අතර,මෙම අදියරේදී ප්‍රාථමික දත්ත රැස් කිරීම හෝ ක්ෂේත්‍ර සත්‍යාපනය එයට ඇතුළත් නොවේ.
- ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සහ ප්‍රතිඵලවල සවිස්තරාත්මක දත්ත තවමත් ලබාගත නොහැකි බැවින්, අයවැයෙහි අනුකූලතාව පිළිබඳ විශ්ලේෂණය මෙම අදියරේදී මූලික වේ.

මෙම සීමාවන් තිබියදීත්, මෙම ක්‍රමවේදය රජයේ කැපවීම සහ මුල් අවදිය තුළ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය සඳහා ක්‍රමානුකූල පදනමක් සපයයි.

# 3. රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ව්‍යූහය

'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්'[34] සඳහා දැක්මක් (vision) සහිතව ජාතික ජන බලවේගය රජය පිහිටුවා ඇත. නව ශ්‍රී ලංකාවක් නිර්මාණය කිරීම සඳහා තම ප්‍රතිපත්ති ප්‍රකාශනය සාර්ථකව ක්‍රියාවට නැංවීම සඳහා මෙම සන්ධානය පැහැදිලි කැපවීමක් පෙන්නුම්කොට ඇත. මෙම රජයේ මූලික අපේක්ෂාව වන්නේ, **පරිසමාප්ත ජීවිතයක්-සුවපහසු රටක්, ගෞරවනීය ජීවිතයක්-සුරක්ෂිත රටක්, නවීන ජීවිතයක්-පොහොසත් රටක්, අභිමානවත් ජීවිතයක්-නොසැලෙන රටක්** නිර්මාණය කිරීමයි. ඉහත මූලික අපේක්ෂාවන් හතර ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර (National Key Result Areas (NKRAs)) සාක්ෂාත් කර ගැනීම සඳහා මෙහෙයුම් (missions) ලෙස සළකන අතරම, පහත සඳහන් උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර හරහා ක්ෂේත්‍ර ඉලක්ක 39 ක් ලෙස හඳුනාගෙන ඇත.

| මෙහෙයුම් අංකය | මෙහෙයුම | ඉලක්ක අංකය | ඉලක්කය | ක්‍රියාකාරකම් ගණන |
|---|---|---|---|---|
| 1 | **පරිසමාප්ත ජීවිතයක් - සුවපහසු රටක්** | 01.1 | ශිෂ්ඨසම්පන්න පුරවැසියෙක් - දියුණු මානව සම්පතක් | 335 |
| | | 01.2 | නිරෝගී ජීවිතයක් - සෞඛ්‍ය සම්පන්න ජනතාවක් | |
| | | 01.3 | සුවපහසු නිවසක් - සතීපාරක්ෂක ජීවිතයක් | |
| | | 01.4 | ජවසම්පන්න පුරවැසියෙක් - ජයග්‍රාහී ජනතාවක් | |
| | | 01.5 | උදාර සංස්කෘතික ජීවිතයක් - සහකම්පනීය ජනතාවක් | |
| | | 01.6 | සංරක්ෂිත ඉතිහාසයක් - උරුම නව්‍යකරණයක් | |
| | | 01.7 | තිරසර ජෛවීය ලෝකයක් - සදාහරිත ජීවිතයක් | |
| | | 01.8 | නිදහස් ජනමාධ්‍ය කර්මාන්තයක් - සමබර තොරතුරු සමාජයක් | |
| 2 | **ගෞරවනීය ජීවිතයක් - සුරක්ෂිත රටක්** | 02.1 | ආරක්ෂිත සමාජයක් - සුපෝෂිත ජාතියක් | 181 |
| | | 02.2 | කාර්යක්ෂම ශ්‍රම සම්පතක් - ගෞරවනීය වෘත්තීය ජීවිතයක් | |
| | | 02.3 | නිදහස් ස්ත්‍රී-පුරුෂ සමාජභාවයක් - සාධාරණ මිනිස් අනන්‍යතාවයක් | |
| | | 02.4 | සුරක්ෂිත ළමා ලෝකයක් - නිර්මාණශීලී අනාගත පරපුරක් | |
| | | 02.5 | තෘප්තිමත් තාරුණ්‍යයක් - සංස්කෘතිකවත් නිවහල් චින්තනයක් | |
| | | 02.6 | ගෞරවනීය ජේෂ්‍ඨ පුරවැසියෙක් - අර්ථවත් විශ්‍රාම දිවියක් | |
| | | 02.7 | නිර්බාධිත සමාජ ජීවිතයක් - යුක්තිසහගත සම ප්‍රවේශයක් | |

[34] A Thriving Nation-A Beautiful Life, National People's Power, 2024, https://www.npp.lk/si/policies/npppolicystatement

| මෙහෙයුම් අංකය | මෙහෙයුම | ඉලක්ක අංකය | ඉලක්කය | ක්‍රියාකාරකම් ගණන |
|---|---|---|---|---|
| 3 | **නවීන ජීවිතයක් - පොහොසත් රටක්** | 03.1 | ප්‍රජාතාන්ත්‍රික ආර්ථිකයක් - පොහොසත් රටක් | 604 |
| | | 03.2 | ඉහළ ඵලදායීතාවක් - ආහාර සුරක්ෂිත රටක් | |
| | | 03.3 | ගුණාත්මක පශු නිෂ්පාදනයක් - ව්‍යවසායකත්ව ප්‍රවේශයක් | |
| | | 03.4 | තිරසර කළමණාකරණයක් - ගුණාත්මක මත්ස්‍ය සම්පතක් | |
| | | 03.5 | ඩිජිටල් රාජ්‍යකරණයක් - ජාත්‍යන්තර හවුල්කාරිත්වයක් | |
| | | 03.6 | පර්යේෂණ හා සංවර්ධන ප්‍රවේශයක් - විදුහුරු සමාජයක් | |
| | | 03.7 | නව්‍ය සංචාරක කර්මාන්තයක් - ආකර්ෂණීය ගමනාන්තයක් | |
| | | 03.8 | ව්‍යවසායකත්ව ප්‍රවර්ධනයක් - ජීවධරණී ප්‍රවේශයක් | |
| | | 03.9 | තිරසර සම්පත් භාවිතාවක් - උපරිම ප්‍රතිලාභ ජනනයක් | |
| | | 03.10 | සුරක්ෂිත බලශක්ති කේන්ද්‍රයක් - තිරසර විනිමය ප්‍රභවයක් | |
| | | 03.11 | මහජන ප්‍රවාහන සේවාවක් - කාර්යක්ෂම ගමනාන්තයක් | |
| | | 03.12 | තිරසර සමුද්‍ර සම්පතක් - ගෝලීය සමුද්‍ර ව්‍යාපාරයෙන් පංගුවක් | |
| | | 03.13 | ආරක්ෂිත දත්ත පද්ධතියක් - සන්නිවේදන තාක්ෂණ විප්ලවයක් | |
| | | 03.14 | ඵලදායී කළමණාකරණයක් - ඒකාබද්ධ පරිහරණ සැලසුමක් | |
| | | 03.15 | විද්‍යාත්මක ඉදිකිරීම් ක්ෂේත්‍රයක් - ගුණාත්මක සේවා නියුක්තියක් | |
| 4 | **අභිමානවත් ජීවිතයක් - නොසැලෙන රටක්** | 04.1 | නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් - ශ්‍රී ලාංකේය ජාතික සාමාග්‍රියක් | 213 |
| | | 04.2 | කාර්යක්ෂම රාජ්‍ය සේවයක් - කුසලතා කේන්ද්‍රීය වෘත්තීයභාවයක් | |
| | | 04.3 | නීතිය මත පාලනයක් - සමප්‍රවේශී අධිකරණ පද්ධතියක් | |
| | | 04.4 | මිත්‍රශීලී පොලිස් සේවාවක් - තෘප්තිමත් වෘත්තීයභාවයක් | |
| | | 04.5 | මනුෂ්‍යත්ව පාදක බන්ධනාගාරයක් - යුක්තිගරුක රැඳවුම් දිවියක් | |
| | | 04.6 | මතින් තොර රටක් - නිරෝගී පුරවැසි දිවියක් | |
| | | 04.7 | උදාර රාජතාන්ත්‍රිකත්වයක් - ස්වෛරී රාජ්‍යයක් | |
| | | 04.8 | උසස් ජාතික ආරක්ෂාවක් - සුරක්ෂිත රාජ්‍යයක් | |
| | | 04.9 | ශ්‍රී ලාංකේය ජාතියක් - විශ්වීය පුරවැසියෙක් | |

මේ අනුව යමින්, හඳුනාගත් අපේක්ෂිත ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර (National Key Result Areas (NKRA)) සහ උප ක්ෂේත්‍ර පහත පරිදි අර්ථ දක්වා ඇත:

- පරිසමාප්ත ජීවිතයක්-සුවපහසු රටක් - **ප්‍රජා** ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය
- ගෞරවනීය ජීවිතයක්-සුරක්ෂිත රටක් - **සමාජ** ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය
- නවීන ජීවිතයක්-පොහොසත් රටක් - **ආර්ථික** ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය
- අභිමානවත් ජීවිතයක්-නොසැලෙන රටක් - **ආණ්ඩුකරණ** ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය

| මෙහෙයුම් (ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර (NKRAs)) | උප ක්ෂේත්‍ර සංඛ්‍යාව | ක්‍රියාකාරකම් සංඛ්‍යාව |
|---|---|---|
| **පරිසමාප්ත ජීවිතයක් - සුවපහසු රටක්** (ප්‍රජා) | 08 | 335 |
| **ගෞරවනීය ජීවිතයක් - සුරක්ෂිත රටක්** (සමාජ) | 07 | 181 |
| **නවීන ජීවිතයක් - පොහොසත් රටක්** (ආර්ථික) | 15 | 604 |
| **අභිමානවත් ජීවිතයක් - නොසැලෙන රටක්** (ආණ්ඩුකරණ) | 09 | 213 |

*වගුව 1 රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර, උප ක්ෂේත්‍ර සහ ක්‍රියාකාරකම්වල සංයුතිය*

ප්‍රතිපත්ති ප්‍රකාශනයේ, **මෙහෙයුම් 04 ක්** (ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර) සහ **ඉලක්ක 39** ක් යටතේ හඳුනාගෙන ඇති **ක්‍රියාකාරකම් 1333** ක් අන්තර්ගතව ඇත.




*රූප සටහන 4 එක් එක් මෙහෙයුම/ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය යටතේ දක්වා ඇති ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ක්‍රියාකාරකම්*

ආර්ථිකය ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර වැඩිම ක්‍රියාකාරකම් සංඛ්‍යාවක් (604) වාර්තා කරන අතර, අනෙකුත් ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රවන ප්‍රජා (335), ආණ්ඩුකරණය (213) සහ සමාජ (181) සාපේක්ෂව අඩු ක්‍රියාකාරකම් ප්‍රමාණයක් පෙන්නුම් කරයි.

## 4. අධීක්ෂණ ක්‍රියාවලිය - පළමු අදියර: විධායක තීරණ එදිරිව ප්‍රතිපත්ති ප්‍රකාශනය

2024 සැප්තැම්බර් මස පැවති ජනාධිපතිවරණයේදී සහ 2024 නොවැම්බර් මස පැවති පාර්ලිමේන්තු මැතිවරණය හරහා 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශනය පුරවැසියන් විසින් අනුමතකොට ඇත. විධායක ජනාධිපතිවරයා ලෙස, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාත්මක කිරීමට ඔහුට විධායක බලය හිමිවිය.

අධීක්ෂණ කාල සීමාව තුළ, විධායක ජනාධිපතිවරයා විසින් පහත සඳහන් තීරණ ගනු ලැබ ඇති බව අධීක්ෂණයකොට ඇත:

| අංකය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම (පිටු අංකය සහිතව) | විධායක තීරණය | නිරීක්ෂණය |
|---|---|---|---|
| 01 | *විද්‍යාත්මකව වෙන්කරන ලද අමාත්‍යාංශ 25කට ඇමතිවරුන් 25ක් සහ අනුරූපී නියෝජ්‍ය ඇමතිවරු පත් කිරීම සහ රාජ්‍ය ඇමති ධුර අහෝසි කිරීම (පිටුව 195)* | කැබිනට් මණ්ඩලය, අමාත්‍යවරුන් සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් 25 කට සීමා කිරීමේ පොරොන්දුව ක්‍රියාත්මක කර ඇත. | • කැබිනට් අමාත්‍යවරුන් සංඛ්‍යාවෙන් 22 ක් සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් සංඛ්‍යාවෙන් 28 ක් වුවද, පොරොන්දුව ක්‍රියාත්මක කර ඇත.<br>මූලාශ්‍රය:<br>https://www.cabinetoffice.gov.lk/cab/index.php?option=com_content&view=article&id=25&Itemid=23&lang=sihttps://www.cabinetoffice.gov.lk/cab/index.php?option=com_content&view=article&id=26&Itemid=24&lang=si |
| 02 | *පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වසර 05 කින් පසුව ලබාදෙන විශ්‍රාම වැටුප අහෝසි කිරීම (පිටුව 195)* | විධායක ජනාධිපතිවරයා විසින් කරන ලද ප්‍රකාශය | • මන්ත්‍රී විශ්‍රාම වැටුප් අහෝසි කිරීම යෝජනා කරමින් විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී රවී කරුණානායක විසින් පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක් ඉදිරිපත් කර ඇත.<br>• රජයේ සහ පාර්ලිමේන්තු ක්‍රියාමාර්ග අපේක්ෂාවෙන් සිටී.<br>මූලාශ්‍රය:<br>https://sinhala.adaderana.lk/news.php?nid=206333https://sinhala.adaderana.lk/news.php?nid=207971 |
| 03 | *මන්ත්‍රීවරුන්ගේ තීරුබදු රහිත වාහන බලපත්‍ර ක්‍රමය ඉවතට (පිටුව 195)* | විධායක ජනාධිපතිවරයා විසින් කරන ලද ප්‍රකාශය | • මන්ත්‍රීවරුන් හට නව වාහන බලපත්‍ර නිකුත් කර නොමැති නමුත්, මන්ත්‍රීවරුන් විසින් වාහන භාවිතා කරනු ලබන යාන්ත්‍රණය තවමත් පැහැදිලි නැත.<br>මූලාශ්‍රය:<br>https://sinhala.adaderana.lk/news.php?nid=206702 |
| 04 | *පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සැසිවාරයට සහභාගී වීම වෙනුවෙන් ගෙවන දීමනා අහෝසි කිරීම (පිටුව 195)* | විධායක ජනාධිපතිවරයා විසින් කරන ලද ප්‍රකාශය | • විපක්ෂ මන්ත්‍රී ජගත් විතාන විසින් නිකුත් කරන ලද වැටුප් පත්‍රිකාවෙන් පෙන්නුම් කරන පරිදි, මෙම දීමනාව තවමත් භාවිතයේ පවතී.<br>මූලාශ්‍රය:<br>https://shorturl.at/nmtjX |
| 05 | *ජනාධිපති නිල නිවාස එකකට පමණක් සීමා කිරීම (පිටුව 195)* | විධායක ජනාධිපතිවරයා විසින් කරන ලද ප්‍රකාශය | • ආගමික නායකයින්ගේ ඉල්ලීම් හේතුවෙන් මහනුවර සම්බන්ධයෙන් මෙම පොරොන්දුව අභියෝගවලට මුහුණ දෙන අතර, නොවිසඳුණු ඉඩම් අයිතිය සම්බන්ධයෙන් යාපනයේ පවතින එම නිවසේ ගැටලුවක් ඇත<br>මූලාශ්‍ර:<br>https://shorturl.at/aqirK<br>https://shorturl.at/y87wp |

| අංකය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම (පිටු අංකය සහිතව) | විධායක තීරණය | නිරීක්ෂණය |
|---|---|---|---|
| 06 | *විශ්‍රාමික ජනාධිපතිවරුන්ට හා ඔවුන්ගේ කලත්‍රයන්ට දී ඇති විශ්‍රාම වැටුප්, විශේෂ දීමනා හා වරප්‍රසාද අහෝසි කිරීම (පිටුව 195)* | විධායක ජනාධිපතිවරයා විසින් කරන ලද ප්‍රකාශය | • හිටපු ජනාධිපතිරුන්ට සහ ඔවුන්ගේ පවුල්වලට විශ්‍රාම වැටුප් සහ විශේෂ වරප්‍රසාද අහෝසි කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව විසින් යාවත්කාලීන කිරීම් අපේක්ෂාවෙන් සිටී.<br>මූලාශ්‍රය: https://shorturl.at/gslyW |
| 07 | *විධායක ජනාධිපති ආණ්ඩුක්‍රමය අහෝසි කොට පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් ස්ථාපිත කිරීම හා විධායක බලතල රහිත ජනාධිපතිවරයෙක් පත්කිරීම (පිටුව 195)* | | • අහෝසි කිරීම සඳහා විධිමත් කාලරාමුවක් ප්‍රකාශයට පත් කළ යුතුව ඇත.<br>මූලාශ්‍රය: https://shorturl.at/3zEf3 |
| 08 | *අමාත්‍යවරුන්ට/නියෝජ්‍ය අමාත්‍යවරුන්ට ධුර කාලය තුළදී එක් වාහනයක් පමණක් ලබාදීම (පිටුව 195)* | විධායක ජනාධිපතිවරයා විසින් කරන ලද ප්‍රකාශය | • අමාත්‍යවරයෙකුට හෝ නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට එක් වාහනයක් පමණක් වෙන් කිරීම සඳහා වූ පොරොන්දුව පිළිබඳව තවදුරටත් සත්‍යාපනය කිරීම අවශ්‍ය වේ.<br>මූලාශ්‍රය: https://shorturl.at/pX8Qy |
| 09 | *2019.04.21 වන පාස්කු ඉරුදින සිදුවූ ප්‍රහාරය සම්බන්ධව ජනාධිපති කොමිෂන් සභා නිර්දේශවලට අනුව අදාළ දේශපාලනඥයන් සහ නිලධාරීන්ට එරෙහිව කඩිනමින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම (පිටුව 207)* | විධායක ජනාධිපතිවරයා විසින් කරන ලද ප්‍රකාශය | • මීට පෙර ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත.<br>මූලාශ්‍රය: https://shorturl.at/XbMDx |

# 5. අධීක්ෂණ ක්‍රියාවලිය - පළමු අදියරː ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව කැබිනට් තීරණ අධීක්ෂණය කිරීම

## 5.1. 2024 නොවැම්බර් සිට 2025 මැයි දක්වා කාලය තුළ අමාත්‍ය මණ්ඩල තීරණ පිළිබඳ විශ්ලේෂණය

මෙම අධීක්ෂණ ක්‍රියාවලිය මගින් **2024 නොවැම්බර් සිට 2025 මැයි** දක්වා කාලය තුළ අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ කැබිනට් තීරණ අධීක්ෂණය කෙරේ. මෙම කාලය තුළ කැබිනට් මණ්ඩලය මුළු **තීරණ 299** ක් ගෙන ඇත. මෙයින් **තීරණ 65** ක් ප්‍රතිපත්ති ප්‍රකාශනයට සම්බන්ධ නොවන, අනිවාර්ය අනුමැතීන් සඳහාවන ව්‍යවස්ථාපිත අවශ්‍යතා ලෙස හඳුනාගන්නා ලදී (උදාː ලේකම්වරුන් පත් කිරීම). මෙමගින් **තීරණ** 234 ක් තවදුරටත් සළකා බැලීම සඳහා අවධානය යොමු කරන ලදී.

තීරණ 234 න් **18 ක්** පහත සඳහන් කරුණු මත අනුකූලතා විශ්ලේෂණයෙන් බැහැර කරන ලදීː:

- ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් නොකළ සම්පූර්ණයෙන්ම නව යෝජනා ලෙස ඉදිරිපත් වීම, හෝ
- කැබිනට් අනුමැතිය අවශ්‍ය කරන, පෙර රජයන්ගේ වැඩපිළිවෙළ තුළ පැවති යෝජනා.

මේ අනුව, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ප්‍රතිපත්තිමය කැපවීම් සමග අනුකූලවීම විශ්ලේෂණය සඳහා **කැබිනට් තීරණ 216** ක් තක්සේරු කරන ලදී. මේ සෑම තීරණයක්ම කාණ්ඩ හතරෙන් එකකට එනම්, **අතිශයින් උචිත, උචිත, අර්ධ වශයෙන් උචිත, සහ උචිත නොවන** ලෙස වර්ගීකරණය කරන ලදීː

මෙම අනුකූලතා තක්සේරුවෙන් ලබාගත් සොයාගැනීම් පහත ආකාරයට සාරාංශගත කර ඇතː

| කැබිනට් තීරණ සංඛ්‍යාව | අනුකූලතාවේ ස්වභාවය | ප්‍රතිශතය (ආසන්න %) |
|---|---|---|
| 50 | අතිශයින් උචිත | 23% |
| 58 | උචිත | 27% |
| 93 | අර්ධ වශයෙන් උචිත | 43% |
| 15 | උචිත නොවන | 7% |

*වගුව 2 අනුකූලතා තක්සේරුවේ සාරාංශය*

## 5.2. කැබිනට් තීරණ සමඟ අනුකූලවීමේ උචිතබව පිළිබඳ සොයාගැනීම්

2024 නොවැම්බර් සිට 2025 මැයි දක්වා කැබිනට් තීරණ වල අනුකූලතා විශ්ලේෂණය, රජයේ ක්‍රියාකාරීත්වය සහ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දක්වා ඇති කැපවීම් අතර සාමාන්‍යයෙන් ධනාත්මක සහසම්බන්ධතාවක් (positive correlation) පෙන්නුම් කරයි. විශ්ලේෂණය කරන ලද තීරණ 216 න්ː




*රූප සටහන 5 අනුකූලතා තක්සේරුවේ ප්‍රතිශතය*

- **23% ක් අතිශයින් උචිතබව පෙන්නුම් පෙන්නුම් කරන** අතර, එයින් ඇඟවෙන්නේ, මෙම ක්‍රියාකාරීත්වයන් ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ දී නිශ්චිත පොරොන්දු, අභිප්‍රාය සහ අන්තර්ගතය යන දෙකෙන්ම නිවැරදිවම ක්‍රියාත්මක කරන බවයි.
- **27% ක් උචිතබව පෙන්නුම් පෙන්නුම් කරන** අතර, ප්‍රතිපත්ති ප්‍රකාශන තේමාවන් සඳහ සැළකිය යුතු සහයෝගයක් පෙන්නුම් කරන නමුත්, නිශ්චිත අනුරූපවීමක් සැමවිටම නොපෙන්වයි .
- **43% ක් අර්ධ වශයෙන් උචිතබව පෙන්නුම් පෙන්නුම් කරන** අතර, එයින් ඇඟවෙන්නේ, බොහෝ මූලපිරීම් ප්‍රතිපත්ති ප්‍රකාශන ඉලක්කවලට සම්බන්ධ වුවද, ඒවා බොහෝ විට අපේක්ෂිත විෂය පථයෙන් කොටසක් පමණක් ආමන්ත්‍රණය කරන බව, නැතිනම් නාමිකව එසේ කරන බවයි.
- **7% ක් උචිත නොවනබව පෙන්නුම් පෙන්නුම් කරන** අතර, ප්‍රකාශිත ප්‍රතිපත්ති ප්‍රමුඛතා සමග පැහැදිලි සම්බන්ධයක් නොමැති තීරණ කුඩා ප්‍රමාණයක් හෙළි කරයි.




*රූප සටහන 6 ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර සමග කැබිනට් තීරණවල අනුකූලතාව*

ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, අවධානය සහිතව, විනිවිදභාවයෙන් යුක්තව, සහ මහජන කැපවීම් සමග අනුකූලවන බව සහතික කිරීම සඳහා අඛණ්ඩ අධීක්ෂණයේ වැදගත්කම මෙම විශ්ලේෂණයෙන් අවධාරණය කෙරේ (**ඇමිණුම-I**).

## 5.3. ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර සම්බන්ධයෙන් කැබිනට් තීරණ පිළිබඳ සොයාගැනීම්




*රූප සටහන 7 ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර සමග කැබිනට් තීරණවල අනුකූලතාවයේ ප්‍රතිශතය*

කැබිනට් තීරණවල ව්‍යාප්තිය ආර්ථික නවීකරණය කෙරෙහි දැඩි අවධානයක් යොමු කරන බව මෙමගින් පෙන්නුම් කරන අතර, ක්‍රියාකාරීත්වයන්ගෙන් **42%** ක් වඩාත්ම උප ක්ෂේත්‍ර සංඛ්‍යාවක් සහිතවන නවීන ජීවිතයක්-පොහොසත් රටක්, යන ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රයට අනුකූල වේ. මෙය යටිතල පහසුකම්. ආර්ථික වර්ධනය සහ නවීකරණය කෙරෙහි ප්‍රතිපත්තිමය අවධානයක් යොමු කරන බව අදහස් කරයි.

අනෙක් අතට තෘප්තිමත් ජීවිතයක්-සුවපහසු රටක් (10%) සහ ගෞරවනීය ජීවිතයක්-ආරක්ෂිත රටක් (17%) මගින් නියෝජනය වන සමාජ යහපැවැත්ම සහ ආරක්ෂාව යනාදියලබා ඇත්තේ සාපේක්ෂව අඩු ප්‍රමුඛතාගත කිරීමකි. මෙය සමාජ වැඩසටහන් පුළුල් කිරීමට පෙර, අඩිතාලමක් ලෙස ධනය ගොඩනැගීමේ උපායමාර්ගික ප්‍රගමනයක් පිළිබිඹු කළ හැකිය.

අභිමානවත් ජීවිතයක්-නොසැලෙන රටක් සමග, 30% ක් අනුකූලතාව දැක්වීම මඟින් ජාතික ඔරොත්තු දීමේ හැකියාව සහ ආණ්ඩුකරණය කෙරෙහි මධ්‍යස්ථ අවධානයක් දක්වන බව පෙන්නුම් කරයි. මේ අතර, තීරණවලින් 1% ක්, බහුවිධ අංශ ආවරණය කරන යම් ඒකාබද්ධ සැලසුම්කරණයක් පෙන්නුම් කරයි.




*රූප සටහන 8 හඳුනාගත් අංශ සමග අනුකූලතාව දක්වන කැබිනට් තීරණ ගණන*

කැබිනට් මණ්ඩලයේ තීරණ, ආර්ථිකය යථා තත්ත්වයට ගැනීම සහ ජාත්‍යන්තර මැදිහත්වීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරන අතර, මෙය සාර්ව ආර්ථික සහ භූ දේශපාලනික පීඩනයන්ට ප්‍රතිචාරාත්මක වීම පෙන්නුම් කරන අතර, සමාජයීය සහ ප්‍රජා-කේන්ද්‍රීය ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රවල සාපේක්ෂව අඩු

නියෝජනයක් පෙන්නුම් කරයි. මෙය රජයේ පුළුල් සංවර්ධන ඉලක්කවලට අනුකූලවන වඩාත් සමබර සහ සමස්තය ඇතුළත් කරන ප්‍රතිපත්ති න්‍යාය පත්‍රයක අවශ්‍යතාවය ඉස්මතු කරයි.

**ආර්ථික අංශය:** ප්‍රසම්පාදනය (14), මූල්‍ය (01), වෙළඳ (09), බලශක්තිය (08), ප්‍රවාහනය (07), බදු (07), කර්මාන්ත (07), ආර්ථිකය (06), සංචාරක කර්මාන්තය (05), ඉඩම් (04), ණය ප්‍රතිව්‍යුහගත කිරීම (04), කෘෂිකර්මාන්තය (04), ඩිජිටල් ආර්ථිකය (03), ව්‍යවසායකත්වය (07), පශු සම්පත් (02), පර්යේෂණ හා සංවර්ධනය (05), සහ සමුද්‍ර (02).

කැබිනට් තීරණවලින් විශාලතම කොටස ආර්ථික අංශය නියෝජනය කරනඅතර, එය විශ්ලේෂණය කරන ලද මුළු ප්‍රමාණයෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් වේ. එය ආර්ථික ස්ථාවරත්වය, යටිතල පහසුකම්, වෙළඳාමට පහසුකම් සැපයීම, බලශක්ති සුරක්ෂිතාව සහ ඩිජිටල් විපරිවර්තනය කෙරෙහි රජයේ දැඩි අවධානය පිළිබිඹු කරයි.

**ආණ්ඩුකරණ අංශය:** විදේශ කටයුතු (26), නීතිය සහ අධිකරණ (12), රාජ්‍ය සේවය (10), දූෂණ විරෝධය (08), ප්‍රජාතන්ත්‍රවාදය (02), සහ ජාතික ආරක්ෂාව (01).

ජාත්‍යන්තර සබඳතා සහ ආයතනික ප්‍රතිසංස්කරණ කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින්, ආණ්ඩුකරණය ද්විතීයික ප්‍රමුඛතාවක් ලෙස මතු වේ. විදේශ කටයුතු මෙම අංශයේ ඉදිරියෙන් සිටින්නේ, සමහරවිට අඛණ්ඩ භූ දේශපාලනික, වෙළඳ, සහ ආධාර පිළිබඳව කෙරෙන කතිකා හේතුවෙන් විය හැකි ය. දූෂණ-විරෝධී ප්‍රයත්නයන් සමග, නෛතික සහ පරිපාලන ප්‍රතිසංස්කරණ, නීතියේ ආධිපත්‍යය සහ රාජ්‍ය වගවීම ශක්තිමත් කිරීම සඳහා කැපවීමක් වෙත සංඥා කරයි.

**ප්‍රජා අංශය:** පරිසරය (10), නිවාස (02), කලාව සහ සංස්කෘතිය (04), මාධ්‍ය (03), ක්‍රීඩා (03), සෞඛ්‍යය (05), සහ අධ්‍යාපනය (05).

ප්‍රජා යහපැවැත්ම මධ්‍යස්ථ ලෙස ප්‍රමුඛතාගත කර ඇත. මෙම සමූහය තුළ පරිසරය, ඉදිරිය ගෙන ඇති අතර, එය තිරසරභාවය පිළිබඳ ගැටළු හඳුනා ගැනීම පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, දිගුකාලීන සමාජ ඒකාග්‍රතාවය සඳහා තීරණාත්මක අංශවන සෞඛ්‍යය, අධ්‍යාපනය, නිවාස සහ සංස්කෘතික සංවර්ධනය ගැන තීරණ ගැනීමේ වාර ගණන සාපේක්ෂව අඩු මට්ටමක පවතින අතර, එමගින් මානව ප්‍රාග්ධනය සහ ප්‍රජාවේ ඔරොත්තු දීමේ හැකියාව වෙනුවෙන් වැඩි ආයෝජනයක් අපේක්ෂා කරයි.

**සමාජ අංශය:** සමාජ ආරක්ෂණය (12), ආහාර සුරක්ෂිතතාව (07), ශ්‍රමය සහ රැකියා නියුක්තිය (06), කාන්තාවන් සහ ළමුන් (02).

සමාජ අංශය, විශේෂයෙන් වත්මන් ආර්ථික දුෂ්කරතා සහ සමාජ අවදානම්වලට ප්‍රතිචාර වශයෙන්, සීමිත, එහෙත් උපායමාර්ගික අවධානයක් ලබා ගනී. සමාජ ආරක්ෂණය සහ ආහාර සුරක්ෂිතතාව සාධාරණ අවධානයක් ලබා ගන්නා අතර, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටළු සහ රැකියා නියුක්තියෙහි ප්‍රතිසංස්කරණ අඩුවෙන් නියෝජනයවන බව පෙනේ. මෙමගින්, සමාජ සංවර්ධනය සඳහා වැඩියෙන් සමස්තය ඇතුළත් කරන සහ සාධාරණ ප්‍රවේශයක අවශ්‍යතාවය යෝජනා කරයි.

විවිධ අංශ හරහා යන ප්‍රතිපත්ති සහ ඒකාබද්ධ සංවර්ධන උපායමාර්ගවලට ලැබෙන්නේ අවම සෘජු අවධානයකි. එයින් පෙන්නුම් කරන්නේ සාකල්‍ය, බහු-ආංශික සැලසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීමෙහි හිඩැසක්/පරතරයක් තිබිය හැකි බවයි.

රජයේ ක්‍රියාකාරකම්, කැබිනට් තීරණ ප්‍රතිපත්ති ප්‍රකාශනය සමඟ අනුකූලවීම මත පදනම්ව, පළමු මාස හය තුළ රජයේ කාර්යසාධනය විශ්ලේෂණය කිරීමෙන් හෙළිදරව් වන්නේ, යෝජිත ක්‍රියාකාරකම් 1,333 න් 239 කට මුල පුරා ඇති බවයි.

මේ නිසා යෝජිත ක්‍රියාකාරකම් පිළිබඳව ක්‍රියාත්මක වීම තවමත් ඉතිරිව ඇත. එපමණක් නොව, මුලපුරා ඇති ක්‍රියාකාරකම් අතර පවා, ඒවා අනාගතයේදී බිම් මට්ටමේ දී ප්‍රත්‍යක්ෂ බලපෑමක් බවට පරිවර්තනය වීම සහතික කිරීම අත්‍යාවශ්‍ය වේ.

## 6. අධීක්ෂණ ක්‍රියාවලිය - පළමු අදියරː ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව පාර්ලිමේන්තු ක්‍රියාකාරිත්වයන් අධීක්ෂණය කිරීම

මෙම අධීක්ෂණ ක්‍රියාවලිය, අයවැය නිවේදන, නීතිමය බලාත්මක කිරීම්, කාරක සභා කටයුතු (රැස්වීම් වාර්තා) සහ ප්‍රධාන ප්‍රතිපත්ති තීරණ කෙරෙහි විශේෂ අවධානයක් සහිතව පාර්ලිමේන්තු ක්‍රියාකාරිත්වයන් පරීක්ෂා කරයි. කෙසේ වෙතත්, පළමු මාස හය තුළ නීතිමය බලාත්මක කිරීම් අධීක්ෂණය කරන ලද අතර ක්‍රියාකාරිත්වයන් සහ නිරීක්ෂණ පහත පරිදි වේː

| අංකය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම (පිටු අංකය සහිතව) | නීති සම්පාදනය | නිරීක්ෂණය |
|---|---|---|---|
| 01 | *දූෂණය සහ මූල්‍ය අපරාධ මැඩලීමේ නීති සහ අනෙකුත් ව්‍යුහයන් ශක්තිමත් කිරීම සහ විධිමත් කිරීම (226)* | 2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත | • කමිටුවේ නිර්දේශ මත පදනම්ව, අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත් කෙටුම්පත තවදුරටත් සංශෝධනය කිරීමට නීති කෙටුම්පත් සම්පාදකයට උපදෙස් දීම සඳහා 2024 දෙසැම්බර් 09 වන දින ගනු ලැබූ කැබිනට් තීරණයක් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.<br>• පනත 2025 අප්‍රේල් 30 වන දින පාර්ලිමේන්තුවේදී සහතික කරන ලදී.<br>මූලාශ්‍රයː<br>https://www.parliament.lk/uploads/acts/gbills/sinhala/6378.pdf |
| 02 | *බදු පරිපාලනය කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය නීති ප්‍රතිසංස්කරණ සිදු කිරීම (102)* | 2025 අංක 4 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | • 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සහ 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත් රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඉන් පසුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට 2025 පෙබරවාරි 19 වන දින කැබිනට් තීරණය ගන්නා ලදී.<br>• පනත 2025 අප්‍රේල් 11 වන දින පාර්ලිමේන්තුවේදී සහතික කරන ලදී.<br>මූලාශ්‍රයː<br>https://www.parliament.lk/uploads/acts/gbills/sinhala/6380.pdf |
| 03 | *උපයනවිට බද්ද වෘත්තිකයන්ට අසාධාරණයක් නොවන පරිදි සංශෝධනය (72)*<br><br>*පුද්ගලයින් සඳහා වන වාර්ෂික බදු නිදහස් සීමාව රුපියල් ලක්ෂ 12 සිට ලක්ෂ 24දක්වා වැඩිකිරීමට සහ බදු කාණ්ඩ (Tax Brackets) හා බදු අනුපාත (Tax Rates) සාධාරණ ලෙස සංශෝධනය කිරීම (103)* | 2025 අංක 2 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත | • 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සහ 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත් රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර ඉන් පසුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට 2025 පෙබරවාරි 19 වන දින කැබිනට් තීරණය ගන්නා ලදී.<br>• පනත 2025 මාර්තු 20 වන දින පාර්ලිමේන්තුවේදී සහතික කරන ලදී.<br>• **2025 අංක 2 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යටතේ බදු-නිදහස් සීමාව රුපියල් මිලියන 1.2 සිට රුපියල් මිලියන 1.8 දක්වා වැඩි කළද, එය පොරොන්දු වූ රුපියල් මිලියන 2.4 ට වඩා අඩුය.**<br>මූලාශ්‍රයː<br>https://www.parliament.lk/uploads/acts/gbills/sinhala/6379.pdf |

| අංකය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම (පිටු අංකය සහිතව) | නීති සම්පාදනය | නිරීක්ෂණය |
|---|---|---|---|
| 04 | *දැනට දින නියමයක් නොමැතිව කල්තබා ඇති පළාත් සභා සහ පළාත් පාලන මැතිවරණ වසරක් ඇතුළත පවත්වා ජනතාවට පාලනයට සම්බන්ධ වීමට අවස්ථාව සැලැසීම (230)* | 2025 අංක 1 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත | • පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා දැනටමත් කැඳවා ඇති නාමයෝජනා ආපසු කැඳවීමට විධිවිධාන සැලසීමට මැතිවරණ, කොමිසමට බලය පවරමින්, සියලුම ඡන්දදායකයින්ගේ අයිතිය සහ තරුණ ප්‍රජාවේ ඡන්ද අයිතිය ආරක්ෂා කිරීමට හැකිවන පරිදි, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකයට උපදෙස් දීම සඳහා 2024 දෙසැම්බර් 02 වන දින ගනු ලැබූ කැබිනට් තීරණයක් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.<br>• පනත 2025 පෙබරවාරි 17 වන දින පාර්ලිමේන්තුවේදී සහතික කරන ලදී.<br>• **පළාත් පාලන මැතිවරණ සාර්ථකව පවත්වා ඇති අතර, වසරක් ඇතුළත පළාත් සභා මැතිවරණ පැවැත්වීම සම්බන්ධයෙන් විධිමත් නිවේදනයක් තවමත් අපේක්ෂා කෙරේ.**<br>මූලාශ්‍ර/ය:<br>https://www.parliament.lk/uploads/acts/gbills/sinhala/6376.pdf<br>https://results.elections.gov.lk/ |
| 05 | *රිමාන්ඩ් සිරකරුවන් ලෙස දීර්ඝකාලීනව රඳවා තැබීම වැළැක්වෙන පරිදි අපරාධ යුක්ති ක්‍රමයට සම්බන්ධ ආයතනවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම (209)* | අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) (1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි) | • 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (මරණ පරීක්ෂණ පැවැත්වීම) පනත කෙටුම්පත සංශෝධනය කිරීම සඳහා 2025 මැයි 19 වන දින කැබිනට් තීරණයක් ගන්නා ලදී. එමගින් අපරාධ නඩු විධාන සංග්‍රහයේ මරණ පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධයෙන් පවතින නීතිමය රාමුව සහ පවතින ක්‍රියා පටිපාටි සහ භාවිතයන් වැඩි දියුණු කිරීමට හැකිවේ.<br>• 2025 අප්‍රේල් 08 වන දින අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් පළමු කියවීම සඳහා පනත් කෙටුම්පත ඉදිරිපත් කරන ලදී.<br>• 2025 මැයි 23 වන දින දෙවන කියවීම.[35]<br>මූලාශ්‍රය:<br>https://www.parliament.lk/uploads/bills/gbills/sinhala/6381.pdf |

[35] Code of Criminal Procedure (Amendment) Act, No. 7 OF 2025 certified on June 18, 2025, https://documents.gov.lk/view/acts/2025/6/07-2025_E.pdf

| අංකය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම (පිටු අංකය සහිතව) | නීති සම්පාදනය | නිරීක්ෂණය |
|---|---|---|---|
| 06 | *ත්‍රිරෝද රථ සේවාව සහ කාර්ය මණ්ඩල, පාසැල් ළමුන් ප්‍රවාහනයද ඇතුළත් අනෙකුත් කුලී රථ සේවාවන් විධිමත් කර ගුණාත්මක සහ කාර්යක්ෂම සේවාවක් බවට පත්කිරීම (174)* | ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන) (1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි) | • ප්‍රවාහන ක්ෂේත්‍රයේ හඳුනාගෙන ඇති ඇතැම් ප්‍රායෝගික ගැටළු සඳහා විසඳුම් ලබාදීම සහ දැනට නියාමනය කර නොමැති ප්‍රවාහන ක්ෂේත්‍ර කිහිපයක් නියාමනය කිරීම සඳහා, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ විධිවිධාන කිහිපයක් වර්තමාන අවශ්‍යතා වලට අනුකූලව යාවත්කාලීන කිරීම සඳහා 2025 පෙබරවාරි 02 වන දින කැබිනට් තීරණයක් ගන්නා ලදී.<br>• ප්‍රවාහන, මහාමාර්ග, ජරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් 2025 මැයි 08 වන දින පළමු කියවීම සඳහා පනත් කෙටුම්පත ඉදිරිපත් කරන ලදී.<br>• 2025 ජුනි 05 වන දින දෙවන කියවීම<br>• 2025 ජුනි 05 වන දින තුන්වන කියවීම[36]<br>මූලාශ්‍රය: https://www.parliament.lk/uploads/bills/gbills/sinhala/6383.pdf |
| 07 | *ශ්‍රී ලංකාව කලාපයේ අවම විදුලි මිල සහිත රටක් බවට පත් කිරීම සඳහා තරගකාරී ප්‍රසම්පාදන හා මිල කැඳවීම් ක්‍රියාවලිය සක්‍රීය කර, තෙල් මත පදනම් වූ විදුලි ජනනය අඩු මිලැති සූර්ය හා සුළං ප්‍රමුඛ පුනර්ජනනීය ප්‍රභවයන් වෙත යොමු කිරීම (165)* | ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) (2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි) | • තිරසර හා ආරක්ෂිත විදුලිබල අංශයක් ස්ථාපිත කිරීම සඳහා උනන්දුවක් දක්වන සියලුම උචිත පාර්ශ්වකරුවන්ගේ අදහස් සැලකිල්ලට ගනිමින්, විදුලිබල පනතේ අරමුණු නැවත සලකා බැලීම සඳහා 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත යළි සලකා බැලීම සඳහා 2025 දෙසැම්බර් 30 වන දින කැබිනට් තීරණයක් ගන්නා ලදී.<br>• 2025 මැයි 23 වන දින පළමු කියවීම සඳහා බලශක්ති අමාත්‍යවරයා විසින් පනත් කෙටුම්පත ඉදිරිපත් කරන ලදී.<br>• 2025 අගෝස්තු 06 වන දින දෙවන කියවීම<br>• 2025 අගෝස්තු 06 වන දින තුන්වන කියවීම[37]<br>• **මිල ගණන් අඩු කිරීම සඳහා අවුරුදු 05 ක සැලැස්මක් යෝජනා කිරීම සහ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අදාළව පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා.**<br>මූලාශ්‍රය: https://www.parliament.lk/uploads/bills/gbills/sinhala/6385.pdf |

[36] National Transport Commission (Amendment) Act, No. 8 OF 2025 certified on June 19, 2025, https://documents.gov.lk/view/acts/2025/6/08-2025_E.pdf

[37] Sri Lanka Electricity Act (Amendment) Act, No. 14 of 2025 certified on August 22, 2025, https://documents.gov.lk/view/acts/2025/8/14-2025_E.pdf

| අංකය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම (පිටු අංකය සහිතව) | නීති සම්පාදනය | නිරීක්ෂණය |
|---|---|---|---|
| 08 | *නවෝත්පාදන දිරිමත් කරන, බුද්ධිමය දේපළ අයිතිවාසිකම් ආරක්ෂා කරන, සහ දත්ත පෞද්ගලිකත්වය සහ ආරක්ෂාව සහතික කරන ආධාරක නියාමන රාමුවක් (154)* | පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) (2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි) | • පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කිරීම සඳහා 2022 අංක 09 දරන පුද්ගලික දත්ත ආරක්ෂණ පනත සම්බන්ධයෙන් 2025 මාර්තු 17 වන දින කැබිනට් තීරණයක් ගන්නා ලදී.<br>• 2025 මැයි 08 වන දින පළමු කියවීම සඳහා ඩිජිටල් ආර්ථික අමාත්‍යවරයා විසින් පනත් කෙටුම්පත ඉදිරිපත් කරන ලදී.<br>• 2017 වර්ෂයේදී ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා ස්මාර්ට් (සුහුරු) කාඩ්පත් භාවිතා කිරීම සඳහා ජාත්‍යන්තර තරඟකාරී ලංසු තැබීමේ ක්‍රමය අනුගමනය කරමින්, පොලිකාබනේට් කාඩ්පත් මිලියන 15 ක් මිලදී ගැනීමට 2025 අප්‍රේල් 07 වන දින කැබිනට් තීරණයක් ගන්නා ලදී.<br>• මෙම සන්දර්භය තුළ, විද්‍යුත් හැඳුනුම්පත් (E-NIC) නිකුත් කිරීමට රජයේ ක්‍රියාමාර්ග පිළිබඳ කැබිනට් තීරණය, පුද්ගලික දත්ත බෙදා ගැනීමේ දේශපාලන සන්දර්භය තුළ මෙම ක්‍රියාවලිය අධීක්ෂණයෙහි තීරණාත්මක කොටසක් වේ.<br>මූලාශ්‍රය: https://www.parliament.lk/uploads/bills/gbills/sinhala/6384.pdf |

# 7. අධීක්ෂණ ක්‍රියාවලිය - පළමු අදියරඃ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව අයවැය අධීක්ෂණය කිරීම

## 7.1. 2025 ජාතික අයවැය පිළිබඳ විශ්ලේෂණය

ජාතික අයවැය ලේඛනය රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි ඇතුළත් පොරොන්දු ඇගයීමට ලක් කළ හැකි ප්‍රධාන නිල ලේඛනයක් ලෙස පවතී. මෙම විශ්ලේෂණය මගින් අයවැය ප්‍රතිපාදන, ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි ඇතුළත් යෝජනාවන්ට කෙතරම් දුරට අනුකූල වන්නේ ද යන්න තක්සේරු කරයි. කැබිනට් තීරණ, ජාතික අයවැය සමග සුසංගත කිරීමේ (harmonizing) වගකීම ප්‍රධාන වශයෙන් පැවැරෙන්නේ රජයට ය. ප්‍රතිපත්ති ප්‍රකාශනය මගින් අයවැය කෙරෙහි පැහැදිලි සහයෝගයක් ප්‍රවර්ධනය නොකරන නමුත්, එවැනි අනුබලයක් ලැබිය යුතුය යන්න පිළිබඳව මහජන හා දේශපාලන කතිකාව අඛණ්ඩව අවධානය යොමු කරයි.

ආරක්ෂක, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන, ඩිජිටල් ආර්ථික, අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය සහ වෘත්තීය අධ්‍යාපනය, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතාව, මහජන ආරක්ෂාව සහ පාර්ලිමේන්තු කටයුතු, කාන්තා හා ළමා කටයුතු, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධනය, ධීවර, ජලජ සහ සාගර සම්පත්, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම්, කම්කරු, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු, වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතාව සහ සමුපකාර සංවර්ධනය, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා, කෘෂිකර්මය, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග, තරුණ කටයුතු සහ ක්‍රීඩා, රාජ්‍ය පරිපාලනය, පළාත් සභා සහ පළාත් පාලන, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස, ග්‍රාමීය සංවර්ධනය, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම, බලශක්ති, පරිසරය, සහ විද්‍යා හා තාක්ෂණය යන අමාත්‍යාංශ වලට අදාලව 2025 ජාතික අයවැයෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන 390 ක් පමණ මෙහිදී පරීක්ෂා කරන ලදී.

මෙම අධීක්ෂණ ක්‍රියාවලිය, පළමු මාස හයක කාලය තුළ, රජය විසින් ගත් ක්‍රියාමාර්ග සහ එම කාලයෙහි පස්වන මාසය (2025 අප්‍රේල්) වන විට බලාත්මක වන අයවැය වෙන් කිරීම් පිළිබඳව විශ්ලේෂණය කරයි. එබැවින්, අයවැය විශ්ලේෂණය වාර්තාකරණ කාලපරිච්ඡේදයේ අවසාන මාසයට (2025 මැයි) සීමා වී ඇත. 2025 ජාතික අයවැය තක්සේරු කරන ලද්දේ, එක් එක් අමාත්‍යාංශයට අදාළ වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති ආකාරය කෙරෙහි අවධානය යොමු කරමිනි. එමගින් රජයේ ප්‍රතිපත්තිමය කැපවීම්වලට ප්‍රමුඛතාවය දීමක් පිළිබඳව ඉඟියක් සපයයි. විශේෂයෙන්, ප්‍රතිපත්තිමය කැපවීම් සහ රජයේ ප්‍රමුඛතාවලට අනුකූලව සම්පත් පෙළගස්වා ඇති ආකාරය තේරුම් ගැනීම සඳහා අමාත්‍යාංශ 24 ක අයවැය ප්‍රතිපාදන සමාලෝචනය කරන ලදී.

## 7.2. අයවැය යෝජනා සමග අනුකූලවීමේ උචිතබව පිළිබඳ සොයාගැනීම්

- 2024 නොවැම්බර් සිට 2025 මැයි දක්වා කාලය තුළ ගනු ලැබූ කැබිනට් තීරණ 216 න් **25 ක්** පමණක් ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූල වන ක්‍රියාමාර්ග බව ද, අයවැය යෝජනාවලට අනුරූපවන බව ද පෙන්නුම් කරයි (**ඇමිණුම-II**).
- කැබිනට් තීරණ 216 න් **191 ක්** ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූල වුවද, ඒවා අනුරූප වූ අයවැය වෙන් කිරීම් නොමැත.
- එවැනි **අයවැය වෙන් කිරීම් 133 ක්** 2025 ජාතික අයැවය තුළින් හඳුනාගෙන ඇති අතර, ඒවා ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු වලට අනුකූල වූ නමුත්, සමාලෝචන කාල පරිච්ඡේදය තුළ ඒවාට සම්බන්ධ කිසිදු කැබිනට් තීරණයක් ගෙන නොමැත (**ඇමිණුම-III**).
- **ව්‍යාපෘති 112 ක්** පෙර රජයන්ගේ ජාතික අයැවය තුළින් අඛණ්ඩව ක්‍රියාත්මක වන ඒවා වන අතර, වත්මන් ප්‍රතිපත්ති ප්‍රකාශනයට ඍජු සම්බන්ධතාවක් නොමැත.

පෙර ආණ්ඩුවල ජාතික අයවැය අතර සමස්තය හරහා යන විශ්ලේෂණය (cross-cutting analysis) මගින් ප්‍රකාශිත දේශපාලන අභිප්‍රායන්, මූල්‍ය සැලසුම් තුළ කෙතරම් හොඳින් අන්තර්ගත කර තිබේද යන්න පිළිබඳව අවබෝධයක් ලබා දේ. මෙම විශ්ලේෂණය මුල් අවධියේ දී සිදු කරන බැවින්, තක්සේරුව මූලික වශයෙන් නිමැවුම් මට්ටම කෙරෙහි අවධානය යොමු කරයි. ප්‍රතිඵල සහ බලපෑම් පිළිබඳ ගැඹුරු ඇගයීම්, අයවැයගත ක්‍රියාකාරකම් සැබෑ ලෙස ක්‍රියාත්මක කිරීම සහ එම ප්‍රගතිය මත රඳා පවතී. කෙසේ වෙතත්, මෙම අධීක්ෂණ ක්‍රියාවලියේ පළමු අදියරේදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන්නේ **නිමැවුම්** පිළිබඳව ය.

# 8. අධීක්ෂණ ක්‍රියාවලිය - පළමු අදියර: නිරීක්ෂණ

රජයේ ක්‍රියාමාර්ග, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඇතුළත් ක්‍රියාකාරකම්වලට අනුව අධීක්ෂණය කරන අතරතුර, මෙම අධීක්ෂණ ක්‍රියාවලිය මගින් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සහ අමාත්‍ය මණ්ඩල යෝජනා යන දෙකෙහිම අඩුපාඩු සහ තාක්ෂණික නොගැලපීම් කිහිපයක් අනාවරණය කරගෙන ඇත. සමහර අවස්ථා වලදී, පැහැදිලි වෙනස්කම් නොමැතිව විවිධ මාතෘකා යටතේ එක හා සමාන කැපවීම් අතිච්ඡාදනය වේ. ඇතැම් පොරොන්දු පිළිබඳව මැනිය හැකි ඉලක්ක හෝ කාලරාමු නොමැති බැවින් ප්‍රගතිය තක්සේරු කිරීම දුෂ්කර වේ. තවද, අමාත්‍ය මණ්ඩල යෝජනාවලදී, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඇතුළත් නිශ්චිත පොරොන්දු ප්‍රමාණවත් ලෙස පිළිබිඹු නොවන අවස්ථාවලදී එම පරතරය පැහැදිලිව දැකිය හැකි ය.

මාධ්‍ය සහ පර්යේෂණ ආයතන යන දෙකම හරහා ප්‍රතිපත්ති ප්‍රකාශනය අධීක්ෂණය කිරීම කෙරෙහි වැඩි වැඩියෙන් අවධානය යොමු වී ඇති බව නිරීක්ෂණය කළ හැකි ය. රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඇතුළත් පොරොන්දුවලට අදාළව රජයේ ක්‍රියාමාර්ග නිරීක්සීමේදී, පාර්ලිමේන්තුවේ නිල වෙබ් අඩවි සහ ජනාධිපති මාධ්‍ය අංශය, මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය, සමාජ මාධ්‍ය වේදිකා, පොඩ්කාස්ට් සාකච්ඡා සහ පර්යේෂණ ප්‍රකාශන ඇතුළු පරාසයක මූලාශ්‍ර මෙම වාර්තාවට පදනම් වී ඇත. මෙම විශ්ලේෂණයට විධායක ජනාධිපතිවරයා, අමාත්‍ය මණ්ඩලය, පාර්ලිමේන්තුව, අමාත්‍යාංශ, ජාතික අයවැය, සහ ජනාධිපති ලේකම් කාර්යාලය විසින් ගනු ලැබූ පියවර ඇතුළත් වේ. මෙම ප්‍රයත්නයන්ට අනුපූරකව, ආණ්ඩුකරණයේ වගවීම සහ විනිවිදභාවය සහතික කිරීම සඳහා පැෆ්රල් සංවිධානය සහ මාර්තු 12 ව්‍යාපාරය විසින් මාධ්‍ය වාර්තා සහ අනෙකුත් සත්‍යාපිත මූලාශ්‍ර අඛණ්ඩව අධීක්ෂණය කරනු ලබයි. ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාත්මක කිරීම පිළිබඳ සොයාගැනීම් සහ නිරීක්ෂණ පහත පරිදි වේ:

| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ආණ්ඩුකරණය |
|---|---|
| අංශය | අමාත්‍යාංශ |
| ආයතනය | විධායක ජනාධිපති |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *විද්‍යාත්මකව වෙන් කරන ලද අමාත්‍යාංශ 25 කට ඇමතිවරුන් 25 ක් සහ අනුරූපී නියෝජ්‍ය ඇමතිවරු පත් කිරීම සහ රාජ්‍ය ඇමති ධුර අහෝසි කිරීම (පිටුව 195)* |
| ක්‍රියාව | අමාත්‍ය මණ්ඩලය 25 කට සීමා කිරීමේ පොරොන්දුව ක්‍රියාත්මක කර ඇත |
| ඉටුවීම | පොරොන්දුව ක්‍රියාත්මක කර ඇත. |
| නිරීක්ෂණය | එහෙත් කැබිනට් අමාත්‍යවරුන් සංඛ්‍යාවෙන් 22 ක් සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් සංඛ්‍යාවෙන් 28 ක් වේ. |
| මූලාශ්‍රය | https://tinyurl.com/mth33zsx<br>https://tinyurl.com/2ypbftka |

| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ආණ්ඩුකරණය |
|---|---|
| අංශය | පාර්ලිමේන්තුව |
| ආයතනය | විධායක ජනාධිපති |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වසර 05 කින් පසුව ලබාදෙන විශ්‍රාම වැටුප අහෝසි කිරීම (පිටුව 195)* |
| ක්‍රියාව | විපක්ෂ මන්ත්‍රී විශ්‍රාම වැටුප් අහෝසි කිරීම යෝජනා කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රී රවී කරුණානායක විසින් පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක් ඉදිරිපත් කර ඇත. |
| ඉටුවීම | පොරොන්දුව ක්‍රියාත්මක කළ යුතුව ඇත. |
| නිරීක්ෂණය | රජයේ සහ පාර්ලිමේන්තු ක්‍රියාමාර්ග අපේක්ෂාවෙන් සිටී |
| මූලාශ්‍රය | https://sinhala.adaderana.lk/news.php?nid=206333 |

| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ආණ්ඩුකරණය |
|---|---|
| අංශය | විධායකය |
| ආයතනය | විධායක ජනාධිපති |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *මන්ත්‍රීවරුන්ගේ තීරුබදු රහිත වාහන බලපත්‍ර ක්‍රමය ඉවතට (පිටුව 195)* |
| ක්‍රියාව | විධායක ජනාධිපතිවරයා විසින් කරන ලද ප්‍රකාශය |
| ඉටුවීම | පොරොන්දුව ක්‍රියාත්මක කර ඇත ඉටුවීම |
| නිරීක්ෂණය | මන්ත්‍රීවරුන් හට නව වාහන බලපත්‍ර නිකුත් කර නොමැති නමුත්, මන්ත්‍රීවරුන් විසින් වාහන භාවිතා කරනු ලබන යාන්ත්‍රණය තවමත් පැහැදිලි නැත. |
| මූලාශ්‍රය | https://sinhala.adaderana.lk/news.php?nid=206702 |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ආණ්ඩුකරණය |
| අංශය | පාර්ලිමේන්තුව |
| ආයතනය | විධායක ජනාධිපති |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සැසිවාරයට සහභාගී වීම වෙනුවෙන් ගෙවන දීමනා අහෝසි කිරීම (පිටුව 195)* |
| ක්‍රියාව | තවමත් ක්‍රියාමාර්ගයක් නොමැත |
| ඉටුවීම | පොරොන්දුව ක්‍රියාත්මක කළ යුතුව ඇත. |
| නිරීක්ෂණය | මෙම දීමනාව තවමත් ප්‍රායෝගිකව පවතී. |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ආණ්ඩුකරණය |
| අංශය | විධායකය |
| ආයතනය | විධායක ජනාධිපති |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *ජනාධිපති නිල නිවාස එකකට පමණක් සීමා කිරීම (පිටුව 195)* |
| ක්‍රියාව | තවමත් ක්‍රියාමාර්ගයක් නොමැත |
| ඉටුවීම | පොරොන්දුව ක්‍රියාත්මක කළ යුතුව ඇත |
| නිරීක්ෂණය | ආගමික නායකයින්ගේ ඉල්ලීම් හේතුවෙන් මහනුවර සම්බන්ධයෙන් මෙම පොරොන්දුව අභියෝගවලට මුහුණ දෙන අතර, නොවිසඳුණු ඉඩම් අයිතිය සම්බන්ධයෙන් යාපනයේ පවතින එම නිවසේ ගැටලුවක් ඇත. |
| මූලාශ්‍රය | https://shorturl.at/aqirK |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ආණ්ඩුකරණය |
| අංශය | ඩිජිටල් රාජ්‍යය |
| ආයතනය | ජනාධිපති ලේකම් කාර්යාලය |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *ජනතාවට ලබා දිය යුතු හඳුනාගත් සේවාවන් රාශියක් ' එකම වහලක් යටින්" සංකල්පය මත, ඩිජිටල් තාක්ෂණය භාවිතයෙන් ඉටුකර දීමට හැකිවන පරිදි සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් තුළ පහසුකම් ඇති කිරීම (පිටුව 199)* |
| ක්‍රියාව | සියලුම රජයේ ගෙවීම් ඩිජිටල්කරණය සඳහා 'GovPay' වේදිකාවක් දියත් කිරීම, කොළඹ ප්‍රධාන කාර්යාලයේ සිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටම දක්වා ජනාධිපති අරමුදලේ සේවාවන් පුළුල් කිරීම, සහ විදේශයන්හි සිටින ශ්‍රී ලාංකිකයන්ට ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල වල පවතින විද්‍යුත් ක්‍රම මගින් විද්‍යුත් උප්පැන්න, විවාහ සහ මරණ සහතික වල සහතික කළ පිටපත් ලබාගැනීමට ඉඩ සලසන විද්‍යුත් උප්පැන්න, විවාහ සහ මරණ සහතික පහසුකම හඳුන්වාදීම යන මේවා මෙම මුලපිරීම් වල ඇතුළත් වේ. මෙම ඩිජිටල් මුල පිරීම් තුන 2025 පෙබරවාරි 07 වන දින හඳුන්වා දෙන ලදී. |
| ඉටුවීම | මුලපුරා ඇත |
| නිරීක්ෂණය | මෙම ක්‍රියාව සාමූහිකව ඩිජිටල් ආණ්ඩුකරණය ප්‍රගමනය කරන අතර, රට අභ්‍යන්තරයේ සහ විදේශයන්හි පුරවැසියන් හට රාජ්‍ය සේවාවන් සඳහා වන සාධාරණ ප්‍රවේශය ඉහළ නංවයි. |
| මූලාශ්‍රය | https://shorturl.at/nYm2o<br>https://govpay.lk/si/<br>https://online.ebmd.rgd.gov.lk/ |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ආණ්ඩුකරණය |
| අංශය | අධිකරණ |
| ආයතනය | අමාත්‍ය මණ්ඩලය |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *රජය වෙනුවෙන් නඩු කටයුතු මෙහෙයවීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවෙන් පරිබාහිරව පළාත්බද රජයේ ප්‍රධාන අභිචෝදක කාර්යාල (Directorate of Public Prosecution) පිහිටුවීම (පිටුව 203)* |
| ක්‍රියාව | අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යංශය ස්වාධීන අභිචෝදක කාර්යාලයක් පිහිටුවීමට සැලසුම් කර ඇත.<br>රාජ්‍ය අභිචෝදක කාර්යාලය පිහිටුවීම සඳහා විද්වත් කමිටුවක් පිහිටුවීමට 2025 මැයි 07 දින කැබිනට් අනුමැතිය ලබාදෙන ලදී. |
| ඉටුවීම | මුලපුරා ඇත |

| | |
|---|---|
| නිරීක්ෂණය | මෙම පියවර රටෙහි පවතින ප්‍රතිසංස්කරණ ප්‍රයත්නයන් සනිටුහන් කරන අතර, තවමත් එවැනි කාර්යාලයක විධිමත් ස්ථාපිත කිරීමක් අපේක්ෂාවෙන් සිටී. |
| මූලාශ්‍රය | https://tinyurl.com/2f5edbww<br>https://tinyurl.com/ypefzank |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ආණ්ඩුකරණය |
| අංශය | විධායකය |
| ආයතනය | විධායක ජනාධිපති |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *විශ්‍රාමික ජනාධිපතිවරුන්ට හා ඔවුන්ගේ කලත්‍රයන්ට දී ඇති විශ්‍රාම වැටුප්, විශේෂ දීමනා හා වරප්‍රසාද අහෝසි කිරීම (පිටුව 195)* |
| ක්‍රියාව | වාර්තා කිරීමේ කාල සීමාව තුළ ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. |
| ඉටුවීම | පොරොන්දුව ක්‍රියාත්මක කළ යුතුව ඇත. |
| නිරීක්ෂණය | හිටපු ජනාධිපතිවරුන්ට සහ ඔවුන්ගේ පවුල් වලට විශ්‍රාම වැටුප් සහ විශේෂ වරප්‍රසාද අහෝසි කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව විසින් යාවත්කාලීන කිරීම් අපේක්ෂාවෙන් සිටී. |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ආණ්ඩුකරණය |
| අංශය | විධායකය |
| ආයතනය | විධායක ජනාධිපති |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *විධයක ජනාධිපති ආණ්ඩුක්‍රමය අහෝසිකොට පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් ස්ථාපිත කිරීම හා විධායක බලතල රහිත ජනාධිපතිවරයෙක් පත් කිරීම (පිටුව 195)* |
| ක්‍රියාව | තවමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත |
| ඉටුවීම | පොරොන්දුව ක්‍රියාත්මක කළ යුතුව ඇත |
| නිරීක්ෂණය | ජාතික ජන බලවේගයේ සුනිල් හඳුන්නෙත්ති ප්‍රසිද්ධියේ අවධාරණය කර ඇත්තේ මෙය අවසාන විධායක ජනාධිපති ධූරය වනු ඇති බවයි. එහෙත්, අහෝසි කිරීම සඳහා විධිමත් කාලරාමුවක් ප්‍රකාශයට පත් කල යුතුව ඇත. |
| මූලාශ්‍රය | https://sinhala.asianmirror.lk/news/political/anura-23/<br>https://economynext.com/akd-sri-lankas-last-executive-president-says-party-spokesman-180780/ |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ආණ්ඩුකරණය |
| අංශය | විධායකය |
| ආයතනය | අමාත්‍යාංශ |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *අමාත්‍යවරුන්ට/නියෝජ්‍ය අමාත්‍යවරුන්ට ධූර කාලය තුළදී එක් වාහනයක් පමණක් ලබාදීම (පිටුව 195)* |
| ක්‍රියාව | ක්‍රියාමාර්ගයක් අපේක්ෂා කෙරේ |
| ඉටුවීම | ක්‍රියාමාර්ගය පිළිබඳව පැහැදිලි කිරීමක් අවශ්‍ය වේ. |
| නිරීක්ෂණය | අමාත්‍යවරයෙකුට හෝ නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට එක් වාහනයක් පමණක් වෙන් කිරීම සඳහා වූ පොරොන්දුව පිළිබඳව තවදුරටත් සත්‍යාපනය කිරීම අවශ්‍ය වේ. |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ආණ්ඩුකරණය |
| අංශය | විධායකය |
| ආයතනය | විධායක ජනාධිපති |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *2019.04.21 වන පාස්කු ඉරුදින සිදුවූ ප්‍රහාරය සම්බන්ධව ජනාධිපති කොමිෂන් සභා නිර්දේශ වලට අනුව අදාළ දේශපාලනඥයන් සහ නිලධාරීන්ට කඩිනමින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම (පිටුව 207)* |
| ක්‍රියාව | පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව ජනාධිපති නියෝගයෙන් අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවට භාර දී ඇත. |
| ඉටුවීම | ක්‍රියාමාර්ගය පිළිබඳව පැහැදිලි කිරීමක් අවශ්‍ය වේ |
| නිරීක්ෂණය | මීට පෙර පැවති ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාව ඉදිරිපත් කර ඇති අතර, වැඩිදුර විමර්ශන අපේක්ෂා කෙරේ. |
| මූලාශය | https://shorturl.at/T3GY |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ආණ්ඩුකරණය |
| අංශය | අධිකරණ |
| ආයතනය | පාර්ලිමේන්තුව |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *දූෂණය සහ මූල්‍ය අපරාධ මැඩලීමේ නීති සහ අනෙකුත් ව්‍යුහයන් ශක්තිමත් කිරීම සහ විධිමත් කිරීම (පිටුව 227)* |
| ක්‍රියාව | *2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත* 2025 අප්‍රේල් 30 වන දින පාර්ලිමේන්තුවේදී සහතික කරන ලදී. |
| ඉටුවීම | මුලපුරා ඇත |
| නිරීක්ෂණය | දූෂණය වැළැක්වීම සහ නීතියේ ආධිපත්‍යය ඉහළ නැංවීම සඳහා මෙම පනත මඟින් නීතිය ශක්තිමත් කර ඇත. |
| මූලාශ්‍රය | https://www.parliament.lk/uploads/acts/gbills/sinhala/6378.pdf |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ආර්ථිකය |
| අංශය | බදු |
| ආයතනය | පාර්ලිමේන්තුව |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *බදු පරිපාලනය කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය නීති ප්‍රතිසංස්කරණ සිදු කිරීම (පිටුව 103)* |
| ක්‍රියාව | 2025 අංක 4 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කිරීමටත්, ඉන් පසුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් 2025 පෙබරවාරි 19 වන දින කැබිනට් අනුමැතිය ලබාදෙන ලදී.<br>2025 අංක 4 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත 2025 අප්‍රේල් 11 වන දින පාර්ලිමේන්තුවේදී සහතික කරන ලදී. |
| ඉටුවීම | පොරොන්දුව ක්‍රියාත්මක කර ඇත |
| නිරීක්ෂණය | මෙම නෛතික ප්‍රතිසංස්කරණය හරහා බදු පරිපාලනය සඳහා විද්‍යුත් කරළියක් (Electronic platform) හඳුන්වා දීම |
| මූලාශ්‍රය | https://www.parliament.lk/uploads/acts/gbills/sinhala/6380.pdf |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ආර්ථිකය |
| අංශය | බදු |
| ආයතනය | පාර්ලිමේන්තුව |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *උපයන විට බද්ද සංශෝධනය (පිටුව 73)*<br>*පුද්ගලයින් සඳහා වන වාර්ෂික බදු නිදහස් සීමාව රුපියල් ලක්ෂ 12 සිට ලක්ෂ 24 දක්වා වැඩි කිරීමට සහ බදු කාණ්ඩ (Tax Brackets) හා බදු අනුපාත (Tax Rates) සාධාරණ ලෙස සංශෝධනය කිරීම (පිටුව 104)* |
| ක්‍රියාව | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර, ඉන් පසුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට 2025 පෙබරවාරි 19 වන දින කැබිනට් අනුමැතිය ලබාදෙන ලදී.<br>2025 අංක 2 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත 2025 මාර්තු 20 වන දින පාර්ලිමේන්තුවේදී සහතික කරන ලදී. |
| ඉටුවීම | පොරොන්දුව අර්ධ වශයෙන් ක්‍රියාත්මක කර ඇත |
| නිරීක්ෂණය | 2025 අංක 2 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යටතේ බදු-නිදහස් සීමාව රුපියල් මිලියන 1.2 සිට රුපියල් මිලියන 1.8 දක්වා වැඩි කළද, එය පොරොන්දු වූ රුපියල් මිලියන 2.4 ට වඩා අඩුය |
| මූලාශ්‍රය | https://www.parliament.lk/uploads/acts/gbills/sinhala/6379.pdf |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ආණ්ඩුකරණය |
| අංශය | ප්‍රජාතන්ත්‍රවාදය |
| ආයතනය | පාර්ලිමේන්තුව |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *දැනට දින නියමක් නොමැතිව කල්තබා ඇති පළාත් සභා සහ පළාත් පාලන මැතිවරණ වසරක් ඇතුළත පවත්වා ජනතාවට පාලනයට සම්බන්ධ වීමට අවස්ථාව සැලැසීම (පිටුව 231)* |
| ක්‍රියාව | 2025 අංක 1 දරන පළාත් පාලන ආයතන මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත 2025 පෙබරවාරි 17 වන දින පාර්ලිමේන්තුවේදී සහතික කරන ලදී.<br>පළාත් පාලන මැතිවරණය 2025 මැයි මස පවත්වන ලදී. |
| ඉටුවීම | පොරොන්දුව අර්ධ වශයෙන් ක්‍රියාත්මක කර ඇත |
| නිරීක්ෂණය | පළාත් පාලන මැතිවරණ සාර්ථකව පවත්වා ඇති අතර, වසරක් ඇතුළත පළාත් සභා මැතිවරණ පැවැත්වීම සම්බන්ධයෙන් විධිමත් නිවේදනයක් තවමත් අපේක්ෂා කෙරේ. |
| මූලාශ්‍රය | https://www.parliament.lk/uploads/acts/gbills/sinhala/6376.pdf<br>https://results.elections.gov.lk/ |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ආර්ථිකය |
| අංශය | බලශක්තිය |
| ආයතනය | පාර්ලිමේන්තුව |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *ශ්‍රී ලංකාව කලාපයේ අවම විදුලි මිල සහිත රටක් බවට පත් කිරීම සඳහා තරගකාරී ප්‍රසම්පාදන හා මිල කැඳවීමේ ක්‍රියාවලිය සක්‍රීය කර, තෙල් මත පදනම් වූ විදුලි ජනනය අඩු මිලැති සූර්ය හා සුළං පුනර්ජනනීය ප්‍රභවයන් වෙත යොමු කිරීම (පිටුව 166)* |
| ක්‍රියාව | 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත අධ්‍යයනය කර සුදුසු සංශෝධන සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා විදුලිබල හා බලශක්ති අංශයේ ප්‍රධාන පාර්ශ්වකරුවන්, ප්‍රතිපත්ති විශේෂඥයින්ගෙන් සමන්විත කමිටුවක් පත් කිරීම සඳහා 2025 දෙසැම්බර් 30 වන දින කැබිනට් අනුමැතිය ලබාදෙන ලදී.<br>2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත සංශෝධනය කිරීම සඳහා වූ ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත<br>2025 මැයි 23 වන දින පළමු කියවීම සඳහා බලශක්ති අමාත්‍යවරයා විසින් පනත් කෙටුම්පත ඉදිරිපත් කරන ලදී |
| ඉටුවීම | මුලපුරා ඇත |
| නිරීක්ෂණය | මෙම සංශෝධන වසර 05 ක් ඇතුළත තරගකාරී ප්‍රසම්පාදන පිළිවෙත් (සූර්ය බලශක්තිය වැඩි කිරීම සහ ගෑස් අඩු කිරීම) මඟින් විදුලිය සඳහා අවම මිල ගණන් සහතික කළ යුතු ය. |
| මූලාශ්‍රය | https://www.parliament.lk/uploads/bills/gbills/sinhala/6385.pdf |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ආර්ථිකය |
| අංශය | ප්‍රවාහනය |
| ආයතනය | පාර්ලිමේන්තුව |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *ත්‍රීරෝද රථ සේවාව සහ කාර්ය මණ්ඩල, පාසැල් ළමුන් ප්‍රවාහනයද ඇතුළත් අනෙකුත් කුලී රථ සේවාවන් විධිමත් කර ගුණාත්මක සහ කාර්යක්ෂම සේවාවක් බවට පත්කිරීම (පිටුව 175)* |
| ක්‍රියාව | 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත 2025 ජූනි 19 දින සහතික කරන ලදී. |
| ඉටුවීම | පොරොන්දුව ක්‍රියාත්මක කර ඇත |
| නිරීක්ෂණය | කලින් අන්තර් පළාත් පෞද්ගලික බස් සේවා අධීක්ෂණය කිරීමට පමණක් සීමා වූ ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධිකාරිය, සඳහන් කර ඇති පරිදි, දැන් පාසල් වෑන් රථ, කාර්යාල වෑන් රථ සහ ත්‍රිරෝද රථ වැනි වාහන ද ආවරණය කරයි. |
| මූලාශ්‍රය | https://www.parliament.lk/uploads/bills/gbills/sinhala/6383.pdf<br>https://www.parliament.lk/uploads/acts/gbills/sinhala/6383.pdf |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ආර්ථිකය |
| අංශය | ඩිජිටල් රාජ්‍යය |
| ආයතනය | අමාත්‍ය මණ්ඩලය සහ පාර්ලිමේන්තුව |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *නවෝත්පාදන දිරිමත් කරන, බුද්ධිමය දේපළ අයිතිවාසිකම් ආරක්ෂා කරන, සහ දත්ත පෞද්ගලිකත්වය සහ ආරක්ෂාව සහතික කරන ආධාරක නියාමන රාමුවක් (පිටුව 155)* |
| ක්‍රියාව | 2017 වර්ෂයේදී ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා ස්මාර්ට් (සුහුරු) කාඩ්පත් භාවිතා කිරීම සඳහා, ජාත්‍යන්තර තරඟකාරී ලංසු තැබීමේ ක්‍රමය අනුගමනය කරමින්, පොලිකාබනේට් කාඩ්පත් මිලියන 15 ක් මිලදී ගැනීමට 2025 අප්‍රේල් 07 වන දින කැබිනට් තීරණයක් ගන්නා ලදී.<br>2022 අංක 09 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත සංශෝධනය කිරීම සඳහාවන පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත 2025 මැයි 08 වන දින ඩිජිටල් ආර්ථික අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලදී. |
| ඉටුවීම | මුලපුරා ඇත |
| නිරීක්ෂණය | විද්‍යුත් හැඳුනුම්පත් (E-NIC) නිකුත් කිරීම සඳහා රජයේ ක්‍රියාමාර්ගය පිළිබඳ කැබිනට් තීරණය, පුද්ගලික දත්ත බෙදාහදා ගැනීමේ දේශපාලන සන්දර්භය තුළ මෙම ක්‍රියාවලිය අධීක්ෂණයෙහි තීරණාත්මක කොටසක් වේ. |
| මූලාශ්‍රය | https://shorturl.at/ROdAV<br>https://www.parliament.lk/uploads/bills/gbills/sinhala/6384.pdf |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ආණ්ඩුකරණය |
| අංශය | අධිකරණ |
| ආයතනය | පාර්ලිමේන්තුව |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *රිමාන්ඩ් සිරකරුවන් ලෙස දීර්ඝකාලීනව රඳවා තැබීම වැළැක්වෙන පරිදි අපරාධ යුක්ති ක්‍රමයට සම්බන්ධ ආයතනවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම (පිටුව 210)* |
| ක්‍රියාව | 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත |
| ඉටුවීම | මුලපුරා ඇත |
| නිරීක්ෂණය | නීතිය අපරාධ යුක්ති ක්‍රමයේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කර, යුක්තිය ඇති කිරීම වේගවත් කිරීම අරමුණු කරගත් ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණයක් සිදු කරයි. |
| මූලාශ්‍රය | https://www.parliament.lk/uploads/bills/gbills/sinhala/6381.pdf<br>https://www.parliament.lk/uploads/acts/gbills/sinhala/6381.pdf |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ආණ්ඩුකරණය |
| අංශය | අධිකරණ |
| ආයතනය | අමාත්‍ය මණ්ඩලය සහ ජාතික අයවැය |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *කොළඹ නගරයේ මුඩුක්කු සහ පැල්පත් නිවාස වල ජීවත්වන ජනතාවට රාජ්‍ය මැදිහත්වීමෙන් සුදුසු නිවාස (පිටුව 32)* |
| ක්‍රියාව | අඩු ආදායම්ලාභීන් සඳහා වන චීන රජයේ ආධාර වැඩසටහන යටතේ නිවාස ඒකක 1,966 ක් ඉදි කිරීම (ජාතික අයවැය 2025) |
| ඉටුවීම | මුලපුරා ඇත |
| නිරීක්ෂණය | 2024 නොවැම්බර් 05 වැනිදා කැබිනට් තීරණයක් ගෙන 2025 ජාතික අයවැයෙන් (2025 සඳහා රුපියල් මිලියන 7000 ක්) මුදල් වෙන් කිරීම හරහා මෙම පොරොන්දුව ඉටු කිරීමට මුලපිරීමෙන්, වර්ධනයක් පෙන්නුම් කරයි. |
| මූලාශ්‍රය | https://shorturl.at/BdwVo<br>https://shorturl.at/5jonK |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රජා |
| අංශය | මාධ්‍ය |
| ආයතනය | අමාත්‍ය මණ්ඩලය සහ පාර්ලිමේන්තුව |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *ප්‍රකාශනයේ නිදහසට බාධා වන වගන්තීන් ඉවත්කොට 2024 අංක 09 දරන මාර්ග ගත ක්‍රම වල සුරක්ෂිතතාව පිළිබඳ පනත සංශෝධනය කිරීම (පිටුව 61)* |
| ක්‍රියාව | 2025 මැයි 08 වන දින පාර්ලිමේන්තු මන්ත්‍රී රවී කරුණානායක විසින් ඉදිරිපත් කරන ලද පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක්, 2024 අංක 09 දරන මාර්ගගත ආරක්ෂණ පනත අවලංගු කිරීම අරමුණු කරයි. එය, පනත සහ ඒ ආශ්‍රිත සියලුම රෙගුලාසි නීතිගත වූ දින සිට නිෂ්ප්‍රභ කිරීමට උත්සාහ දරයි. 2024 අංක 09 දරන මාර්ගගත ආරක්ෂණ පනතෙහි දැනටමත් හඳුනාගෙන ඇති සංශෝධන සහ මහජන අදහස් විමසීමෙන් පසුව හඳුනාගත යුතු ඒවා ද ඇතුළත් කිරීම මගින් පනත් කෙටුම්පත සංශෝධනය කිරීම සඳහා, ශ්‍රේෂ්ඨාධිකරණයේ ගරු විනිසුරුවරයෙකුගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් පත් කිරීම සඳහා 2025 මැයි 26 වන දින කැබිනට් අනුමැතිය ලබාදෙන ලදී. |
| ඉටුවීම | මුලපුරා ඇත |
| නිරීක්ෂණය | විපක්ෂයේ මන්ත්‍රීවරයා පනත අවලංගු කිරීම සඳහා පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළේය.<br>සඳහන් කළ පරිදි, පනත සංශෝධනය කිරීමට රජය කැබිනට් මණ්ඩලයට යෝජනා කළේය.<br>රජයේ සහ පාර්ලිමේන්තු ක්‍රියාමාර්ග අපේක්ෂාවෙන් සිටී. |
| මූලාශ්‍රය | https://www.parliament.lk/uploads/acts/gbills/sinhala/6311.pdf<br>https://shorturl.at/d7gen |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රජා |
| අංශය | මාධ්‍ය |
| ආයතනය | අමාත්‍ය මණ්ඩලය |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *සමස්ත ජනමාධ්‍ය ක්‍රියාවලිය ප්‍රශස්ත ලෙස පවත්වා ගෙන යාම සඳහා ස්වාධීන ජනමාධ්‍ය කොමිෂන් සභාවක් (පිටුව 62)* |
| ක්‍රියාව | එකී පනත් කෙටුම්පත සූදානම් කිරීම අවසානයකට ගෙන ඒම සඳහා වත්මන් රජයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබාදීමට ශ්‍රී ලංකා මාධ්‍ය වෘත්තිකයන්ගේ වරලත් ආයතනය පිහිටුවීම සඳහා වූ පනත් කෙටුම්පතකට 2025 අප්‍රේල් 07 වන දින කැබිනට් අනුමැතිය ලබාදෙන ලදී. |
| ඉටුවීම | ක්‍රියාව පිළිබඳව පැහැදිලි කිරීමක් අවශ්‍ය වේ |
| නිරීක්ෂණය | නියාමනය සහ වගවීම කෙරෙහි අවධානය යොමු කරමින් පුවත්පත් කලාව අධීක්ෂණය කිරීම සඳහා ස්වාධීන මාධ්‍ය කොමිසමක් අවශ්‍ය බව ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කරයි. නමුත් මාධ්‍ය වෘත්තිකයන්ගේ වරලත් ආයතනය යනු, මාධ්‍ය වෘත්තිකයන් හඳුනා ගැනීම සහ ප්‍රමිතිකරණය කිරීම අරමුණු කරගත් වෘත්තීය ආයතනයකි. |
| මූලාශ්‍රය | https://shorturl.at/Z9OJu |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | සමාජ |
| අංශය | සමාජ ආරක්ෂණය |
| ආයතනය | අමාත්‍ය මණ්ඩලය සහ ජාතික අයවැය |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු සඳහා සාමාන්‍ය බැංකු පොලී අනුපාතයට වඩා 5%ක වැඩි පොලී ප්‍රතිශතයක් (පිටුව* 67*)* |
| ක්‍රියාව | ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා විශේෂ ස්ථාවර තැන්පතු යෝජනා ක්‍රමය (වාර්තා කිරීමේ කාල සීමාවෙන් ඔබ්බට) ක්‍රියාත්මක කිරීම සඳහා 2025 ජූලි 16 වන දින කැබිනට් අනුමැතිය ලබාදෙන ලදී.<br>2025 ජාතික අයවැය මගින් 2025 දී අවසන් කිරීමට නියමිත මූල්‍ය සුරක්ෂිතතාවය ඉහළ නැංවීම සඳහා ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා විශේෂ පොලී යෝජනා ක්‍රමයක් වෙනුවෙන් රුපියල් මිලියන 25000 ක් වෙන් කරන ලදී. |
| ඉටුවීම | මුලපුරා ඇත |
| නිරීක්ෂණය | කෙසේ වෙතත්, ප්‍රතිපත්ති ප්‍රකාශය මගින් සාමාන්‍ය බැංකු අනුපාත වලට වඩා 5% ක ප්‍රසාද පොලියක් පොරොන්දු වූ නමුත්, 2025 ජාතික අයවැය හරහා පොරොන්දු වූයේ 3% ක අනුපාතයක් පමණි. |
| මූලාශ්‍රය | https://www.news19.lk/a-special-interest-scheme-for-senior-citizens/<br>https://shorturl.at/r98w9 |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | සමාජ |
| අංශය | සමාජ ආරක්ෂණය |
| ආයතනය | අමාත්‍ය මණ්ඩලය |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *රාජ්‍ය සේවයේ වැටුප් විෂමතා අවම කරන හා සේවකයා දිරිගන්වන ජාතික වැටුප් ව්‍යුහයක්* (*පිටුව* 72) |
| ක්‍රියාව | 2016 අංක 03 දරන කම්කරු ජාතික අවම වැටුප් පනත සංශෝධනය කිරීම සඳහා 2025 අප්‍රේල් 07 වැනි දින කැබිනට් අනුමැතිය ලබාදෙන ලදී. 2025 අංක 11 දරන කම්කරු ජාතික අවම වැටුප් (සංශෝධන) පනත (වාර්තාකරණ කාල සීමාවෙන් ඔබ්බට) 2025 ජූලි 23 දින සහතික කරන ලදී. |
| ඉටුවීම | මුලපුරා ඇත |
| නිරීක්ෂණය | සේවකයින්ගේ මාසික අවම වැටුප සහ දෛනික වැටුප සැලකිය යුතු ලෙස වැඩි දියුණු කිරීම |
| මූලාශ්‍රය | https://shorturl.at/kWMLv<br>https://documents.gov.lk/view/acts/2025/7/11-2025_E.pdf |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | සමාජ |
| අංශය | ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාවය |
| ආයතනය | ජාතික අයවැය |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *ආර්තව දරිද්‍රතාව* (Period Poverty) *අවසන් කිරීම වෙනුවෙන් අවශ්‍ය බදු සහන, මූල්‍ය සහ අනෙකුත් පහසුකම් ලබාදීම (පිටුව 78)* |
| ක්‍රියාව | පාසල් සිසුවියන් 80,000 කට සනීපාරක්ෂක තුවා සපයා දීම සඳහා රුපියල් මිලියන 1440 ක් ජාතික අයවැයෙන් වෙන් කරන ලදී. |
| ඉටුවීම | මුලපුරා ඇත |
| නිරීක්ෂණය | 2025 වසර තුළ ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 1440 ක් වෙන් කර ඇත. |
| මූලාශ්‍රය | https://sinhala.news.lk/news/features/2025-7<br>https://www.dgi.gov.lk/media/attachments/2025/02/17/budget-speech-2025-final.pdf |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ආර්ථිකය |
| අංශය | ව්‍යවසායකත්වය |
| ආයතනය | අමාත්‍ය මණ්ඩලය සහ ජාතික අයවැය |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *කුඩා පරිමාණයේ ගොවියන්, නිෂ්පාදකයින්, ව්‍යවසායකයින් සහ ආයෝජකයින් සඳහා මූල්‍ය පහසුකම් සැපයීමට සමුපකාර, සමෘද්ධි හා ප්‍රාදේශීය සංවර්ධන බැංකු කාර්යක්ෂම ලෙස මෙහෙයවීම (පිටුව 105)* |
| ක්‍රියාව | "නව විස්තීර්ණ ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය - සරුසාර" පොලී සහනාධාර යෝජනා ක්‍රමය 2025 වර්ෂයේ සිට වාර්ෂික වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා 2025 ජනවාරි 27 වැනි දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදුන් අතර, 2025 ජාතික අයවැයෙන් අරමුදල් (රුපියල් මිලියන 5,503) වෙන් කරන ලදී. |
| ඉටුවීම | මුලපුරා ඇත |
| නිරීක්ෂණය | එය කලාපීය සංවර්ධන යාන්ත්‍රණ හරහා කුඩා පාරිමාණ ගොවීන්ට මූල්‍ය ආධාර ක්‍රියාත්මක කරයි. |
| මූලාශ්‍රය | https://shorturl.at/Ilmn9<br>https://www.treasury.gov.lk/api/file/dd36b446-29b2-40eb-8f6d-a16b9def60b9 |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ආර්ථිකය |
| අංශය | ඩිජිටල් රාජ්‍යය |
| ආයතනය | අමාත්‍යාංශ |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *ඩිජිටල්කරණය, කාර්ය සාධන කළමනාකරණය, සහ පුරවැසි නියැලීම යන සංකල්පයන් සැලකිල්ලට ගනිමින් වත්මන් රාජ්‍ය කළමනාකරණය නව රාජ්‍ය කළමනාකරණ ක්‍රම දක්වා පරිවර්තනය කිරීම (පිටුව 198)* |
| ක්‍රියාව | ශ්‍රී ලංකා මහ බැංකුව - නව සේවක අර්ථසාධක අරමුදල් කළමනාකරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා පද්ධති ඒකාබද්ධ කරන්නෙකු තෝරා ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමට 2025 පෙබරවාරි 09 වන දින කැබිනට් අනුමැතිය ලබාදෙන ලදී. |
| ඉටුවීම | මුලපුරා ඇත |
| නිරීක්ෂණය | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා කැඳවා ඇති අතර, උපදේශන සේවාව සඳහා වන කාර්යය ලැයිස්තුව ප්‍රකාශයට පත් කර ඇත. |
| මූලාශ්‍රය | https://shorturl.at/jZHgU<br>https://www.cbsl.gov.lk/en/consultancy-services-epf-tor<br>https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_ documents/TOR%20Final%2020190731%20.pdf |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ආණ්ඩුකරණය |
| අංශය | රාජ්‍ය සේවය |
| ආයතනය | විධායක ජනාධිපති |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *රාජ්‍ය සම්පත් භාවිතයේදී සිදුවන නාස්තිය නැති කිරීම සඳහා රාජ්‍ය ආයතනයන් දිරිගන්වමින් ඒවා මැනීම සඳහා දර්ශක හඳුන්වාදීම (පිටුව 199)* |
| ක්‍රියාව | ජනාධිපති කාර්යාලයේ සුඛෝපභෝගී වාහන ක්‍රියාමාර්ගයේ පළමු අදියර 2025 මාර්තු 02 වැනිදා ආරම්භ විය. දෙවැනි අදියර 2025 අප්‍රේල් 23 වැනිදා සිට ආරම්භ විය. |
| ඉටුවීම | මුලපුරා ඇත |
| නිරීක්ෂණය | ඉහළ ධාරිතාවයකින් යුත් එන්ජිමක් සහිත තෝරාගත් සුඛෝපභෝගී වාහන වෙන්දේසි කර, උපයන ලද ආදායම පිළිබඳ වාර්තාවක් 2025 මාර්තු 01 දිනට පෙර මුදල් අමාත්‍යාංශයට ලබාදෙන ලෙස රජය රාජ්‍ය ආයතන වලට උපදෙස් දී ඇත. |
| මූලාශ්‍රය | https://shorturl.at/LW85G |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ආණ්ඩුකරණය |
| අංශය | දූෂණ-විරෝධය |
| ආයතනය | පාර්ලිමේන්තුව |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *දූෂණ විරෝධී කොමිසම වෙත ලැබෙන පැමිණිලි මාස හයක් ඇතුළත විමර්ශනය කිරීම හෝ එසේ නොකරන ලද පැමිණිලි පිළිබඳ වාර්තාවක් සෑම මාස හයකට වරක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම (පිටුව 202)* |
| ක්‍රියාව | තවමත් ක්‍රියාමාර්ගයක් නොමැත |
| ඉටුවීම | පොරොන්දුව පිළිබඳ පැහැදිලි කිරීමක් අවශ්‍ය වේ |
| නිරීක්ෂණය | ලැබුණු පැමිණිලි සහ ගත් ක්‍රියාමාර්ග පිළිබඳව පාර්ලිමේන්තුවට මාස හයකට වරක් යාවත්කාලීන කිරීම් නිකුත් කිරීමට රජයෙන් අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, යාවත්කාලීන කිරීම් තවමත් අපේක්ෂා කෙරේ. |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ආණ්ඩුකරණය |
| අංශය | විශ්වීය පුරවැසියා |
| ආයතනය | ජනාධිපති ලේකම් කාර්යාලය |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *සියලු පුරවැසියනට තම භාෂාවෙන් සේවා ලබා ගැනීමට හැකි වන පරිදි ජාතික භාෂා ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම (පිටුව 232)* |
| ක්‍රියාව | රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය වන “Clean Sri Lanka” වැඩසටහන පළාත් පාලන මට්ටමින් ක්‍රියාත්මක කිරීම ලෙස. |
| ඉටුවීම | තවමත් ක්‍රියාමාර්ගයක් නොමැත |
| නිරීක්ෂණය | උඩරට ප්‍රදේශවල "Clean Sri Lanka" ව්‍යාපෘති වල සංඥා පුවරු සිංහලෙන් පමණක් යෙදීම සම්බන්ධව පැමිණිලි ලැබන බව නිරීක්ෂණය වේ. එයින් අදහස් වන්නේ ජාතික භාෂා ප්‍රතිපත්තිය පොරොන්දු වූ පරිදි ක්‍රියාත්මක නොවන බවයි. |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ආණ්ඩුකරණය |
| අංශය | විශ්වීය පුරවැසියා |
| ආයතනය | අමාත්‍යාංශ |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *කඳුකර දෙමළ ප්‍රජාවගේ වැටුප් ජීවන වියදමට සරිලනසේ ඉහළ දැමීම (පිටුව 232)* |
| ක්‍රියාව | 2016 අංක 03 දරන කම්කරු ජාතික අවම වැටුප් පනත සංශෝධනය කිරීම සඳහා 2025 අප්‍රේල් 07 වන දින කැබිනට් අනුමැතිය ලබාදෙන ලදී. 2025 අංක 11 දරන කම්කරු ජාතික අවම වැටුප් (සංශෝධන) පනත 2025 ජූලි 23 දින සහතික කරන ලදී (වාර්තා කිරීමේ කාල සීමාවෙන් ඔබ්බට) රාජ්‍ය සහ පෞද්ගලික අංශ සඳහා අවම වැටුප් නීතියෙන් සකසා ඇත. |
| ඉටුවීම | තවමත් ක්‍රියාමාර්ගයක් නොමැත |
| නිරීක්ෂණය | උඩරට වතු කම්කරුවන් තවමත් කිසිදු නිශ්චිත වැටුප් වැඩිවීමකින් ප්‍රතිලාභ ලබා නොමැත. |
| මූලාශ්‍රය | https://shorturl.at/sHe5A<br>https://www.parliament.lk/uploads/acts/gbills/sinhala/6388.pdf |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රජාව |
| අංශය | අධ්‍යාපනය |
| ආයතනය | ජාතික අයවැය |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *ශිෂ්‍යාධාර සහ මහපොළ ජීවන වියදමට සරිලන ලෙස ඉහළ දැමීම (පිටුව 19)* |
| ක්‍රියාව | 2025 ජාතික අයවැයෙන් විශ්වවිද්‍යාල සිසුන් 103,000 ක් පමණ සඳහා මහපොළ සහ ශිෂ්‍යාධාර කාලෝචිතව ගෙවීම සඳහා රුපියල් මිලියන 4600 ක් වෙන් කර ඇත. |
| ඉටුවීම | මුලපුරා ඇත |
| නිරීක්ෂණය | ජීවන වියදමට අනුකූලව රාජ්‍ය හා පෞද්ගලික අංශයට වේතන හා වැටුප් නීතියෙන් වැඩි කර ඇති බැවින්, ජීවන වියදමට අනුකූලව මහපොළ සහ අනෙකුත් ශිෂ්‍යාධාර රුපියල් 5,000 සිට රුපියල් 7,500 දක්වා සහ මාසික ශිෂ්‍යාධාර රුපියල් 4,000 සිට රුපියල් 6,500 දක්වා වැඩි කිරීම සුදුසු වේ. |
| මූලාශ්‍රය | https://www.treasury.gov.lk/api/file/b4e706a0-7e3d-45c2-834b-eef840175553<br>https://mawbima.lk/2025/02/17/mahapola-scholarship-increased-by-rs-2500/ |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ආණ්ඩුකරණය |
| අංශය | රාජ්‍ය සේවය |
| ආයතනය | අමාත්‍ය මණ්ඩලය |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *බිම් මට්ටමේ සිට හඳුනාගත් සමාජ සහ ආර්ථික ගැටලු හා අවශ්‍යතාවයන්, ජාතික සංවර්ධන වැඩපිළිවෙළ මත පදනම්ව ආමන්ත්‍රණය කිරීමට අවශ්‍ය යාන්ත්‍රණයක් සැකසීම (පිටුව 198)* |
| ක්‍රියාව | විදේශ ගමන් බලපත්‍ර මුද්‍රණය කඩිනම් කිරීම සඳහා අවශ්‍ය අතිරේක කාර්ය මණ්ඩලය සැපයීමට (විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ වත්මන් ප්‍රමාදය ඉවත් කිරීම සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව පැය 24 පුරාම ක්‍රියාත්මක කිරීමෙන් දිනකට විදේශ ගමන් බලපත්‍ර 4,000 ක් නිකුත් කිරීමට), රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව, එම දෙපාර්තමේන්තුවේ සේවය කර ඇති විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදවීමට සහ දැනට රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අනුයුක්ත කිරීමට 2025 පෙබරවාරි 03 වන දින කැබිනට් අනුමැතිය ලබාදෙන ලදී.<br>ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ විදේශ ගමන් බලපත්‍ර මුද්‍රණය කිරීම පැය 24 පුරාම කඩිනම් කිරීම සඳහා අවශ්‍ය කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමික නිලධාරීන් බඳවා ගැනීම සඳහා 2025 පෙබරවාරි 10 වන දින අයදුම්පත් කැඳවනු ලබයි. |
| ඉටුවීම | මුල පුරා ඇත |
| නිරීක්ෂණය | මෙය කාර්යක්ෂම ආකාරයකින් විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රමාදය ඉවත් කිරීම සඳහා වන අතර, එය බිම් මට්ටමේ ගැටලුවක් විසඳීම සඳහා ප්‍රතිපත්ති ප්‍රකාශනය ලබාගත් ජයග්‍රහණයකි. |
| මූලාශ්‍රය | https://shorturl.at/uKttj<br>https://www.immigration.gov.lk/newsdetails_e.php?nid=110 |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ආණ්ඩුකරණය |
| අංශය | විශ්වීය පුරවැසියා |
| ආයතනය | අමාත්‍ය මණ්ඩලය |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *ප්‍රතිත්‍රස්ත පනත ඇතුළු සියලු මර්දනකාරී අණපනත් අහෝසි කර සියලු ජනතාවගේ නිදහස සහතික කිරීම (පිටුව 232)* |
| ක්‍රියාව | නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරන ලද අවසන් කෙටුම්පත තවදුරටත් අධ්‍යයනය කර, ත්‍රස්තවාදය මැඩපැවැත්වීම සඳහා පුළුල් නීති සම්පාදනයක් හඳුන්වාදීම සඳහාවන පනත් කෙටුම්පත තවදුරටත් වැඩි දියුණු කිරීම සඳහා සුදුසු යෝජනා ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් පත් කිරීමට 2025 පෙබරවාරි 19 වන දින කැබිනට් අනුමැතිය ලබාදෙන ලදී. |
| ඉටුවීම | පොරොන්දුව පිළිබඳ පැහැදිලි කිරීමක් අවශ්‍ය වේ |
| නිරීක්ෂණය | ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරන බවට පොරොන්දුවක් දී තිබුණද, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත් කෙටුම්පතට සංශෝධන ගෙන ඒම සඳහා කැබිනට් මණ්ඩලය කටයුතු ආරම්භ කර ඇත. |
| මූලාශ්‍රය | https://shorturl.at/Arhh8 |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ආර්ථිකය |
| අංශය | කර්මාන්ත |
| ආයතනය | ජාතික අයවැය |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *හඳුනාගත් විභවයන්ට අනුකූලව නව කාර්මික කලාප බිහිකරන අතර, මෙම කලාප වල නවෝත්පාදන සහ කාර්මික විවිධාංගීකරණයට අනුබල දීම (පිටුව 152)* |
| ක්‍රියාව | නව ආර්ථික කලාප (උතුරු, නැගෙනහිර සහ දකුණු) - 2025-2030 ප්‍රවේශ මාර්ග ඉදිකිරීම, ජල සැපයුම සහ විදුලිබල සැපයුම ඇතුළු මූලික යටිතල පහසුකම් සැපයීම සඳහා මුදල්, සැලසුම් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ප්‍රතිපත්ති ප්‍රකාශන කාල සීමාව සඳහා රුපියල් මිලියන 100 ක් වෙන් කර ඇත. |
| ඉටුවීම | මුලපුරා ඇත |
| නිරීක්ෂණය | උතුරු හා නැගෙනහිර ප්‍රදේශ සිවිල් යුද්ධයෙන් පීඩාවට පත් වූ බැවින්, යෝජිත ආර්ථික කලාපය ජනතාවගේ ජීවනෝපායට සහාය වනු ඇත. |
| මූලාශ්‍රය | https://www.treasury.gov.lk/api/file/dd36b446-29b2-40eb-8f6d-a16b9def60b9 |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ආර්ථිකය |
| අංශය | නිවාස |
| ආයතනය | ජාතික අයවැය |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *සහන සහ රැකවරණය අවශ්‍ය යුද - වැන්දඹුවන්, අනාථ පුද්ගලයින්, ආබාධ සහිත ප්‍රජාව හා මානසික පීඩනයට ලක් වූවන් සඳහා සහන සැලසීම (පිටුව 232)* |
| ක්‍රියාව | ගැටුම් වලින් පීඩාවට පත් පවුල් සඳහා නැවත පදිංචි කිරීමේ/ස්ථිර නිවාස ව්‍යාපෘතිය 2010 සිට අඛණ්ඩව ක්‍රියාත්මක වන අතර, 2025 ජාතික අයවැය මගින් නාගරික සංවර්ධන ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය යටතේ 2027 දක්වා රුපියල් මිලියන 3500 ක් වෙන් කර ඇත. |
| ඉටුවීම | මුලපුරා ඇත |
| නිරීක්ෂණය | උතුරු නැගෙනහිර ප්‍රදේශ සිවිල් යුද්ධයෙන් පීඩාවට පත්වූ බැවින්, යෝජිත නැවත පදිංචි කිරීමේ/නිවාස යෝජනා ක්‍රමය මගින් ජනතාවගේ ජීවිත යළි ලබාගැනීම සඳහා, ඔවුන්ගේ මූලික අවශ්‍යතා සපුරාලීමට සහය විය හැකිය. |
| මූලාශ්‍රය | https://www.treasury.gov.lk/api/file/dd36b446-29b2-40eb-8f6d-a16b9def60b9 |

| | |
|---|---|
| ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | සමාජ |
| අංශය | සමාජ ආරක්ෂණය |
| ආයතනය | ජාතික අයවැය |
| ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව | *දැනට අස්වැසුම ප්‍රතිලාභ ලබන අඩු ආදායම්ලාභී පවුල් සඳහා මසකට අවම වටිනාකම රුපියල් 10,000 ක සහනාධාර මුදලක් (පිටුව 66)* |
| ක්‍රියාව | දිළිඳු සහ අතිශය දිළිඳු කාණ්ඩ සඳහා දැනට ලබාදෙන මාසික ප්‍රතිලාභ දීමනාව, පිළිවෙලින්, රුපියල් 8,500/- සිට රුපියල් 10,000/- දක්වා සහ රුපියල් 15,000/- සිට රුපියල් 17,500/- දක්වා වැඩි කිරීමට සහ අස්වැසුම සුභසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද දින සිට, ඒ අනුව සංශෝධනය කරන ලද එම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට 2024 දෙසැම්බර් 02 වන දින කැබිනට් අනුමැතිය ලබාදෙන ලදී. මුදල්, සැලසුම් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ අස්වැසුම ප්‍රතිලාභීන් (පළමු කාර්තුවේ පවුල් මිලියන 2.05 ක් සහ දෙවන කාර්තුවේ සිට අඛණ්ඩව පවුල් මිලියන 1.8 ක්) සඳහා මුදල් ප්‍රදාන ලබාදීම සඳහා 2025 වසර වෙනුවෙන් 2025 ජාතික අයවැයෙන් රුපියල් මිලියන 160,156 ක් වෙන්කර ඇත. |
| ඉටුවීම | පොරොන්දුව ක්‍රියාත්මක කර ඇත |
| නිරීක්ෂණය | පොරොන්දු වූ පරිදි, ඉතා දුප්පත් කාණ්ඩයට අවම වශයෙන් රුපියල් 17,500 ක් සහ දුප්පත් කාණ්ඩයට අවම වශයෙන් රුපියල් 15,000 ක් ලබාදෙනු ඇත. |
| මූලාශ්‍රය | https://shorturl.at/Dqy7S<br>https://www.treasury.gov.lk/api/file/dd36b446-29b2-40eb-8f6d-a16b9def60b9 |

# 9. සාරාංශය සහ ඉදිරි ගමන් මග

මෙම අර්ධ-වාර්ෂික වාර්තාව, රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය සහ විධායක තීරණ, කැබිනට් තීරණ, පාර්ලිමේන්තු ක්‍රියාමාර්ග සහ 2025 ජාතික අයවැය හරහා රජයේ ක්‍රියාමාර්ග අතර සුසංගත වීමේ මිශ්‍ර රටාවක් අවධාරණය කරයි. රජයේ ක්‍රියාමාර්ගවලින් කොටසක්, පැහැදිලි සහ සෘජු අනුකූලතාවක් පෙන්නුම් කරන අතර, සැළකිය යුතු කොටසක් එහි ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව අර්ධ අනුකූලතාවක් පමණක් හෝ කිසිදු අනුකූලතාවක් නොමැති බව පිළිබිඹු වේ.

පහත සඳහන් පරිදි, ක්‍රියාත්මක කිරීමේ අපැහැදිලිතා සමග, පැහැදිලි බවින් තොරව, ක්‍රියාකාරකම් සඳහන් කර ඇති අතර, වචන ගැළපුම සහ තොරතුරුවල නොගැළපීම් වැනි තාක්ෂණික දෝෂ කිහිපයක් නිරීක්ෂණය කරන ලදී:

- ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පූර්විකාවේ, අධ්‍යාපන අංශය යටතේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ අ.පො.ස. උසස් පෙළ විෂය තත්ත්වය විශ්ලේෂණය කර ඇත. නමුත් ක්‍රියාකාරකම් වල J.S.E, S.S.E (කණිෂ්ඨ ද්විතීයික) (පහළ) සහ S.S.E (ජ්‍යෙෂ්ඨ ද්විතීයික) (උසස්) ලෙස සඳහන් කර ඇත. එහිදී,පාසල් අධ්‍යාපනය 6 සිට 9 වසර දක්වා කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය (J.S.E ), 10 වසරේ සිට 11 වසර දක්වා ජ්‍යෙෂ්ඨ ද්විතීයික (පහළ) අධ්‍යාපනය (S.S.E ), සහ 12 සිට 13 වසර දක්වා ජ්‍යෙෂ්ඨ ද්විතීයික (උසස්) අධ්‍යාපනය (පිටුව 15) ලෙස කාණ්ඩ තුනකට බෙදා ඇත. මෑතකාලීනව, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදුවෙමින් පවතින බැවින්, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කර ඇති පරිදි අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ අ.පො.උසස් පෙළ J.S.E සහ S.S.E ලෙස පරිවර්තනය කිරීමේ කිසියම් අභිප්‍රායක් ඇති බව **සත්‍යාපනය කර ගැනීම අවශ්‍ය වේ.**

- ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කර ඇති පරිදි, අඩු ආදායම්ලාභීන් සඳහා 'ප්‍රජා ශක්ති' දරිද්‍රතාවය පිටුදැකීමේ වැඩසටහන (පිටුව 66) අනුව, නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූලව ''**සමෘද්ධිමත් රටක් - සුරක්ෂිත ජීවිතයක්**'' යන දැක්ම සාක්ෂාත් කර ගැනීමට හැකිවන පරිදි, බහුවිධ ප්‍රවේශයක් සහිත ඒකාබද්ධ වැඩසටහනක් ලෙස 'ප්‍රජා ශක්ති' වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කැබිනට් අනුමැතිය ලබා දී ඇත. ''**පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්**'' යන ප්‍රතිපත්ති ප්‍රකාශනයට අමතරව, කැබිනට් තීරණයේ ඉහත සඳහන් කළ පරිදි විශේෂ දැක්මක් තිබේ ද යන්න **සත්‍යාපනය කර ගැනීම අවශ්‍ය වේ**.

පවතින ආකූලතා වර්ග සළකා බලන අතරම, මෙම වාර්තාව එහි විශ්ලේෂණය හරහා පහත සඳහන් කරුණු සාරාංශගත කිරීමට අදහස් කරයි:

- 2024-2029 කාලය සඳහා ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති මුළු ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දු **1333** කි.
- රජයේ මුල් මාස හය තුළ ගනු ලැබූ කැබිනට් තීරණ 216 හරහා මුලපුරන ලද ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දු **239** කි. මෙම විශ්ලේෂණය රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීමේ ප්‍රවණතාවය පෙන්නුම් කිරීම සඳහා ය.
- ජාතික ජන බලවේගය රජයේ මුල් මාස හය තුළ විධායක ජනාධිපතිවරයා හරහා මුලපුරන ලද ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දු **09** කි.
- රජයේ මුල් මාස හය තුළ සහ මෙම වාර්තා කරන කාලයෙන් ඔබ්බට නීති සම්පාදනයෙන්/සංශෝධනය කිරීමෙන් පාර්ලිමේන්තු ක්‍රියාමාර්ග හරහා ආරම්භ කරන ලද ප්‍රතිපත්ති ප්‍රකාශ පොරොන්දු **08** කි.
- රජයේ මුල් මාස හය තුළ කැබිනට් තීරණ සහ 2025 ජාතික අයවැය හරහා මුලපුරන ලද ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දු **25** කි.
- 2025 ජාතික අයවැය තුළ ජාතික අයවැය හරහා මුලපුරන ලද ප්‍රතිපත්ති ප්‍රකාශ පොරොන්දු **133** කි.

1969 අංක 1 දරන ආනයන අපනයන (පාලන) පනතේ විධිවිධාන යටතේ මෝටර් රථ ආනයනය සඳහා පනවා තිබූ තාවකාලික අත්හිටුවීම, පියවරෙන් පියවර ඉවත් කිරීමට අදාළ රෙගුලාසිවලට අනුමැතිය ලබාදීම වැනි කැබිනට් තීරණ කිහිපයක් තිබේ. මෝටර් වාහන ආනයනය සඳහා පනවා ඇති තාවකාලික අත්හිටුවීම ඉවත් කිරීම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුවලට අමරතව කාලෝචිත තීරණයකි.

විධායක ජනාධිපතිවරයාට, ඇමැතිවරුන්හට ලබාදෙන විදේශ ගමන් දීමනාවේ ඉතිරි මුදල ආපසු දෙන බව ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් නොවේ. පසුගිය කාලයේ විධායක ජනාධිපතිවරයා සහ ඇමැතිවරුන් කිහිප දෙනෙක් ස්වේච්ඡාවෙන් ගමන් දීමනා ආපසු ලබා දුන්නද, මෙය අගය කරන අතරම, මේ සම්බන්ධයෙන් රජයේ විධිමත් ප්‍රතිපත්තියක් තවමත් ප්‍රකාශයට පත්කර නොමැත.

රජය විසින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 දෙනා සඳහාම පුද්ගලික ආරක්ෂක නිලධාරීන් ඉවත් කරන ලද අතර, මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික නිවාසවල ආරක්ෂක ලාම්පු සඳහා බලශක්ති අමාත්‍යාංශය යටතේ 2025 ජාතික අයවැයෙන් රුපියල් මිලියන 4 ක් වෙන් කර ඇත. මෙය මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික නිවාස සඳහා ආරක්ෂක ලාම්පු සඳහා අයවැයෙන් මුදල් වෙන් කිරීමක්ද යන්න ප්‍රශ්නකාරීය.

සාමූහික කැබිනට් තීරණ ලෙස අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද කැපී පෙනෙන සාමූහික තීරණ (2025-04-07 දිනැති) ඇත. ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුවට අමරතව, එක්සත් රාජධානිය ශ්‍රී ලාංකිකයින් 04 දෙනෙකුට සම්බාධක පැනවීමට මෑතක දී ගත් තීරණය පරීක්ෂා කිරීම සඳහා අමාත්‍ය කමිටුවක් පත් කිරීමට දුන් පොරොන්දුව සහ බෞද්ධ රාජ්‍යයන් දෙකක් ලෙස දෙරටේ ජනතාව අතර දිගුකාලීන සමීප සම්බන්ධතාවය සැලකිල්ලට ගනිමින්, මියන්මාරයට මානුෂීය ආධාර සැපයීමට (2025 අප්‍රේල් 1 දිනැති) ගත් තීරණය මේ අතර විය. රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය නිල ජාතික සංවර්ධන සැලැස්ම ලෙස කැබිනට් මණ්ඩලය විසින් (2025-03-03 දිනැති) විධිමත් ලෙස අනුමත කිරීම සැලකිය යුතු සන්ධිස්ථානයක් වේ. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම සහ කළමනාකරණ බාධක විසඳීමේ කාර්යය සඳහා නිලධාරීන්ගේ කමිටුවක් පත් කිරීමට කැබිනට් මණ්ඩලය ගත් (2024-12-30 දිනැති) තීරණය තවත් වැදගත් පියවරක් ලෙස සඳහන් කළ හැකිය.

තවද, පහත සඳහන් කැබිනට් තීරණ, ප්‍රතිපත්ති ප්‍රකාශනය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට සෘජුවම සහායවන බවත්, පොළඹවන බවත් අධීක්ෂණය කෙරේ:

මධ්‍ය කාලීනව දළ දේශීය නිෂ්පාදිතයෙන් (Gross Domestic Product-GDP) 5% කට වඩා වැඩි ආර්ථික වර්ධන වේගයක් අත්කර ගැනීමට රජය අපේක්ෂා කරයි. ආර්ථික සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති සාකච්ඡා අධීක්ෂණය කිරීම සහ පහසුකම් සැලසීම, කාර්යක්ෂමතාව සහ ජාතික ආර්ථික අරමුණු සමඟ අනුකූලතාව සහතික කිරීම සඳහා (2025 අප්‍රේල් 21 දිනැති) කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ආර්ථික කළමනාකරණ පිළිබඳ විශේෂ කමිටුවක් පිහිටුවීමට කැබිනට් මණ්ඩලය අනුමැතිය ලබා දුන්නේය.

වත්මන් රජයේ Clean Sri Lanka ජාතික ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උපායමාර්ගික මෙවලමක් ලෙස, 2025/26 වර්ෂයේ සිට පාසල්, රජය, නිෂ්පාදන සහ සේවා යන ප්‍රධාන කාණ්ඩ යටතේ ජාතික ඵලදායිතා සම්මාන තරඟය පැවැත්වීමට (2025-02-19 දිනැති) අනුමැතිය හිමි වී ඇත.

ඉහත සඳහන් කළ නිරීක්ෂණවලට අමතරව, මෙම අර්ධ-වාර්ෂික වාර්තාව මගින්, රජය විසින් ගනු ලැබූ කැබිනට් තීරණවලට අනුව ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීම පිළිබඳ මූලිකත්වය ගන්නා වැඩසටහන් (**Flagship Program)** සඳහා නිදසුන් ලෙස ලෙස පහත ක්‍රියාමාර්ග ඉස්මතු කරයි.

- **Clean Sri Lanka** මුලපිරීම යනු, විශේෂයෙන්ම සමාජයීයව සවිඥානික, පාරිසරිකව වගකීම් සහිත, සහ සදාචාරාත්මක පදනමක් ඇති සමාජයක් ගොඩනැඟීමේ පුළුල් දැක්ම යටතේ බහුවිධ ප්‍රතිපත්ති ප්‍රකාශන තේමාවල ක්‍රමෝපායයික ක්‍රියාත්මක කිරීමකි.[38]

- දේශීය හා ජාත්‍යන්තර පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයෙන් යුතුව නව **ජාතික දූෂණ විරෝධී ක්‍රියාකාරී සැලැස්මක් (2025-2029)** සකස් කර ඇති අතර, ඒ සඳහා 2025-03-24 දිනැති කැබිනට් තීරණය මගින්අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.[39]

ඉදිරියට ගමන ගැන සලකා බැලීමේදී, ශක්තිමත් අධීක්ෂණ සහ ඇගයීමේ යාන්ත්‍රණයක් අත්‍යවශ්‍යවන බව සඳහන් කළ යුතුය. මෙයට පහත් දෑ ඇතුළත් විය යුතුය:

- අමාත්‍යාංශ විසින් මෙහෙයවනු ලබන ක්‍රියාකාරී සැලසුම්
- පැහැදිලිව නිර්වචනය කරන ලද ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs)
- නිතිපතා කෙරෙන ප්‍රගති සමාලෝචන

එවැනි මෙවලම් මගින්, රජයට ජාතික සංවර්ධනය කෙරෙහි තම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම්වල සැබෑ බලපෑම මැන බැලීමට සහ අවශ්‍ය අවස්ථාවලදී ප්‍රතිපත්ති හෝ සම්පත් වෙන් කිරීම් සීරුමාරු කිරීමට හැකියාව ලබා දෙයි. ප්‍රතිඵල සහ බලපෑම් පිළිබඳ ගැඹුරු ඇගයීම්, අයවැය ක්‍රියාකාරකම්වල සැබෑ ක්‍රියාත්මකවීම සහ ප්‍රගතිය මත රඳා පවතී.

[38]https://www.cabinetoffice.gov.lk/cab/index.php?option=com_content&view=article&id=16&Itemid=49&lang=en&dID=12908
[39]https://www.cabinetoffice.gov.lk/cab/index.php?option=com_content&view=article&id=16&Itemid=49&lang=en&dID=13092

2024 ජනාධිපතිවරණයට සහ පාර්ලිමේන්තු මැතිවරණයට පෙර ජාතික ජන බලවේගය විසින් ඉදිරිපත් කරනු ලැබූ කරන ලද ප්‍රතිපත්ති ප්‍රකාශනය අධීක්ෂණය කිරීමට සහ ආණ්ඩුකරණයේදී එය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රජය වගකිව යුතුවන ලෙස තබා ගැනීමට පැෆ්රල් සංවිධානය සහ මාර්තු 12 ව්‍යාපාරය කැපවී සිටී. විනිවිදභාවය සහ පොරොන්දු ඉටුකිරීමේ අවශ්‍යතාවය ශක්තිමත් කරමින්, දේශපාලන වේදිකාවල ලබාදෙන වාචික පොරොන්දු සහ සහතික කිරීම් සඳහා පුරවැසියන් සැළකිය යුතු වටිනාකමක් ලබාදෙන බව පිලිගැනීම ද ඒ හා සමානව වැදගත් වේ.

විදේශයන්හි ජීවත්වන ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා කලින්/පූර්ව ඡන්ද ප්‍රකාශ කිරීමේ යාන්ත්‍රණයන් ආරක්ෂා කිරීම සඳහා පැෆ්රල් සහ මාර්තු 12 ව්‍යාපාරය අඛණ්ඩව පෙනී සිටින අතර, රට තුළ සහ ඉන් පිටත සංක්‍රමණිකයින්ගේ ඡන්ද අයිතිය ආරක්ෂා කිරීම සඳහා රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු වී ඇති බව ගැන සැළකිලිමත්ව සිටී (පිටුව 195). මෙම පොරොන්දුව ක්‍රියාත්මක කිරීම පිළිබඳ රජයේ යාවත්කාලීන කිරීම් සඳහා පැෆ්රල් සහ පාර්ශ්වකරුවන් විමසිල්ලෙන් සිටී. මෙම ස්වාධීන අධීක්ෂණ මුලපිරීම හරහා, පැෆ්රල් සංවිධානය සහ මාර්තු 12 ව්‍යාපාරය, ශ්‍රී ලංකාවේ විනිවිදභාවය, සහභාගීත්ව ආණ්ඩුකරණය සහ ප්‍රජාතන්ත්‍රවාදී වගවීම ඉහළ නැංවීම සඳහා තම කැපවීම යළි තහවුරු කරයි. මෙම වාර්තාව ඒ සඳහා මූලික පදනමක් ලෙස පමණක් නොව, එළඹෙන අදියරේ දී වඩාත් පුළුල් ප්‍රතිඵල සඳහා වේදිකාව සකසා දෙයි.

# 10. නිර්දේශ

ප්‍රජාතන්ත්‍රවාදී වගවීම ශක්තිමත් කිරීමට සහ දේශපාලනික කැපවීම් අර්ථවත් ලෙස ආණ්ඩුකරණය හා සංවර්ධන ප්‍රතිඵල බවට පරිවර්තනය වීම තහවුරු කිරීම උදෙසා මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දු සඵලදායී ලෙස අධීක්ෂණය කිරීම අත්‍යවශ්‍ය වේ. ප්‍රතිපත්ති ප්‍රකාශන අධීක්ෂණයෙහි පළමු අදියරෙහි සොයාගැනීම්වලට අනුව, පැෆ්රල් සංවිධානය හා මාර්තු 12 ව්‍යාපාරය විසින් පහත සඳහන් නිර්දේශ මාලාව ඉදිරිපත් කරනු ලබයි. එහි අරමුණ වන්නේ විනිවිදභාවය වර්ධනය කිරීම, ප්‍රතිපත්ති ප්‍රකාශන සැකසුමට හා ක්‍රියාත්මක කිරීම සඳහා වූ ක්‍රමවත් ප්‍රවේශයන් ආයතනගත කිරීම, සහ නිවැරදි හා කාලීන තොරතුරු සඳහා ඇති ප්‍රවේශය වැඩි දියුණු කිරීම යනාදියයි. මෙම නිර්දේශ තුළින්, වඩාත් තියුණු වගවීම, සමස්තය ඇතුළත්කර ගැනීම, සහ රටෙහි ආණ්ඩුකරණ ක්‍රියාවලීන් පිළිබඳ විශ්වසනීයත්වය පෝෂ්‍ය කිරීම ඉලක්ක කරනු ලබයි.

### 1. වගවීම සහතික කිරීම සඳහා ප්‍රායෝගික සහ යථාර්ථවාදී මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශන සකස් කිරීම

2024 ජනාධිපතිවරණයට පෙර, පැෆ්රල් සංවිධානය, මාර්තු 12 ව්‍යාපාරය හා එක්ව, ජාතික ජනතා බලවේගය ඇතුළු ප්‍රධාන දේශපාලන පක්ෂ වෙත ක්‍රමවත් ප්‍රතිපත්ති ප්‍රකාශන සකස් කිරීම සඳහා රාමුවක් සකස් කර ඉදිරිපත් කරන ලදී. කෙසේ වෙතත්, අධීක්ෂණ ක්‍රියාවලියෙන් පෙන්නුම් කර ඇත්තේ මෙම රාමුව වත්මන් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ප්‍රමාණවත් ලෙස පිළිබිඹු වී නොමැති බවයි. පැහැදිලි ව්‍යුහයක්, ආන්තික කණ්ඩායම් සහ ඉදිරි පරම්පරාවන් ඇතුළත් කරන පුළුල් පදනමක් සහිත මහජන අදහස් විමසීමක්, කාලරාමු, සම්පත් සහ අධීක්ෂණය සහ ඇගයීම සඳහාවන සංරචක සහිත නිශ්චිත ක්‍රියාත්මක කිරීමේ සැලසුම්, සහ ජාතික ප්‍රතිපත්ති මෙන්ම ජාත්‍යන්තර සහ කලාපීය කැපවීම් සමග අනුකූලවීම යන මේවා සහතික කිරීමේ වැදගත්කම මෙම රාමුව අවධාරණය කරයි. එබැවින්, වගවීම සහ විශ්වසනීයත්වය ශක්තිමත් කිරීම සඳහා මෙම රාමුව අනාගත ප්‍රතිපත්ති ප්‍රකාශන සකස් කිරීමේ ක්‍රියාවලීන් තුළට සම්පූර්ණයෙන්ම ඇතුළත් කිරීමේ අවශ්‍යතාවය පැෆ්රල් සංවිධානය සහ මාර්තු 12 ව්‍යාපාරය යළි අවධාරණය කරයි.

### 2. ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ආණ්ඩුකරණ ක්‍රියාවලීන්ට ඒකාබද්ධ කිරීම

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දු, කැබිනට් හෝ විධායක තීරණ හරහා මූලපුරන ක්‍රියාකාරකම් තුළ, ඇතැම් විට සඳහන්වන බව අධීක්ෂණයෙන් පෙන්වා දී ඇති නමුත්, මෙය සෑමවිටම ක්‍රියාවේ යොදවන්නක් ලෙස නිරීක්ෂණය කළ නොහැක. වගවීම ශක්තිමත් කිරීම සහ ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා, කැබිනට් තීරණ, විධායක ක්‍රියාමාර්ග සහ ජාතික අයවැය ඇතුළුව, රජයේ තීරණ ගැනීම් සිදුකරන සියලු ආයතන වලට ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දු නිතිපතා ඒකාබද්ධ කළ යුතු බව පැෆ්රල් සංවිධානය සහ මාර්තු 12 ව්‍යාපාරය නිර්දේශ කරයි. එමගින් ඒවා පිළිබඳව සළකා බැලීම සහ ඒවා සඵලදායීව ක්‍රියාවට නැංවීම තහවුරු කරයි.

### 3. කැබිනට් තීරණ කෙරෙහි මහජන ප්‍රවේශය සහතික කිරීම

ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දු ක්‍රියාත්මක කිරීම සඳහා කැබිනට් තීරණ ඉතා වැදගත් මෙවලමක් වේ. වර්තමානයේ, එවැනි තොරතුරු සඳහා ඇති ප්‍රවේශය අමාත්‍ය මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන මාධ්‍ය නිවේදනවලට බොහෝ දුරට සීමා වී ඇති අතර, ඒවා ක්‍රමානුකූල අධීක්ෂණයක් කිරීම සඳහා ප්‍රමාණවත් විස්තර සපයන්නේ නැත. ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාත්මක කිරීම පිළිබඳව විනිවිදභාවය, වගවීම සහ සඵලදායීව තක්සේරු කිරීම සහතික කිරීම සඳහා, පැෆ්රල් සංවිධානය සහ මාර්තු 12 ව්‍යාපාරය, සවිස්තරාත්මක කැබිනට් තීරණ ප්‍රසිද්ධියේ ලබාගත හැකිවන විවෘත දත්ත යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම නිර්දේශ කරයි.

### 4. නිවැරදි, පරිපූර්ණ සහ යාවත්කාලීනකර ඇති දත්ත ලබාගැනීමේ හැකියාව

ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දු ක්‍රියාත්මක කිරීම තක්සේරු කිරීම සඳහා නිවැරදි, පරිපූර්ණ සහ නිතිපතා යාවත්කාලීන කරන දත්ත අත්‍යවශ්‍ය වේ. විවිධ අංශවලට අනුව අමාත්‍යාංශ සඳහා අයවැය වෙන් කිරීම් මගින්, කැපවීම් ක්‍රියාකාරිත්වයන් බවට පරිවර්තනය කිරීමේ දී ඍජු කාර්යභාරයක් ඉටුකරන අතර, දැනට පවතින වාර්තාකරණ යාන්ත්‍රණයන් කාර්තුමය කාර්ය සාධන සමාලෝචන හරහා කෙරෙන රජයේ අභ්‍යන්තර අධීක්ෂණයට සීමා වේ. වර්තමානයේ, සිවිල් සමාජ සංවිධාන හෝ පර්යේෂණ ආයතනවලට ස්වාධීන අධීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා එවැනි දත්ත වෙත ප්‍රවේශ වීමට ඉඩ සලසන විධිමත් ක්‍රමවේදයක් නොමැත. එබැවින්, ස්වාධීන තෙවන පාර්ශ්වීය අධීක්ෂණයට ඉඩ සැලසීම සහ ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම් ක්‍රියාත්මක කිරීමේ දී වැඩි විනිවිදභාවයක් සහ වගවීමක් ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරී සැලසුම්, උපායමාර්ගික සැලසුම්, සහ කාර්ය සාධන දත්තවල ප්‍රගතිය වෙත කාලෝචිත ප්‍රවේශයක් ලබා දීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට, පැෆ්රල් සංවිධානය සහ මාර්තු 12 ව්‍යාපාරය නිර්දේශ කරයි.

## 5. ජාතික අධීක්ෂණ සහ ඇගයීම් තොරතුරු පද්ධතියක් (කෝෂ්ඨාගාරයක්) ස්ථාපිත කිරීම

රජයේ අභ්‍යන්තර යාන්ත්‍රණයන් සහ ස්වාධීන අධීක්ෂකයින් යන දෙයංශයෙන්ම උත්පාදනය කරන සොයාගැනීම් සහ නිර්දේශවල කේන්ද්‍රීයගබඩාවක් ලෙස කටයුතු කිරීම සඳහා ජාතික අධීක්ෂණ සහ ඇගයීම් තොරතුරු පද්ධතියක් ස්ථාපිත කරන ලෙස පැෆ්රල් සංවිධානය සහ මාර්තු 12 ව්‍යාපාරය නිර්දේශ කරයි. එවැනි පද්ධතියක් පාඩම් ඉගෙනුම කෙරෙහි පහසුකම් සපයා, සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්ති සම්පාදනය වැඩිදියුණු කර, රජයේ වැඩසටහන් සහ ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම් ක්‍රියාත්මක කිරීමේ දී විනිවිදභාවය සහ වගවීම ඉහළ නංවනු ඇත.

# 11. මූලාශ්‍ර


ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව. (2018). ශ්‍රී ලංකා ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය 2018. කොළඹ: ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව.
https://www.publicfinance.lk/sin/report/evaluationpolicy_2018_depprojectmanagement

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව. (2023). ශ්‍රී ලංකාවේ ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ රාමුව. කොළඹ: ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව.
https://www.treasury.gov.lk/api/file/2b47c573-30a3-499e-9055-a7bd90cbccc9

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය. (2025). 2025 අයවැය ඇස්තමේන්තු: මූල්‍ය වර්ෂය - 2025 (පළමු, දෙවන සහ තෙවන වෙළුම). කොළඹ: මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය.
https://www.treasury.gov.lk/web/detailed-approved-budget-estimates-2025

M. Segone (Ed.), (2010). From policies to results Developing capacities for country monitoring and evaluation systems.
https://www.betterevaluation.org/tools-resources/policies-results-developing-capacities-for-country-monitoring-evaluation-systems

Tennakoon, Nipunika & Jayathilake, Tikiri. (2021). Policy and Legislation Evaluation and Scrutiny by Parliament of Sri Lanka. Journal of Southeast Asian Human Rights. 5. 154. 10.19184/jseahr.v5i2.13603.
https://www.researchgate.net/publication/357909612_Policy_and_Legislation_Evaluation_and_Scrutiny_by_Parliament_of_Sri_Lanka

ජාතික ජන බලවේගය. (2024). පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්. බත්තරමුල්ල: ජාතික ජන බලවේගය.
https://www.npp.lk/si/policies/npppolicystatement

OECD (2005), Paris Declaration on Aid Effectiveness, OECD Publishing.
https://www.oecd.org/content/dam/oecd/en/publications/reports/2005/03/paris-declaration-on-aid-effectiveness_g1g12949/9789264098084-en.pdf

PAFA Secretariat (2011). Public Financial Management Performance Measurement Framework, Washington DC, USA: PAFA Secretariat
https://www.pefa.org/sites/pefa/files/resources/downloads/PMFEng-finalSZreprint04-12_1.pdf

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව. (2020). පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 119: ශ්‍රී ලංකාවේ ජාතික ඇගයීම් ධාරිතාව සහතික කිරීම පිණිස අධ්‍යයනය කර සිය නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහාවන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ අතුරු වාර්තාව. කොළඹ: ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව.
www.parliament.lk/uploads/comreports/1582525317035156.pdf

Segone, M. (Ed.). (2010). From Policies to Results: Developing capacities for country monitoring and evaluation systems. UNICEF Evaluation Office.

Segone, M., Rugh, J., Et al.. (2012). Evaluation and Civil Society: Stakeholders' perspectives on national evaluation capacity development. Evaluation Partners, UNICEF, IOCE.
https://www.betterevaluation.org/tools-resources/policies-results-developing-capacities-for-country-monitoring-evaluation-systems

Sivagnanasothy, V. (2020). Development Evaluation in Sri Lanka. USAID/SDGAP.

Sivagnanasothy, V. (2020). Managing for development results in Sri Lanka: Practitioner's guide – A step-by-step approach. USAID/SDGAP.

Soma De Silva. (2021). Theory of change for development success. Sri Lanka Evaluation Association.

Tennakoon, Nipunika & Jayathilake, Tikiri. (2021). Policy and Legislation Evaluation and Scrutiny by Parliament of Sri Lanka. Journal of Southeast Asian Human Rights.

Uklala, Ashishie & Bessong, Peter & Oti, Peter & Tapang, Arzizeh & Ina, Egu. (2021). Empirical analysis of public accounts committee and accountability of funds in Nigeria. Academy of Accounting and Financial Studies Journal. 25. 1-12.
https://www.researchgate.net/publication/352160286_EMPIRICAL_ANALYSIS_OF_PUBLIC_ACCOUNTS_COMMITTEE_AND_ACCOUNTABILITY_OF_FUNDS_IN_NIGERIA

Wood, B., Kabell, D., Sagasti, F., & Muwanga, N. (2008). Synthesis report on the first phase of the evaluation of the implementation of the Paris Declaration. Ministry of Foreign Affairs, Denmark.
https://assets.publishing.service.gov.uk/media/5a79ac57ed915d07d35b7425/Paris-Dec-Synthesis-Report.pdf

# ඇමිණුම I දත්ත විස්තරය: ප්‍රතිපත්ති ප්‍රකාශනය එදිරිව කැබිනට් තීරණ

## ප්‍රජා ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 01 | සෞඛ්‍යය | දරුවන්ගේ සෞඛ්‍ය හා පෝෂණ තත්වය වර්ධනය කෙරෙන ක්‍රියාකාරකම් (14)<br><br>ළමුන්ගේ ශාරීරික හා මානසික සමබරතාවන් පවත්වාගෙන යාම සඳහා වැඩසටහන් (16) | පාසල් පෝෂණ වැඩසටහන සඳහා එක් ශිෂ්‍යයෙකු වෙනුවෙන් දෛනිකව දැරිය යුතු මුදල රුපියල් 85/- සිට රුපියල් 110/- දක්වා වැඩි කිරීම පිණිස අධ්‍යාපන අමාත්‍යංශය වෙත අතිරේක ප්‍රතිපාදන සලසා දීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත රුපියල් මිලියන 1,800 ක ප්‍රතිපාදන සලසා ගැනීම (2024-11-25) | අතිශයින් උචිත | වැඩි දියුණු කළ අරමුදල් මගින් ආහාර වේලෙහි ගුණාත්මකභාවය සහ පෝෂණය ඉහළ නැංවිය හැකිය. පැහැදිලිවම මහා පරිමාණ, බලපෑම් සහිත බෙදාහැරීමේ යාන්ත්‍රණයක් ඉලක්ක කර ගෙන ඇති අතර ප්‍රතිපත්ති ප්‍රකාශන ඉලක්ක සඳහා සැබෑ මූල්‍ය කැපවීමක් පෙන්නුම් කරයි. |
| 02 | සෞඛ්‍යය | රාජ්‍ය සෞඛ්‍ය සේවා ආයතනවලට අවශ්‍ය සියලු ම අත්‍යවශ්‍ය ඖෂධ අඛණ්ඩව සැපයීම සහතික කිරීම (27) | රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සහ දේශීය ඖෂධ නිෂ්පාදකයින් වෙතින් අත්‍යවශ්‍ය වෛද්‍ය සැපයීම් ප්‍රසම්පාදනය (2024-12-02) | උචිත | රජයේ රෝහල් වලට අඛණ්ඩ සැපයුමක් සහ තිරසාරභාවය සහ සැපයුම් දාමයේ ස්ථාවරත්වය සඳහා සහාය වේ. ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් ඉලක්කගත ජනගහනයට සහ බෙදාහැරීමේ ක්‍රමවේදයට ගැලපේ. |
| 03 | පරිසරය | රම්සා තෙත් බිම් සංරක්ෂණය කිරීමට කටයුතු කිරීම සහ ඒ මගින් සංචාරක ආකර්ෂණය ලබා ගැනීම. බහුපාර්ශ්වීය හවුල්කරුවන් හා ප්‍රජා සහභාගිත්වය සහිතව හායනයට ලක් වූ තෙත් බිම් ප්‍රතිෂ්ඨාපනය (55) | තෙත්බිම් සම්බන්ධ අන්තර්ජාතික සම්මුතිය හෙවත් රැම්සාර් සම්මුතියේ 15 වන පාර්ශවකරුවන්ගේ සම්මේලනය සඳහා ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකාව විසින් ''තෙත්බිම් වල ස්වභාවධර්මයේ හිමිකම්'' සම්බන්ධ යෝජනාවක් කෙටුම්පත් කර ඇත. එම යෝජනාව මගින් සාමාජික රටවල් විසින් සිය රටවල පවතින තෙත්බිම් වල ස්වභාවධර්මයේ හිමිකම හඳුනා ගැනීමට අපේක්ෂා කරනු ලබයි (2024-12-09) | අතිශයින් උචිත | තෙත්බිම් ආරක්ෂාව සඳහා ජාත්‍යන්තර නීති රාමු ඉදිරියට ගෙන යාමෙන් සහ සංරක්ෂණය, පාරිසරික ප්‍රතිෂ්ඨාපනය, සහ පාරිසරික සංචාරක ව්‍යාපාරය සංවර්ධනය සඳහා වන ජාතික කැපවීම් වලට සහාය දක්වමින් එය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ මූලධර්ම ක්‍රියාත්මක කරයි. |
| 04 | පරිසරය | කෘෂිකාර්මික, කාර්මික, ගෘහස්ථ හා සේවා ස්ථානවල අප ජලය විද්‍යානුකූලව පරිසරයට බැහැර කිරීමට සුදුසු ක්‍රම හඳුන්වාදීම සහ නියාමනය විධිමත් කිරීම (53) | අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත හොරණ අපනයන සැකසුම් කලාපයේ පොදු අපජල පිරිපහදු යන්ත්‍රාගාරයේ ධාරිතාව වැඩි කිරීමේ කොන්ත්‍රාත්තුව Luminex PLC වෙත පිරිනැමීම අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී (2024-12-09) | උචිත | විශේෂයෙන් හොරණ අපනයන සැකසුම් කලාපය වැනි කාර්මික කලාප වල විද්‍යාත්මක අපජල පිරිපහදු ක්‍රම හඳුන්වාදීම සහ නියාමනය කිරීම. |
| 05 | සෞඛ්‍යය | දරුවන්ගේ සෞඛ්‍ය හා පෝෂණ තත්වය වර්ධනය කෙරෙන ක්‍රියාකාරකම් (14)<br><br>ළමුන්ගේ ශාරීරික හා මානසික සමබරතාවන් පවත්වාගෙන යාම සඳහා වැඩසටහන් (16) | එක් දරුවෙකු සඳහා දිනකට වෙන් කර ඇති රුපියල් 60/- ක මුදල රුපියල් 100/- දක්වා වැඩි කිරීමටත්, මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන/පෙර පාසල් දරුවන් සඳහා උදෑසන ආහාර වේල ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර ''අඩු බර සහිත දරුවන් වැඩි ප්‍රතිශතයක් සිටින පෙර පාසල්'' යන නිර්ණායකය පදනම් කර ගෙන තෝරා ගනු ලබන මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන/පෙර පාසල් වල එම වැඩසටහන ඉදිරියට ක්‍රියාත්මක කිරීම (2024-12-18) | අතිශයින් උචිත | විශේෂයෙන් එය වඩාත්ම අවදානමට ලක්විය හැකි දරුවන් අතර (අඩු බර) ළමා පෝෂණය වැඩි දියුණු කිරීමට දායක වේ. එය ශාරීරික හා සංජානන සංවර්ධනය සඳහා ප්‍රධාන කාල පරිච්ඡේදයක් (පෙර පාසල්) වන පූර්ව කාලීන මැදිහත්වීම ඉලක්ක කරයි. පෝෂණ සහයෝගය වැඩි කිරීමෙන්, එය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සෞඛ්‍ය සහ පෝෂණ තත්ත්වය වැඩි දියුණු කිරීමේ ඉලක්ක වලට අනුකූල වන පරිදි මන්දපෝෂණය ආමන්ත්‍රණය කරයි. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 06 | නිවාස | අවශ්‍ය අවස්ථාවන්හිදී විකල්ප නවාතැන් පහසුකම්, රැකියා සහ වෙනත් ආධාර (67) | ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය හමුවේ හිංසනයෙහි වින්දිතයන් බවට පත්වන කාන්තාවන් සහ දරුවන් වෙනුවෙන් තාවකාලික රැකවරණය සැලසීම සඳහා කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය විසින් ගම්පහ, රත්නපුර, මොනරාගල, කොළඹ, මාතර, මඩකලපුව, මුලතිව් හා යාපනය යන දිස්ත්‍රික්කවල එක් රැකවරණ නිවාසයක් බැගින් ද අනුරාධපුර දිස්ත්‍රික්කයේ රැකවරණ නිවාස 02 ක් ද වශයෙන් රැකවරණ නිවාස 10 ක් පවත්වා ගෙන යනු ලබයි (2024-12-18) | අර්ධ වශයෙන් උචිත | මෙම ක්‍රියාකාරකම තුළ රැකියා සහාය අංශය ගැන සාකච්ඡා කර නැත. නමුත් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුවේ දෙවන කොටස වන ජීවනෝපාය වැඩසටහන්, කුසලතා පුහුණුව හෝ සේවානියුක්ති පහසුකම් සැපයීම පිළිබඳ කිසිදු සඳහනක් නොමැත. |
| 07 | ආර්ථිකය | අපනයන ඉපැයීම්වලට සාපේක්ෂව විදේශ ප්‍රේෂණ ගෙන්වා ගැනීම හා මෙහෙයුම් කාර්යක්ෂම කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුවට බලය පැවරෙන පරිදි විදේශ විනිමය පනත සංශෝධනය කිරීම (104) | 2024-12-20 දින සිට බලාත්මක වන පරිදි මාස හයක (06) කාලසීමාවක් සඳහා 2017 අංක 12 දරණ විදේශ විනිමය පනතේ 22 වගන්තිය යටතේ නියමයක් නිකුත් කිරීම (2024-12-18) | අර්ධ වශයෙන් උචිත | කැබිනට් තීරණයේ සාරාංශය විශේෂතා විස්තර වශයෙන් පැහැදිලි නොකළද, මෙම පනතට කරන ලද සංශෝධන සලකා බැලීම/අනුමත කිරීම යන කරුණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ප්‍රකාශිත ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණ ඉලක්කයට අනුකූල වේ. |
| 08 | පරිසරය | ස්වාභාවික විපත් සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ ක්‍රමවේද හඳුන්වාදීම, මිනිස් ක්‍රියාකාරකම් පාලනය කිරීම , වන්දි හා රක්ෂණ ක්‍රම හඳුන්වා දීම (55) | උපරිම වශයෙන් හෙක්ටයාර 02 ක් (අක්කර 05 ක්) දක්වා අක්කරයකට උපරිම වශයෙන් රුපියල් 40,000/- ක හානිපූරණයක් ද, එසේම, බඩඉරිඟු, අර්තාපල්, මිරිස්, ලොකුලූණු සහ සෝයා බෝංචි යන භෝග වර්ග 05 සඳහා උපරිම වශයෙන් හෙක්ටයාර 01 ක් (අක්කර 2.5 ක්) දක්වා අක්කරයකට උපරිම වශයෙන් රුපියල් 40,000/- ක හානිපූරණයක් ද, 2025 වර්ෂය සඳහා කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත වෙන් කරනු ලබන ප්‍රතිපාදන වලින් ලබාදීම (2024-12-23) | අර්ධ වශයෙන් උචිත | මෙම ක්‍රියාකාරකම මඟින් රක්ෂණය හරහා බෝග හානි සඳහා වන්දි යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කරන අතර, එය එම ප්‍රතිපත්ති ප්‍රකාශන කරුණට අනුකූල වේ. |
| 09 | පරිසරය | පවත්නා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සහ ඊට සෘජුව අදාළ වන අනෙකුත් ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලසුම් සමාලෝචනය කර ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්මක් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම (56) | "Clean Sri Lanka" වැඩසටහනට අනුගතව, පළාත් පාලන බල ප්‍රදේශ පදනම් කර ගනිමින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම (2024-12-23) | උචිත | "Clean Sri Lanka" වැඩසටහන යනු පළාත් පාලන ආයතන සමග බහු-ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය සහ අපද්‍රව්‍ය කළමනාකරණය ආවරණය කරන සෘජුව අනුකූල වන අන්තර් ක්ෂේත්‍රීය ව්‍යාපෘතියකි. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 10 | පරිසරය | පරිසර සුරක්ෂිතතාව තහවුරු කිරීම උදෙසා දැනට පනවා ඇති අණපනත්වල දුර්වලකම්, අඩුපාඩු, ඌනතාවන් ඉවත් කිරීම, ජාත්‍යන්තරය සමග එළඹි ගිවිසුම් හා ප්‍රඥප්තීන් හා දේශීය පාරිසරික නීති සමාලෝචනය, මහජන අදහස් හා යෝජනා සඳහා සහභාගිත්ව ප්‍රවේශ ක්‍රියාමාර්ග ගැනීම සහ අවශ්‍යතාව මත නව පනත් සම්පාදනය සඳහා ඒ ඒ ක්ෂේත්‍රවල ප්‍රවීණයන්ගෙන් සමන්විත කොමිසමක් ස්ථාපිත කිරීම (54) | ශ්‍රී ලංකාවේ පළමු ද්විවාර්ෂික විනිවිදභාවය පිළිබඳ වාර්තාව දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියට ඉදිරිපත් කිරීම (2024-12-30) | අතිශයින් උචිත | මෙම ක්‍රියාකාරකම ජාත්‍යන්තර ගිවිසුම් (විශේෂයෙන් UNFCCC සහ පැරිස් ගිවිසුම) සඳහා කැපවීම තහවුරු කරයි. එය අවසානයේ ප්‍රතිපත්ති හෝ නීති ප්‍රතිසංස්කරණ වලට තුඩු දිය හැකිය. |
| 11 | ව්‍යවසායකත්වය | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට මූල්‍ය ආධාර සැපයීම සඳහා සංවර්ධන බැංකුවක් මගින් මූල්‍ය ක්ෂේත්‍රය හරහා ශක්‍යතා ඇගයීම් මත රුපියල් මිලියන 10 දක්වා ඇපකර රහිත ණය යෝජනා ක්‍රමයක් (Based on Feasibility and Credit Score) (153) | නිශ්චිත නිර්ණායක කිහිපයකට යටත්ව, උපරිම දෛනික වී කෙටීමේ ධාරිතාව මෙට්‍රික් ටොන් 25 ක් දක්වා වන සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් (වී මෝල් පවත්වා ගෙන යන ලබන සමුපකාර සමිති ද ඇතුළුව) වෙත රාජ්‍ය හා පෞද්ගලික බැංකු හරහා සහනදායී පොලී අනුපාතයක් යටතේ රුපියල් මිලියන 50 ක උපරිමයක් දක්වා ඔඩපණ ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම (2024-12-30) | අර්ධ වශයෙන් උචිත | කැබිනට් තීරණය ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් වෙනස් වන්නේ: ණය වර්ගය (ඇප රහිත නොවේ), අංශය (වී මෝල් හිමියන්ට සීමා වේ) සහ විෂය පථය (සාමාන්‍ය කුඩා, ක්ෂුද්‍ර සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායක සහය නොවේ) යන කරුණු අනුව ය. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා සහාය වීමේ අරමුණ දෙකෙහිම පවතී, නමුත් සැලසුම සහ විෂය පථය සැලකිය යුතු ලෙස වෙනස් වේ. |
| 12 | ආහාර සුරක්ෂිතතාව | රාජ්‍ය සෞඛ්‍ය සේවා ආයතනවලට අවශ්‍ය සියලු ම අත්‍යවශ්‍ය ඖෂධ අඛණ්ඩව සැපයීම සහතික කිරීම (27) | මෙරපනම් එන්නත් ග්‍රෑම් 1 න් වයල් 900,000 ක් සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය පාකිස්ථානයේ M/s Genix Pharma (Pvt.) Ltd. වෙත පිරිනැමීම (2024-12-30) | අර්ධ වශයෙන් උචිත | සැපයුම්කරු විදේශීය සමාගමක් වුවද, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ප්‍රසම්පාදනය දේශීය සැපයුම්කරුවන්ට පමණක් සීමා නොවේ. එය හුදෙක් මහජන සෞඛ්‍ය ආයතනවල අත්‍යවශ්‍ය ඖෂධ අඛණ්ඩව පැවතීම අරමුණු කරගෙන ඇත. |
| 13 | සෞඛ්‍යය | රාජ්‍ය සෞඛ්‍ය සේවා ආයතනවලට අවශ්‍ය සියලු ම අත්‍යවශ්‍ය ඖෂධ අඛණ්ඩව සැපයීම සහතික කිරීම (27) | ටෙනෙක්ටිප්ලේස් එන්නත් මිලිග්‍රෑම් 40 න් වයල් 9,000 ක් මිලදී ගැනීම පිණිස අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත පදනම්ව සාරානුකූලව ප්‍රතිචාර දක්වන ලද අවම ලංසුකරු වෙත M/s ABC Pharma Services (Pvt) Ltd. වෙත පිරිනැමීම (2024-12-30) | අර්ධ වශයෙන් උචිත | SCAPC හරහා විනිවිද පෙනෙන ක්‍රියා පටිපාටි අනුගමනය කරමින් ප්‍රසම්පාදනය සිදු කරන ලද අතර, සාධාරණත්වය සහ පිරිවැය-සඵලතාව සහතික කරමින් සාරානුකූලව ප්‍රතිචාර දක්වන ලද අවම ලංසුකරුට ප්‍රදානය කරන ලදී. මේ අනුව, ප්‍රසම්පාදන ක්‍රියාමාර්ගය පැහැදිලිවම අත්‍යාවශ්‍ය ඖෂධයක් සුලභව තිබීම පවත්වා ගෙන යාම අරමුණු කරගෙන ඇත. |
| 14 | ප්‍රසම්පාදනය | දේශීය ලංසුකරුවන්ගේ සහභාගිත්වය වැඩි කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි විනිවිදභාවය සහතික කිරීම (191) | අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත පදනම්ව, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සඳහා දෙමහල් වානේ ව්‍යුහ ගබඩාවක් රත්මලානේ ඉදිකිරීම (2024-12-30) | අර්ධ වශයෙන් උචිත | මෙම ක්‍රියාවලිය SCAPC හරහා විනිවිදභාවය සහතික කරයි. නමුත් දේශීය ලංසුකරුවන්ගේ සහභාගිත්වය වැඩි කිරීම අරමුණු කරගත් ක්‍රියාමාර්ග පිළිබඳ සාක්ෂි නොමැත. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 15 | කලාව සහ සංස්කෘතිය | රටේ ඉතිහාසය, සංස්කෘතිය සහ උරුමයට අදාළ පාර්ශ්වකරුවන් විසින් දැනට නියුක්තව සිටින සංස්කෘතික සම්පත් ආරක්ෂා කිරීමේ සහ කළමනාකරණයට අදාළ කාර්යයන්ගෙන් ඔබ්බට ගොස් සංස්කෘතික උරුමය සහ ඉතිහාසයේ වටිනාකම් පිළිබඳ ඔවුන් තුළ තිබෙන අවබෝධය වැඩිදියුණු කිරීම (48) | තෙස්තමේන්තුකරුගේ අභිප්‍රායන්ට පටහැනි නොවන පරිදි "රිච්මන්ඩ් කාසල්" මන්දිරය අලුත්වැඩියා කිරීම සහ එකී මන්දිරයෙහි කටයුතු පවත්වාගෙන යාම රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ සිදු කිරීමට හැකි වන පරිදි උනන්දුවක් දක්වන පෞද්ගලික අංශයේ ආයෝජකයින් වෙතින් යෝජනා කැඳවීම (2025-01-06) | උචිත | සංස්කෘතික උරුමයක් සංරක්ෂණය කිරීම සඳහා පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන් සම්බන්ධ කර ගැනීමෙන් මෙම ක්‍රියාකාරකම ප්‍රතිපත්ති ප්‍රකාශනයට සහය වේ. එමගින් සංස්කෘතික සම්පත් පිළිබඳ පුළුල් අවබෝධයක් සහ කළමනාකරණය ඉහළ නංවයි. |
| 16 | අධ්‍යාපනය | ජාතික විශ්වවිද්‍යාල පද්ධතිය උසස් න්‍යායික හා පර්යේෂණාත්මක අධ්‍යාපනය ලබාදෙන මධ්‍යස්ථාන බවට පත්කොට ජාත්‍යන්තර මට්ටමේ උසස් වෘත්තීය අධ්‍යාපනයක් ලබාදෙන සමාන්තර විශ්වවිද්‍යාලයීය පද්ධතියක් ඇති කිරීමට කටයුතු කෙරේ. (18) | 2019 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) ප්‍රතිඵල මත බඳවා ගත් වෛද්‍ය සිසුන් හට ගුණාත්මක රෝහල් පාදක පුහුණුවක් ලබාදීම තහවුරු කිරීම සඳහා කළුතර ශික්ෂණ රෝහල හා ගල්ලස්ස මාතෘ හා ළමා රෝහල යොදා ගැනීම, සහ මොරටුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ස්ථාපිත කිරීම සඳහා කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, නාගොඩ බටහිර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට සහ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ඉඩම් කොටස් 02 ක් එම විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීම (2025-01-20) | අර්ධ වශයෙන් උචිත | එය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දැක්ම සපුරාලමින්, ජාතික විශ්වවිද්‍යාල පද්ධතිය තුළ, විශේෂයෙන් වෛද්‍ය ක්ෂේත්‍රය තුළ, උසස් වෘත්තීය සහ පර්යේෂණාත්මක අධ්‍යාපනය යන දෙකම ඉහළ නංවයි. |
| 17 | පරිසරය | ශ්‍රී ලංකාවේ සියලු ම ජල මූලාශ්‍ර අධ්‍යයනය කර, සංවේදී මූලාශ්‍ර මැණුම් කටයුතු සිදු කිරීම සහ ගැසට් කර සංරක්ෂණය කිරීම (52) | හවුල්කාර සාමාජිකයින් සඳහා යුරෝ 399,819 ක උපරිම ප්‍රදාන දායකත්වයක් ලබාදීමටත්, ඉන් යුරෝ 164,236 ක මුදලක් ජල හා සංවර්ධන හවුල්කාරිත්ව වැඩසටහනේ 3 වන අදියර (DUPC 3) යටතේ ශ්‍රී ලංකා රජය වෙත වෙන් කරදීම (2025-01-20) | අර්ධ වශයෙන් උචිත | එය ජලය ආශ්‍රිත වැඩසටහන් සඳහා සහාය දක්වයි, නමුත් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ නියම කර ඇති පරිදි සංවේදී ජල මූලාශ්‍ර අධ්‍යයනය කිරීම, සංවේදීතාව තක්සේරු කිරීම සහ ගැසට් කිරීම යන නිශ්චිත කාර්යයන් පැහැදිලිව ආමන්ත්‍රණය නොකරයි. https://www.un-ihe.org/search?query=Sri+Lanka+ |
| 18 | ක්‍රීඩා | ක්‍රීඩා සඳහා විශේෂ දක්ෂතා ඇති ක්‍රීඩකයින් හඳුනා ගැනීමට සහ ඔවුන්ගේ ආර්ථික මට්ටම, පෝෂණය සහ පුහුණුවට අදාළ උපකරණ ලබාදීම සඳහා පාසැල් සහ දිස්ත්‍රික්ක මට්ටමින් විශේෂ වැඩසටහන් (35) | ''පාසල් ආහාර වැඩසටහන'' වඩාත් සැලසුම් සහගතව 2025 වර්ෂයේ සිට ඉදිරියට ක්‍රියාත්මක කිරීමටත්, වාර්ෂිකව මුළු ශිෂ්‍ය සංඛ්‍යාව මිලියන 1.5 ක උපරිමයට යටත්ව ප්‍රතිලාභ සලසා දීමට හැකිවන පරිදි අයවැය ප්‍රතිපාදන සලසා ගැනීම (2025-01-20) | උචිත නොවන | පාසල් ආහාර වැඩසටහන සිසුන් හට පෝෂණ සහාය සඳහා දායක වන අතර, එය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අවශ්‍ය කරන පරිදි විශේෂයෙන් සුවිශේෂී කුසලතා ඇති ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඉලක්ක කර නොගන්නා අතර, පුහුණුව හෝ විශේෂිත ආර්ථික සහාය ඇතුළත් නොකරයි. |
| 19 | පරිසරය | පවත්නා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සහ ඊට සෘජුව අදාළ වන අනෙකුත් ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලසුම් සමාලෝචනය කර ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්මක් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම (56) | ජපාන යෙන් මිලියන 300 ක ප්‍රදාන ආධාර ලබා ගැනීම සහ එම අරමුදල් බස්නාහිර, උතුර සහ නැගෙනහිර පළාත් වල පළාත් පාලන ආයතනයන්හි කසළ කළමනාකරණ ධාරිතාව වැඩි කිරීම සඳහා Garbage Compactors 28 ක් ප්‍රසම්පාදනය කිරීම පිණිස, ජපාන ආර්ථික සහ සමාජ සංවර්ධන වැඩසටහන යටතේ එකී ප්‍රදානය යොදා ගැනීමට අපේක්ෂිතය (2025-01-27) | උචිත | ප්‍රතිපත්ති ප්‍රකාශනය ප්‍රතිපත්ති සහ සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සමාලෝචනය අවධාරණය කරන අතර, ක්‍රියාකාරකම ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන්නේ බාහිරව අරමුදල් සපයන උපකරණ ප්‍රසම්පාදනය කෙරෙහි ය. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 20 | පරිසරය | ස්වාභාවික විපත් සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ ක්‍රමවේද හඳුන්වාදීම, මිනිස් ක්‍රියාකාරකම් පාලනය කිරීම , වන්දි හා රක්ෂණ ක්‍රම හඳුන්වා දීම (55) | කලාපීය ඒකාබද්ධ බහුවිධ ආපදා අනතුරු ඇඟවීමේ පද්ධති (RIMES) ආයතනයේ සිව්වන අමාත්‍ය සමුළුව 2025 අප්‍රේල් මස අවසන් සතිය හෝ මැයි මස පළමු සතිය තුළ දින 04 ක කාලයක් කොළඹදී පැවැත්වීම (2025-01-27) | අර්ධ වශයෙන් උචිත | මෙම සමුළුව පැවැත්වීම ස්වභාවික ආපදා සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති හඳුන්වාදීම සහ ශක්තිමත් කිරීමේ අරමුණ ඉදිරියට ගෙන යයි. කෙසේ වෙතත්, ක්‍රියාකාරකම මානව ක්‍රියාකාරකම් කළමනාකරණය හෝ වන්දි ලබා දීමේ යාන්ත්‍රණයන් නිශ්චිතව සඳහන් නොකරයි, නමුත් මූලික පූර්ව අනතුරු ඇඟවීමේ අංගයට අදාළ වේ. |
| 21 | කලාව සහ සංස්කෘතිය | ශක්තිමත් බුද්ධිමය දේපළ පනතක් ඇති කොට කලාකරුවාගේ නිර්මාණ අයිතිය තහවුරු කිරීම සහ ලෝක බුද්ධිමය හිමිකම් සංවිධානයේ (World Intelleectual Property Organizaion) ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම (41) | ලෝක බුද්ධිමය දේපළ සංවිධානය විසින් පරිපාලනය කරන මැඩ්රිඩ් සන්ධාන පත්‍රයට ප්‍රවේශ වීමේ කටයුතු ඉදිරියට සිදු කිරීම හා ඒ සඳහා 2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනතට අවශ්‍ය සංශෝධන සිදු කිරීම (2025-02-03) | අතිශයින් උචිත | මෙම ක්‍රියාකාරකම ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO) මත පදනම් වූ යාන්ත්‍රණ (මැඩ්රිඩ් ප්‍රොටෝකෝලය) සහ නීතිමය සංශෝධන හරහා බුද්ධිමය දේපළ (IP) නීති රාමුව ශක්තිමත් කිරීම මඟින් ප්‍රතිපත්ති ප්‍රකාශනයට සෘජුවම සහාය දක්වා, එමගින් බුද්ධිමය දේපළ ආරක්ෂණයන් වැඩි දියුණු කරයි. |
| 22 | අධ්‍යාපනය | පශ්චාත් උපාධි අධ්‍යාපනය සහ පර්යේෂණ ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය හා භෞතික සම්පත් සම්පාදනය (19) | අධ්‍යාපන සහ ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සහ ඒකාබද්ධව වැඩමුළු හා සම්මන්ත්‍රණ සංවිධාන කිරීම අරමුණු කර ගනිමින් වසර පහක (05) කාල සීමාවක් සඳහා බලාත්මක වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ විශ්වවිද්‍යාලය සහ කොරියානු ජනරජයේ ජාතික කොරියානු සමුද්‍රීය හා සාගර විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීම (2025-02-19) | උචිත | විශ්වවිද්‍යාල දෙකක් අතර අධ්‍යාපනික හා ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සහ වැඩමුළු සහ සම්මන්ත්‍රණ සංවිධානය කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම මඟින් පශ්චාත් උපාධි අධ්‍යාපනය සහ පර්යේෂණ සහයෝගීතාවයට සෘජුවම සහාය දක්වයි. |
| 23 | පරිසරය | ගංගා ද්‍රෝණි හා මධ්‍යම කඳුකරයේ වැසි ජලය ගබඩා කර ගත යුතු අවම ජලධර ප්‍රමාණය ගණනය කර, මතුපිට ඇති ජල ධරයන් හා පාෂාණ තුළ ඇති ජලධරයන් ප්‍රතිපූර්ණ කිරීම උදෙසා ක්‍රමවේද (53) | ගාල්ල නගරයේ ජල සම්පාදන යෝජනා ක්‍රමයෙහි ආදායම් නොලබන ජල පරිභෝජනය අඩු කිරීම සහ කළමනාකරණය කිරීම පිණිස පුද්ගලික අංශයේ සහභාගිත්වයෙන් නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.<br><br>යෝජිත නියමු ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය උපදේශක සේවාව සලසා දීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟතාව පළ කර ඇති අතර, ඒ සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 1.28 ක ප්‍රදානයක් ලබාදීමට ද කැමැත්ත ප්‍රකාශ කර තිබේ (2025-02-19) | අර්ධ වශයෙන් උචිත | ජල ගබඩා අවශ්‍යතා ගණනය කිරීම හෝ ජල සම්පත් ප්‍රතිපූර්ණ කිරීම කෙරෙහි ප්‍රතිපත්ති ප්‍රකාශනයේ යොමුව එය සෘජුවම ආමන්ත්‍රණය නොකරයි. කෙසේ වෙතත්, මේ කරුණු දෙකම ජල තිරසරභාවය වැඩි දියුණු කිරීම අරමුණු කරයි, එබැවින් අර්ධ අනුකූල වේ. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 24 | ක්‍රීඩා | නීති විරෝධී ඖෂධ භාවිතය, තරග පාවාදීම් සහ වෙනත් වංචා ඇතුළු සියලු වංචා හා දූෂණ තුරන් කිරීමට යාන්ත්‍රණයක් (36)<br><br>ක්‍රීඩා ආචාරධර්ම පද්ධතියක් හා පවත්නා ක්‍රීඩා නීති යාවත්කාලීන කිරීම (36) | 2013 අංක 33 දරණ ක්‍රීඩා වල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත සංශෝධනය කිරීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකයට උපදෙස් දීම (2025-02-24) | උචිත | ක්‍රීඩා වලදී නීති විරෝධී මත්ද්‍රව්‍ය භාවිතය (උත්තේජක ද්‍රව්‍ය ගැනීම) සෘජුවම ආමන්ත්‍රණය කරන සහ පවතින ක්‍රීඩා නීති පද්ධතිය යාවත්කාලීන කිරීම හා සම්බන්ධ වන, ක්‍රීඩා වලදී තහනම් උත්තේජක භාවිතයට එරෙහි සම්මුති පනත සංශෝධනය කිරීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කිරීම මෙම ක්‍රියාකාරකමට ඇතුළත් වේ. |
| 25 | සෞඛ්‍යය | පවුල් වෛද්‍ය ඒකක ප්‍රදේශයන්හි රෝගීන්ට විශේෂිත සෞඛ්‍ය සේවා සැපයීම සඳහා පර්යන්ත සායනික සේවා (විශේෂිත උපදේශකයින්ගේ පැමිණීම්) ස්ථාපිත කිරීම (25) | සෞඛ්‍ය පද්ධතිය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා වන ආසියානු සංවර්ධන බැංකු ණය මුදලේ සහ ප්‍රදානයේ වලංගු කාල සීමාව 2025-11-30 දින දක්වාත්, ණය මුදල ගිණුම් පියවා අවසන් කිරීමේ දිනය 2026-05-31 දින දක්වාත් දීර්ඝ කිරීම (2025-03-03) | අර්ධ වශයෙන් උචිත | ණය කාල සීමාව දීර්ඝ කිරීම පුළුල් සෞඛ්‍ය පද්ධතිය වැඩි දියුණු කිරීමට සහාය වන නමුත්, නිශ්චිත ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් සමඟ අනුකූල වීම අරමුදල් භාවිතා කරන ආකාරය මත රඳා පවතී. |
| 26 | කලාව සහ සංස්කෘතිය | සංස්කෘතික උරුමයන් සංචාරක කර්මාන්තයේ සැලකිය යුතු කොටසක් බවට පත් කිරීම සහතික කිරීම සඳහා (translated by me) මෙම අංශය සමග සංචාරක කර්මාන්තය බද්ධ කිරීමට අවශ්‍ය වැඩසටහන් සැකසීම (45) | සංස්කෘතික ප්‍රකාශනයන්හි විවිධත්වය ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම පිළිබඳ යුනෙස්කෝ (2005) සම්මුතිය ශ්‍රී ලංකාව විසින් අපරානුමත කරනු ලැබීම පිණිස ප්‍රතිපත්තිමය අනුමැතිය ඉල්ලීම (2025-03-03) | අර්ධ වශයෙන් උචිත | යුනෙස්කෝ සම්මුතිය අනුමත කිරීම, සංස්කෘතික උරුමයන් සංරක්ෂණය කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ ජාතික හා ජාත්‍යන්තර රාමු තුළට ඒකාබද්ධ කිරීම යන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අරමුණු අනුපූරණය කරයි. |
| 27 | කර්මාන්ත | හඳුනාගත් වෘත්තීය ආයතන සඳහා කාර්යයේ ස්වභාවය අනුව සේවක සෞඛ්‍යාරක්ෂාව පිළිබඳ පරීක්ෂණයක් සිදුකොට සහතික පිරිනැමීම (25) | ජපාන රජයේ ආර්ථික හා සමාජ සංවර්ධන වැඩසටහන යටතේ ජපන් යෙන් මිලියන 300 ක (ආසන්න වශයෙන් රුපියල් මිලියන 590 ක) ප්‍රදානයක් මඟින් කටුනායක, බියගම, සීතාවක සහ වතුපිටිවල අපනයන සැකසුම් කලාප සඳහා ලීටර් 4000 ක ධාරිතාවයකින් යුත් ගිනි නිවන රථ 4 ක් සහ උපකරණ කට්ටල 12 ක් ලබාදීම (2025-03-17) | අර්ධ වශයෙන් උචිත | ක්‍රියාකාරකම් මඟින් සේවා ස්ථාන ආරක්ෂාවට වක්‍රව සහාය වන නමුත්, ආරක්ෂාව තක්සේරු කිරීම් සහ සහතික කිරීමේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්කය සම්පූර්ණයෙන්ම ආමන්ත්‍රණය නොකරයි. |
| 28 | ප්‍රසම්පාදනය | රාජ්‍ය සෞඛ්‍ය සේවා ආයතනවලට අවශ්‍ය සියලු ම අත්‍යවශ්‍ය ඖෂධ අඛණ්ඩව සැපයීම සහතික කිරීම (27)<br><br>නිසි තොග පවත්වා ගනිමින් ඖෂධ හිඟය වළක්වා ගැනීම (27) | අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත පදනම්ව, සාරානුකූලව ප්‍රතිචාර දක්වන ලද අවම ඇගයීමට ලක් කල ලංසුකරු වන ශ්‍රී ලංකාවෙහි M/s Lifecerll Interventions (Pvt) Ltd (Manufacturer - Gennova Biopharmaceuticals Limited, India) වෙත අදාළ කොන්ත්‍රාත්තුව (ටෙනෙක්ටිප්ලේස් 40 mg එන්නතින් වයල් 6000 ක් සැපයීම සඳහා ප්‍රසම්පාදනය) පිරිනැමීම (2025-03-17) | අතිශයින් උචිත | හිඟය වැළැක්වීම සහ තොග පවත්වා ගැනීම සඳහා අත්‍යවශ්‍ය ඖෂධ මිලදී ගැනීමෙන් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව මෙම ක්‍රියාකාරකම සෘජුවම ඉටු කරයි. අඛණ්ඩ සැපයුම සහතික කිරීම සඳහා ප්‍රසම්පාදනය ප්‍රධාන පියවරකි. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 29 | ප්‍රසම්පාදනය | දේශීය වශයෙන් ඖෂධ නිෂ්පාදනය පුළුල් කිරීම (27) | 2025 වර්ෂය සඳහා වෛද්‍ය සැපයීම් අංශය වෙත ශල්‍ය ගෝස් අවශ්‍යතාව මීටර් මිලියන 30 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. ශල්‍ය ගෝස් සලාක නිර්ණය කිරීමේ කමිටුව විසින් ලියාපදිංචි දේශීය නිෂ්පාදකයන් 282 දෙනෙකුගෙන් 2025 වසර සඳහා ශල්‍ය ගෝස් මීටර් මිලියන 30 ක් මිලදී ගැනීම නිර්දේශ කර තිබේ (2025-04-01) | උචිත | ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දේශීය නිෂ්පාදන ප්‍රයත්නයන් යටතේ වෛද්‍ය පරිභෝජන ද්‍රව්‍ය ඇතුළත් වන අතර එය බොහෝ ප්‍රතිපත්ති රාමු වල බහුලව දක්නට ලැබේ. |
| 30 | ජනමාධ්‍ය | සමස්ත ජනමාධ්‍ය ක්‍රියාවලිය ප්‍රශස්ත ලෙස පවත්වාගෙන යාම සඳහා ස්වාධීන ජනමාධ්‍ය කොමිෂන් සභාවක් (62) | ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පිහිටුවීමේ පනත් කෙටුම්පත සකස් කිරීමේ කාර්යය නිම කිරීම සඳහා වත්මන් රජයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබාදීම සඳහා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී (2025-04-07) | උචිත නොවන | ප්‍රතිපත්ති ප්‍රකාශනය සමඟ සම්පූර්ණයෙන්ම එකඟ නොවේ. නියාමනය සහ වගවීම කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රතිපත්ති ප්‍රකාශනය පුවත්පත් කලාව අධීක්ෂණය කිරීම සඳහා ස්වාධීන මාධ්‍ය කොමිසමක් ඉල්ලා සිටී. නමුත් කැබිනට් තීරණය මාධ්‍ය වෘත්තිකයන් හඳුනා ගැනීම සහ ප්‍රමිතිකරණය කිරීම අරමුණු කරගත් වෘත්තීය ආයතනයක් මිස ස්වාධීන අධීක්ෂණ කොමිසමක් නොවන වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පිළිබඳව වේ. |
| 31 | නිවාස | කොළඹ නගරයේ මුඩුක්කු සහ පැල්පත් නිවාසවල ජීවත්වන ජනතාවට රාජ්‍ය මැදිහත්වීමෙන් සුදුසු නිවාස 32) | දැනට නිවාස ඒකකයක් සඳහා ඉදිකිරීම් සහ නිවාස ලබාදෙන රුපියල් 650,000/- ක් වන රජයේ ආධාර මුදල රුපියල් 1,000,000/- ක් දක්වා වැඩි කිරීම අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී (2025-04-21) | අර්ධ වශයෙන් උචිත | රජයේ මැදිහත්වීම තුළින් කොළඹ අඩු ආදායම්ලාභී පදිංචිකරුවන්ට දැරිය හැකි මිලකට නිවාස පහසුකම් සැලසීමට ප්‍රතිපත්ති ප්‍රකාශනය කැපවී සිටී. නමුත් ප්‍රදානය වැඩි කිරීම යනු අඩු ආදායම්ලාභී පදිංචිකරුවන්ට නිවාස ලබා ගැනීමට උපකාර කිරීම අරමුණු කරගත් පැහැදිලි රජයේ මැදිහත්වීමකි. |
| 32 | අධ්‍යාපනය | පශ්චාත් උපාධි අධ්‍යාපනය සහ පර්යේෂණ ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය හා භෞතික සම්පත් සම්පාදනය (19) | ශ්‍රී ලාංකීය උපාධිධාරී සිසුන් සඳහා පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව අවස්ථා ලබාගැනීම ඇතුළු උසස් අධ්‍යාපනික සහයෝගිතාවන් ඇතිකර ගැනීම. යෝජිත අවබෝධතා ගිවිසුමට එළඹීම මගින් ශ්‍රී ලාංකීය සිසුන්ට සිංගප්පූරු ජාතික විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධි ඇතුළුව පශ්චාත් උපාධි හැදෑරීමටත්, ධාරිතා සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගිවීමටත්, ඒකාබද්ධ පර්යේෂණ සිදුකිරීමටත් අවස්ථාව හිමිවනු ඇත (2025-04-28) | උචිත | මෙම ක්‍රියාකාරකමට පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව, උසස් උපාධි (ආචාර්ය උපාධි ඇතුළුව), ධාරිතා වර්ධනය, සහ ඒකාබද්ධ පර්යේෂණ සඳහා අවස්ථා සපයන සහයෝගීතාවන් ස්ථාපිත කිරීම ඇතුළත් වේ. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 33 | පරිසරය | ගංවතුර, ලැව්ගිනි සහ නායයෑම් සඳහා පූර්ව සහ සක්‍රීය (Proactive and real-time alerts systems) අනතුරු ඇඟවීම් සඳහා ක්‍රියාකාරී ආපදා කළමනාකරණ පද්ධති සංවර්ධනය කිරීම (139) | ඉහළ බලපෑම් සහිත කාලගුණය, ගංවතුර හා නායයෑම් පුරෝකථනය සහ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ පළමු අදියරේ එක් සංරචකයක් වශයෙන් හඳුනාගනු ලැබ ඇත. එම සංරචකය ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය උපදේශන සේවා ලබාගැනීම පිණිස උපදේශක සමාගමක් තෝරා ගැනීම පිණිස උපදේශක සමාගමක් තෝරා ගැනීම සඳහා තරඟකාරී ලංසු කැඳවා ඇත (2025-05-19) | උචිත | තත්‍ය කාලීන ස්වභාවික ආපදා අනතුරු ඇඟවීමේ පද්ධති පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්කය සපුරා ගැනීම සඳහා පැහැදිලි ක්‍රියාත්මක කිරීමේ පියවරකි. |
| 34 | ජනමාධ්‍ය | ජනමාධ්‍ය හා සමාජ මාධ්‍ය ජාලා භාවිත කර පොත පත කියවීම, කලා රසවින්දනය පිළිබඳ මහජන අවකාශයෙහි කතිකාව තීව්‍ර කරමින් විසි එක්වෙනි සියවසෙහි සංස්කෘතිකවත් පුරවැසියා නිර්මාණය කිරීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (41) | දිනපතා ඉහළ යන රිය අනතුරු වළක්වා ගනිමින් මාර්ගය සැමට සුරක්ෂිත තැනක් බවට පත් කිරීම සඳහා පාසල් සිසුන් මූලික කරගෙන "Take Care - සුරැකෙමු මගතොට" යන තේමාව යටතේ දැනුවත් කිරීමේ ව්‍යාපෘතියක් පාසල් පදනම් කර ගනිමින් ක්‍රියාත්මක කිරීම පිණිස සැලසුම් කර තිබේ (2025-05-19) | උචිත නොවන | මෙම ක්‍රියාකාරකම පාසල් සිසුන් අතර මාර්ග ආරක්ෂාව පිළිබඳ දැනුවත්භාවය ආමන්ත්‍රණය කරයි, නමුත් මාධ්‍ය සහ සමාජ ජාල හරහා කලාව, සංස්කෘතිය හෝ මහජන කතිකාව ප්‍රවර්ධනය කිරීමේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්කයට දායක නොවේ. |
| 35 | ක්‍රීඩා | ක්‍රීඩා පනත සංශෝධනය කිරීම (35)<br><br>ක්‍රීඩා ආචාරධර්ම පද්ධතියක් හා පවත්නා ක්‍රීඩා නීති යාවත්කාලීන කිරීම (36) | ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය 2013 අංක 33 දරණ ක්‍රීඩා වල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ ප්‍රතිපාදන අනුව පිහිටුවා ඇති අතර ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ ප්‍රමිතීන් යටතේ ක්‍රියාත්මක වේ (2025-05-26) | උචිත | මෙම ක්‍රියාකාරකම ක්‍රීඩා ආශ්‍රිත නීති සහ චර්යා සංග්‍රහයන් සංශෝධනය කිරීම සහ යාවත්කාලීන කිරීම යන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්කයට සහය වේ. |
| 36 | ජනමාධ්‍ය | ප්‍රකාශනයේ නිදහසට බාධාවන වගන්තීන් ඉවත්කොට 2024 අංක 09 දරන මාර්ග ගත ක්‍රමවල සුරක්ෂිතතාව පිළිබඳ පනත සංශෝධනය කිරීම (61) | 2024 අංක 9 දරණ මාර්ගගත ක්‍රම වල සුරක්ෂිතභාවය පිළිබඳ පනත සංශෝධනය කිරීම (2025-05-26) | අතිශයින් උචිත | පොරොන්දු වූ පරිදි මාර්ගගත ආරක්ෂණ පනත සංශෝධනය කිරීමේ ක්‍රියාවලියට මුලපුරන බැවින්, ක්‍රියාකාරකම් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්කය සමඟ අනුකූල වේ. |

## සමාජ ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 01 | ආහාර සුරක්ෂිතතාව | තත්වානුරූපී තීරණය/අවම වශයෙන් මාස තුනකට ප්‍රමාණවත් අත්‍යවශ්‍ය ආහාර ස්වාරක්ෂක තොග පවත්වා ගැනීම (114) | තැම්බූ නාඩු සහල් වර්ගයට සමාන සහල් (ස්වර්ණ) වර්ගයෙන් සහල් මෙට්‍රික්ටොන් 70,000 ක් වහාම ආනයනය කිරීම (2024-11-25) | උචිත | ආහාර සුරක්ෂිතතාව සහ දැරිය හැකි මිල පවත්වා ගැනීමේ අභිප්‍රාය සපුරාලීම සඳහා නිවැරදි කිරීමේ හෝ හදිසි පියවරක් ලෙස මෙම ක්‍රියාව කටයුතු කරයි. |
| 02 | සමාජ ආරක්ෂණය | රටේ සියලු ම අංශවල ශ්‍රමිකයින්ට අදාළ වන පරිදි විශ්‍රාම වැටුප් පිළිබඳ පුළුල් ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම (69) | වැඩි කරන ලද විශ්‍රාමික දීමනා ගෙවීම පිණිස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත රුපියල් මිලියන 1,400 ක ප්‍රතිපාදන සලසා ගැනීම (2024-11-25) | අර්ධ වශයෙන් උචිත | ධැනට සිටින විශ්‍රාමිකයන්ට සහාය දක්වන නමුත් සියලුම සේවකයින් ආවරණය වන පරිදි පද්ධතිමය හෝ සමස්තය ඇතුළත් කරන ප්‍රතිපත්තියක් පිළිබිඹු නොකරයි. ආවරණය පුළුල් කිරීම හෝ නව හිමිකම් නිර්මාණය කිරීම නොකරයි. මෙය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණයක් නොව, මූල්‍ය ආධාර පියවරකි. |
| 03 | සමාජ ආරක්ෂණය | දැනට අස්වැසුම ප්‍රතිලාභ ලබන අඩු ආදායම්ලාභී පවුල් සඳහා මසකට අවම වටිනාකම රු10,000ක සහනාධාර මුදලක් (66) | දුප්පත් හා අන්ත දිළිඳු සමාජ කාණ්ඩ සඳහා දැනට ගෙවනු ලබන මාසික ප්‍රතිලාභ දීමනාව පිළිවෙලින් රුපියල් 8,500/- සිට රුපියල් 10,000/- දක්වාත්, රුපියල් 15,000/- සිට රුපියල් 17,500/- දක්වාත් වැඩි කිරීම සහ ඒ අනුව සංශෝධිත අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීම (2024-12-02) | අතිශයින් උචිත | මෙම ක්‍රියාකාරකම අඩු ආදායම්ලාභී පවුල් සඳහා ඉලක්කගත මූල්‍ය සහන ලබාදීම සඳහා වන NPP ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව පැහැදිලිව හා සෘජුව ක්‍රියාත්මක කිරීමකි. වැඩි කළ මුදල් ප්‍රමාණයන් සහ ව්‍යාප්ත වූ ආවරණයක් සහිත සංශෝධිත අස්වැසුම යෝජනා ක්‍රමය, ප්‍රතිපත්තිවලට අනුකූල වීම සහ ප්‍රධාන සමාජ ආරක්ෂණ පොරොන්දුවක් ඉටු කිරීම යන දෙකම නියෝජනය කරයි. |
| 04 | සමාජ ආරක්ෂණය | සමාජ සජීවීකරණය ඔස්සේ පවුල් සහ කුඩා කණ්ඩායම් මට්ටමින් ගැටලු හඳුනා ගැනීම, විශ්ලේෂණය සහ විසඳුම් සඳහා ව්‍යාපෘති හඳුනා ගැනීම (66) | 2025 වසරේ අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට පෙර, පාසල් ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා පාසල් ළමුන් සඳහා වූ දීමනාවක් ලබාදීම (2024-12-02) | අර්ධ වශයෙන් උචිත | මෙම ක්‍රියාකාරකම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දිළිඳුකමේ ලක්ෂණ (අධ්‍යාපන පිරිවැය බර) ආමන්ත්‍රණය කරන නමුත්, ප්‍රතිපත්ති ප්‍රකාශනය කැප වන ක්‍රියාවලීන් සහ යාන්ත්‍රණ හරහා නොවේ. අවදානමට ලක්විය හැකි පවුල් වලට සහය වීමේ අභිප්‍රාය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සමාජ ආරක්ෂණ ඉලක්ක සමඟ පුළුල් ලෙස අනුකූල වේ. |
| 05 | සමාජ ආරක්ෂණය | සමාජ සජීවීකරණය ඔස්සේ පවුල් සහ කුඩා කණ්ඩායම් මට්ටමින් ගැටලු හඳුනා ගැනීම, විශ්ලේෂණය සහ විසඳුම් සඳහා ව්‍යාපෘති හඳුනා ගැනීම (66) | දිවයින පුරා පිහිටි මුළු පාසල් 10,096 අතුරින් ළමුන් සංඛ්‍යාව 300 ට අඩු පාසල් 6,576 ක අස්වැසුම ප්‍රතිලාභී නොවන පවුල් වල සියලුම ළමුන්ට, ළමා සංවර්ධන මධ්‍යස්ථාන වල සිට පාසල් වෙත පැමිණෙන ළමුන්ට සහ පිරිවෙන් වල ඉගෙනුම ලබන ගිහි පැවිදි සිසුන්ට රුපියල් 6,000/- ක් බැගින් වූ ලිපිද්‍රව්‍ය දීමනාව ලබාදීමටත්, එකී දීමනාව වවුචර් පත්‍රයක් මඟින් ලබාදීමට (2025-01-06) | අර්ධ වශයෙන් උචිත | මෙම ක්‍රියාකාරකම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දරිද්‍රතාවය සහ අවදානම අඩු කිරීමේ අරමුණට අනුකූල වන නමුත්, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අවධාරණය කර ඇති පුළුල් ගෘහස්ථ විශ්ලේෂණය හෝ ප්‍රජා ව්‍යාපෘති පාදක ප්‍රවේශය එහි නොමැත. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 06 | සමාජ ආරක්ෂණය | සමාජ සජීවීකරණය ඔස්සේ පවුල් සහ කුඩා කණ්ඩායම් මට්ටමින් ගැටලු හඳුනා ගැනීම, විශ්ලේෂණය සහ විසඳුම් සඳහා ව්‍යාපෘති හඳුනා ගැනීම (66) | 2015 වර්ෂයේ සිට තෝරාගත් පාසල් සිසුන් සඳහා පාසල් පාවහන් යුගලක් ලබාදීමේ වැඩසටහන අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කර ඇති අතර, 2025 වර්ෂය සඳහා එකී වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පත් කරන ලද නිලධාරි කමිටුවකට නිර්දේශය මත පදනම්ව පහත සඳහන් පිරිදි පාසල් සිසුන්, පිරිවෙන් වල ගිහිපැවිදි සිසුන් හා සීලමාතාවන් සඳහා පාවහන් මිලදී ගැනීමට රුපියල් 3,000/- බැගින් තිළිණ පතක් ලබාදීම (2025-01-20) | අර්ධ වශයෙන් උචිත | දරිද්‍රතා සහන කෙරෙහි දායක වන නමුත් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රධාන යාන්ත්‍රණයන්- විශේෂයෙන්, ගෘහ මට්ටමේ හඳුනාගැනීම/විශ්ලේෂණය, ප්‍රජා-පාදක ව්‍යාපෘති සහ රාජ්‍ය-පෞද්ගලික/සමුපකාර අංශයේ සහභාගිත්වය නොමැත. |
| 07 | අධ්‍යාපනය | ජාතික විශ්වවිද්‍යාල පද්ධතිය උසස් න්‍යායික හා පර්යේෂණාත්මක අධ්‍යාපනය ලබාදෙන මධ්‍යස්ථාන බවට පත්කොට ජාත්‍යන්තර මට්ටමේ උසස් වෘත්තීය අධ්‍යාපනයක් ලබාදෙන සමාන්තර විශ්වවිද්‍යාලයීය පද්ධතියක් ඇති කිරීමට කටයුතු කෙරේ (18) | කොටගල වැවිලි සමාගම යටතේ පවතින සොරණ වතුයායට අයත් ඉඩමෙන් අක්කර 2.5 ක ප්‍රමාණයක් කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ ශ්‍රී පාලි මණ්ඩපය වෙත පවරා ගැනීම (2025-01-27) | අර්ධ වශයෙන් උචිත | එය ජාතික විශ්වවිද්‍යාල පද්ධතියේ යටිතල පහසුකම් පුළුල් කිරීමට දායක වන බැවින්, අනාගත අධ්‍යාපනික ප්‍රගමනය කිරීම් වලට ඉඩ සලසයි. |
| 08 | අධ්‍යාපනය | ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල පශ්චාත් උපාධි අධ්‍යාපනය ලබා ගැනීම සඳහා අවශ්‍ය ඉංග්‍රීසි භාෂා ඇතුළු අනෙකුත් මූලික සුදුසුකම් ලබා ගැනීම සඳහා සෑම තෘතීයික අධ්‍යාපන ආයතනයකම විශේෂ ඒකක පිහිටුවීම සහ එම ඒකක හරහා ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල පශ්චාත් උපාධි අධ්‍යාපන අවස්ථා ලබා ගැනීමට අවශ්‍ය සබඳතා පුළුල් කිරීම (19) | ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාල හා විදේශීය විශ්වවිද්‍යාල අතර අවබෝධතා ගිවිසුම් වලට එළඹීම<br><br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය හා මහජන චීන සමූහාණ්ඩුවේ වූහාන් ක්‍රීඩා විශ්වවිද්‍යාලය, ජපානයේ අයිසු විශ්වවිද්‍යාලය, නෝර්වේ ඇග්ඩර් විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියාවේ ඩීකින් විශ්වවිද්‍යාලය, මොරටුව විශ්වවිද්‍යාලය හා චීනයේ ලින්යී විශ්වවිද්‍යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා ඉන්දියාවේ මහත්මා ගාන්ධි වෛද්‍ය විද්‍යා හා තාක්ෂණ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය හා චීනයේ ෂැන්ඩොන්ග් විද්‍යා හා තාක්ෂණ විශ්වවිද්‍යාලය, කැළණිය විශ්වවිද්‍යාලය සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ කෝට්ලන්ඩ් හි නිව්යෝර්ක් රාජ්‍ය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සහ ඕස්ට්‍රේලියාවේ රෝයල් මෙල්බර්න් තාක්ෂණ ආයතනය, කැළණිය විශ්වවිද්‍යාලය සහ කොරියානු ජනරජයේ ජාතික කොරියානු සමුද්‍රීය සාගර විශ්වවිද්‍යාලය. | අර්ධ වශයෙන් උචිත | එය උසස් සෛද්ධාන්තික, පර්යේෂණාත්මක හෝ වෘත්තීය අධ්‍යාපනය පිළිබඳව ප්‍රතිපත්ති ප්‍රකාශනයේ නිශ්චිත අරමුණු සෘජුවම ක්‍රියාත්මක නොකරයි. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 09 | සමාජ ආරක්ෂණය | දැනට අස්වැසුම ප්‍රතිලාභ ලබන අඩු ආදායම්ලාභී පවුල් සඳහා මසකට අවම වටිනාකම රු10,000ක සහනාධාර මුදලක් සහභාගිත්ව, විනිවිද බවින් යුත්, සහ කාර්යක්ෂම ප්‍රතිලාභීන් තෝරාගැනීමේ ක්‍රියාවලියක් හඳුන්වාදීම ඩිජිටල් වේදිකාවක් ඔස්සේ ප්‍රතිලාභ ලැබිය යුතු සියලු ම ප්‍රතිලාභීන් නව නිර්ණායක භාවිත කරමින් වසරක් ඇතුළත හඳුනා ගෙන සුදුසුකම් ලබන සියල්ලටම මූල්‍ය සහනාධාර (66) | "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ජාතික ප්‍රතිපත්තියට අනුව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති දිළිඳු බව තුරන් කිරීමේ ජාතික ව්‍යාපාරය හා සමගාමීව, ග්‍රාමීය ව්‍යවසාය හා ජීවනෝපාය සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය හා ධාරිතා සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය හා ධාරිතා සංවර්ධනය හරහා ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීමේ අරමුණින් වඩාත් පුළුල් ප්‍රවේශයකින් යුතුය ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි සෞභාග්‍යා සංවර්ධන කාර්යාංශයේ ව්‍යුහය, විෂය පථය සහ කාර්යභාර්ය ප්‍රතිව්‍යුහගත කර, ග්‍රාමීය සංවර්ධන කාර්යාංශය ලෙස නම් කිරීම (2025-02-03) | අතිශයින් උචිත | ඩිජිටල් වේදිකා මුලපිරීම, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අරමුණු වන පාරදෘශ්‍ය, කාර්යක්ෂම ප්‍රතිලාභීන් තෝරා ගැනීම සහ මූල්‍ය ආධාර සැපයීම සමග සම්පූර්ණයෙන්ම අනුකූල වේ. කාර්යාංශයේ ප්‍රතිව්‍යුහගත කිරීම, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අරමුණු වලට සෘජුවම සහාය වෙමින්, වඩාත් පුළුල් ග්‍රාමීය සංවර්ධනය හරහා දරිද්‍රතාවය පිටුදැකීමේ ප්‍රයත්නයන්ට සහාය වේ. |
| 10 | ශ්‍රමය සහ රැකියා නියුක්තිය | නුපුහුණු ශ්‍රමිකයන් වෙනුවට කුසලතා පිරි පුහුණු ශ්‍රමිකයන් විදේශ රැකියාවලට යැවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග (73) | සුදුසුකම් ලබන ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ට එකී වැඩසටහන යටතේ උපරිම වශයෙන් වසර තුනක (03) කාලසීමාවක් තුළ වාර තුනක් (03) දක්වා සේවය කිරීමට හැකිවන පරිදි නියමු ව්‍යාපෘතියක් ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීම සඳහා කොරියානු ජනරජයේ අදාළ පළාත් සහ නගර සභා (ප්‍රාන්ත) සමඟ අවබෝධතා ගිවිසුම් වලට අත්සන් තැබීම, සහ නියමු ව්‍යාපෘතියෙහි සාර්ථකත්වය මත පදනම්ව එම වැඩසටහන ඉදිරියට පවත්වාගෙන යාම (2025-02-19) | අර්ධ වශයෙන් උචිත | ක්‍රියාකාරකමෙහි පුහුණුව ගැන පැහැදිලිව සඳහන් නොවුනත්, විධිමත් ගිවිසුම් සහ සුදුසුකම යන්නෙන් අදහස් කරන්නේ විදේශ රැකියාවලට යවන සේවකයින් නියාමනය කිරීමට සහ ඔවුන්ගේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට දරන උත්සාහයකි. |
| 11 | සමාජ ආරක්ෂණය | අවශ්‍ය අවස්ථාවන්හිදී විකල්ප නවාතැන් පහසුකම්, රැකියා සහ වෙනත් ආධාර (67) | තාවකාලික කාන්තා රැකවරණ නිවාසය ද කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟ ඒකාබද්ධව පවත්වා ගෙන යනු ලබන රැකවරණ නිවාස ජාලයට ඇතුළත් කර ගැනීම (2025-02-19) | අර්ධ වශයෙන් උචිත | මෙම ක්‍රියාකාරකම, අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා විකල්ප නිවාස ලබාගැනීමේ හැකියාව ඉහළ නැංවීම මගින්, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ මූලික අභිප්‍රායයට සහාය වෙමින් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්කයට හොඳින් අනුගත වේ. |
| 12 | ශ්‍රමය සහ රැකියා නියුක්තිය | රාජ්‍ය අංශයේ බඳවා ගැනීම්, උසස්වීම් සහ මාරුවීම් දේශපාලන මැදිහත්වීම්වලින් තොරව සුදුසුකම් සහ නිපුණතා මත (73) | අමාත්‍යාංශ 11 ක් යටතේ පවතින ආයතන වල සහ පළාත් සභා 05 ක පවතින පුරප්පාඩු 4,987 ක් අතුරින් පුරප්පාඩු 2,003 ක් සඳහා බඳවා ගැනීම් සිදු කිරීම (2025-02-19) | අර්ධ වශයෙන් උචිත | මෙම ක්‍රියාකාරකම රාජ්‍ය අංශයේ බඳවා ගැනීම් පිළිබඳව සාකච්ඡා කළද, ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් අවශ්‍ය කරන පරිදි, අනුගමනය කරන ලද ක්‍රියාවලිය කුසලතා මත පදනම් වූවක් ද සහ දේශපාලන මැදිහත්වීම් වලින් තොර ද යන්න පැහැදිලිව සඳහන් නොකරයි. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 13 | කාන්තාවන් සහ ළමුන් | ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව ඉපැයුම් අතර පරතරය (Gender wage gap) ඇතිවන අවස්ථා හඳුනා ගනිමින් එය අවසන් කිරීමට පියවර ගැනීම (77)<br><br>වැඩ කරන ස්ත්‍රීන් මුහුණ දෙන විශේෂිත සාධක හඳුනාගනිමින්, ඔවුන්ගේ සේවා සුරක්ෂිත බව තහවුරු වන පරිදි පවතින කම්කරු නීති හා ප්‍රතිපත්ති සංශෝධනය කිරීම සහ අවශ්‍ය නව නීති හඳුන්වාදීම (77)<br><br>වැඩ කරන ස්ත්‍රීන් මුහුණ දෙන විශේෂිත සාධක හඳුනාගනිමින්, ඔවුන්ගේ සේවා සුරක්ෂිත බව තහවුරු කිරීම (77)<br><br>ස්ත්‍රීන්ගේ ව්‍යවසායකත්ව අවස්ථා ඉහළ නැංවීම සඳහා ඔවුන්ට අවශ්‍ය බැංකු හා මූල්‍ය පහසුකම් (78)<br><br>ස්ත්‍රීන්ගේ වැටුප් නොලබන සුරැකුම් ශ්‍රමයේ බර අඩුකිරීම (78) | ජාත්‍යන්තර කාන්තා දින ජාතික සැමරුම ඇතුළත්ව ජාතික, පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (2025-02-24) | උචිත නොවන | ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීම දෘශ්‍යතාව සහ සවිබලගැන්වීමට සහාය වන අතර, ක්‍රියාකාරකම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අවධාරණය කර ඇති නිශ්චිත ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ හෝ මූල්‍ය සහයෝගය පැහැදිලිව ආමන්ත්‍රණය නොකරයි. |
| 14 | සමාජ ආරක්ෂණය | ප්‍රජා ශක්තිඃ දිළිඳුකම තුරන් කිරීම සහනාධාර වැඩසටහන (66) | නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුගතව 'පොහොසත් රටක් - සුරක්ෂිත ජීවිතයක්' යන දැක්ම සාක්ෂාත් කර ගැනීමට හැකිවන පරිදි බහුවිධ ප්‍රවේශයක් සහිත ඒකාබද්ධ වැඩසටහනක් වශයෙන් ''ප්‍රජා ශක්ති'' වැඩසටහන ක්‍රියාත්මක කිරීම (2025-02-24) | අතිශයින් උචිත | මෙම ක්‍රියාකාරකම, ප්‍රජාශක්ති දරිද්‍රතාවය පිටුදැකීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඇති කැපවීම ඍජුවම ඉටු කරයි. |
| 15 | ශ්‍රමය සහ රැකියා නියුක්තිය | රාජ්‍ය අංශයේ බඳවා ගැනීම්, උසස්වීම් සහ මාරුවීම් දේශපාලන මැදිහත්වීම්වලින් තොරව සුදුසුකම් සහ නිපුණතා මත (73) | රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කරමින් අවශ්‍යතා, ප්‍රමුඛතා හා කාලරාමු හඳුනාගෙන ඒ ආශ්‍රිතව අතවශ්‍යයෙන්ම සිදුකළ යුතු බඳවා ගැනීම් ප්‍රමාණයන් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම (2025-03-10) | අතිශයින් උචිත | කමිටු නිර්දේශ මත පදනම් වූ රාජ්‍ය අංශයේ බඳවා ගැනීම පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්කය ක්‍රියාකාරකම මගින් පිළිබිඹු කරයි. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 16 | සමාජ ආරක්ෂණය | අඩු ආදායම්ලාභී පවුල්වල ආබාධ සහිත පුද්ගලයින් සඳහා මසකට රුපියල් 10,000ක මූල්‍යාධාරයක් (67) | 2025 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු මඟින් වෙන් කරනු ලැබ ඇති ප්‍රතිපාදන තුළ, දැනට බලපවත්නා අස්වැසුම ප්‍රතිලාභ ගෙවීම් යෝජනා ක්‍රමය යටතේ ලබාදෙන ප්‍රතිලාභ පහත සඳහනා පරිදි සංශෝධනය කරමින් ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත් කිරීම:<br><br>අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් යෝජනා ක්‍රමයේ 1 වන උපලේඛනයේ අඩංගු සංක්‍රාන්තික සමාජ කාණ්ඩය<br><br>එකී යෝජනා ක්‍රමයේ 11 වන උපලේඛනයේ අඩංගු ආබාධ සහිත තැනැත්තන් සඳහා පිරිනමනු ලබන මාසික ආධාර මුදල සහ වකුගඩු ආධාර ලබන තැනැත්තන් සඳහා පිරිනමන මාසික ආධාර මුදල රුපියල් 7,500 සිට රුපියල් 10,000 දක්වා ඉහළ නැංවීම සහ වැඩිහිටි තැනැත්තන් සඳහා පිරිනමනු ලබන මාසික ආධාර මුදල රුපියල් 3,000 සිට රුපියල් 5.000 දක්වා ඉහළ නැංවීම සහ එම තීරණ 2025 අප්‍රේල් මස සිට ක්‍රියාත්මක කිරීම.<br><br>ආධාර ලබන ආබාධ සහිත තැනැත්තන් සඳහා දීමනාව, වකුගඩු රෝගී තැනැත්තන් සඳහා වන දීමනාව සහ වැඩිහිටි තැනැත්තන් සඳහා වන දීමනාව ඉහත යෝජනා වලට යටත්ව, ගෙවීම් කාලසීමාව 2025-12-31 දක්වා දීර්ඝ කිරීම.<br><br>2025 අප්‍රේල් මාසයෙන් පසු සංක්‍රාන්තික සමාජ කාණ්ඩය යටතේ දීමනා ගෙවීම නතර වුවත්, එම පවුල්වල සිටින ආබාධ සහිත තැනැත්තන්, වකුගඩු රෝගීන් සහ වැඩිහිටි පුද්ගලයින් සඳහා පිරිනමනු ලබන ප්‍රතිලාභ දීමනා ගෙවීම් කාලසීමාව 2025-12-31 දක්වා දීර්ඝ කිරීම (2025-03-17) | අතිශයින් උචිත | ආබාධිත දීමනාව රුපියල් 10,000 දක්වා ඉහළ නැංවීමෙන් සහ ආවරණය පුළුල් කිරීමෙන් ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූල වේ. |
| 17 | සමාජ ආරක්ෂණය | දැනට අස්වැසුම ප්‍රතිලාභ ලබන අඩු ආදායම්ලාභී පවුල් සඳහා මසකට අවම වටිනාකම රු10,000ක සහනාධාර මුදලක් (66) | අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය යටතේ දැනට ගෙවනු ලබන ප්‍රතිලාභ වල වටිනාකම් ඉහළ නංවමින් එම යෝජනා ක්‍රමය සංශෝධනය කිරීම (2025-04-01) | අර්ධ වශයෙන් උචිත | ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව කරා යන ප්‍රගතිය තවමත් පිළිබිඹු කරන නමුත්, වැඩිවීම රුපියල් 10,000 ට වඩා අඩු නම්, ප්‍රකාශිත ඉලක්කය සම්පූර්ණයෙන්ම සපුරා නොගනී. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 18 | ශ්‍රමය සහ රැකියා නියුක්තිය | රාජ්‍ය සේවයේ වැටුප් විෂමතා අවම කරන හා සේවකයා දිරිගන්වන ජාතික වැටුප් ව්‍යුහයක් (72) | 2025-04-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රුපියල් 17,500/- සිට රුපියල් 27,000/- දක්වා රුපියල් 9,500/- කින් ජාතික අවම මාසික වේතනය ඉහළ නැංවීම් 2025-04-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජාතික අවම දෛනික වේතනය රුපියල් 700/- සිට රුපියල් 1,080/- දක්වා රුපියල් 380/- කින් ඉහළ නැංවීම් 2026-01-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රුපියල් 27,000/- සිට රුපියල් 30,000/- දක්වා රුපියල් 3,000/- කින් ජාතික අවම මාසික වේතනය ඉහළ නැංවීම් 2026-01-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජාතික අවම දෛනික වේතනය රුපියල් 1,080/- සිට රුපියල් 1,200/- දක්වා රුපියල් 120/- කින් ඉහළ නැංවීම (2025-04-07) | අතිශයින් උචිත | මෙය විශේෂයෙන් අවම වැටුප් පිළිබඳව වන අතර, එය විශේෂයෙන් අඩු ආදායම්ලාභී සේවකයින් සඳහා වඩා පුළුල් ජාතික වැටුප් ව්‍යුහයේ තීරණාත්මක කොටසක් ලෙස කටයුතු කරයි. |
| 19 | ශ්‍රමය සහ රැකියා නියුක්තිය | විධිමත් ක්‍රමවේදයක් යටතේ පහත පරිදි කඩිනමින් රැකියා ලබාදීමට පියවර ගැනෙනු ඇත. ඉන්පසුව, ආර්ථිකය පුළුල් වන විට උපාධිධාරීන් සඳහා නව රැකියා අවස්ථා නිර්මාණය කිරීම සඳහා යාන්ත්‍රණයක් සකස් කෙරේ (73) | "2025 අයවැය මගින් යෝජිත රැකියා විරහිත උපාධිධාරීන් සහ තරුණ තරුණියන් 30,000 ක් රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ වැඩපිළිවෙල" යටතේ බඳවා ගැනීම (2024-04-07) | අතිශයින් උචිත | දිගුකාලීන රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා ලබාදීමේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව එය ඉටු කරයි. එය පුළුල් ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීමේ පළමු අදියර නියෝජනය කරයි. |
| 20 | කාන්තාවන් හා ළමුන් | ළමා හා තරුණ පුද්ගලයින්ගේ ආඥාපනත, ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥාපනත, අයාල ආඥාපනත, අනාථ නිවාස ආඥාපනත වැනි යල් පැන ගිය නීති සමාලෝචනය කිරීම, සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම (83) | නව රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුවෙහි 'සුරක්ෂිත ළමා ලෝකයක් - නිර්මාණශීලී අනාගත පරපුරක්' ප්‍රතිපත්තිමය බැඳියාවෙහි ප්‍රධාන මූලධර්මයක් වශයෙන් දරුවන්ට සිදුවන අපයෝජන සහ සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්වයන්ගෙන් දරුවන් ආරක්ෂා කිරීම හඳුනාගනු ලැබ ඇත (2025-05-26) | උචිත | එය දරුවන් අතර මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා අඩිතාලම වන අපයෝජනයෙන් සහ ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂා වීම කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ මූලික මූලධර්මයක් ආමන්ත්‍රණය කරයි. |
| 21 | ශ්‍රමය සහ රැකියා නියුක්තිය | රාජ්‍ය අංශයේ බඳවා ගැනීම්, උසස්වීම් සහ මාරුවීම් දේශපාලන මැදිහත්වීම්වලින් තොරව සුදුසුකම් සහ නිපුණතා මත (73) | රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්යමණ්ඩල කළමනාකරණය සඳහා, රේඛීය අමාත්‍යාංශ 18 ක, පළාත් සභා 04 ක සහ විශේෂ වියදම් ඒකක 02 ක තනතුරු පුරප්පාඩු 15,073 ක් සඳහා බඳවා ගැනීම නිර්දේශ කර ඇත (2025-05-26) | උචිත | මෙම ක්‍රියාකාරකම බඳවා ගැනීමේ ක්‍රියාවලීන් වැඩි දියුණු කිරීමට සහාය වන නමුත් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් පරිදි කුසලතාවාදය බලාත්මක කිරීම සහ දේශපාලන මැදිහත්වීම් වැළැක්වීම පිළිබඳ නිශ්චිත සාක්ෂි නොමැත. |

## ආර්ථික ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 01 | ණය ප්‍රතිව්‍යුහගතකරණය | ණය තිරසර බව පවත්වා ගැනීම හා දරාගත හැකි මට්ටමක ණය පොලී තබා ගැනීම ඉලක්ක කරගනිමින්, අවශ්‍යතාවය අනුව ණය සමාලෝචන කටයුතුවලදී භාවිත කිරීම සඳහා විකල්ප ණය තිරසරකරණ විශ්ලේෂණයක් පිළියෙළ කිරීම (106) | ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ස්වෛරීත්ව ණය සංයුතිය, ආයෝජකයින් සහ පියවීම් සම්බන්ධයෙන් කරුණු සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා ආර්ථිකයට සිදු කරනු ලබන බලපෑම පිළිබඳව ශ්‍රී ලංකා රජයේ මූල්‍ය හා නීති උපදේශකයින් විසින් සිදු කරන ලද විශ්ලේෂණයකින් අනතුරුව සහ ශ්‍රී ලංකාව සඳහා වන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ වන විධිවිධාන පරිදි එම අරමුදල විසින් සිදු කරනු ලබන ණය තිරසර විශ්ලේෂණය මඟින් පෙන්වා දෙන ලද පරාමිතීන්ට අනුව, දැනට පවතින බැඳුම්කර සඳහා නව බැඳුම්කර හුවමාරු කිරීමේ මාර්ගයෙන් ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර ප්‍රතිව්‍යුහගතකරණය සඳහා (2024-11-25) | අර්ධ වශයෙන් උචිත | විකල්ප DSA භාවිතය (ප්‍රකාශනයට අනුව) පැහැදිලිව සඳහන් කර නැතත්, ක්‍රියාවෙන් පෙන්නුම් කරන්නේ ප්‍රතිව්‍යුහගත කිරීමේදී ණය තිරසරකරණ විශ්ලේෂණය DSA යොදාගැනීමයි. |
| 02 | ප්‍රවාහනය | ප්‍රමුඛතා ලේඛනයකට අනුව මාර්ග තිරසාරව නඩත්තු කිරීම (174) | විදේශ ණය මූල්‍යකරණය යටතේ වෙනු කරනු ලැබ ඇති ප්‍රතිපාදන ඉතිරිවීම් වෙනුවට, දේශීය මූල්‍යකරණය යටතේ අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන සලසා ගැනීම පිණිස පරිපූරක ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදීම (2024-12-02) | අර්ධ වශයෙන් උචිත | මූල්‍ය යාන්ත්‍රණ ආමන්ත්‍රණය කර ඇත. නමුත් මාර්ග නඩත්තුවේ උපායමාර්ගික ප්‍රමුඛතාවය නොවේ, නමුත් නඩත්තු කටයුතු ගැන සෘජුවම සඳහන් නොකරයි. |
| 03 | ආහාර සුරක්ෂිතතාව | තත්වානුරූපී තීරණය/අවම වශයෙන් මාස තුනකට ප්‍රමාණවත් අත්‍යවශ්‍ය ආහාර ස්වාරක්ෂක තොග පවත්වා ගැනීම (114) | ආනයන පාලන බලපත්‍ර ලබා ගැනීමකින් තොරව 2024-12-20 දින දක්වා මෙරටට සහල් ආනයනය කිරීම සඳහා වහාම ක්‍රියාත්මක වන පරිදි අවසර ලබාදීම (2024-12-02) | උචිත | ආනයන බලපත්‍ර අත්හැරීමේ ලේඛනය යනු ප්‍රමාණවත් සංචිත හරහා ආහාර සුරක්ෂිතතාව සහතික කිරීමේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ උපායමාර්ගික ඉලක්කය සපුරා ගැනීම සඳහා වන උපාය පියවරකි. විශේෂයෙන් හිඟයන් හෝ වෙළඳපල අස්ථාවරත්වය අතරතුර, මෙවැනි ආනයන පහසුකම් සැපයීම අවශ්‍ය වේ. විශේෂයෙන් හිඟයන් හෝ වෙළඳපල අස්ථාවරත්වය අතරතුර මෙවැනි ආනයන පහසුකම් සැපයීම අවශ්‍ය වේ. ප්‍රමාණවත් සහල් ලබාගැනීම සහතික කිරීම මඟින් මෙම ක්‍රියාකාරකම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ආහාර සුරක්ෂිතතා ඉලක්කයට සෘජුවම සහාය වේ. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 04 | ආහාර සුරක්ෂිතතාව | රටේ පවතින ආහාර තොග පිළිබඳව දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම (114) | ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය සහතික කිරීම සඳහා සම්බන්ධිත සියලුම ආයතනයන්හි සහභාගිත්වය සහිත, දත්ත හා තොරතුරු මත පදනම් වූ විද්‍යාත්මක විශ්ලේෂණයන් තුළින් ප්‍රතිපත්තිමය මඟපෙන්වීම ලබාදීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාදෙන ලදී (2024-12-09) | අතිශයින් උචිත | විශේෂයෙන් ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය වැඩි දියුණු කිරීම සඳහා විද්‍යාත්මක, දත්ත මඟින් දැනුවත් වූ තොරතුරු සහ බහු-ආයතනික ප්‍රවේශයන් ප්‍රවර්ධනය කිරීමේදී, මෙය ආහාර තොග තත්‍ය-කාලීනව නිරීක්ෂණය කිරීම හරහා දත්ත මත පාදක වූ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වේ. |
| 05 | ප්‍රවාහය | රියදුරු බලපත් ලබාදීමේ සහ බලපත් අලුත් කිරීමේ ක්‍රමවේදය විධිමත් කිරීම (175) | ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කරන ලද යෝජනා සැලකිල්ලට ගෙන දැනට භාවිතා කරනු ලබන රියදුරු බලපත්‍රය වෙනුවට නව ඩිජිටල් රියදුරු බලපත්‍රයක් කඩිනමින් හඳුන්වා දීම පිණිස අවශ්‍ය පියවර ගැනීමට සහ එතෙක් රියදුරු බලපත්‍ර නිකුත් කිරීම සඳහා දැනට අනුගමනය කරනු ලබන ක්‍රමවේදය තවදුරටත් ක්‍රියාත්මක කිරීමට (2024-12-09) | අතිශයින් උචිත | අමාත්‍ය යෝජනා සහ අඛණ්ඩව යන ක්‍රමවේදය, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් යහපාලන මූලධර්ම වලට අනුකූලව ව්‍යූහගත සහ උපදේශාත්මක ප්‍රවේශයක් පෙන්නුම් කරයි. ඩිජිටල්කරණය සහ ක්‍රමවේදය තවත් ඔපලීම වඩාත් ක්‍රමානුකූල, පාරදෘශ්‍ය සහ කාර්යක්ෂම බලපත්‍ර නිකුත්කිරීමේ ක්‍රියාවලියකට සෘජුවම දායක වේ. |
| 06 | ව්‍යවසායකත්වය | ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ ආර්ථික කටයුතු යථාතත්වයට පත්කිරීම හා හිඟ ණය සඳහා සහන සැලසීමට නව සහන බැංකුවක් ස්ථාපිත කිරීම (105) | පසුගිය වසර 04 ක කාලය තුළ ශ්‍රී ලංකාව මුහුණ දුන් ආර්ථික අර්බුදය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට දැඩි ලෙස බලපා ඇති අතර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් විසින් බැංකු වලින් ලබාගත් ණය පියවීමේදී දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදුව ඇති බව වාර්තා වී ඇත.2025-03-31 දින දක්වා පරාටේ නීතිය ක්‍රියාත්මක කිරීම අත්හිටුවීම දීර්ඝ කිරීම සහ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රාජ්‍ය හා පෞද්ගලික බැංකු සහ අනෙකුත් රාජ්‍ය ආයතන ඇතුළු සියලුම පාර්ශවකරුවන්ගේ සක්‍රීය දායකත්වයෙන් මෙම ගැටලුව විසඳීමට බහුමාන යාන්ත්‍රණයක් සකස් කිරීම (2024-12-09) | අර්ධ වශයෙන් උචිත | ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ආරක්ෂා කිරීම සහ ඒවාට සහාය දීමේ අරමුණ පැහැදිලිව බෙදාහදාගෙන ඇතත්, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ වඩාත් ව්‍යුහාත්මක, ආයතනික ප්‍රවේශයක් (කැපවූ සහන බැංකුවක් හරහා) අපේක්ෂා කරයි. එහෙත් කැබිනට් මණ්ඩලයේ ක්‍රියාමාර්ගය ක්‍රියා පටිපාටිමය සහ තාවකාලික වන අතර, ක්ෂණික අවදානම් අවම කිරීම සහ බහු පාර්ශ්වකරුවන්ගේ සම්බන්ධීකරණය අරමුණු කර ගෙන ඇත. |
| 07 | කෘෂිකර්මාන්තය | සාධාරණ මිලට පොහොර ඇතුළු කෘෂි යෙදවුම් ලබා දීම (116) | ලෝක ආහාර වැඩසටහන යටතේ මියුරියේට් ඔෆ් පොටෑෂ් පොහොර මෙට්‍රික් ටොන් 55,000 ක් ප්‍රදානයක් වශයෙන් ශ්‍රී ලංකා රජය වෙත ලබා ගැනීම (2024-12-09) | අර්ධ වශයෙන් උචිත | ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සාධාරණ මිලකරණය අවධාරණය කළ ද, පරිත්‍යාගයක් ලෙස පොහොර ලැබීම ප්‍රසම්පාදන පිරිවැය අඩු කිරීමෙන් මෙම ඉලක්කයට සහාය වන අතර, එමඟින් රජයට අඩු පිරිවැයකින් බෙදා හැරීමට හෝ තවදුරටත් සහනාධාර ලබාදීමට ඉඩ සලසයි. |
| 08 | ඩිජිටල් ආර්ථිකය | පුරවැසියන්ට විනිවිදභාවයෙන් හා කාර්යක්ෂම සේවා සැපයීම සඳහා ප්‍රතිචාරාත්මක රාජ්‍ය අංශයක් බිහිකිරීම උදෙසා ප්‍රධාන රාජ්‍ය ආයතන ඩිජිටල්කරණය කිරීම (133) | ඩිජිටල් සංවර්ධන ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය කිරීම සහ ඩිජිටල් සංවර්ධන විසඳුම් ක්‍රියාත්මක කිරීමේදී ඉන්දියාව සහ ශ්‍රී ලංකාව දෙරට අතර ආයතනික සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම (2024-12-18) | උචිත | විස්තර කර ඇති ක්‍රියාකාරකම මඟින් නිලධාරීන්ගේ ඩිජිටල් විපර්වර්තනයේ ධාරිතාව ගොඩනැගීම සහ ආයතනික සහයෝගිතාව පෝෂ්‍ය කිරීම ඩිජිටල්කරණයේ මුලපිරීම් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට සහාය වේ. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 09 | පශු සම්පත් | කිරි නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා මහා පරිමාණ ගොවිපළ පද්ධතියක් (120) | පුං ගවයන් ආනයනය කර ගව ශුක්‍ර නිෂ්පාදනය කරන තෙක් සහිවාල් ගව ශුක්‍ර වඩි 20,000 ක් ඉන්දියාවේ ජාතික කිරි සංවර්ධන මණ්ඩලයෙන් රජයකින් රජයකට ගනුදෙනුවක් ලෙස මිලදී ගැනීම (2024-12-18) | උචිත | දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමේ ඉලක්කයට දායක වන අතර, එබැවින් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දිගුකාලීන කෘෂිකාර්මික සංවර්ධන උපායමාර්ගයට අදාළ, ස්ථාවර සහ සහාය වේ. |
| 10 | ප්‍රසම්පාදනය | දේශීය ලංසුකරුවන්ගේ සහභාගිත්වය වැඩි කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි විනිවිදභාවය සහතික කිරීම (191) | ප්‍රසම්පාදනයන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ අධිකාරී සීමාව ඉක්මවා යන බැවින්, එම ප්‍රසම්පාදන කටයුතු අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව වෙත යොමු කළ යුතුව ඇත (2024-12-18) | උචිත | අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව පාරදෘශ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලීන් සහතික කර දේශීය ලංසුකරුවන් දිරිමත් කරන්නේ නම්, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්කය සමඟ, යොමු කිරීමේ ක්‍රියාවලියම පරස්පර විරෝධී නොවන නමුත් පාරදෘශ්‍යභාවය සහ සහභාගිත්වය ශක්තිමත් කළ යුතු ය. |
| 11 | ප්‍රසම්පාදනය | දේශීය ලංසුකරුවන්ගේ සහභාගිත්වය වැඩි කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි විනිවිදභාවය සහතික කිරීම (191) | ඉදිකිරීම් ද්‍රව්‍ය වල පිරිවැය ඉහළ යාම සහ එකතු කළඅගය මත බද්ද (VAT) සංශෝධනය කිරීම වැනි කරුණු හේතුවෙන් ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන වෙන් කර ගැනීම (2024-12-18) | උචිත නොවන | එහි වර්තමාන වචන වලින්, එය ප්‍රසම්පාදන පාරදෘශ්‍යභාවය හෝ ලංසුකරුවන්ගේ සහභාගිත්වයට වඩා අයවැය ගැලපීම් කෙරෙහි අවධානය යොමු කරයි. |
| 12 | බදු | අපනයන භාණ්ඩ හා සේවා විවිධාංගීකරණය ප්‍රවර්ධනය කිරීම සහ අවශ්‍ය යටිතල පහසුකම් (109) | ක්ලින්කර්, සිමෙන්ති තොග සහ සිමෙන්ති වල සිල්ලර වෙළෙඳ ඇසුරුම් වශයෙන් ඇති බෑග් ආනයනය කිරීමේදී කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 1/- බැගින් සෙස් බද්ද අඩු කිරීමටත්, ඉදිකිරීම් කාර්යයන් සඳහා මෙට්‍රික් ටොන් මිලියන 1 ක් දක්වා ප්‍රමාණයක් කලුගල් කුට්ටි අපනයනය කිරීමට සහ කියුබික් මීටර 1 ක් සඳහා රුපියල් 1,000/- ක අනු ප්‍රමාණයකින් යුත් සෙස් බද්දක් නියම කර අය කර ගැනීම (2024-12-18) | උචිත නොවන | (ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කර ඇති පරිදි) යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ නිශ්චිත සඳහනක් නොමැත. නමුත් අනුකූලවීම රඳා පවතින්නේ ඇණවුමෙහි අඩංගු දේ නව අංශ හෝ සේවාවන් සඳහා සහය දක්වන්නේ ද යන්න මත ය. |
| 13 | දූෂණ විරෝධී | රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණය විධිමත් කිරීම මගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය (FIU) ශක්තිමත් කිරීම (105) | මුදල් විශුද්ධිකරණය වැළැක්වීම පිණිස, 2025 වසරේදී සිදු කිරීමට නියමිත ශ්‍රී ලංකාව පිළිබඳ අන්‍යෝන්‍ය ඇගයීමේදී යහපත් ස්ථානයක් ලබාගැනීම උදෙසා භාර ආඥා පනතේ විධිවිධාන සංශෝධනය කිරීමේ අවශ්‍යතාව පෙන්වා දී ඇත (2024-12-18) | උචිත | එය මූල්‍ය බුද්ධි ඒකකයෙහි (IFU) වඩා පුළුල් ඉලක්ක වලට සහාය දක්වන නමුත් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ නිශ්චිත පොරොන්දුව සෘජුවම ක්‍රියාත්මක නොකරයි. පූර්ණ අනුකූලවීම සඳහා ආයතනික ශක්තිමත් කිරීම සහ FIU සම්බන්ධ අන්තර්-නියෝජිතායතන සම්බන්ධීකරණ යාන්ත්‍රණයන් කෙරෙහි අවධානය යොමු කරන ප්‍රතිසංස්කරණ අවශ්‍ය වේ. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 14 | ආහාර සුරක්ෂිතතාව | අවම වශයෙන් මාස තුනකට ප්‍රමාණවත් අත්‍යවශ්‍ය ආහාර ස්වාරක්ෂක තොග පවත්වා ගැනීම (114) | සකස් කර වෙළෙඳ පොළට සැපයීම පිණිස පවතින තීරු බදු අනුපාතය අනුව අමු අයඩීකරණය නොකළ ලුණු මෙට්‍රික් ටොන් 30,000 ක උපරිමකට යටත්ව ආනයනය කිරීම (2024-12-18) | අර්ධ වශයෙන් උචිත | එය අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය පැවතීම සහතික කිරීමේ වඩා පුළුල් ඉලක්කයට සම්බන්ධ වේ. නමුත් එය මාස 3 ක තොගයක් ක්‍රමානුකූලව පවත්වා ගැනීම සඳහා වන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම ඉටු නොකරයි. එය ශාරීරික හා සංජානන සංවර්ධනය සඳහා ප්‍රධාන කාල පරිච්ඡේදයක් වන කලින් මැදිහත්වීම ඉලක්ක කරයි. පෝෂණ සහයෝගය වැඩි කිරීමෙන්, එය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සෞඛ්‍ය සහ පෝෂණ තත්ත්වය වැඩි දියුණු කිරීමේ ඉලක්ක දෙකටම අනුකූල වීමෙන් මන්දපෝෂණය ආමන්ත්‍රණය කරයි. |
| 15 | ආර්ථිකය | බදු පරිපාලනය කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය නීති ප්‍රතිසංස්කරණ සිදු කිරීම (103) | අදාළ බද්ද පරිච්පින්න කිරීම සඳහා වන 2024-03-25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක නොකිරීමටත්, 2007 අංක 48 දරණ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතට යටත් වන භාණ්ඩ සඳහා විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු අනු ප්‍රමාණ 2025-01-01 දින සිට අඛණ්ඩව බලාත්මක කර පවත්වා ගෙන යාම (2024-12-18) | අර්ධ වශයෙන් උචිත | මෙම ක්‍රියාකාරකම පිළිබිඹු කරන්නේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ විස්තර කර ඇති පරිදි ප්‍රතිසංස්කරණ මුලපිරීමක් නොව, සාමාන්‍ය බදු බලාත්මක කිරීමකි. |
| 16 | ආහාර සුරක්ෂිතතාව | අවම වශයෙන් මාස තුනකට ප්‍රමාණවත් අත්‍යවශ්‍ය ආහාර ස්වාරක්ෂක තොග පවත්වා ගැනීම (114) | ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාවයෙන් තොරව පුද්ගලික අංශයේ ආනයනකරුවන්ට සහල් ආනයනය කිරීම සඳහා අවසර ලබාදී ඇති කාලසීමාව 2025-01-10 දින තෙක් දීර්ඝ කිරීම (2024-12-23) | අර්ධ වශයෙන් උචිත | ආනයන සීමා ලිහිල් කිරීම මගින් සහල් ආනයනයට පහසුකම් සැලසීම මෙම ක්‍රියාකාරකමේ අරමුණ වන අතර, එමගින් රට තුළ ප්‍රමාණවත් සහල් තොග පවත්වා ගැනීමට උපකාරී වේ. නමුත් පුද්ගලික අංශයේ ආනයනකරුවන්ට ආයතන පාලන බලපත්‍ර නොමැතිව සහල් ආනයනය කිරීමට ඇති කාලය 2025-10-01 දක්වා දීර්ඝ කරයි. |
| 17 | ප්‍රසම්පාදනය | දේශීය ලංසුකරුවන්ගේ සහභාගිත්වය වැඩි කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි විනිවිදභාවය සහතික කිරීම (191) | අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත පදනම්ව 2025-04-01 දින සිට 2025-08-31 දින දක්වා කාලය තුළ මර්බන් වර්ගයේ බොර තෙල් නැව් තොග 06 ක් මිලදී ගැනීම (2024-12-23) | උචිත නොවන | මර්බන් වර්ගයේ බොරතෙල් මිලදී ගැනීම බොහෝ විට ජාත්‍යන්තර ප්‍රසම්පාදනයකට සම්බන්ධ වන අතර, එහිදී දේශීය ලංසුකරුවන්ගේ සහභාගිත්වය අදාළ නොවේ නැතහොත් සඳහන් නොවේ. |
| 18 | බදු | බදු පරිපාලනය කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය නීති ප්‍රතිසංස්කරණ සිදු කිරීම (103) | 2007 අංක 48 දරණ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයන් පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම (2024-12-23) | උචිත නොවන | තමම ද්වයම බදුකරණයට අදාළ වුවද, ක්‍රියාකාරකම කටයුතු කරන්නේ සාමාන්‍ය බදු අනුපාත වෙනස්කම් සමඟ මිස, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් පරිදි බදු පරිපාලන කාර්යක්ෂමතාව සඳහා වන ව්‍යුහාත්මක නීතිමය ප්‍රතිසංස්කරණ සමඟ නොවේ. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 19 | විදේශ කටයුතු | එක් එක් සිදුවීම් අනුව ජාත්‍යන්තර ගැටලු සම්බන්ධයෙන් ස්වාධීන ස්ථාවරයක් පවත්වා ගැනීම සහ කිසිදු හමුදා සන්ධානයකට සම්බන්ධ නොවීම හෝ බලපෑමට යටත් නොවීම (220) | මෙරට දේශීය ජල තීරය සහ මහ මුහුදේ නීති විරෝධී, වාර්තා නොවූ සහ අවිධිමත් ධීවර මෙහෙයුම් සම්බන්ධ ගැටලු පිළිබඳ ව්‍යවස්ථාදායක රාමුව ශක්තිමත් කිරීම උදෙසා එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ තාක්ෂණික සහාය ද ඇතිව ධීවර අමාත්‍යාංශයේ නිලධාරීන් මෙන්ම නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ, නීතිපති දෙපාර්තමේන්තුවේ සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් විසින් මූලික කෙටුම් පතක් සකස් කරනු ලැබ ඇත (2024-12-23) | අතිශයින් උචිත | එය නීතිමය ක්‍රියාමාර්ග හරහා ශ්‍රී ලංකාවේ භෞමික ජල තීරයේ ස්වෛරීභාවය ආරක්ෂා කිරීමට දායක වේ. |
| 20 | වෙළඳ | අන්තර් නෞකාකරණය (Transshipment), අන්තර් ගොඩබෑම් (Transload), නැවෙන් නැවට භාණ්ඩ මාරු කිරීම (Ship to Ship Cargo Transfer), හා තටාංග මාරුකිරීම් (Cross Docking) පහසුකම් සහිත කාර්යක්ෂම සේවා සපයන කලාපීය ලොජිස්ටික් කළමනාකරණ කේන්ද්‍රස්ථානයක් සඳහා වරාය පහසුකම් දියුණු කිරීම (108) | බහාලුම් නිදහස් කිරීම සඳහා දැනට අනුගමනය කරනු ලබන ක්‍රමවේදයේ කාර්යක්ෂමතාව තවදුරටත් වැඩි දියුණු කරමින් කිසිදු ප්‍රමාදයකින් තොරව වරායෙන් බහාලුම් නිදහස් කිරීම වෙනුවෙන් යෝග්‍ය ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය පියවර ගැනීම (23-12-2024) | අර්ධ වශයෙන් උචිත | එය සැපයුම් මධ්‍යස්ථානයක් ලෙස වරාය සංවර්ධනය කිරීමේ වඩා පුළුල් ඉලක්කයට සහාය වෙමින් මෙහෙයුම් කාර්යක්ෂමතාව ආමන්ත්‍රණය කරයි, නමුත් එය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් වඩා පුළුල් පරාසයක සේවාවන් සම්පූර්ණයෙන්ම සපුරාලන්නේ නැත. |
| 21 | ප්‍රසම්පාදනය | දේශීය ලංසුකරුවන්ගේ සහභාගිත්වය වැඩි කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි විනිවිදභාවය සහතික කිරීම (191) | කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි පිටත්වීමේ/සංක්‍රමණ ප්‍රදේශය තුළ ප්‍රසිද්ධ වෙළෙඳ සන්නාම වලට අයත් කාන්තා හා පිරිමි යන දෙපාර්ශවයේම ඇඟලුම් සහිත අලෙවි සැල් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත පදනම්ව, අනෙකුත් අලෙවිසැල් සඳහා නැවත ලංසු කැඳවීම අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී (30-12-2024) | උචිත නොවන | සුදුසුකම් නිර්ණායක ලිහිල් කිරීම, දේශීය මනාපයන් පිරිනැමීම හෝ පුළුල් දේශීය ප්‍රචාරයක් සහතික කිරීම වැනි දේශීය සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා පියවර ඇතුළත් නොකළහොත් යළි ආරාධනා කිරීමේ ක්‍රියාවලිය ඇති කරනු ලබන්නේ සීමිත බලපෑමකි. |
| 22 | බලශක්තිය | ශ්‍රී ලංකාව කලාපයේ අවම විදුලි මිල සහිත රටක් බවට පත් කිරීම සඳහා තරගකාරී ප්‍රසම්පාදන හා මිල කැඳවීම් ක්‍රියාවලිය සක්‍රීය කර, තෙල් මත පදනම් වූ විදුලි ජනනය අඩු මිලැති සූර්ය හා සුළං ප්‍රමුඛ පුනර්ජනනීය ප්‍රභවයන් වෙත යොමු කිරීම (166) | තිරසර සහ සුරක්ෂිත විදුලි බල ක්ෂේත්‍රයක් ස්ථාපිත කිරීම සඳහා උනන්දුවක් දක්වන අදාළ සියලු පාර්ශවකරුවන්ගේ අදහස් සැලකිල්ලට ගනිමින්, 2024 අංක 36 දරණ විදුලිබල පනතේ පරමාර්ථ යළි සලකා බැලීම (30-12-2024) | උචිත | මිල ගණන් සහ ක්‍රියාකාරකම් අඩු කිරීම සඳහා අවුරුදු 05 ක සැලැස්මක් යෝජනා කිරීම, ප්‍රතිපත්ති ප්‍රකාශනයට අදාළව පාර්ශ්වකරුවන් සමඟ අස්වැසිල්ලක් ඇති කිරීම සඳහා බල කරයි. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 23 | කර්මාන්ත | නිවස්න කලාප, මහල් නිවාස, සේවා, කාර්මික ඉදිකිරීම් ආශ්‍රිතව කසළ කළමනාකරණ වැඩසටහන් (56) | වාලච්චේන කඩදාසි කම්හල වෙත ඉවතලන කඩදාසි තොග අඛණ්ඩව සපයා ගැනීම තහවුරු කිරීම: රජයේ මුද්‍රණාලය, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, මැතිවරණ කොමිෂන් සභාව, අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒ යටතේ ක්‍රියාත්මක වන රජයේ ආයතන, සියලුම විශ්වවිද්‍යාල, රජයේ සියලුම අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වෙතින් බැහැර කරනු ලබන තත්ත්වයෙන් උසස් සුදු කඩදාසි ඇතුළු ඉවතලන කඩදාසි තොග, සීමාසහිත ජාතික කඩදාසි සමාගම විසින් ප්‍රවාහන පහසුකම් සැපයීමේ පදනම මත නොමිලේ සීමාසහිත ජාතික කඩදාසි සමාගම වෙත භාරදීම. අනෙකුත් රාජ්‍ය සංස්ථා, මණ්ඩල හා ව්‍යවස්ථාපිත ආයතන සහ රජයට අනුබද්ධිත සියලුම ආයතන වල පවතින ඉවතලන කඩදාසි තොග, ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව අදාළ ආයතන හා සීමාසහිත ජාතික කඩදාසි සමාගම එකඟවන සහනදායි මිලකට එකී සමාගම වෙත භාරදීම (2025-01-06) | අර්ධ වශයෙන් උචිත | නේවාසික, උස් ගොඩනැගිලි, සේවා සහ කාර්මික ගොඩනැගිලි සඳහා අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් අනිවාර්ය කිරීම මඟින් මෙම ක්‍රියාකාරකම ප්‍රතිපත්ති ප්‍රකාශන යෝජනාව ක්‍රියාත්මක කරයි. |
| 24 | ප්‍රසම්පාදනය | දේශීය ලංසුකරුවන්ගේ සහභාගිත්වය වැඩි කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි විනිවිදභාවය සහතික කිරීම<br>(191) | ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් කොළඹ වරායේ සිදු කරනු ලබන මෙහෙයුම් සඳහා 80 Ton Bollard Pull Tug යාත්‍රා 02 ක් කුලී පදනම මත ලබාගැනීම පිණිස ක්‍රියාත්මක කරනු ලැබ ඇති ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කිරීම.<br><br>2025 වසර මැද භාගය තුළ ආරම්භ කිරීමට නියමිත නව පර්යන්ත මෙහෙයුම් සඳහා අවශ්‍ය 70 Ton Bollard Pull Twin Azimuth Stern Drive Harbour Tug යාත්‍රා 02 ක් කුලී පදනම මත ලබාගැනීම සඳහා නව ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීම (2024-01-06) | අර්ධ වශයෙන් උචිත | මෙම ක්‍රියාකාරකමට ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අවසන් කිරීම සහ නැවත ආරම්භ කිරීම ඇතුළත් වුවද, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අවධාරණය කර ඇති පරිදි පාරදෘශ්‍යභාවය හෝ දේශීය ලංසුකරුවන්ගේ සහභාගිත්වය වැඩි දියුණු කිරීම සඳහා වන පියවර නිශ්චිතව සඳහන් නොකරයි. |
| 25 | ප්‍රසම්පාදනය | දේශීය ලංසුකරුවන්ගේ සහභාගිත්වය වැඩි කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි විනිවිදභාවය සහතික කිරීම<br>(191) | තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත පදනම්ව සාරානුකූලව ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වන M/s Ceylex Engineering (Pvt.) Ltd. වෙත අදාළ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම (2025-01-06) | උචිත | කමිටු නිර්දේශ හරහා පාරදෘශ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලියකට අනුගත වීමෙන් සහ දේශීය, සාරානුකූලව ප්‍රතිචාරාත්මක ලංසුකරුවෙකුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් මෙම ක්‍රියාකාරකම ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූල වේ. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 26 | සංචාරක කර්මාන්තය | සංචාරක අංශයේ සංවර්ධනය සඳහා විධිමත් ජාත්‍යන්තර හවුල්කාරිත්වයන්, පරිත්‍යාගශීලී නියෝජිතායතන සහ රාජ්‍ය නොවන සංවිධානවල තාක්ෂණික සහ මූල්‍ය ආධාර ප්‍රමුඛතා සහ අවශ්‍යතා පදනමින් ඵලදායී ලෙස භාවිත කිරීම (146) | දෙපාර්ශවය අතර ඇතිකර ගනු ලබන සහයෝගිතාව මත චීන මාධ්‍ය සමූහයේ අති නවීන තාක්ෂණය සහ විශේෂඥ දැනුම උපයෝගි කරගනිමින් ශ්‍රී ලංකාව චීන සංචාරකයින් සඳහා ප්‍රමුඛ ගමනාන්තයක් ලෙස ස්ථානගත කිරීමේ අරමුණින් චීන මාධ්‍ය සමූහය (China Media Group) සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීම (2025-01-06) | අතිශයින් උචිත | තාක්ෂණය සහ විශේෂඥතාව බෙදාහදා ගැනීම තුළින් සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර හවුල්කාරිත්වයක් ස්ථාපිත කිරීම. |
| 27 | ව්‍යවසායකත්වය | බිත්තර සහ කුකුළු මස් නිෂ්පාදන අපනයන ක්‍රියාදාමය ශක්තිමත් කිරීමේ පියවර (121) | චීන වෙළෙඳපොළට කුකුල් මස් අපනයනය සම්බන්ධ ක්‍රියාපටිපාටිය (Protocol) සඳහා අදාළ වන ගිවිසුම අත්සන් තැබීම පිණිස වන එකී ගිවිසුම චීන රේගු පාලන ආයතනය සහ සිය අමාත්‍යංශය අතර අත්සන් තැබීම (2025-01-06) | අතිශයින් උචිත | චීන බලධාරීන් සමඟ විධිමත් ගිවිසුමක් හරහා කුකුළු මස් අපනයන ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම, වෙළඳපල ප්‍රවේශය සහ වෙළඳ පහසුකම් වැඩි දියුණු කිරීම මඟින් මෙම ක්‍රියාකාරකම ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූල වේ. |
| 28 | සමුද්‍ර | ධීවර ක්ෂේත්‍රයේ භාවිත යෙදවුම්වන ජීවී - අජීවී ආහාර, යාත්‍රා සහ දැල් ආම්පන්න, ජල ජීවී වගාවන් සඳහා අවශ්‍ය කුඩු උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදනය සඳහා පහසුකම් (129) | කුඩා පරිමාණ සහ අඩු ආදායම්ලාභී ධීවරයින් සඳහා ධීවර දැල් 75,000 ක්. කුඩා පරිමාණ සහ අඩු ආදායම්ලාභී ධීවරයින් සඳහා පෙර සකසන ලද නිවාස 500 ක්. කුඩා පරිමාණ සහ අඩු ආදායම්ලාභී ධීවරයින් සඳහා සහල් ටොන් 1,630 ක් (2025-01-06) | අර්ධ වශයෙන් උචිත | ධීවර දැල් බෙදා හැරීම ධීවර ද්‍රව්‍ය නිෂ්පාදනයට පහසුකම් සැලසීමේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්කයට සෘජුවම සහය වේ. කෙසේ වෙතත්, නිවාස සහ සහල් සැපයීම කර්මාන්ත ද්‍රව්‍ය නිෂ්පාදනයට නොව සුභසාධන ආධාර වලට සම්බන්ධ වේ. |
| 29 | ඉඩම් | දීර්ඝ කාලයක් තිස්සේ පදිංචි ජනතාවට එම ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය සහතික කෙරෙන ඔප්පු (187) | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් කොට්ටාව මාලපල්ල හි පිහිටි ඉඩම සහ ඒ තුළ පිහිටි නිවාස සංකීර්ණය රජයේ ඉඩම් ආඥා පනතේ 6(1) වගන්තියෙහි විධිවිධාන පරිදි නිදහස් දීමනාවක් වශයෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත පවරා දීමට, සහ එකී නිවාස සංකීර්ණයේ පදිංචි කිරීමට නියමිත ප්‍රතිලාභීන්ට ඔප්පු ලබාදීමට හැකිවන පරිදි තෝරාගනු ලබන ප්‍රතිලාභීන්ට වැය බරක් නොවන පරිදි අදාළ ඔප්පු ලබාදීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම (2025-01-20) | අතිශයින් උචිත | රජයේ ඉඩම් වල දිගුකාලීන පදිංචිකරුවන්ට නිසි නීතිමය ක්‍රියාපටිපාටි අනුගමනය කරමින් ඉඩම් ඔප්පු ලබාදීමේ පොරොන්දු වූ ක්‍රියාමාර්ගය එය පැහැදිලිව ක්‍රියාත්මක කරයි. |
| 30 | ප්‍රසම්පාදනය | දේශීය ලංසුකරුවන්ගේ සහභාගිත්වය වැඩි කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි විනිවිදභාවය සහතික කිරීම (191) | කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතියේ අදියර 11 හි බටහිර බහාලු පර්යන්ත 11 සඳහා බටහිර දියකඩනය දීර්ඝ කිරීමේ සවිස්තරාත්මක සැලසුම මෙහෙයවීම සඳහා අදාළ උපදේශක සේවා කොන්ත්‍රාත්තුව M/s. Dohwa Engineering Co. Ltd. වෙත පිරිනැමීම (2025-01-20) | උචිත නොවන | ක්‍රියාකාරකම් මඟින් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අරමුණ වන පාරදෘශ්‍ය ප්‍රසම්පාදනය සහ දේශීය ලසුංකරුවන්ගේ සහභාගිත්වය වැඩි කිරීම සමඟ අනුකූල වන බවක් පෙන්නුම් නොකරයි. |
| 31 | නීතිය සහ අධිකරණ | දූෂණය සහ මූල්‍ය අපරාධ මැඩලීමේ නීති සහ අනෙකුත් ව්‍යුහයන් ශක්තිමත් කිරීම සහ විධිමත් කිරීම (227) | අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත් කෙටුම්පත සකස් කිරීම (2025-01-20) | අතිශයින් උචිත | දූෂණ විරෝධී නීති ශක්තිමත් කිරීම සහ විධිමත් කිරීම යන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්කයට සෘජුවම සහාය දක්වයි. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 32 | ව්‍යවසායකත්වය | කුඩා පරිමාණයේ ගොවියන්, නිෂ්පාදකයින්, ව්‍යවසායකයින් සහ ආයෝජකයින් සඳහා මූල්‍ය පහසුකම් සැපයීමට සමුපකාර, සමෘද්ධි හා ප්‍රාදේශීය සංවර්ධන බැංකු කාර්යක්ෂම ලෙස මෙහෙයවීම (105) | කෙටිකාලීන භෝග සහ ගෙවතු වගා වල යෙදෙන සුළු සහ කුඩා පරිමාණ ගොවීන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සහ එකී යෝජනා ක්‍රමය ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂයේ සිට මේ දක්වා ක්‍රියාත්මක කරනු ලැබ ඇත (2025-01-27) | උචිත | එය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් පරිදි ප්‍රාදේශීය සංවර්ධන යාන්ත්‍රණයන් හරහා කුඩා පරිමාණ ගොවීන්ට මූල්‍ය ආධාර ක්‍රියාත්මක කරයි. |
| 33 | ඉඩම් | ජාතික ඉඩම් පරිහරණ සැලසුම් ප්‍රතිපත්තියට අනුකූලව ප්‍රාදේශීය සංවර්ධන සැලසුම් (188) | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වඩාත් ඵලදායීව ක්‍රියාවට නැංවීම සඳහා නෛතික පසුබිමක් සැකසීම පිණිස පාර්ලිමේන්තු පනතක් මගින් එම දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා බලතල නිශ්චය කිරීම. ඒ සඳහා විධිවිධාන ඇතුළත්ව පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදක වෙත උපදෙස් දීම (2025-01-27) | අතිශයින් උචිත | වගකිවයුතු දෙපාර්තමේන්තුවේ නෛතික පදනම ශක්තිමත් කිරීම, ප්‍රාදේශීය සංවර්ධන සැලසුම් ජාතික ප්‍රතිපත්තියට අනුව පෙළගැස්විය හැකි බවත් ක්‍රියාත්මක කළහැකි බවත් සහතික කිරීම සඳහා තීරණාත්මක පියවරකි. |
| 34 | ණය ප්‍රතිව්‍යුහගතකරණය | ණය තිරසර බව පවත්වා ගැනීම හා දරාගත හැකි මට්ටමක ණය පොලී තබා ගැනීම ඉලක්ක කරගනිමින්, අවශ්‍යතාවය අනුව ණය සමාලෝචන කටයුතුවලදී භාවිත කිරීම සඳහා විකල්ප ණය තිරසරකරණ විශ්ලේෂණයක් පිළියෙළ කිරීම (DSA) (106) | විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියට අදාළව ජපාන රජය අතර හුවමාරු පත්‍ර සහ ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JICA) අතර සංශෝධන ගිවිසුම අත්සන් කිරීම, ශ්‍රී ලංකා රජය විසින් නිල ණය හිමි කමිටුව සමඟ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සාකච්ඡා අවසන් කර අවබෝධතා ගිවිසුමකට එළඹීමෙන් අනතුරුව, හුවමාරු පත්‍ර සහ සංශෝධන ගිවිසුම අත්සන් කළ යුතුව ඇත (2025-03-02) | අර්ධ වශයෙන් උචිත | ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්කය වන්නේ එය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු සහ ජාත්‍යන්තර සහයෝගීතාවයට සම්බන්ධ වන බැවිනි. එය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ විකල්ප ණය තිරසරකරණ විශ්ලේෂණයක් සකස් කිරීමේ ප්‍රධාන ක්‍රියාමාර්ගය සෘජුවම ආමන්ත්‍රණය නොකරයි. |
| 35 | කෘෂිකර්මාන්තය | දේශගුණික විපර්යාසයන්ට අනුගත භෝග ප්‍රභේද, වගා හා වාරි තාක්ෂණික ක්‍රම සැලසුම් කිරීම, ජනනය කිරීම සහ යොදා ගැනීම (117) | ඇමෙරිකානු ඩොලර් මිලියන 100 ක ලෝක බැංකු සහන ණය මුදලක් සහ ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවේ තාක්ෂණික සහයෝගය මත ආහාර බෝග, වැවිලි බෝග, පශු සම්පත් හා ධීවර නිෂ්පාදන ඇතුළු කෘෂිකාර්මික අංශයේ සියලු ක්ෂේත්‍රයන්හි ඵලදායිතාව මෙන්ම, දේශීය හා විදේශීය වෙළෙඳපොල තරඟකාරිත්වය හා දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම (2025-02-03) | උචිත | ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් වන පරිදි දේශගුණික-සුහුරු භාවිතාවන් සංවර්ධනය කිරීම සහ යොදාගැනීම ස්වභාවිකවම ඇතුළත් වන, ඵලදායිතාව සහ ඔරොත්තු දීමේ ධාරිතාව වැඩි දියුණු කිරීම මගින් කෘෂිකර්මාන්තයේ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීමේ මූලික අරමුණ එය ආමන්ත්‍රණය කරයි. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 36 | ප්‍රසම්පාදනය | දේශීය ලංසුකරුවන්ගේ සහභාගිත්වය වැඩි කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි විනිවිදභාවය සහතික කිරීම (191) | සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සේවයේ CFM 56-5B එන්ජින් අලුත්වැඩියා සහ නඩත්තු, අලුත්වැඩියා සහ මෙහෙයුම් පිරිවැඩියා කොන්ත්‍රාත්තුව සඳහා, තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත පදනම්ව සාරානුකූලව ප්‍රතිචාර දක්වන ලද අවම ලංසුකරු වන Lufthansa Technik (LHT)/Hamburg වෙත එකී කොන්ත්‍රාත්තුව වසර හතරක (04) කාලයක් සඳහා ප්‍රදානය කිරීම (2025-02-03) | අර්ධ වශයෙන් උචිත | මෙම ක්‍රියාකාරකම නිසි ඇගයීම සහ සාරානුකූලව ප්‍රතිචාර දක්වන අවම ලංසුකරු තෝරා ගැනීම හරහා ප්‍රසම්පාදනයේ පාරදෘශ්‍යභාවයට සහාය වේ. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්තුව විදේශීය ආයතනයකට ප්‍රදානය කර ඇති බැවින්, දේශීය ලංසුකරුවන්ගේ සහභාගිත්වය වැඩි කිරීමේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අරමුණ එය ආමන්ත්‍රණය නොකරයි. |
| 37 | ආහාර සුරක්ෂිතතාව | අවම වශයෙන් මාස තුනකට ප්‍රමාණවත් අත්‍යවශ්‍ය ආහාර ස්වාරක්ෂක තොග පවත්වා ගැනීම (114) | ශීත කළ පොල් මද හා කැබලි කර වියළන ලද කුරුට්ට සහිත පොල් (කොප්පරා නොවන), පොල් කිරි/පිටි කළ පොල් කිරි හා දිසිදි පොල් ආනයනයට අදාළ මාර්ගෝපදේශ අනුගමනය කරමින් පොල් ගෙඩි මිලියන 200 කට සමාන ධාරිතාවයකින් යුත් පොල් මද ආශ්‍රිත නිෂ්පාදන ප්‍රමාණයක් සහ පොල් තෙල් නිෂ්පාදනය සඳහා වියළන ලද කුරුට්ට සහිත පොල් (කොප්පරා නොවන) ආනයනය කිරීම පිණිස අවශ්‍ය පියවර ගැනීම (2025-02-03) | අර්ධ වශයෙන් උචිත | පොල්තෙල් නිෂ්පාදනය සඳහා පොල් මද ආශ්‍රිත නිෂ්පාදන සහ ඒ ආශ්‍රිත යෙදවුම් ආනයනය කිරීමේ ක්‍රියාකාරකම ප්‍රධාන ආහාර ද්‍රව්‍යයක් (පොල්තෙල්) තිබීම සහතික කිරීම සඳහා පූර්වගාමී (ප්‍රගාමී) පියවරකි. නමුත් ශ්‍රී ලාංකික පොල් කර්මාන්ත සංස්කෘතියේ සන්දර්භය තුළ එය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීමේ අභිප්‍රාය හා සම්බන්ධ ඉතා වැදගත් තීරණයකි. |
| 38 | ආර්ථිකය | නවෝත්පාදන දිරිමත් කරන, බුද්ධිමය දේපළ අයිතිවාසිකම් ආරක්ෂා කරන, සහ දත්ත පෞද්ගලිකත්වය සහ ආරක්ෂාව සහතික කරන ආධාරක නියාමන රාමුවක් (155) | ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ ලේඛන ඩිජිටල්කරණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ යෝජිත ප්‍රදානය ලබාගැනීම පිණිස ලෝක බුද්ධිමය දේපළ සංවිධානය සමඟ සහයෝගිතා ගිවිසුමකට අත්සන් තැබීම (2025-02-09) | අර්ධ වශයෙන් උචිත | ක්‍රියාකාරකම් පැහැදිලිවම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අරමුණු, විශේෂයෙන් බුද්ධිමය දේපළ අයිතිවාසිකම් සහ නීතිමය රාමු සම්බන්ධයෙන් සහාය දක්වන අතර එම නිසා අනුකූල වේ. |
| 39 | ප්‍රසම්පාදනය | දේශීය අවශ්‍යතා සපුරාලීම සඳහා සපුගස්කන්ද තෙල් පිරිපහදුව නවීකරණය කිරීම සහ පිරිපහදු කළ තෙල් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන සඳහා ප්‍රමාණාත්මක විදේශීය වෙළඳපොළ කොටසක් අත්පත් කර ගැනීම (154) | සපුගස්කන්ද තෙල් පිරිපහදුව සංවර්ධනය කිරීම සහ එම පරිශ්‍රය තුළම ඉදිකිරීම, මෙහෙයුම් හා පැවරීම (BOT) පදනම මත දිනකට බැරල් 100,000 ක ධාරිතාවයකින් යුත් නව පිරිපහදුවක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස සුදුසු මූල්‍ය සම්පාදක/ආයෝජකයින් හඳුනාගැනීම සහ තෝරා ගැනීම සඳහා අභිලාෂ ප්‍රකාශ කිරීම් කැඳවීමටත්, සුදුසුකම් සපුරන ආයතන වෙතින් යෝජනා කැඳවීම (2025-02-09) | අතිශයින් උචිත | දේශීය ඉල්ලුම සපුරාලීම සහ අපනයන විභවය ඉහළනැංවීම සහ දෙකටම අනුකූල වන නිෂ්පාදන ධාරිතාව සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම එහි අරමුණයි. |
| 40 | ප්‍රසම්පාදනය | දේශීය ලංසුකරුවන්ගේ සහභාගිත්වය වැඩි කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි විනිවිදභාවය සහතික කිරීම (191) | යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා පද්ධති සම්බන්ධකයෙක් (System Integrator) තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීම (2025-02-09) | උචිත | මෙම ක්‍රියාකාරකම ප්‍රසම්පාදන විෂය පථයට අයත් වන අතර, ක්‍රියාවලිය තුළ පාරදෘශ්‍යභාවය සහ දේශීය සහභාගිත්වය නිශ්චිතව ආමන්ත්‍රණය නොකළහොත් එය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ප්‍රකාශිත ඉලක්කය සමඟ අර්ධ වශයෙන් පමණක් අනුකූල වේ. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 41 | ප්‍රවාහනය | කඩිනමින් ප්‍රතිසංස්කරණය කළ යුතු ග්‍රාමීය හා වතු ආශ්‍රිත මාර්ග හඳුනාගෙන ප්‍රමුඛතා ලේඛනයක් සකසා එම ප්‍රමුඛතා ලේඛනය අනුව මාර්ග ප්‍රතිසංස්කරණය කර තිරසාරව නඩත්තු කිරීම (174) | උතුරු හා නැගෙනහිර පළාත් වල යෝජිත ග්‍රාමීය මාර්ග වැඩි දියුණු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම (සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක්ම ආවරණය වන පරිදි උතුරු පළාත තුළ මාර්ග කිලෝ මීටර 1,500 ක් සහ නැගෙනහිර පළාත තුළ මාර්ග කිලෝ මීටර 500 ක් සංවර්ධනය කිරීම (2025-02-09) | අතිශයින් උචිත | වැඩසටහන සඳහා මාර්ග තෝරා ගැනීම ප්‍රමුඛතා ක්‍රියාවලියක් මත පදනම් වූ බව උපකල්පනය කළහොත්, මෙම ක්‍රියාකාරකම ක්‍රමානුකූල හා ප්‍රමුඛතාගත ග්‍රාමීය මාර්ග අලුත්වැඩියාව සහ නඩත්තුව යන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අභිප්‍රාය සමඟ අනුකූල වේ. |
| 42 | කර්මාන්ත | කර්මාන්තය අධෛර්මත් කරන නීති, රෙගුලාසි හා ක්‍රමවේද ජාත්‍යන්තර සම්මුතීන්, ගිවිසුම් සහ ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි සංශෝධනය (125) | 1971 අංක 14 දරණ වී අලෙවි මණ්ඩල පනත සංශෝධනය කිරීම පිණිස අවශ්‍ය පියවර ගැනීම (2025-02-09) | අර්ධ වශයෙන් උචිත | මෙම සංශෝධනය කර්මාන්ත කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම, නවීකරණය කිරීම හෝ ජාත්‍යන්තර භාවිතාවන්ට අනුකූල වීම කෙරෙහි අවධානය යොමු කරන්නේ නම්, එය අනුකූල වනු ඇත. |
| 43 | ණය ප්‍රතිව්‍යුහගතකරණය | ණය තිරසර බව පවත්වා ගැනීම හා දරාගත හැකි මට්ටමක ණය පොලී තබා ගැනීම ඉලක්ක කරගනිමින්, අවශ්‍යතාවය අනුව ණය සමාලෝචන කටයුතුවලදී භාවිත කිරීම සඳහා විකල්ප ණය තිරසරකරණ විශ්ලේෂණයක් පිළියෙළ කිරීම (DSA) (106) | හංගේරියානු අපනයන ණය රක්ෂණ පුද්ගලික සමාගම සමඟ ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ ගිවිසුමකට එළඹීම (2025-02-19) | අර්ධ වශයෙන් උචිත | එය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ පුළුල් ඉලක්කයට සහාය දක්වයි, නමුත් විකල්ප ණය තිරසරකරණ විශ්ලේෂණයක් (DSA) සකස් කිරීම සහ උපායමාර්ගිකව භාවිතා කිරීම පිළිබඳ නිශ්චිත ප්‍රකාශන අරමුණ සම්පූර්ණයෙන්ම ආමන්ත්‍රණය නොකරයි. |
| 44 | බලශක්තිය | සූර්ය බලය මගින් මෙගාවොට් දෙදාහක් (2,000MW) ක්‍රමිකව ජාතික පද්ධතියට එක්කර ගැනීම (166) | ත්‍රිකුණාමලයේ සාම්පූර්හි මෙගාවොට් 50 ක (අදියර 1) සහ මෙගාවොට් 70 ක (අදියර11) සූර්ය බලාගාර ස්ථාපිත කිරීම, රජයන් දෙකක් අතර සිදු කරනු ලබන යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ඉදිරි පියවර ගැනීම (2025-02-19) | අර්ධ වශයෙන් උචිත | තෙල් මත පදනම් වූ උත්පාදනය මත යැපීම අඩු කිරීම සහ විදුලි පිරිවැය අඩු කිරීම සඳහා උපායමාර්ගික පියවරක් ලෙස සූර්ය බලශක්ති ධාරිතාව පුළුල් කිරීමේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ප්‍රමුඛතාවයට එය සහාය වේ. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 45 | බදු | බදු පරිපාලනය කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය නීති ප්‍රතිසංස්කරණ සිදු කිරීම (103) | පොදු මහජනතාවගේ යහපත සඳහා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල වෙළෙඳපොළ මිල ස්ථාවරව පවත්වාගෙන යාමේ සහ දේශීය ගොවීන් සඳහා පහසුකම් සැලසීමේ රජයේ ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහාත්, රාමසාන් උත්සවය වෙනුවෙන් පරිත්‍යාග වශයෙන් මෙරටට ලැබෙන රටඉඳි සඳහා බදු සහනයක් ලබාදීම සඳහාත් 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ විධිවිධාන යටතේ නිකුත් කරනු ලැබ ඇති පහත සඳහන් නියමයන් පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම පිණිස මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.<br><br>2024 12 31 දිනැති අංක 2417/20 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි සහ 5 වැනි වගන්ති යටතේ පනවන ලද නියමය<br><br>2025 01 27 දිනැති අංක 2421/03 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති 2007 අංක 48 දරන විශ්ෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ පනවන ලද නියමය (2025-12-19) | අර්ධ වශයෙන් උචිත | මේවා ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව බදු පරිපාලන කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම අරමුණු කරගත් නීතිමය ප්‍රතිසංස්කරණ නොව, වෙළඳාම සහ වෙළඳපොළ ස්ථාවරත්වය සඳහා වන ප්‍රතිපත්තිමය පියවරයන් වේ. |
| 46 | ප්‍රවාහනය | ත්‍රීරෝද රථ සේවාව සහ කාර්ය මණ්ඩල, පාසැල් ළමුන් ප්‍රවාහනයද ඇතුළත් අනෙකුත් කුලී රථ සේවාවන් විධිමත් කර ගුණාත්මක සහ කාර්යක්ෂම සේවාවක් බවට පත්කිරීම (175) | ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ හඳුනාගෙන ඇති ප්‍රායෝගික ගැටලු කිහිපයකට අදාළව විසඳුම් ලබාදීම, සහ දැනට නියාමනය නොවන ප්‍රවාහන ක්ෂේත්‍ර කිහිපයක් නියාමනය කිරීම (2025-02-19) | උචිත | ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කර ඇති පරිදි ප්‍රවාහන සේවා නියාමනය සහ විධිමත් කිරීමේ පුළුල් ඉලක්කයට මෙම ක්‍රියාකාරකම සහාය දක්වයි. ත්‍රිරෝද රථ, කුලී රථ, කාර්යමණ්ඩල සහ පාසල් ප්‍රවාහනය නියාමන ක්‍රියාවලිය තුළ පැහැදිලිවම ආවරණය වී තිබේද යන්න මත සම්පූර්ණ අනුකූල වීම රඳා පවතී. |
| 47 | බදු | උපයනවිට බද්ද වෘත්තිකයන්ට අසාධාරණයක් නොවන පරිදි සංශෝධනය (73)<br>බදු පරිපාලනය කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය නීති ප්‍රතිසංස්කරණ සිදු කිරීම (103) | 2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනත සහ 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම, එකී පනත් කෙටුම්පත් රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම, සහ ඉන් අනතුරුව අනුමැතිය සඳහා ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම (2025-02-25) | අතිශයින් උචිත | ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් පරිදි බදු පරිපාලනයේ කාර්යක්ෂමතාවයට සෘජුවම සහය වන බදු නීති සඳහා නීතිමය ප්‍රතිසංස්කරණ මෙම ක්‍රියාකාරකමට ඇතුලත් වේ. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 48 | ප්‍රසම්පාදනය | දේශීය ලංසුකරුවන්ගේ සහභාගිත්වය වැඩි කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි විනිවිදභාවය සහතික කිරීම (191) | ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත පදනම්ව, වසර දෙකක් (02) කාලසීමාවක් සඳහා පැරිස්, කැන්ටොන්, ඩකා, ඩුබායි, ගැන් අයිලන්ඩ්, ජෙඩාහ් සහ ඉන්දියාවේ බැංගලෝර්, කොචින්, චෙන්නායි, දිල්ලි, මදුරෙයි, මුම්බායි, තිරුවානන්තපුරම් හා තිරුචිරප්පල්ලි යන ජාත්‍යන්තර ගුවන්තොටුපොළ වලදී ශ්‍රී ලන්කන් ගුවන් සේවයේ ගුවන්යානා වලට අවශ්‍ය ඉන්ධන සැපයීමේ කොන්ත්‍රාත්තු පිරිනැමීම (2025-02-24) | අර්ධ වශයෙන් උචිත | ක්‍රියාවලිය විධිමත් ලෙස පෙනුන ද, පාරදෘශ්‍යභාවය සහතික කිරීම හෝ දේශීය ලංසුකරුවන්ගේ සහභාගිත්වය පිළිබඳ විස්තර නොමැතිව, ප්‍රතිපත්ති ප්‍රකාශනය සමඟ පූර්ණ අනුකූලතාවය තහවුරු කළ නොහැක. |
| 49 | සංචාරක කර්මාන්තය | සංචාරක සේවාවන්හි සියලු අංශවල ගුණාත්මක තත්වය වර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතිකරණ වැඩපිළිවෙළක් (146)<br><br>සංචාරක කර්මාන්තයේ අවිධිමත් සේවා සපයන්නන් විධිමත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් (146) | ශ්‍රී ලංකාව තුළ ඔට්ටු ඇල්ලීම සහ සූදු ආයතන ප්‍රමිතිකරණය කිරීම සඳහා පුළුල් හා පූර්ණ විෂය පථයක් සහිත ස්වාධීන නියාමන ආයතනයක් ලෙස සූදු ක්‍රීඩා නියාමනය කිරීමේ අධිකාරිය පිහිටුවීම සඳහා පනත් කෙටුම්පත කඩිනමින් සකස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබාදීම (2025-02-24) | අර්ධ වශයෙන් උචිත | සමහර සන්දර්භයන් තුළ ඔට්ටු ඇල්ලීම සහ සූදුව සංචාරක ව්‍යාපාරයට ලිහිල් ලෙස සම්බන්ධ විය හැකි වුවද (උදා: කැසිනෝ සංචාරක ව්‍යාපාරය), මෙහි ක්‍රියාකාරකමේ ප්‍රධාන අරමුණ වන්නේ සංචාරක සේවා පුළුල් ලෙස වැඩි දියුණු කිරීමට හෝ සංචාරක ව්‍යාපාර මෙයෙවන්නන් විධිමත් කිරීමට නොව සූදුව නියාමනය කිරීමයි. |
| 50 | පර්යේෂණ හා සංවර්ධනය | කෘෂිකාර්මික, සාගර සහ මිරිදිය සම්පත් ප්‍රශස්ත ලෙස කළමනාකරණය කරමින් පසු අස්වනු හානිය අවම කිරීමටත්, නිෂ්පාදන විවිධාංගීකරණයට අවශ්‍ය තාක්ෂණය හඳුන්වා දීම (141) | "නවෝත්පාදන පර්යේෂණ ඩිජිටල්කරණය සහ ඔරොත්තු දීමේ හැකියාව තුලින් තිරසර ජලය සහ අපජල කළමනාකරණය" යන තේමාව යටතේ ජාත්‍යන්තර ජල සම්මේලනය සහ 9 වන පර්යේෂණ සම්මන්ත්‍රණය 2025 මාර්තු මස 19 සහ 20 යන දිනයන්හිදී පැවැත්වීම (2025-03-03) | අර්ධ වශයෙන් උචිත | මෙම ක්‍රියාකාරකම මිරිදිය කළමනාකරණය සහ නවෝත්පාදනයට සහය වන නමුත්, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්කයේ සියලුම සංරචක (පශ්චාත් අස්වනු හානිය අඩු කිරීම හෝ නිෂ්පාදන විවිධාංගීකරණය වැනි) පුළුල් ලෙස ආමන්ත්‍රණය නොකරයි. |
| 51 | පර්යේෂණ හා සංවර්ධනය | පිළිකා, දියවැඩියාව, හෘදයාබාධ වැනි රෝග කල්තියා හඳුනා ගැනීමට නවීන තාක්ෂණික පරීක්ෂණ (138) | තෝරාගත් දිස්ත්‍රික්ක වල ජනගහන පාදක පිළිකා ලේඛනගත කිරීමේ වැඩසටහන හරහා පිළිකා පිළිබඳ ආවේක්ෂණය ශක්තිමත් කිරීම සඳහා වන යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම (2025-03-03) | උචිත | මෙම ක්‍රියාකාරකම පිළිකා පිළිබඳ ආවේක්ෂණය ඉහළ නැංවීම සහ කල්තියා හඳුනා ගැනීම ප්‍රවර්ධනය කිරීම මගින් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අරමුණට සෘජුවම සහය වන අතර, දිගුකාලීන සෞඛ්‍ය සේවා පිරිවැය අඩු කිරීමට දායක වේ. |
| 52 | බලශක්තිය | දැනට පවතින තෙල් පර්යන්ත ප්‍රතිසංස්කරණය කිරීමෙන් පසු ත්‍රිකුණාමලයේ ජාත්‍යන්තර තෙල් සම්ප්‍රේෂණ සහ ගබඩා කිරීමේ පර්යන්තයක් ඉදිකිරීම (154) | මහා භාණ්ඩාගාරයට වැය බරක් නොවන පරිදි ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ අරමුදල් මගින් යෝජිත ව්‍යාපෘතිය (ත්‍රිකුණාමලය ඉහළ ටැංකි අංගනයේ ටැංකි විසිහතරක් (24) සංවර්ධනය කිරීම) ක්‍රියාත්මක කිරීම (2025-03-03) | අතිශයින් උචිත | මෙම ක්‍රියාකාරකම මගින් ත්‍රිකුණාමලය ඉහළ ටැංකි අංගනයේ ඇති ටැංකි 24 සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන අතර, එමගින් පවතින තෙල් ගබඩා යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීමට සහ වඩා හොඳින් භාවිතා කිරීමට සෘජුවම සහය වේ. |
| 53 | බලශක්තිය | සූර්ය බලය මගින් මෙගාවොට් දෙදාහක් (2,000MW) ක්‍රමිකව ජාතික පද්ධතියට එක්කර ගැනීම (166) | සියඹලාණ්ඩුව මෙගාවොට් 100 සූර්ය බලශක්ති ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ඉඩම්, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත හෙක්ටයාර 219,7233 ක ඉඩම ප්‍රදානයක් වශයෙන් ලබාදීම (2025-03-03) | අතිශයින් උචිත | සුනිත්‍ය බලශක්ති අධිකාරියට ඉඩම් ප්‍රදානය කිරීම සූර්ය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පහසුකම් සපයන අතර ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පුනර්ජනනීය බලශක්ති ඉලක්කයට සහය වේ. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 54 | ප්‍රවාහනය | ග්‍රාමීය ජනතාවගේ නිෂ්පාදන ආරක්ෂාකාරීව ප්‍රවාහනය සඳහා සුදුසු තාක්ෂණය සහිත භාණ්ඩ ප්‍රවාහන සේවාවන් (174) | බස්රථ සැරසිලි හා උපාංග හේතුවෙන් බස්රථ වල ගමන් ගන්නා මගීන්ගේ ආරක්ෂාවට ඇතිවිය හැකි බලපෑම පිළිබඳ අධ්‍යයනය කර, මෙම සියලු තත්ත්වයන් සැලකිල්ලට ගෙන, ඒ සම්බන්ධයෙන් විධිමත් පරිදි ක්‍රියා කිරීම සඳහා නිර්දේශ සහිත වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යංශය ඇතුලු අනෙකුත් අදාළ සියලු ආයතන නියෝජනය වන පරිදි නිලධාරි කමිටුවක් පත් කිරීම (2025-03-01) | උචිත නොවන | මෙම ක්‍රියාකාරකම සාමාන්‍ය ප්‍රවාහන ආරක්ෂාව හා සම්බන්ධ වන නමුත්, සුදුසු තාක්ෂණයන් භාවිතයෙන් ග්‍රාමීය නිෂ්පාදන ආරක්ෂිතව ප්‍රවාහනය කිරීමේ නිශ්චිත ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්කය එය සෘජුවම ආමන්ත්‍රණය නොකරයි. |
| 55 | බලශක්තිය | සූර්ය බලය මගින් මෙගාවොට් දෙදාහක් (2,000MW) ක්‍රමිකව ජාතික පද්ධතියට එක්කර ගැනීම (166) | 2024/25 මූල්‍ය වර්ෂයේ සිට ඇමෙරිකානු ඩොලර් 25,000 ක් වූ වාර්ෂික දායකත්ව මුදල් අඛණ්ඩව ගෙවීම.<br><br>ශ්‍රී ලංකාවේ තාක්ෂණ යෙදවුම් සම්පත් මධ්‍යස්ථානයක් (STAR-C) පිහිටුවීම.<br><br>'රටවල් පිළිබඳ හවුල්කාරිත්ව කාර්යරාමුව' ශ්‍රී ලංකාව සහ ජාත්‍යන්තර සූර්යබල සන්ධානය අතර අත්සන් තැබීම (2025-03-01) | අර්ධ වශයෙන් උචිත | මෙම ක්‍රියාකාරකම සූර්ය බලශක්ති උත්පාදනය පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අරමුණට සහය විය හැකිය. |
| 56 | කර්මාන්ත | ජාතික කර්මාන්ත සැලසුම් බුද්ධි මණ්ඩලයක් ස්ථාපිත කිරීම (National Industrial Think Tank) සහ සැලසුම් කිරීම (151)<br><br>එක් එක් කර්මාන්තවල ජාතික වැදගත්කම මත ඒවා දියුණු කිරීම සඳහා සෘජු මැදිහත්වීම, තිරසාරත්වය හා නියාමනය සඳහා පහසුකම් සැලසීම (151) | 1990 අංක 46 දරණ කර්මාන්ත ප්‍රවර්ධන පනත සංශෝධනය කිරීම සඳහා වන පනත් කෙටුම්පත සකස් කිරීමේ කාර්යය කඩිනමින් නිම කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබාදීම (2025-03-01) | අර්ධ වශයෙන් උචිත | කර්මාන්ත ප්‍රවර්ධන පනත සංශෝධනය කිරීම ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූලව කාර්මික ප්‍රතිසංස්කරණ සඳහා සහය විය හැකි නමුත්, බුද්ධි මණ්ඩල හෝ ඉලක්කගත මැදිහත්වීම් ආමන්ත්‍රණය කරන්නේද යන්න පිළිබඳ පැහැදිලි තොරතුරු නොමැත. |
| 57 | වෙළඳ | ශ්‍රී ලංකා තේ සන්නාමය නැවත දීප්තිමත් කරමින් ඉහළ මිලක් ලැබෙන වෙළඳපොළ සොයා දීමට රාජ්‍ය මැදිහත්වීම (115) | 1957 අංක 51 දරණ තේ පාලන පනත සංශෝධනය කිරීම සඳහා පනත් කෙටුම්පත සකස් කිරීමේ කාර්යය නිම කිරීම (2025-03-10) | අතිශයින් උචිත | ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණ තුළින් ශ්‍රී ලංකා තේ (Ceylon Tea) සන්නාමය ශක්තිමත් කිරීමේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්කයට මෙම ක්‍රියාකාරකම සෘජුවම දායක වේ. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 58 | ව්‍යවසායකත්වය | උපායමාර්ගික වැදගත්කම, ආර්ථික වර්ධනයේ විභවතාවය, නිෂ්පාදන ආර්ථිකය උත්තේජනය කිරීමේ හැකියාව, මූල්‍ය ස්ථාවරත්වයට ඇති බලපෑම සහ ජාතික ආරක්ෂාවට ඇති අදාළත්වය සලකා බලමින් එක් එක් ආයතනය සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග තීරණය කිරීම. (108) | රජයට අයත් වාණිජමය නොවන ආයතන පිළිබඳ සමාලෝචනය කර වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්ගේ සභාපතිත්වයෙන් යුතුව නිලධාරී කමිටුවක් පත් කිරීමට 2024-12-18 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කරනු ලැබ ඇත. එම කමිටුව විසින් ආයතන 160 ක් සමාලෝචනය කර ඇති අතර ඉන් විශ්වවිද්‍යාල ඇතුලු උසස් අධ්‍යාපන 36 ක් සමාලෝචනය කිරීම සඳහා ක්ෂේත්‍රයේ සාමාජිකයන්ගෙන් සමන්විත අනුකමිටුවක සහාය ලබාගැනීමට තීරණය කර ඇත. එම ආයතන හැර ඉතිරි ආයතන 124 කාණ්ඩ 09 ක් යටතේ වර්ගීකරණය කරමින් කමිටුවේ නිර්දේශ ඉදිරිපත් කර තිබේ. ඒ අනුව, එකී නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී (2025-03-17) | අතිශයින් උචිත | ක්‍රියාකාරකම මඟින් ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව උපායමාර්ගික ආයතනික තීරණ සඳහා අත්‍යාවශ්‍ය සමාලෝචන ක්‍රියාවලිය ආරම්භ කරනු ලබන්නේ උපායමාර්ගික තීරණ ගැනීම සඳහා අවශ්‍ය වන විධිමත් සමාලෝචන යාන්ත්‍රණයක් පිහිටුවීමෙනි. |
| 59 | බලශක්තිය | දේශීය සමාගම් ජාත්‍යන්තර හවුල්කරුවන් සමග එක්ව් ක්ෂේත්‍රයට අවශ්‍ය ප්‍රාග්ධනය සහ තාක්ෂණය ආකර්ෂණය කරගැනීම දිරිමත් කිරීම (168)<br><br>දේශීය සමාගම්වලට ජාත්‍යන්තර වෙළඳපොළේ ගනුදෙනු කිරීමට රාජ්‍යතාන්ත්‍රික සහයෝගය ලබා දීම (168) | සීමාසිහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ මෙහෙයුම් සිදුවන ප්‍රදේශ වල විදුලි ඉල්ලුම ඉහළ යාම හේතුවෙන් එම ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන විදුලිය බෙදාහැරීමේ ජාලය ශක්තිමත් කිරීම හා නවීකරණය කිරීම සඳහා සම්ප්‍රේෂණ සංවර්ධන සහ බෙදාහැරීමේ ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කිරීම (2025-03-17) | උචිත | විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සහ ඉල්ලුම සපුරාලීම සඳහා විදුලි බෙදාහැරීමේ ජාල නවීකරණය කිරීම සහ ශක්තිමත් කිරීම මඟින් රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූලව ක්‍රියාකාරකම් සිදු කෙරේ. අඛණ්ඩ සැපයුම සහතික කිරීම සඳහා ප්‍රසම්පාදනය ප්‍රධාන පියවරකි. |
| 60 | ඩිජිටල් ආර්ථිකය | නවෝත්පාදන දිරිමත් කරන, බුද්ධිමය දේපළ අයිතිවාසිකම් ආරක්ෂා කරන, සහ දත්ත පෞද්ගලිකත්වය සහ ආරක්ෂාව සහතික කරන ආධාරක නියාමන රාමුවක් (155) | 2022 අංක 9 දරණ පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත. පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත (සංශෝධන) පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම (2025-03-17) | අර්ධ වශයෙන් උචිත | පුද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කිරීම, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්කයේ මූලික කොටසක් වන දත්තවල රහස්‍යභාවය සහ ආරක්ෂාවට අදාළ නීතිමය විධිවිධාන ශක්තිමත් කිරීම සහ යාවත්කාලීන කිරීම සඳහා සෘජුවම සහය වේ. |
| 61 | දූෂණ විරෝධී | රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණය විධිමත් කිරීම මගින් ශ්‍රී ලංකා මහ<br><br>බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය (FIU) ශක්තිමත් කිරීම (105) | මූල්‍ය වාර්තාකරණ නියාමන පනත් කෙටුම්පත සකස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ එකඟතාව ලබාදීම නීති කෙටුම්පත් සම්පාදක විසින් මූල්‍ය වාර්තාකරණ නියාමන මූලික පනත් කෙටුම්පත සකස් කර තිබේ (17-03-2025) | අර්ධ වශයෙන් උචිත | මූල්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ, පාරදෘශ්‍යභාවය සඳහා නීතිමය ප්‍රතිසංස්කරණ හෝ මූල්‍ය රෙගුලාසි ශක්තිමත් කිරීම අඩංගු නම්, මෙම ක්‍රියාකාරකම NPP ප්‍රතිපත්ති ප්‍රකාශනය සමඟ අර්ධ වශයෙන් අනුකූල වේ. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 62 | බදු | සාධාරණ ලෙස රේගු බදු ආදායම වැඩි කර ගැනීම සඳහා පවතින සංකීර්ණතීරුබදු අනුපාත ව්‍යුහය සරල කිරීම (104) | මෝටර් වාහන ආනයනය කිරීම සඳහා වූ තාවකාලික අත්හිටුවීම ඉවත් කිරීමට සමගාමීව එම වාහන ආනයනය සඳහා 30% ක ආනයන තීරු බද්දක් පැනවීම (17-03-2025) | අර්ධ වශයෙන් උචිත | ක්‍රියාකාරකම රේගු ආදායම වැඩි කිරීම සහතික කරයි. නමුත් එය කිසිදු ව්‍යුහාත්මක වෙනසක් සිදු නොකරයි. |
| 63 | වෙළඳ | සහයෝගීතාවයේ සාමූහික බලය වැඩිදියුණු කිරීම, ශක්තිමත් කිරීම<br><br>සඳහා නව සමුපකාර ව්‍යාපාර ආකෘති ප්‍රවර්ධනය (153) | සමුපාකාර තොග වෙළෙඳ සංස්ථාව ඈවර කිරීම සම්බන්ධයෙන් වන පූර්ව අමාත්‍ය මණ්ඩල තීරණය අවලංගු කර ශක්‍යතාවයෙන් යුත් ව්‍යාපාරික සැලැස්මක් මත පදනම්ව එම සංස්ථාවේ ව්‍යාපාරික කටයුතු නැවත ආරම්භ කිරීම (2025-03-17) | අතිශයින් උචිත | සමුපකාර අංශය ඉහළ නැංවීමේ යෙදවුමක් ලෙස එය ප්‍රතිපත්ති ප්‍රකාශනයට ක්‍රියාකාරීව සම්බන්ධ වේ. |
| 64 | බලශක්තිය | දේශීය අවශ්‍යතා සපුරාලීම සඳහා සපුගස්කන්ද තෙල් පිරිපහදුව නවීකරණය කිරීම සහ පිරිපහදු කළ තෙල් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන සඳහා ප්‍රමාණාත්මක විදේශීය වෙළඳපොළ කොටසක් අත්පත් කර ගැනීම (152) | 2025 මාර්තු මාසයේ සිට 2026 පෙබරවාරි මාසය දක්වා පසුගස්කන්ද විදුලි බලාගාරයේ ස්ථාපිත කර ඇති SEMT Pielstick PC 4.2 ඩීසල් එන්ජින් (A බලාගාරය) සඳහා සහ MAN B&W 8L ඩීසල් එන්ජින් (B බලාගාරය) සඳහා ලිහිසි තෙල් සැපයීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම (2025-03-24) | අර්ධ වශයෙන් උචිත | දේශීය ඉල්ලුම සපුරාලීම සඳහා සපුගස්කන්ද පිරිපහදුව ශක්තිමත් කිරීමේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්කයට මෙම ක්‍රියාකාරකම සෘජුවම දායක වේ. |
| 65 | ණය ප්‍රතිව්‍යුහගතකරණය | රාජ්‍ය මූල්‍ය විනිවිදභාවය සහ ආණ්ඩුවේ වගවීම සහතික කිරීමට හා ණය අවභාවිතය සිදු කළ පුද්ගලයින්ට එරෙහි නීතිමය පියවර ගැනීම සඳහා ආණ්ඩු විසින් ලබා ගත් විදේශ ණය පිළිබඳ සවිස්තරාත්මක ණය විගණනයක් (Debt Audit) කඩිනමින් සිදුකිරීම (106) | රාජ්‍ය ණය කළමනාකරණ පනත මගින් විදේශ ණය ගැනීම් කළමනාකරණය කිරීම සඳහා 1957 අංක 29 දරණ විදේශ ණය පනත සහ එහි පසුකාලීන සංශෝධන අවලංගු කිරීම (2025-03-24) | උචිත | අවලංගු කිරීම විගණනය සහ වගවීම සහතික කරන නව නීති හෝ යාන්ත්‍රණ හඳුන්වා දීම හා සම්බන්ධ නම්, එය අනුකූලවීමක් ලෙස සැලකිය හැකිය. |
| 66 | ඉඩම් | ඵලදායී පරිපාලනයකට සහ කළමනාකරණයකට මඟ පාදන ඉඩම් පිළිබඳ නව නීති රාමුවක් සහ නව ඉඩම් පනතක් (187) | ඉඩම් අත්කර ගැනීමේ ක්‍රියාවලිය සඳහා ගතවන කාලය අවම කර, සරළ ක්‍රමවේදයක් යටතේ ඉඩම් අත්පත්කර ගැනීමටත්, ඒකීය ක්‍රමවේදයක් යටත් වන්දි ගෙවීමටත් හැකිවන පරිදි, 1950 අංක 09 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත වර්තමාන අවශ්‍යතාවන් ගැලපෙන අයුරින් සංශෝධනය කිරීම (2025-03-24) | උචිත | මෙම ක්‍රියාකාරකම ඵලදායී ඉඩම් පරිපාලන පද්ධතියකට දායකවන බැවින් එය ප්‍රතිපත්ති ප්‍රකාශනය සමඟ අනුකූල වේ. ඉඩම් කළමනාකරණය සඳහා වඩා හොඳ නීතිමය රාමුවකි. විධිමත් කරන ලද ක්‍රියාපටිපාටි සහ සාධාරණ වන්දි. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 67 | වෙළඳ | සමුපකාර ක්‍රමය යටතේ නිෂ්පාදකයන් සංවිධානය කිරීම සහ ශක්තිමත් කිරීම (154) | 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත මගින් ප්‍රකාශන අයිතිය, කාර්මික සැලසුම්, පේටන්ට් අයිතිය, ලකුණු හා ව්‍යාපාර නාම ආදියට අදාළව නීතිමය ප්‍රතිපාදන සලසා ඇති නමුත්, ශාක ප්‍රභේදවන අයිතිවාසිකම් ආරක්ෂාව (අභිජනනය කරන්නන්ට, පර්යේෂකයන්ට හා ගොවීන්ට අදාළව) සඳහා ප්‍රතිපාදන නොපවතී. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් නව ශාක ප්‍රභේද අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත සකස් කිරීමේ කටයුතු නිම කිරීම පිණිස වත්මන් අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබාගත යුතු බව පෙන්වා දී ඇත (2025-04-07) | අර්ධ වශයෙන් උචිත | සැබෑ ක්‍රියාකාරකම සහන ප්‍රතිලාභීන්ට ආහාර පැකේජ බෙදා හැරීම සඳහා සමුපකාර සිල්ලර වෙළඳසැල් (COOPFED සහ ලංකා සතොස) භාවිතා කිරීම හා සම්බන්ධ වේ. සමුපකාර හරහා නිෂ්පාදකයින්ට සහාය වීමේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අභිප්‍රාය සමඟ අනුකූලව, එය සමුපකාර රාමු ශක්තිමත් කරන අතර ඔවුන්ගේ මෙහෙයුම් භූමිකාව ඉහළ නංවයි. |
| 68 | නීතිය සහ අධිකරණ | නවෝත්පාදන දිරිමත් කරන, බුද්ධිමය දේපළ අයිතිවාසිකම් ආරක්ෂා කරන, සහ දත්ත පෞද්ගලිකත්වය සහ ආරක්ෂාව සහතික කරන ආධාරක නියාමන රාමුවක් (155) | 2003 අංක 36 දරණ බුද්ධිමය දේපල පනත මගින් ප්‍රකාශන අයිතිය, කාර්මික සැලසුම්, පේටන්ට් අයිතිය, ලකුණු හා ව්‍යාපාර නාම ආදියට අදාළව නීතිමය ප්‍රතිපාදන සලසා ඇති නමුත්, ශාක ප්‍රභේද වල අයිතිවාසිතම් ආරක්ෂාව (අභිජනනය කරන්නන්ට, පර්යේෂකයන්ට හා ගොවීන්ට අදාළව) සඳහා ප්‍රතිපාදන නොපවතී (2025-04-07) | අර්ධ වශයෙන් උචිත | වත්මන් බුද්ධිමය දේපළ පනතේ ශාක විවිධත්වයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා විධිවිධාන නොමැති අතර, එය පවතින රාමුවේ හිඩැසකි. එය ගැටළුව විසඳීම සඳහා නව නීති සම්පාදනය හෝ සංශෝධන හඳුන්වා නොදෙන අතර, දත්ත පෞද්ගලිකත්වය හෝ සයිබර් ආරක්ෂාව ආවරණය නොකරයි. |
| 69 | ප්‍රවාහනය | ජල මාර්ග ප්‍රවාහනය පර්යේෂණ සහ ප්‍රවර්ධනය සඳහා තාක්ෂණික ඒකකයක් සහ ශක්‍යතා අධ්‍යනවලින් හඳුනාගනු ලබන ජල මාර්ගවල මගී සහ භාණ්ඩ ප්‍රවාහන සේවා (174) | පුත්තලම - කොටුව, කොටුව-ගාල්ල, ගාල්ල-මාතර ආදී වශයෙන් සමුද්‍ර ජල ප්‍රවාහන සේවාවක් ඇති කිරීම සහ ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ඇති කිරීම මගින් සංචාරක ප්‍රවර්ධනය සහ මගී ප්‍රවාහනය සඳහා පහසුකම් සැලසීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව, එමෙන්ම, හැමිල්ටන් ඇළ, බේරේ වැව, දියවන්නා ඔය හා මාදු ගඟ වැනි විභවයන් භාවිතා කරමින් අභ්‍යන්තර ජල ප්‍රවාහන පහසුකම් සැපයීම මගින් ද සංචාරක කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂිත ය. (2025-04-21) | අතිශයින් උචිත | මේ දෙකම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අපේක්ෂා කරන ප්‍රායෝගික යටිතල පහසුකම් සහ සේවාවන් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාකාරකම සමඟින්, ජල මාර්ග ප්‍රවාහනය සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම අවධාරණය කරයි. |
| 70 | සමුද්‍ර | ධීවර වරායන් ආශ්‍රිතව යාත්‍රා රැඳවීමට සේවා පදනම් කරගත් කලාප වෙන් කිරීම (130) | කරෙයිනගර් බෝට්ටු අංගනය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඉන්දීය රජයේ ප්‍රදානයක් ලබාගැනීම පිණිස අවබෝධතා ගිවිසුමකට අත්සන් තබා තිබේ (2025-04-21) | අර්ධ වශයෙන් උචිත | ක්‍රියාකාරකම වක්‍රව දායක විය හැකි නමුත් ප්‍රකාශනයේ නිශ්චිත කැපවීම පැහැදිලිව ක්‍රියාත්මක නොකරයි. |
| 71 | සංචාරක කර්මාන්තය | දේශීය සංචාරක ව්‍යාපාරය රට තුළ ප්‍රමුඛ හා විකල්ප සංචාරක ප්‍රවාහයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය හා, පෞද්ගලික අංශයේ සහභාගිත්වය දිරිමත් කිරීම (146) | නෞකාවන්හි හා කොළඹ වරාය නගරයේ අක්වෙරළ සූදු ක්‍රීඩා ක්‍රියාකාරකම් සහ මාර්ගගත සූදු ක්‍රීඩා ක්‍රියාකාරකම් ඇතුළුව ශ්‍රී ලංකාවේ සූදු ක්‍රීඩා කර්මාන්ත මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් පුළුල් හා පූර්ණ විෂය පථයක් සහිත ස්වාධීන තනි නියාමකවරයෙකු වශයෙක් ක්‍රියා කිරීම සඳහා (2025-04-21) | උචිත නොවන | සූදුව සංචාරක ව්‍යාපාරයේ කොටසක් විය හැකි වුවද, සූදු මෙහෙයුම් නියාමනය කිරීම ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හෝ දේශීය සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම හා සමාන නොවේ. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 72 | ප්‍රවාහනය | ඛනිජතෙල් මත යැපෙන ප්‍රවාහන පද්ධතිය පිරිසිදු හා හරිත බලශක්තිය වෙත ක්‍රමානුකූලව පරිවර්තනය කිරීමට පියවර (168) | විදුලි බලයෙන් ධාවනය කරන මෝටර් ට්‍රයිසිකල් (ත්‍රිරෝද රථ) ලියාපදිංචිය සඳහා ප්‍රතිපාදන සැලසීම විද්‍යුත් මෝටර් ට්‍රයිසිකල් (ත්‍රිරෝද රථ) නිෂ්පාදනයේදී සහ පෙට්‍රල් හෝ ඩීසල් භාවිතයෙන් ධාවනය කරනු ලබන මෝටර් ට්‍රයිසිකල් (ත්‍රිරෝද රථ) විදුලි බලයෙන් ධාවනය කිරීමට හැකිවන අයුරින් පරිවර්තනය කිරීමේදී විද්‍යුත් ආරෝපිත බැටරි භාවිතා කිරීම හේතුවෙන් එවැනි මෝටර් ට්‍රයිසිකල් වල (ත්‍රිරෝද රථ වල) තාර බර ඉහළ යාම සිදුවේ (2025-04-21) | අර්ධ වශයෙන් උචිත | බැටරි හේතුවෙන් තාර බර වැඩිවීමක් මෙම ක්‍රියාකාරකම සටහන් කළද, විදුලි බලයෙන් ක්‍රියාත්මක වන වාහන ප්‍රවර්ධනය කිරීමේ මූලික ක්‍රියාව, ප්‍රවාහනය ක්‍රමානුකූලව විද්‍යුත්කරණය කිරීම පිළිබඳ ප්‍රෙතිපත්ති ප්‍රකාශනයේ ඉලක්කයට සම්පූර්ණයෙන්ම අනුකූල වේ. |
| 73 | ආර්ථිකය | ආයෝජන හා ව්‍යාපාර කටයුතු සම පසුබිමක් තුළ පහසුවෙන් කිරීමට<br><br>නව ව්‍යාපාරවලට පිවිසීමේ සහ ස්ථාන සොයා ගැනීමේ පහසුව, ජලය හා<br><br>විදුලිය ඇතුළු උපයෝගිතා පහසුවෙන් ලබා ගැනීම, ඉහළ නිපුණතාවයෙන්<br><br>යුත් ශ්‍රම සුලබතාවය ඇති කිරීම, කාර්යක්ෂම මූල්‍ය සේවා, ජාත්‍යන්තර<br><br>වෙළඳාමට පිවිසීම, සාධාරණ හා පාරදෘශ්‍ය බදු අයකිරීම, කාර්යක්ෂම ආරවුල් බේරුම්කරණය හා වෙළඳපොළ තරගකාරීත්වය තහවුරු කරන ආර්ථික<br><br>ප්‍රජාතන්ත්‍රවාදය සහිත පරිසරයක් නිර්මාණය කිරීම (107) | මධ්‍යකාලීන රාමුවක් තුළ දළ දේශීය නිෂ්පාදිතයෙන් 5% කට වැඩි ආර්ථික වර්ධන වේගයක් අත්කර ගැනීමට රජය අපේක්ෂා කරනු ලබයි.<br>කාර්යක්ෂමතාව සහ ජාතික ආර්ථික අරමුණු කෙරෙහි යොමු ගතවීම තහවුරු කර ගනිමින් ආර්ථික සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති සාකච්ඡා අධීක්ෂණය හා ඒ සඳහා පහසුකම් සැලසීම පිණිස ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද විශේෂ කමිටුව ස්ථාපිත කිරීම (2025-04-21) | අර්ධ වශයෙන් උචිත | මෙම ක්‍රියාකාරකම ආර්ථික සංවර්ධනය හා සම්බන්ධීකරණය පිළිබඳ පොදු ඉලක්කයට සහය වන නමුත් සවිස්තරාත්මක ප්‍රතිපත්ති ප්‍රකාශන සංරචක පිළිබඳ පැහැදිලි ක්‍රියාමාර්ග නොමැත. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 74 | නීතිය සහ අධිකරණ | පතල් කර්මාන්තයේ හා මැණික් ව්‍යාපාරයේ තිරසර සංවර්ධනය ඉලක්ක කර මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනත සඳහා අත්‍යවශ්‍ය යාවත්කාලීන සංශෝධනයන් (161) | පහත සඳහන් පනත් සංශෝධනය කිරීම සඳහා සහ එකී පනත් සංශෝධනයන් 2025 වර්ෂයේ රජයේ නීති සම්පාදන වැඩසටහනට ඇතුළත් කිරීම:<br><br>1993 අංක 50 දරණ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත<br><br>1969 අංක 36 දරණ කාර්මික සංවර්ධන පනත<br><br>2009 අංක 12 දරණ ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතන පනත<br><br>1979 අංක 40 දරණ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත<br><br>2006 අංක 17 දරණ ජාතික ව්‍යවසාව සංවර්ධන අධිකාරිය පනත<br><br>2014 අංක 18 දරණ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත<br><br>1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභාව සහ අනුබද්ධ ආයතන පනත<br><br>1996 අංක 04 දරණ ජාතික ශිල්ප සභාව සහ අනුබද්ධ ආයතන (විශේෂ විධිවිධාන) පනත (2025-04-28) | උචිත | මෙම ක්‍රියාකාරකමට කාර්මික සංවර්ධන පනත සහ 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත සංශෝධනය කිරීම ඇතුළත් වේ. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 75 | කර්මාන්ත | තේ , රබර්, පොල් වැනි බහු වාර්ෂික භෝග වගාවන්හි අතුරුභෝග වගාව සහ භෝග විවිධාංගීකරණය සඳහා තාක්ෂණික, මූල්‍ය හා අනෙකුත් පහසුකම් (116) | 1956 අංක 11 දරන රබර් පාලන පනත සංශෝධන කිරීම පිණිස නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත නැවත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය පිණිස පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම (2025-04-28) | උචිත | මෙම ව්‍යවස්ථාදායක ක්‍රියාමාර්ගය, රබර් අංශය තුළ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්ක සපුරා ගැනීම සඳහා වන ප්‍රත්‍යක්ෂ පියවරකි. |
| 76 | කර්මාන්ත | තේ , රබර්, පොල් වැනි බහු වාර්ෂික භෝග වගාවන්හි අතුරු භෝග වගාව සහ භෝග විවිධාංගීකරණය සඳහා තාක්ෂණික, මූල්‍ය හා අනෙකුත් පහසුකම් (116) | 1956 අංක 11 දරණ රබර් පාලන පනත සංශෝධනය කිරීම පිණිස නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති පනත් කෙටුම්පත නැවත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය පිණිස පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.<br><br>1958 අංක 2 දරණ තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීම පාලන) පනත සංශෝධනය කිරීම.<br><br>2005 අංක 19 දරණ සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම පනත සංශෝධනය කිරීම.<br><br>2000 අංක 47 දරණ තේ ශක්ති අරමුදල පනත සංශෝධනය කිරීම.<br><br>1957 අංක 51 දරණ තේ පාලන පනත සංශෝධනය කිරීම.<br><br>1956 අංක 11 දරණ රබර් පාලන පනත සංශෝධනය කිරීම.<br><br>වැවිලි කළමනාකරණ පනත ලෙස නව පනතක් හඳුන්වා දීම.<br><br>තුරුසවිය සමිතින්හි බලතල රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට පැවරීම සඳහා නව පනතක් හඳුන්වා දීම.<br><br>1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනතට කාලීන අවශ්‍යතාව මත නව රෙගුලාසි ඇතුළත් කිරීමට හැකිවන ලෙස එම පනතට සංශෝධන ගෙන ඒම.<br><br>1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත සහ රෙගුලාසි ආශ්‍රිත සංශෝධන සිදු කිරීම (2025-04-28) | අර්ධ වශයෙන් උචිත | ක්‍රියාකාරකමෙහි "අතුරු භෝග වගාව" හෝ භෝග "විවිධාංගීකරණය" ගැන පැහැදිලිව සඳහන් නොවුනත්, මූලික වැවිලි ආශ්‍රිත නීති සඳහා කරන ලද පුළුල් සංශෝධන, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අරමුණු ක්‍රියාත්මක කිරීමට පහසුකම් සහ රාමු බලදායී කිරීමට ප්‍රබල ලෙස සහය වේ. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 77 | පර්යේෂණ හා සංවර්ධනය | අපේ රටට අවශ්‍ය නවීන අඩු වියදම් යන්ත්‍රෝපකරණ සහ මෙවලම් තැනීම සඳහා දේශීය නිෂ්පාදකයින්ට පර්යේෂණ හා සංවර්ධන පහසුකම් සහ අවශ්‍ය කුසලතා ලබාදීම (සිංහල පිටපත තුළ සඳහන්ව නැත. පරිවර්තනය: පැෆ්රල් සංවිධානය) | දියුණු තාක්ෂණයන් හුවමාරු කිරීමට පහසුකම් සැලසීමෙන් සහ දේශීය පාර්ශවකරුවන් සඳහා පුහුණුව සහ ධාරිතා ගොඩනැංවීමේ කටයුතු සඳහා ප්‍රවේශය ලබාදෙමින් සංශෝධන ඇතුළත් කොට යාවත්කාලීන කරන ලද යන්ත්‍රෝපකරණ නිෂ්පාදන සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම අත්සන් තැබීම (2025-04-28) | උචිත | නවීන යන්ත්‍රෝපකරණ තැනීම සඳහා අවශ්‍ය දියුණු තාක්ෂණයන් සහ කුසලතා සංවර්ධනය වෙත ප්‍රවේශය බලදායී කිරීම මගින් මෙය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්කයට සෘජුවම සහය වේ. |
| 78 | ව්‍යවසායකත්වය | උපායමාර්ගික වැදගත්කම, ආර්ථික වර්ධනයේ විභවතාවය, නිෂ්පාදන ආර්ථිකය උත්තේජනය කිරීමේ හැකියාව, මූල්‍ය ස්ථාවරත්වයට ඇති බලපෑම සහ ජාතික ආරක්ෂාවට ඇති අදාළත්වය සලකා බලමින් එක් එක් ආයතනය සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග තීරණය කිරීම (108) | රජය සතු ව්‍යාපාරික සමාගම් මනා කළමනාකරණයකින් යුතුව හා අවශ්‍ය ප්‍රතිසංස්කරණයන් සිදුකර පවත්වා ගෙන යාමට අවශ්‍ය නව නෛතික රාමුවක් හඳුන්වා දීම සඳහා "රාජ්‍ය වාණිජ ව්‍යාපාර කළමනාකරණ පනත් කෙටුම්පත", නමින් මූලික කෙටුම්පතක් මේ වනවිට සකස් කර ඇත. එමඟින්, රාජ්‍ය ව්‍යවසායයන් සම්පූර්ණයෙන්ම දේශපාලන බලපෑම් වලින් ඉවත් කිරීමටත්, ඒවායේ අධ්‍යක්ෂ මණ්ඩල සඳහා වෘත්තීය සුදුසුකම් සහිත ක්ෂේත්‍රයන්හි ප්‍රවීණත්වයක් සහිත වෘත්තිකයන් පත් කිරීමටත් හැකිවනු ඇත (2025-04-28) | අතිශයින් උචිත | ආර්ථික වර්ධනයට, මූල්‍ය ස්ථාවරත්වයට සහ නිෂ්පාදන ආර්ථික උත්තේජනයට දායක වෙමින් රජය සතු ව්‍යවසායන්හි උපායමාර්ගික සහ වෘත්තීය කළමනාකරණය බලදායී කිරීම. ජාතික අවශ්‍යතා වෙනුවෙන් තීරණ ගන්නා බව ද එය සහතික කරයි. |
| 79 | පර්යේෂණ හා සංවර්ධනය | ඩෙංගු, වකුගඩු (CKD), බෝවන රෝග, සහ ශ්‍රී ලංකාවට අදාළ වෙනත් විශේෂ සෞඛ්‍ය ගැටලු විසඳීම සඳහා ජාන විද්‍යාව, ජෛව රසායනය, නැනෝ තාක්ෂණය, පරිවෘත්තීය, ප්‍රෝටියෝමික්ස්, සහ කෘත්‍රිම බුද්ධිය (AI) වැනි නවීන විද්‍යාත්මක ක්‍රම (138) | වත්මන් දේශීය හා ලෝක ආර්ථික හා දේශපාලන ප්‍රවණතා යටතේ නැනෝ තාක්ෂණික හා ජෛව තාක්ෂණික පර්යේෂණ හා සංවර්ධන ප්‍රවේශයක් තුළින් ශ්‍රී ලංකාවේ සීඝ්‍ර ආර්ථික වර්ධනයක් සඳහා වැඩි දායකත්වයක් ලබාදීමට හැකිවන පරිදි එම ආයතන දෙක ප්‍රතිව්‍යුහගත කිරීම සුදුසු බවට හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් යන ආයතන කාර්යභාරය සමාලෝචනය කර, ඒවායේ නෛතික ව්‍යුහය හා උපායමාර්ගික සැලසුම් සඳහා සිදුකළ යුතු ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් නිර්දේශ සහිත වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස විද්‍යුත් කමිටුවක් පත් කිරීම සඳහා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව (2025-05-07) | අර්ධ වශයෙන් උචිත | ආයතන දෙකම ප්‍රතිපත්ති ප්‍රකාශන යෝජනාවට අදාළ වීමෙන්, සංශෝධනය එහි කාර්යසාධනයන්ට සහාය විය හැකිය. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 80 | කර්මාන්ත | මන්නාරම් සහ කාවේරි ද්‍රෝණියේ දැනට සිදුකෙරී ඇති ගවේෂණවලින් හඳුනාගෙන ඇති ස්වභාවික වායු ඇතුළු ඛනිජ ඉන්ධන සම්පත උකහා ගැනීමට අදාළ කැණීම් හා නව ගවේෂණ ගිවිසුම්වලට කඩිනමින් එළඹීමට කටයුතු කිරීම (167) | මන්නාරම් ද්‍රෝණියේ ගවේෂණ බිම් කොටස් 04 හි ඛනිජතෙල් හා ස්වාභාවික වායු ගවේෂණය සහ නිෂ්පාදනය සඳහා ආයෝජන යෝජනා කැඳවීම සඳහා බලපත්‍ර වටයක් ක්‍රියාත්මක කිරීමටත්, එම කාර්යය සඳහා ඵලදායී අලෙවිකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම පිණිස සුදුසු අලෙවිකරණ උපදේශකයෙකුගේ සේවය ලබා ගැනීම (2025-05-07) | අර්ධ වශයෙන් උචිත | මෙම ක්‍රියාකාරකම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අනාගත ක්‍රියාමාර්ග සඳහා මූලික සාධාරණීකරණයක් සපයයි. නමුත් එය අතීතයට බලපාන අතර ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අනාගත පොරොන්දු ක්‍රියාත්මක කිරීමක් නොවේ. |
| 81 | සමාජ ආරක්ෂණය | සමෘද්ධි හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුද ඇතුළත් සමුපකාර බැංකුකරණය ශක්තිමත් කර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ මූල්‍ය අවශ්‍යතා සම්පාදනය කිරීම (153) | සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති රජයේ විගණනයට යටත් කිරීම පිණිස සංශෝධනයක් ඇතුළත් කිරීම සඳහා 2017 අංක 2 දරණ දිවි නැගුම (සංශෝධන) පනතින් සංශෝධිත 2013 අංක 1 දරණ සමෘද්ධි පනත සංශෝධනය කිරීම පිණිස 2024-12-30 දින පැවති රැස්වීම (2025-05-07) | අර්ධ වශයෙන් උචිත | මෙම ක්‍රියාකාරකම සමෘද්ධි බැංකු ව්‍යුහාත්මකව ශක්තිමත් කිරීමට සහය වන අධීක්ෂණය සහ වගවීම වැඩි දියුණු කරයි. නමුත් එය ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (MSMEs) සඳහා මූල්‍ය සහයෝගය වැඩි දියුණු කිරීමේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්කය සෘජුවම ක්‍රියාත්මක නොකරයි. |
| 82 | සංචාරක කර්මාන්තය | R & D මගින් අගය එකතු කළ සේවාවන් සහ ස්වභාවික සම්පත් උපයෝගී කරගෙන තිරසාර ලෙස සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය (141) | යෝජිත අවබෝධතා ගිවිසුම මඟින් මහජන චීන සමූහාණ්ඩුව සහ ශ්‍රී ලංකාව අතර වැඩසටහන් හුවමාරු කර ගැනීම, ඉගෙනුම් හා පුහුණු අවස්ථා ප්‍රවර්ධනය කිරීම, ඒකාබද්ධ රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදනය කිරීම සහ සංචාරක කර්මාන්තයට අවශ්‍ය ප්‍රචාරණය ලබාගැනීම සඳහා අවස්ථාව සැලසෙනු ඇත (2025-05-19) | උචිත | මෙම ක්‍රියාකාරකම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පුළුල් ඉලක්කයට අනුකූල වෙමින්, සංචාරක කර්මාන්තයේ වර්ධනයට සහ දාශ්‍යතාවට සහය වේ. කෙසේ වෙතත්, එය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පර්යේෂණ හෝ දේශීය අගය එකතු කිරීමේ අවධානය සෘජු ආකාරයකින් ඉටු නොකරයි. |
| 83 | බදු | පුද්ගලයින් සඳහා වන වාර්ෂික බදු නිදහස් සීමාව රුපියල් ලක්ෂ 12 සිට ලක්ෂ 24දක්වා වැඩිකිරීමට සහ බදු කාණ්ඩ (Tax Brackets) හා බදු අනුපාත (Tax Rates) සාධාරණ ලෙස සංශෝධනය කිරීම (104) | පොලිය මත රඳවා ගැනීමේ බද්ද අය කිරීමෙන් නිදහස් කිරීම සඳහා වසරකට රුපියල් මිලියන 1.8 ක් නොඉක්මවන තක්සේරු ආදායමක් සහිත සියලු නේවාසික තැන්පත්කරුවන් සඳහා ස්වයං ප්‍රකාශනයක් හඳුන්වා දීමට සහ සියලුම වර්ගයේ බැංකු ගිණුම් විවෘත කිරීම සඳහා බදු හඳුනාගැනීමේ අංකය (TIN) ඉදිරිපත් කිරීම අනිවාර්ය කිරීම (2025-05-19) | අර්ධ වශයෙන් උචිත | මෙම ක්‍රියාකාරකම අඩු ආදායම්ලාභීන්ගෙන් කොටසකට සුළු බදු සහනයක් හඳුන්වා දෙන අතර සාධාරණ බදු ක්‍රමයක් කරා යන ක්‍රමික පියවරක් පිළිබිඹු කරයි. ආදායම් බදු සීමාව දෙගුණ කිරීමේ හෝ බදු කාණ්ඩ පුළුල් ලෙස සංශෝධනය කිරීමේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ මූලික පොරොන්දුව එය ඉටු නොකරයි. |
| 84 | පර්යේෂණ හා සංවර්ධනය | ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් සිදුවන ආර්ථික ප්‍රවණතා, විභවතා හා සංවර්ධනයන් තුළ නව අවස්ථා ගවේෂණය කිරීම සඳහා පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම (108) | පර්යේෂණ සහ සංවර්ධන වාණිජකරණ ජාතික ප්‍රවේශය වෙත වාණිජකරණය සඳහා යොමු කෙරෙන ව්‍යාපෘති යෝජනා ඇගයීමට ලක්කර, සුදුසු ආයෝජකයින් වෙත යොමු කිරීම සඳහා තාක්ෂණ, අධ්‍යාපන, විද්‍යා, සෞඛ්‍ය, පාරිසරික, ආහාර හා තිරසරභාවය, සමාජ සංවර්ධනය, යහපැවැත්ම හා අනෙකුත් අංශ වල විශේෂඥ දැනුම සහිත විශේෂඥයින්ගෙන් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කිරීම (2025-05-26) | උචිත | මෙම ක්‍රියාකාරකම පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා සහාය ආයතනගත කිරීම, නවෝත්පාදනයන් පෝෂ්‍ය කිරීම සහ ආයෝජකයින්ගේ සහභාගිත්වය සහ වාණිජකරණය හරහා එය ආර්ථික අවස්ථාවන්ට සම්බන්ධ කිරීම මගින් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්කය ඉදිරියට ගෙන යයි. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 85 | ඩිජිටල් ආර්ථිකය | පුරවැසියන්ට විනිවිදභාවයෙන් හා කාර්යක්ෂම සේවා සැපයීම සඳහා ප්‍රතිචාරාත්මක රාජ්‍ය අංශයක් බිහිකිරීම උදෙසා ප්‍රධාන රාජ්‍ය ආයතන ඩිජිටල්කරණය කිරීම (133) | දැනටමත් ආරම්භ කර ඇති සහ ඉදිරියේදී ආරම්භ කිරීමට සැලසුම් කර ඇති ඩිජිටල් පරිවර්තන ව්‍යාපෘති බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි අවශ්‍ය බලතල සහිත ස්වාධීන ආයතනයක් වශයෙන් 'GovTech (Pvt) Limited' නමින් රජය සතු සමාගමක් ස්ථාපිත කිරීම (2025-05-26) | අතිශයින් උචිත | මෙම ක්‍රියාකාරකම, එම ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය කැපවූ ආයතනික යටිතල පහසුකම් නිර්මාණය කිරීම මඟින්, ඩිජිටල් ලෙස විපරිවර්තනය කරන ලද, පුරවැසි කේන්ද්‍රීය රජයක් පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දැක්මට සෘජුවම සහය වේ. |
| 86 | ව්‍යවසායකත්වය | සංචාරක අංශයේ සංවර්ධනය සඳහා විධිමත් ජාත්‍යන්තර හවුල්කාරිත්වයන්, පරිත්‍යාගශීලී නියෝජිතායතන සහ රාජ්‍ය නොවන සංවිධානවල තාක්ෂණික සහ මූල්‍ය ආධාර ප්‍රමුඛතා සහ අවශ්‍යතා පදනමින් ඵලදායී ලෙස භාවිත කිරීම (146) | 'රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ වැඩසටහන' යටතේ කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමේ කොටස් නැවත ආරම්භ කිරීම, සහ ඒ සඳහා තවදුරටත් ගනුදෙනු උපදේශක ලෙස ඉන්දියාවේ ඩෙලොයිට් ටච් තොමත්සු එල්එල්පී සමාගමේ සේවය ලබා ගැනීම (2025-05-26) | උචිත නොවන | මෙම ක්‍රියාකාරකම වාණිජමය වශයෙන් කොටස් ආපසු පැවරීමේ ක්‍රියාවලියක් වන අතර, එය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු වූ පරිදි සංචාරක අංශයේ වර්ධනය සඳහා ජාත්‍යන්තර සංවර්ධන හවුල්කාරිත්වයන් ගොඩනැගීම සඳහා වන මුලපිරීමක් නොවේ. |
| 87 | සංචාරක කර්මාන්තය | ශක්‍යතා අධ්‍යයන පදනම් කරගනිමින් නව සංචාරක ගමනාන්ත ස්ථාපිත කර අදාළ පාර්ශවකරුවන්ට පහසුකම් (145) | "සමුද්‍රීය මාර්ගයේ රාත්‍රී යාමයː: නොනිදන කොළඹ" (Marine Nights: Awakening Colombo) තේමාව යටතේ කොල්ලුපිටිය දුම්රිය ස්ථානයේ සිට දෙහිවල දක්වා කිලෝමීටර් 7.4 ක් පමණ වන කොළඹ සමුද්‍රීය මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. එහිදී ගාලු මුවදොර කෙලවර සිට ශාන්ත තෝමස් ප්‍රාථමික පාසල දක්වා මීටර 400 ක් පමණ වන කලාපය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට අපේක්ෂා කරනු ලබයි (2025-05-26) | උචිත | ඉලක්කගත සංවර්ධන මුලපිරීම් හරහා සංචාරක කර්මාන්තය වෙත පිරිනමන අවස්ථා පුළුල් කිරීමේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අරමුණට අනුකූලව, නව නාගරික සංචාරක ගමනාන්තයක් නිර්මාණය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය සෘජුවම දායක වේ. |
| 88 | කෘෂිකර්මාන්තය | සාධාරණ මිලට පොහොර ඇතුළු කෘෂි යෙදවුම් ලබා දීම (116) | විවෘත වෙළෙඳපොළ තුළ සෘජු හා මිශ්‍ර පොහොර ලෙස අලෙවි කිරීම පිණිස ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය අනුගමනය කරමින්, යූරියා මෙට්‍රික් ටොන් 15,000 ක් ස්ටේට් ෆර්ටිලයිසර් කම්පැනි ලිමිටඩ් විසින් ආනයනය කිරීම (2025-05-26) | අර්ධ වශයෙන් උචිත | පොහොර ආනයනය කිරීම සහ බෙදා හැරීම සාධාරණ මිල ගණන් යටතේ ලබාගත හැකි බව සහතික කරන බැවින්, සම්පූර්ණ අනුකූල වීම තහවුරු කිරීම සඳහා, මිලකරණ ප්‍රතිපත්ති සහ යහපත් පිළිවෙත් ප්‍රවර්ධනය පිළිබඳ විස්තර ප්‍රයෝජනවත් වනු ඇති නමුත්, ක්‍රියාකාරකම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අභිප්‍රාය සමඟ අනුකූල වේ. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 89 | වෙළඳ | ආයෝජන හා ව්‍යාපාර කටයුතු සම පසුබිමක් තුළ පහසුවෙන් කිරීමට නව ව්‍යාපාරවලට පිවිසීමේ සහ ස්ථාන සොයා ගැනීමේ පහසුව, ජලය හා විදුලිය ඇතුළු උපයෝගිතා පහසුවෙන් ලබා ගැනීම, ඉහළ නිපුණතාවයෙන් යුත් ශ්‍රම සුලබතාවය ඇති කිරීම, කාර්යක්ෂම මූල්‍ය සේවා, ජාත්‍යන්තර වෙළඳාමට පිවිසීම, සාධාරණ හා පාරදෘශ්‍ය බදු අයකිරීම, කාර්යක්ෂම ආරවුල් බේරුම්කරණය හා වෙළඳපොළ තරගකාරීත්වය තහවුරු කරන ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය සහිත පරිසරයක් නිර්මාණය කිරීම (107) | විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන වල ව්‍යාපාරික ක්‍රියාකාරකම් සාර්ථකව සහ තිරසරව සිදු කිරීම සඳහා මධ්‍යගත, නෛතිකව පිළිගත හැකි සහ වගවීම සහිත ආයතනික සැකැස්මක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ තිබේ (2025-05-26) | අර්ධ වශයෙන් උචිත | එය ව්‍යාපාරික කටයුතු සඳහා හිතකර සහ නියාමනය කරන ලද පරිසරයක් පෝෂ්‍ය කිරීම සඳහා සංයුක්ත ආයතනික යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කරන අතර, එය ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය සහ ව්‍යාපාර කිරීමේ පහසුව සඳහා වන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්ක වලට අනුකූල වේ. |
| 90 | පශු සම්පත් | ගොවිපළවල් යාන්ත්‍රීකරණයෙන් සුළු පරිමාණ ගොවි ඒකක උපරිම ආර්ථික වාසි ලබන මධ්‍ය මට්ටමේ වාණිජ ඒකක බවට පරිවර්තනය (120) | ලෝක බැංකුව විසින් මූල්‍යනය කරනු ලබන අන්තර්ගතිකව සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කෘෂිකර්ම අංශය දියුණු කිරීම සඳහා වෙන් කර ඇති ඇමෙරිකානු ඩොලර් මිලියන 10 ක අරමුදල් උපයෝජනය කරමින් "කිරි ගොවිපොළ ඵලදායීතාව ඉහළ නංවා කිරි අගය දාම සංවර්ධනය කිරීම" (2025-05-26) | උචිත | කෘෂිකාර්මික ඒකක වාණිජමය වශයෙන් ශක්‍ය මෙහෙයුම් බවට පරිවර්තනය කිරීම හා ගැලපෙන, විශේෂයෙන් කිරි ගොවිපලවල් ඉලක්ක කර ගනිමින්, කුඩා ගොවිපලවල් වඩාත් ඵලදායී හා ශක්‍ය බවට පත්කිරීමේ පුළුල් ඉලක්කයට එය සහාය වේ. |
| 91 | වෙළඳ | ප්‍රපාතන විරෝධී (Anti-Dumping) නීතිරීති ශක්තිමත් කිරීම සහ සාධාරණ වෙළෙඳාම (Fair Trading) පිළිබඳව නව නීති රීති හඳුන්වාදීම සහ පවතින නීති යාවත්කාලීන කිරීම (109) | 2018 අංක 2 දරණ ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනතේ විධිවිධාන යටතේ සාදන ලද සහ අංක 2429/32 දරණ 2025-03-27 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති 2025 ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පැනවීම සඳහා විමර්ශනයක් ආරම්භ කිරීම සඳහා අයදුම් පත්‍රය (2025-05-26) | අතිශයින් උචිත | මෙම ක්‍රියාකාරකම, ප්‍රපාතන විරෝධී නීති ශක්තිමත් කිරීම සහ අදාළ රෙගුලාසි යාවත්කාලීන කිරීම පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්කයට සහාය දක්වයි. |
| 92 | බදු | බදු අය කිරීමේ කාර්යක්ෂමතාව හා සාධාරණ බව තහවුරු කිරීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුව, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය ඇතුළු අදාළ රාජ්‍ය ආයතනවල මෙහෙයුම් දේශීය අදායම් දෙපාර්තමේන්තුව සමග ජාලගත කිරීම (103) | සාර්ව ආර්ථික ස්ථායීකරණ ක්‍රියාමාර්ග යටතේ ජාත්‍යන්තර ගනුදෙනු සම්බන්ධයෙන් කටයුතු කිරීමට විශේෂ අංශයක් ද සහිතව බදු ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා නව ඒකකයක් හඳුන්වා දීමට යෝජනා කර ඇත. ඒ අනුව, දැනට පවතින අභියෝග ජය ගැනීම තුළින් රාජ්‍ය ආදායම් පරිපාලන යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රශස්ත භාවිතයන් සමග අනුගත වෙමින් 'ආදායම් පරිපාලන ප්‍රතිසංස්කරණ හා නවීකරණ කාර්යාංශය' යන නමින් විශේෂ කාර්යාංශයක් ජනාධිපති කාර්යාලය යටතේ පිහිටුවීමට අනුමැතිය ලැබී ඇත (2025-05-26) | උචිත | එය ගැටළු හඳුනා ගැනීම පමණක් සිදු කරයි, නමුත් ඒකාබද්ධ කිරීම හෝ එම ඒකාබද්ධ කිරීම හරහා කාර්යක්ෂමතාව සහ සාධාරණත්වය වැඩි දියුණු කිරීම සඳහා පියවර දක්වන්නේ නැත. |

## ආණ්ඩුකරණ ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 01 | සමාජ ආරක්ෂණය | රැඳවියන්ට ලබාදෙන ආහාරවල ගුණාත්මකභාවය සහතික කිරීම (210) | බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ බන්ධනාගාර වල රැඳවියන් වැඩිවීම සහ ආහාර මිල ඉහළ යාම හේතුවෙන් ආහාරපාන සඳහා දැරිය යුතු පිරිවැය ඉහළ යාම නිසා අවශ්‍ය අතිරේක ප්‍රතිපාන සලසා දීම (2024-11-25) | අර්ධ වශයෙන් උචිත | ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ප්‍රකාශිත ප්‍රමුඛතාවයට අනුකූලව, සිරකරුවන්ගේ ආහාරවල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා රුපියල් මිලියන 1,4000 ක් වෙන් කිරීම ප්‍රායෝගික පියවරකි. |
| 02 | රාජ්‍ය සේවය | රාජ්‍ය සේවාවෙහි කාර්යක්ෂමතාවය වැඩිකිරීම සඳහා ජනප්‍රියව භාවිත කරන සේවක කප්පාදුව වෙනුවට, නව සමාජ ආර්ථික ඉලක්කයන් ළඟා කරගැනීමේ අරමුණ සහිතව සේවකයින් ප්‍රතිස්ථානගත කිරීම සඳහා ඔවුන්ගේ හැකියාවන් සහ සුදුසුකම් ඇතුළු අනෙකුත් තොරතුරු හඳුනාගැනීමට කඩිනම් සංගණනයක් පැවැත්වීම (198) | සංවර්ධන නිලධාරින්ගේ පරිපාලන කටයුතු වලදී මෙන්ම, කාර්යසාධනය සම්බන්ධව වර්තමානයේදී උද්ගත වී ඇති විවිධ ගැටලු හඳුනාගෙන, එම ගැටලු විශ්ලේෂණය කර ඒ සඳහා තිරසර විසඳුම් ඉදිරිපත් කිරීම සහ අමාත්‍ය කමිටුවට සහාය වීම පිණිස අග්‍රාමාත්‍ය ලේකම්වරාගේ සභාපතිත්වයෙන් යුත් නිලධාරි කමිටුවක් පත් කිරීම (2024-12-02) | අර්ධ වශයෙන් උචිත | සීමිත විෂය පථයකි (එක් සේවක කාණ්ඩයක් පමණි) සම්පූර්ණ සංගණනයක් නොවේ. පුළුල් ප්‍රතිසංස්කරණ සඳහා පරිපාලනමය පියවරකි,නමුත් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ වඩා පුළුල් ශ්‍රම බලකාය ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්මට සමාන නොවේ. |
| 03 | ප්‍රජාතන්ත්‍රවාදය | දැනට දින නියමයක් නොමැතිව කල්තබා ඇති පළාත් සභා සහ පළාත් පාලන මැතිවරණ වසරක් ඇතුළත පවත්වා ජනතාවට පාලනයට සම්බන්ධ වීමට අවස්ථාව සැලැසීම (231) | සියලු ඡන්ද හිමියන්ගේ ඡන්ද අයිතිය සහ තරුණ ප්‍රජාවගේ ඡන්දය සඳහා නාම යෝජනා ලබාදීමේ අයිතිය ආරක්ෂා වන පරිදි දැනට කැඳවා ඇති පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා වන නාම යෝජනා ආපසු කැඳවීමට සහ නව නාම යෝජනා කැඳවීම පිණිස විධිවිධාන සැලැස්වීමට හැකිවන පරිදි මැතිවරණ කොමිෂන් සභාව වෙත බලය ලැබෙන සේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදක වෙත උපදෙස් ලබාදීම සඳහා යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. (2024-12-02) | අර්ධ වශයෙන් උචිත | මැතිවරණ ප්‍රකාශනයේ සඳහන් පරිදි පළාත් සභා මැතිවරණයට නොව, මැතිවරණ කාලසටහන මෙහෙයවීම සහ මැතිවරණ පොරොන්දුව ඉටු කිරීම සඳහා පළාත් පාලන ආයතන වලට ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවේශය සහ සහභාගිත්වය ශක්තිමත් කිරීම සඳහා නීතිමය යාන්ත්‍රණය. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 04 | රාජ්‍ය සේවය | රාජ්‍ය සම්පත් භාවිතයේදී සිදුවන නාස්තිය නැති කිරීම සඳහා රාජ්‍ය ආයතනයන් දිරිගන්වමින් ඒවා මැනීම සඳහා දර්ශක හඳුන්වාදීම (199) | සියලුම රාජ්‍ය ආයතන වල පවතින වාහන පිළිබඳව විධිමත් අධ්‍යයනයක් සිදුකර, රේගු සංකේතාංක 87.03 යටතට ගැනෙන පෙට්‍රල් එන්ජින් ධාරිතාව 1800ජජට වැඩි වාහන සහ ඩීසල් එන්ජින් ධාරිතාව 2300ජජට වැඩි වාහන (ඩබල් කැබ්/සිංගල් කැබ්/වෑන් රථ/ බස් රථ හැර) නියමිත ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් 2025-03-01 දිනට පෙර අදාළ ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් විසින් අපහරණය කිරීමටත්, ඒ අනුව කටයුතු කර මහා භාණ්ඩාගාරයේ කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත වාර්තා කිරීම සඳහා අදාළ චක්‍රලේඛ උපදෙස් නිකුත් කිරීම පිණිස භාණ්ඩාගාරයේ ලේකම් වෙත බලය පැවරීමටත් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී (2024-12-02) | අර්ධ වශයෙන් උචිත | පරිමාණයන්/මිනුම් තවමත් සඳහන් කර නැත, නමුත් වාර්තා කිරීම ඔවුන්ට පූර්ව අවශ්‍යතාවයකි. වත්කම් නිරීක්ෂීම මූලික පරිපාලන පියවරක් වන අතර සම්පත් භාවිතය සහ විභව අනිසි භාවිතය නියාමනය කිරීමට හැකියාව ලබාදෙයි. |
| 05 | විදේශ කටයුතු | තිරසාර බලශක්ති ව්‍යාපෘති සඳහා ජාත්‍යන්තර හවුල්කාරිත්වයන් සහ ආයෝජන ප්‍රවර්ධනය කිරීම මගින් ශ්‍රී ලංකාව පුනර්ජනනීය බලශක්තියේ ප්‍රමුඛයෙක් ලෙස ස්ථානගත කිරීම. ගෝලීය පුනර්ජනනීය බලශක්ති මුලපිරීම් වලට සහභාගී වීම සහ හොඳම භාවිතාවන් බෙදා හදා ගැනීම (220) | බලශක්ති පද්ධතිය ශක්තිමත් කිරීම සහ පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධ කිරීමේ ව්‍යාපෘතිය සඳහා, භාණ්ඩාගාර ඇපකරයක් මත වෙන් වෙන් වශයෙන් ණය ගිවිසුම් 02 ක් යටතේ ලංකා විදුලිබල මණ්ඩලය සහ සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම වෙත පිළිවෙලින් ඇමෙරිකානු ඩොලර් මිලියන 150 ක් සහ ඇමෙරිකානු ඩොලර් මිලියන 50 ක් වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 200 ක ණය මුදලක් ලබාදීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟතාව පළ කර තිබේ. එකී ණය මුදල ලබාගැනීම සඳහා වන ඇපකර ගිවිසුමකට ආසියානු සංවර්ධන බැංකුව සමඟ අත්සන් තැබීම, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී (2025-12-09) | උචිත | බලශක්ති අංශයේ ජාත්‍යන්තර හවුල්කාරිත්වයන් සහ ආයෝජන, විශේෂයෙන් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සමඟ බැඳී ඇත්නම්, ගෝලීය පුනර්ජනනීය මුලපිරීම් සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය පිළිබිඹු කරන අතර, යහ භාවිතයේ මූල්‍යකරණ යාන්ත්‍රණයන්ට අනුකූල වේ. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 06 | දූෂණ විරෝධී | දූෂණය සහ මූල්‍ය අපරාධ මැඩලීමේ නීති සහ අනෙකුත් ව්‍යුහයන් ශක්තිමත් කිරීම සහ විධිමත් කිරීම (227) | නීති කෙටුම්පත් සම්පාදක විසින් කෙටුම්පත් කරන ලද අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළකර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා 2024-08-12 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී ඇත. එහෙත්, එකී පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් අනතුරුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් නිරීක්ෂණ ගණනාවක් ඉදිරිපත් කරනු ලැබ ඇත. ඒ අනුව, මෙම පනත් කෙටුම්පතට අදාළව මූලික කෙටුම්පත සකස් කිරීම සඳහා එවකට අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ඇමතිතුමා විසින් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයෙකුගේ ප්‍රධානත්වයෙන් පත් කරන ලද කමිටුව වෙත ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ යොමු කර ඇති අතර, එම කමිටුව විසින් අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත් කෙටුම්පත සඳහා තවදුරටත් විධිවිධාන කිහිපයක් ඇතුලත් කරමින් දැනට පිළියෙල කරනු ලැබ ඇති පනත් කෙටුම්පත සංශෝධනය කිරීම නිර්දේශ කරනු ලැබ ඇත. එකී නිර්දේශ මත පදනම්ව අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත් කෙටුම්පත තවදුරටත් සංශෝධනය කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී (2024-12-09) | අතිශයින් උචිත | එය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දූෂණ විරෝධී න්‍යාය පත්‍රයට අනුකූල වෙමින්, මූල්‍ය අපරාධ නිරීක්සීම සඳහා නීතිමය රාමු ශක්තිමත් කිරීමට දායක වේ. |
| 07 | ප්‍රජාතන්ත්‍රවාදය | ජනාධිපති නිල නිවාස එකකට පමණක් සීමා කිරීම (195) | එම පරිශ්‍රයන් හා නිවාස ආර්ථිකමය වශයෙන් ඵලදායීව උපයෝජනය කිරීමට හැකිවන පරිදි යෝග්‍ය ක්‍රමවේදයක් යෝජනා කිරීම සඳහා නිලධාරි කමිටුවක් පත් කිරීම අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී (2024-12-09) | අර්ධ වශයෙන් උචිත | රජයේ අතිරික්ත නිවාස භාවිතය ක්‍රමානුකූල කිරීම සහ නැවත පැවරීම සඳහා කැබිනට් මණ්ඩලය ගත් ක්‍රියාමාර්ගය, අභිප්‍රාය සහ දිශාව අනුව ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූල වේ. කෙසේ වෙතත්, මහනුවර ජනාධිපති නිවස පවරා නොගැනීම, එවැනි නිවාස එකකට සීමා කිරීමට ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම ඉටු කිරීමේදී හිඩැසක් ඇති කරයි, එසේම යාපනයට ඉඩම් හිමිකාරිත්වය පිළිබඳ ගැටළුවක් පවතින බැවින් රජයට එහි භාවිතය ලබා ගැනීමට නොහැකි විය. https://economynext.com/sri-lanka-to-find-better-uses-for-five-extra-presidential-palaces-193374/ |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 08 | මූල්‍ය | ජාත්‍යන්තර ආර්ථිකය සමඟ සම්බන්ධ වීම සහ ආර්ථික ධනය සහ ආරක්ෂාව සැපයීම සඳහා දේශීය ආර්ථිකය ස්ථානගත කිරීම (219) | ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය ඇතිව ක්‍රියාත්මක කරනු ලබන විස්තීර්ණ අරමුදල් පහසුකම් වැඩසටහනට සමගාමීව, ශ්‍රී ලංකාවේ විස්තීර්ණ ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය මූල්‍යනය කිරීම සඳහා අරමුදල් සපයා ගැනීම පිණිස ශ්‍රී ලංකා රජය විසින් අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ප්‍රතිපත්ති මත පදනම් වූ ණය යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 50 ක ණය මුදලක් ලබාදීමට එම ආයතනය විසින් එකඟතාව පළකර තිබේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ද මෙම ණය ලබාගැනීම, ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක එම අරමුදල් වැඩසටහනේ පරාමිතීන්ට අනුකූල වන බවට තහවුරු කර ඇත. ඒ අනුව, එකී ණය මුදල ලබාගැනීම වෙනුවෙන් අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල සමඟ ණය ගිවිසුමට එළඹීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී (2024-12-09) | අර්ධ වශයෙන් උචිත | අනුකූල වීම ණය මුදලේ අරමුණ අනුව කොන්දේසි සහිත වේ: යටිතල පහසුකම්, පුනර්ජනනීය බලශක්තිය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්, කෘෂිකර්මාන්තය හෝ සමාජ සේවා සඳහා ණය මුදල සහය වන්නේ නම්, අනුකූල වීම ශක්තිමත් වේ. එය අයවැය ස්ථාවර කිරීමට හෝ ණය සේවාකරණයට සහය වන්නේ නම්, එය තවදුරටත් ආර්ථික ආරක්ෂාව සමඟ අනුකූල වන නමුත් ධනය උත්පාදනය සමඟ සෘජුව අනුකූල වීම අඩු ය. |
| 09 | නීතිය සහ අධිකරණ | රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තු ශාඛා පළාත්බදව පිහිටුවීම (202) | පූගොඩ අධිකරණ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් මිලියන 681.2 ක් ලෙස සංශෝධනය කර අදළ මිල විචලනයන් ගෙවීමටත්, ව්‍යාපෘතියෙහි ඉතිරි වැඩ නිම කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අයවැය ඇස්තමේන්තුව මඟින් වෙන් කර ගැනීම (2024-12-09) | උචිත නොවන | ප්‍රතිපත්ති ප්‍රකාශනය පළාත්වල රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට යෝජනා කරන නමුත්, ක්‍රියාකාරකම අධිකරණ සංකීර්ණය පිළිබඳව වේ. |
| 10 | ආර්ථිකය | රාජ්‍ය ආයතනවල සමාන ප්‍රසම්පාදන පටිපාටීන් පිළිපැදීම සහතික කිරීම (191) | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156ආ. (1) ප්‍රකාරව පිහිටුවන ලද ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156ඇ. (1) පරිදි පැවරී ඇති බලතල අනුව සියලු රජයේ ආයතන විසින් භාණ්ඩ සහ සේවා, වැඩ, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති ප්‍රසම්පාදනය කරනු ලැබීම සම්බන්ධයෙන් සාධාරණ, යුක්තිසහගත, විනිවිද පෙනෙන සුලු, තරගකාරී සහ පිරිවැය සඵලතාවයකින් යුත් පටිපාටි සහ උපමාන සකස් කිරීම එකී කොමිසන් සභාවේ කර්තව්‍යය වේ (2024-12-18) | උචිත | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වල අභිප්‍රාය සහ ක්‍රියාකාරිත්වය මත පදනම්ව, කැබිනට් තීරණය සහ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්කය පුළුල් ලෙස අනුකූල වී ඇත. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 11 | රාජ්‍ය සේවය | උපායමාර්ගික වැදගත්කම, ආර්ථික වර්ධනයේ විභවතාවය, නිෂ්පාදන ආර්ථිකය උත්තේජනය කිරීමේ හැකියාව, මූල්‍ය ස්ථාවරත්වයට ඇති බලපෑම සහ ජාතික ආරක්ෂාවට ඇති අදාළත්වය සලකා බලමින් එක් එක් ආයතනය සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග තීරණය කිරීම. (108) | වත්මන් අවශ්‍යතා වලට ගැලපෙන අයුරින් එම ආයතන යාවත්කාලීන නොවීම, පැවරී ඇති බලතල ප්‍රමාණවත් නොවීම හෝ නොගැලපීම, එම ආයතන වෙත පැවරී ඇති කාර්යයන් පෞද්ගලික අංශය විසින් වඩාත් කාර්යක්ෂම අයුරින් ඉටු කිරීම සහ එකම හෝ සමාන හෝ කාර්යයන් ඉටු කරනු ලබන ආයතන කිහිපයක් පැවතීම වැනි කරුණු හේතුවෙන් රජයට අයත් වාණිජමය නොවන ආයතන පිළිබඳ සමාලෝචනයක් සිදුකිරීම කාලීන අවශ්‍යතාවක් බවට පත්ව තිබේ. ඒ අනුව, එවැනි සමාලෝචනයක් සිදුකර නිර්දේශ සහිත වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුත් නිලධාරී කමිටුවක් පත් කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාදෙන ලදී (2024-12-18) | අර්ධ වශයෙන් උචිත | ආයතනයේ වැදගත්කම පිළිබඳ උපායමාර්ගික තීරණ ගැන සඳහන් කරමින් ප්‍රකාශනයේ රජයට අයත් ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමට අදාළ ක්‍රියාකාරකම. |
| 12 | ජාතික ආරක්ෂාව | කලාපයේ සුරක්ෂිතභාවය සහ සාමකාමී සහජීවනය සහතික කිරීම, ආරක්ෂිත ජාත්‍යන්තර සබඳතා තුළින් ජාතික ආරක්ෂාව ශක්තිමත්ව ගොඩනගා ගැනීම (226) | ශ්‍රී ලංකා පොලිසියේ වාහන අවශ්‍යතාව සපුරාලීම සඳහා සහාය ලබාදීමක් ලෙස ඉන්දීය රජය විසින් ශ්‍රී ලංකා රුපියල් මිලියන 300 ක මුදල් ප්‍රදානයක් ලබාදීමට එකඟතාව පළකර ඇත. එම ප්‍රදානය භාවිතා කරමින් උතුරු පළාතේ පොලිස් ස්ථාන වල රාජකාරි අවශ්‍යතා සඳහා කැබ්රථ ලබාදීමට සැලසුම් කර තිබේ. ඒ අනුව, එකී ප්‍රදානය ලබාගැනීම සඳහා දෙපාර්ශවය අතර අවබෝධතා ගිවිසුමට එළඹීම පිණිස මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී (2024-12-18) | අර්ධ වශයෙන් උචිත | ප්‍රතිපත්ති ප්‍රකාශනය ජාත්‍යන්තර ආධාර වලට විරුද්ධ නොවන නමුත් එවැනි ගිවිසුම් ජාතික ස්වෛරීභාවය සහ මහජන යහපත ආරක්ෂා කළ යුතු බව අවධාරණය කරයි. වාහන සහය පොලිස් බලකාය නවීකරණය කිරීමට සහ ජාතික ආරක්ෂාව පිළිබඳ වෘත්තීයභාවය ඉහළ නැංවීමට දායක විය හැකිය. |
| 13 | විදේශ කටයුතු | කලාපීය විස්තීරණ ආර්ථික හවුල්කාරිත්වයන් (RCEP) ද්විපාර්ශ්විකව හෝ බහුපාර්ශ්විකව ස්ථාපිත කිරීම (222) | සමාජ ආර්ථික සංවර්ධනය සහ ද්විපාර්ශවික සහයෝගිතාව ශක්තිමත් කිරීම සඳහා ඉන්දීය රජය සහ ශ්‍රී ලංකා රජය අතර අවබෝධතා ගිවිසුම් රාමුවක් අත්සන් කිරීම (2024-12-23) | උචිත | කලාපීය විස්තීරණ ආර්ථික හවුල්කාරිත්වයන් (RCEP) වඩා පුළුල්, ව්‍යුහගත වෙළඳ සහ ආර්ථික ඒකාබද්ධතා රාමු (බොහෝ විට බහුවිධ ජාතීන් ඇතුළුව) පිළිබඳව සඳහන් කරන බැවින්, මෙම අවබෝධතා ගිවිසුම RCEP අරමුණ සම්පූර්ණයෙන් සාක්ෂාත් කර ගැනීමට වඩා, ආරම්භක හෝ සහායක පියවරක් නියෝජනය කරයි. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 14 | විදේශ කටයුතු | සාකච්ඡා සහ සංසන්දි කතිකා (Negotiations) කුසලතා, සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රිකභාවය, ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය සහ ජාත්‍යන්තර නීතිය කෙරෙහි අවධානය යොමු කරමින් රාජ්‍යතාන්ත්‍රිකයින් සඳහා පුළුල් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (218) | පාර්ශවයන්ට ක්‍රියාකාරකම් වර්ධනය කර ක්‍රියාත්මක කළ හැකි සහයෝගිතා වැඩ රාමුවක් සැපයීමටත්, පවතින සම්පත් ප්‍රයෝජනයට ගනිමින් අන්‍යෝන්‍ය ප්‍රතිලාභ සඳහා පහසුකම් සැලසීමටත් හැකිවන පරිදි එක්සත් ජාතීන්ගේ පුහුණු හා පර්යේෂණ ආයතනය (UNITAR) සහ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය අතර වසර 03 ක කාලයක් සඳහා අවබෝධතා ගිවිසුම (2024-12-23) | අර්ධ වශයෙන් උචිත | එක්සත් ජාතීන්ගේ පුහුණු හා පර්යේෂණ ආයතනය (UNITAR) සමඟ ඇති කරගත් අවබෝධතා ගිවිසුම, පුහුණු වැඩසටහන් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සහයෝගිතා රාමුවක් සපයන අතර, කතිකා, ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය සහ ජාත්‍යන්තර නීතිය වැනි රාජ්‍යතාන්ත්‍රික කුසලතා සහ දැනුම පිළිබඳ ක්ෂේත්‍ර ඉහළ නැංවීමේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්කයට සෘජුවම සහාය වේ. |
| 15 | විදේශ කටයුතු | සාගර නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (UNCLOS) යටතේ නවු පැවරීමට අදාළ නීති හඳුන්වාදීම (222) | සාගර නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය වඩා හොඳින් ක්‍රියාත්මක කිරීම, විවිධ පාර්ශවකරුවන්ගේ පුළුල් සහයෝගිතාව සහ සම්බන්ධීකරණය තුළින් විශාල භූගෝලීය ප්‍රදේශ ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම යන කරුණු පදනම් කර ගනිමින් එකී ගිවිසුමට එළඹීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ තිබේ (2024-12-23) | උචිත | මෙම ක්‍රියාකාරකම මගින් පාර්ශ්වකරුවන් අතර සංරක්ෂණය සහ සම්බන්ධීකරණය සඳහා සහයෝගීතාවය සහ ගිවිසුම් හරහා සාගර නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (UNCLOS) වඩා හොඳින් ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ. |
| 16 | රාජ්‍ය සේවය | රාජ්‍ය සේවයෙහි සියලු සේවා ශ්‍රේණියන්ට සහ විවිධ සේවාවන් වෙත නිලධාරීන් බඳවා ගැනීම සහ උසස් වීම් ලබාදීම නිශ්චිත කාල රාමුවකට අනුව සිදු කිරීමට අවශ්‍ය විධිවිධාන (199) | කොමිෂන් සභා, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන වල මෙන්ම පළාත් සභා වල කාර්යමණ්ඩල නැවත සමාලෝචනය කර අත්‍යවශ්‍ය බඳවා ගැනීම් සිදු කිරීමටත්, සේවා අවශ්‍යතා අනුව කාර්යමණ්ඩල නැවත ස්ථානගත කොට උපරිම සේවාවක් ලබා ගැනීමටත් අවශ්‍ය පියවර ගැනීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්ගේ සභාපතිත්වයෙන් යුත් නිලධාරී කමිටුවක් පත් කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී (2024-12-30) | අර්ධ වශයෙන් උචිත | මෙම ක්‍රියාකාරකම රජයේ කාර්යමණ්ඩල වැඩි දියුණු කිරීමේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පුළුල් අරමුණට සහාය දක්වන නමුත්, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කර ඇති පරිදි නීති සංශෝධනය හෝ කාලානුරූපී ප්‍රතිසංස්කරණ පිළිබඳව නිශ්චිතව සඳහන් නොකරයි. එය නියාමන ප්‍රතිසංස්කරණ වලට වඩා මෙහෙයුම් ක්‍රියාමාර්ග කෙරෙහි වැඩි අවධානයක් යොමු කරයි. |
| 17 | දූෂණ විරෝධී | මූල්‍ය අවභාවිතාවන්, අල්ලස්, කොමිස් වැනි දූෂිත ක්‍රියාවන් වැළැක්වීම අරමුණු කරගනිමින් නීතිරීති සම්පාදනය කිරීම ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා කටයුතු කිරීම<br>(203) | 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ විධිවිධාන අධ්‍යයන කර අත්‍යවශ්‍යයෙන්ම සංශෝධනය කල යුතු වගන්ති හා ඇතුළත් කල යුතු නව වගන්ති පිළිබඳව නිර්දේශ සහිත සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ කොමසාරිස්වරයෙකුගේ ප්‍රධානත්වයෙන් අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය, නීතිපති දෙපාර්තමේන්තුව හා නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව යන ආයතන වල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විතව කමිටුවක් පත් කිරීම (2024-12-30) | අතිශයින් උචිත | මෙම ක්‍රියාකාරකම, අල්ලස් හා දූෂණය වැළැක්වීමට සහාය වෙමින්, දූෂණ විරෝධී පනතට සංශෝධන යෝජනා කරමින් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ නීති සම්පාදන ප්‍රතිසංස්කරණ ඉලක්ක ප්‍රගමනය කරයි. අතීත නඩු නැවත ඉදිරිපත් කිරීම නිශ්චිතව සඳහන් කර නැතත්, ශක්තිමත් කරන ලද නීති රාමුව යටතේ ඒවා ආමන්ත්‍රණය කළ හැකිය. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 18 | දූෂණ විරෝධී | තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී සක්‍රීය සහ නිෂ්ක්‍රීය ක්‍රම දෙකෙහිම සිදුවන මහජන මුදල් නාස්තිය තුරන් කරමින් රාජ්‍ය සේවාව කාර්යක්ෂමව, විනීතව සහ දූෂණයෙන් තොරව සැපයීම පිළිබඳ නිලධාරීන් ඇගයීමට ලක්කිරීම සඳහා මහජනතා ප්‍රතිචාර ලබාගැනීමේ ක්‍රමවේද (198) | රජය කෙරෙහි පළකල මහජන විශ්වාසය ආරක්ෂා කර ගැනීමට මෙන්ම, විශේෂයෙන්ම රාජ්‍ය සේවය තුළ අපේක්ෂිත ධනාත්මක වෙනසක්ම් සිදු කිරීම සඳහා එවැනි පැමිණිලි පිළිබඳව අපක්ෂපාතී මෙන්ම විද්‍යාත්මක කරුණු විමර්ශනයක් සිදු කිරීම (2024-12-30) | අර්ධ වශයෙන් උචිත | පැමිණිලි විමර්ශනය කිරීම තුළින් වගවීම සහ මහජන විශ්වාසය ශක්තිමත් කිරීම, කාර්යක්ෂම හා දූෂණයෙන් තොර රාජ්‍ය සේවයක අරමුණට සහය වීම කෙරෙහි අවධානය යොමු කරමින් මෙම ක්‍රියාකාකරම ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූල වේ. |
| 19 | වෙළඳ | පවතින නිදහස් වෙළෙඳ ගිවිසුම් යාවත්කාලීන කිරීම හා නව නිදහස් වෙළඳ ගිවිසුම්වලට ප්‍රවේශවීම (152) | යෝජිත ගිවිසුම මගින් ශ්‍රී ලංකාව හා වියට්නාමය අතර වෙළෙඳ ගනුදෙනු වල පිරිවැය අඩු කිරීම, දේශසීමා මායිම් ආශ්‍රිත බදු නිරවද්‍ය ආකාරයෙන් ගණනය කිරීම හා එක්රැස් කිරීම, සීමාකිරීම් වලට යටත් භාණ්ඩ හුවමාරු වීම තහනම් කිරීම, සීමාකිරීම සහ පාලනය කිරීම සම්බන්ධිත රෙගුලාසි පැනවීම යන අරමුණු ඉටුකර ගැනීම (2025-01-06) | අර්ධ වශයෙන් උචිත | මෙම ක්‍රියාකාරකම වෙළඳ ගිවිසුම් වලට අනුපූරක විය හැකි ගනුදෙනු පිරිවැය අඩු කිරීම සහ බදු එකතු කිරීම වැඩි දියුණු කිරීම වැනි වෙළඳාමේ මෙහෙයුම් අංග කෙරෙහි අවධානය යොමු කරයි. |
| 20 | ආර්ථිකය | වරාය, ගුවන් තොටුපළ සහ වරාය නගර සැපයුම් දාම කේන්ද්‍රස්ථාන ලෙස වැඩිදියුණු කරමින් කර්මාන්තවලට විදේශ වෙළෙඳපොළට ප්‍රවිශ්ට වීමට පහසුකම් (152) | යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපොළ වෙත නිශ්චිත කාලසටහන් ගත ගමන් වාර ක්‍රියාත්මක කෙරෙන ගුවන් සේවා සඳහා දැනට ක්‍රියාත්මක වන අපගමන බද්දෙන් 50% ක ගාස්තු අත්හැරීමේ සහනය 2026-01-30 දින දක්වා දීර්ඝ කිරීම.<br><br>කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ (රත්මලාන) වෙත නිශ්චිත කාලසටහන් ගත ගමන් වාර ක්‍රියාත්මක කෙරෙන ගුවන් සේවා සඳහා දැනට ක්‍රියාත්මක වන අපගමන බද්දෙන් 50% ක ගාස්තු අත්හැරීමේ සහනය 2025-03-27 දින සිට වසරක කාලයක් දක්වා දීර්ඝ කිරීම.<br><br>මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ වෙත නිශ්චිත කාලසටහන් ගත ගමන් වාර ක්‍රියාත්මත කෙරෙන ගුවන් සේවාට සඳහා දැනට ක්‍රියාත්මක වන අපගමන බද්දට අදාළ පූර්ණ සහනය 2024-12-29 දින සිට තවත් වර්ෂයක කාලයක් දක්වා දීර්ඝ කිරීම (2025-01-06) | උචිත | බදු සහන හරහා ජාත්‍යන්තර ගුවන් සම්බන්ධතාව දිරිමත් කිරීම, සැපයුම් දාම මධ්‍යස්ථාන ලෙස ගුවන්තොටුපළ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ කර්මාන්ත සඳහා ජාත්‍යන්තර වෙළඳපොළ ප්‍රවේශය ඉහළනැංවීම මගින් මෙම ක්‍රියාකාරකම් ප්‍රතිපත්ති ප්‍රකාශන යෝජනාවට සහය වේ. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 21 | නීතිය සහ අධිකරණ | අධිකරණ ක්‍රියාවලියට නවීන තාක්ෂණය හඳුන්වාදීමට පියවර ගැනීම සහ විනිශ්චයකාරවරුන්ට හා කාර්ය මණ්ඩලයට ඒ සම්බන්ධ නිසි පුහුණුව ලබාදීම ආදිය තුළින් අධිකරණ ක්‍රියාවලිය වඩා සුමට හා කාර්යක්ෂම කිරීම (201) | විශේෂ අවස්ථානුගත කරුණු යටතේ සැකකරුට හෝ වූදිතයාට අධිකරණයේ පෞද්ගලිකවම පෙනී සිටින ලෙස නියම කිරීම ඉවත් කිරීම සඳහාත්, දුරස්ථ සාක්ෂි පටිගත කිරීම සහ විශේෂඥ සාක්ෂිකරුවන් වෙත විද්‍යුත් තැපැල මඟින් සිතාසි ලබාදීම සඳහා විධිවිධාන සැලසීම පිණිසත් 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා 2023-12-05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් කෙටුම්පත් කරනු ලැබ ඇති අදාළ පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී (2025-01-06) | අර්ධ වශයෙන් උචිත | ප්‍රතිපත්ති ප්‍රකාශනයේ මූලික අරමුණ සපුරාලන අතර‍්‍ය පැමිණීම, දුරස්ථ සාක්ෂි දීම සහ විද්‍යුත් සන්නිවේදනය හරහා අධිකරණ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා නවීන තාක්ෂණය හඳුන්වා දීමෙන් මෙම ක්‍රියාකාරම ප්‍රතිපත්ති ප්‍රකාශනය සමඟ අනුකූල වේ. |
| 22 | විදේශ කටයුතු | සංස්කෘතික හුවමාරුව වැඩිදියුණු කිරීම, විදේශයන්හි ශ්‍රී ලාංකේය සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම - සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීම, ජාත්‍යන්තරය තුළ ශ්‍රී ලාංකේය කලාකරුවන්ට සහාය වීම සහ ගෝලීය සංස්කෘතික උත්සවවලට සහභාගී වීම මගින් මෘදු බලය ගොඩනැගීම සහ අන්‍යෝන්‍ය අවබෝධය වර්ධනය කිරීම (221) | සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය සහ මහජන චීන සමූහාණ්ඩුවේ ජාතික ගුවන් විදුලි සහ රූපවාහිනී පරිපාලනය අතර අවබෝධතා ගිවිසුම.<br><br>සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම සහ චීනයේ ෂින්හුවා පුවත් නියෝජිතායතනය (Xinhua News Agency) අතර අවබෝධතා ගිවිසුම.<br><br>ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සහ චීන මාධ්‍ය සමූහය (China Media Group) අතර අවබෝධතා ගිවිසුම.<br><br>ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව සහ චීන මාධ්‍ය සමූහය (China Media Group) අතර අවබෝධතා ගිවිසුම (2025-01-06) | උචිත | සාමකාමී සහ ස්ථාවර ජාත්‍යන්තර සබඳතා වලට සහය වෙමින්, අන්‍යොන්‍ය අවබෝධය ඉහළ නංවන සහ සංස්කෘතික හුවමාරු ප්‍රවර්ධනය කරන ජාත්‍යන්තර මාධ්‍ය සහයෝගිතා ගිවිසුම් ඇති කිරීම. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 23 | විදේශ කටයුතු | ජාත්‍යන්තර නීතිය අනුව සියලු ම රටවල් මුහුදු සහ ගුවන් ප්‍රවේශ භුක්ති විඳින ලෝකයක් ආරක්ෂා කිරීමට ක්‍රියා කිරීම (221) | ශ්‍රී ලංකා රජය සහ ඉතාලි රජය අතර ද්විපාර්ශවික ගුවන් සේවා ගිවිසුමකට අත්සන් තැබීම. ඕනෑම වර්ගයක ගුවන් යානයක් උපයෝගි කර ගනිමින් ඒකඟතාවකට පැමිණි ගුවන් මාර්ග ඔස්සේ ගුවන් මගී සේවා සඳහා සතියකට නිශ්චිත කාලසටහන් ගත ගුවන් ගමන් වාර 14 ක් දක්වා සහ ගුවනින් භාණ්ඩ ප්‍රවාහන සේවා සඳහා සතියකට නිශ්චිත කාලසටහන් ගත ගුවන් ගමන් වාර 07 ක් දක්වා පවත්වා ගැනීමට හැකියාව ලැබේ (2025-01-20) | අතිශයින් උචිත | ජාත්‍යන්තරව පිළිගත් ගුවන් සේවා රාමු යටතේ සාධාරණ, නෛතික සහ අන්‍යොන්‍ය ප්‍රවේශය ප්‍රවර්ධනය කිරීම, විධිමත් ගිවිසුමක් හරහා නීත්‍යානුකූල ජාත්‍යන්තර ගුවන් ප්‍රවේශයට පහසුකම් සැලසීම මගින් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්කය සමඟ ක්‍රියාකාරකම පැහැදිලිවම අනුකූල වේ. |
| 24 | විදේශ කටයුතු | විශේෂයෙන් ආර්ථික ක්ෂේත්‍රය තුළ ශ්‍රී ලංකාවේ ජාතික අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීමට උපකාරී වන නව අවස්ථා සහ නව ගෝලීය හා කලාපීය වේදිකා ගවේෂණය කිරීම. | දේශපාලන, ආර්ථික, වාණිජ, විද්‍යාත්මක, තාක්ෂණික සහ සංස්කෘතික අංශ ඇතුළුව ද්විපාර්ශවික සබඳතා ප්‍රවර්ධනය කිරීම, ශක්තිමත් කිරීම සහ පුළුල් කිරීම අරමුණු කර ගනිමින්, ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය සහ ඉතාලියේ විදේශ කටයුතු සහ ජාත්‍යන්තර සහයෝගිතා අමාත්‍යාංශය අතර දේශපාලන උපදේශන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුම (2025-01-27) | අතිශයින් උචිත | මෙම ක්‍රියාකාරකමට ආර්ථික හා වාණිජ අංශ ඇතුළු බහුවිධ අංශවල ද්විපාර්ශ්වික සබඳතා වඩා පුළුල් කිරීම ඇතුළත් වන අතර, එය නව අවස්ථා සහ වේදිකා ගවේෂණය කිරීමට සහ භාවිතා කිරීමට ඍජු මාර්ගයකි. |
| 25 | විදේශ කටයුතු | විශේෂයෙන් ආර්ථික ක්ෂේත්‍රය තුළ ශ්‍රී ලංකාවේ ජාතික අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීමට උපකාරී වන නව අවස්ථා සහ නව ගෝලීය හා කලාපීය වේදිකා ගවේෂණය කිරීම (ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සිංහල පිටපත තුළ සඳහන්ව නැත. පරිවර්තනයː පැෆ්රල් සංවිධානය විසිනි) | චීන රජයේ සහාය ඇතිව ක්‍රියාත්මක කෙරෙන සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු කඩිනමින් නිම කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘති කාල සීමාව දීර්ඝ කිරීම, තෝරාගත් රෝහල් වල සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම හා සම්බන්ධ පියවර (2025-01-27) | අර්ධ වශයෙන් උචිත | එය ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබිඹු කරයි (ගෝලීය වේදිකා ගවේෂණය කිරීම). කෙසේ වෙතත්, එය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අවධාරණය කර ඇති පරිදි ආර්ථික අවස්ථා හෝ ආර්ථික ජාතික අවශ්‍යතා කෙරෙහි ඍජුවම අවධානය යොමු නොකරයි. |
| 26 | විදේශ කටයුතු | විශේෂයෙන් ආර්ථික ක්ෂේත්‍රය තුළ ශ්‍රී ලංකාවේ ජාතික අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීමට උපකාරී වන නව අවස්ථා සහ නව ගෝලීය හා කලාපීය වේදිකා ගවේෂණය කිරීම (ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සිංහල පිටපත තුළ සඳහන්ව නැත. පරිවර්තනයː පැෆ්රල් සංවිධානය විසිනි) | මන්නාරම දිස්ත්‍රික්කයේ පවතින එකම තෘතීයික සත්කාරක රෝහල වන මන්නාරම දිස්ත්‍රික් මහ රෝහලේ හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම සහ වෛද්‍ය උපකරණ සැපයීම සඳහා ශ්‍රී ලංකා රුපියල් මිලියන 600 ක උපරිමයකට යටත්ව මූල්‍ය ප්‍රදානයක් ලබාදීම (ඉන්දියාවෙන්) (2025-03-02) | අර්ධ වශයෙන් උචිත | මෙම ක්‍රියාකාරකම ජාතික සෞඛ්‍ය සේවා ව්‍යාපෘතියක් සඳහා බාහිර අරමුදල් ලබාගැනීම ඇතුළත් වන අතර, එය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ගෝලීය/කලාපීය වේදිකා උපයෝගී කර ගැනීමේ ප්‍රවේශයට අනුකූල වේ. කෙසේ වෙතත්, මෙම ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් සෞඛ්‍ය සේවා කේන්ද්‍ර කරගත් එකක් වන අතර, ප්‍රතිපත්ති ප්‍රකාශනය විශේෂයෙන් ආර්ථික ක්ෂේත්‍රයට ප්‍රමුඛතාවය ලබා දෙයි. |
| 27 | රාජ්‍ය සේවය | රාජ්‍ය සේවයෙහි සියලු සේවා ගණයයන්ට සහ විවිධ සේවාවන් වෙත නිලධාරීන් බඳවා ගැනීම සහ උසස් වීම් ලබාදීම නිශ්චිත කාල රාමුවකට අනුව සිදු කිරීමට අවශ්‍ය විධිවිධාන (199) | අදාළ නිලධාරීන්ගේ සහ පොදු මහජනතාවගේ අදහස් හා යෝජනා ලබාගෙන, දැනට පවතින නීතිරීති, රෙගුලාසි සහ කාර්ය පටිපාටියන්හි සිදුකළ යුතු සංශෝධන පිළිබඳ නිර්දේශ සහිත වාර්තාවක් ලබා ගැනීම (2025-02-03) | අර්ධ වශයෙන් උචිත | එය රජයේ සේවයේ පත්වීම් සහ උසස්වීම් සඳහා නීති රීති සංශෝධනය කිරීමේ ක්‍රියාවලියට මුල පුරයි. කාල රාමුව කොටස ක්‍රියාකාරකම තුළම ආමන්ත්‍රණය කර නැති නමුත්, මෙය තවමත් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව ඉටුකිරීම සඳහා ස්ථාවර සහ අවශ්‍ය පියවරකි. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 28 | රාජ්‍ය සේවය | සේවා ව්‍යවස්ථාවන්හි ඇති ගැටලු නිරාකරණය කරමින් ඒවා සංශෝධනය කිරීම (198) | මෙරටින් බැහැරව ගත කරන නිවාඩුවකින් පසු රාජකාරියට වාර්තා කළ නිලධරයෙකු, එම වර්ෂයේදීම නැවත වරක් විදේශ නිවාඩු ලබාගැනීමට අදහස් කරන විට එම නිලධරයාට එසේ නිවාඩු ලබාගන්නා වර්ෂයට හිමි ඉතිරි විවේක නිවාඩු ලබාගැනීමට හැකිවන පරිදි ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 8:5 උප වගන්තිය සංශෝධනය කිරීම (2025-02-03) | උචිත | මෙම ක්‍රියාකාරකම විශේෂයෙන් ආයතන සංග්‍රහයේ (XII පරිච්ඡේදය 8.5 උප වගන්තිය) සංශෝධනයක් ආමන්ත්‍රණය කරයි. එය නිලධාරීන්ගේ සේවා කොන්දේසි සහ නිවාඩු හිමිකම් පාලනය කරයි. එය සේවා ආශ්‍රිත ගැටළු විසඳීම සහ රෙගුලාසි සංශෝධනය කිරීම සමඟ සෘජුවම සම්බන්ධ වේ. |
| 29 | රාජ්‍ය සේවය | බිම් මට්ටමේ සිට හඳුනාගත් සමාජ සහ ආර්ථික ගැටලු හා අවශ්‍යතාවයන්, ජාතික සංවර්ධන වැඩපිළිවෙළ මත පදනම්ව ආමන්ත්‍රණය කිරීමට අවශ්‍ය යාන්ත්‍රණයක් සැකසීම (198) | විදේශ ගමන් බලපත්‍ර මුද්‍රණය වේගවත් කිරීම සඳහා අවශ්‍ය අමතර කාර්ය මණ්ඩලය සපයා ගැනීම ( මේ වනවිට පවත්නා විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රමාදය ඉවත් කිරීම). ඒ සඳහා අවශ්‍ය අතිරේක කාර්යමණ්ඩලය, එම දෙපාර්තමේන්තුවේ සේවය කර විශ්‍රාම ලබා ඇති නිලධාරීන්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාව මත කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදවීම මඟින් සහ දැනට රජයේ සේවයේ නිරත නිලධාරීන්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විමසමින් අනුයුක්ත කර ගැනීම මඟින් සලසා ගැනීම (2025-02-03) | අතිශයින් උචිත | විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රමාදයන් ඉවත් කිරීම සඳහා අතිරේක කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමේ ක්‍රියාකාරකම, පරිපාලනමය පියවර හරහා සේවා සැපයීම වැඩි දියුණු කිරීම මඟින් බිම් මට්ටමේ සමාජ-ආර්ථික ගැටලුවක් (පුරවැසියන්ගේ සංචලනය සහ රැකියා අවස්ථා වලට බලපාන ප්‍රමාදයන්) සෘජුවම ආමන්ත්‍රණය කරයි. |
| 30 | විදේශ කටයුතු | ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා ප්‍රාග්ධනය සහ තාක්ෂණ හුවමාරුව ලබා ගැනීමේ අරමුණින් සෘජු විදේශ ආයෝජන (FDI) ලබා ගැනීමට විදේශීය හවුල්කරුවන් සමඟ කටයුතු කිරීම (219) | 2025 ලෝක රාජ්‍ය සමුළුවට සහභාගිවීම සඳහා ගරු ජනාධිපතිතුමා විසින් එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සිදුකිරීමට නියමිත රාජ්‍ය සංචාරය අතරතුරදී ශ්‍රී ලංකාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය අතර අන්‍යෝන්‍ය ආයෝජන ප්‍රවර්ධනය සහ ආරක්ෂාව පිළිබඳ ගිවිසුමකට අත්සන් තැබීම (2025-02-09) | අතිශයින් උචිත | එක්සත් අරාබි එමීර් රාජ්‍යය සමඟ අන්‍යෝන්‍ය ආයෝජන ප්‍රවර්ධනය සහ ආරක්ෂාව පිළිබඳ ගිවිසුම අත්සන් කිරීම, සෘජු විදේශ ආයෝජන (FDI) ආකර්ෂණය කර ගැනීම, ආයෝජක විශ්වාසය ශක්තිමත් කිරීම, සහ ආයෝජන සඳහා නීතිමය ආරක්ෂාවන් ස්ථාපිත කිරීම අරමුණු කර ගනිමින් මෙම ඉලක්ක වලට සෘජුවම සහාය වන අතර, මේ සියල්ල නව ආයෝජන දිරිමත් කිරීමට සහ FDI මූලාශ්‍ර විවිධාංගීකරණය කිරීමට දායක වේ. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 31 | රාජ්‍ය සේවය | රාජ්‍ය සේවයෙහි සියලු සේවා ශ්‍රේණියයන්ට සහ විවිධ සේවාවන් වෙත නිලධාරීන් බඳවා ගැනීම සහ උසස් වීම් ලබාදීම නිශ්චිත කාල රාමුවකට අනුව සිදු කිරීමට අවශ්‍ය විධිවිධාන (199) | ඒ ඒ අමාත්‍යංශ විසින් එම අමාත්‍යංශ යටතේ පවතින දෙපාර්තමේන්තු සහ අනෙකුත් ආයතන වල පවතින තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා එම කමිටුව වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීම් සැලකිල්ලට ගෙන කමිටුව විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් බඳවා ගැනීම් සිදු කිරීම සඳහා අදාළ අමාත්‍යංශ සහ ආයතන වෙත අනුමැතිය ලබාදීම.<br><br>රාජ්‍ය පරිපාලන, පළාත් සභා පළාත් පාලන අමාත්‍යංශය<br>ආරක්ෂක අමාත්‍යංශය<br>විද්‍යා හා තාක්ෂණ අමාත්‍යංශය<br>මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යංශය<br>අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යංශය<br>ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යංශය<br>සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යංශය<br>බස්නාහිර පළාත් සභාව<br>නැගෙනහිර පළාත් සභාව<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව (2025-02-09) | අර්ධ වශයෙන් උචිත | එය කර්මාන්ත හට ඇති නීතිමය බාධක ඉවත් කිරීමට අදාළ වේ, ජාත්‍යන්තර අනුකූල වීමගැන සඳහන් නොකිරීම මෙය අර්ධ අනුකූල වීමක් බවට පත් කරයි. |
| 32 | විදේශ කටයුතු | විශේෂයෙන් ආර්ථික ක්ෂේත්‍රය තුළ ශ්‍රී ලංකාවේ ජාතික අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීමට උපකාරී වන නව අවස්ථා සහ නව ගෝලීය හා කලාපීය වේදිකා ගවේෂණය කිරීම. | එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ක්‍රියාකාරී සාමාජිකයෙකු වශයෙන් තවදුරටත් කටයුතු කිරීමට හැකිවන පරිදි 2022 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වන සාමාජික මුදල් ගෙවීම පිණිස (2025-02-19) | අර්ධ වශයෙන් උචිත | ජාතික ආර්ථික අවශ්‍යතා වලට දායක වන වැදගත් ගෝලීය වේදිකාවක (එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ-FAO) ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරී භූමිකාව පවත්වා ගැනීමෙන් මෙම ක්‍රියාකාරකම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අරමුණයට සහය වේ. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 33 | නීතිය සහ අධිකරණ | ප්‍රතිත්‍රස්ත පනත ඇතුළු සියලු මර්දනකාරී අණපනත් අහෝසි කර සියලු ජනතාවගේ නිදහස සහතික කිරීම (232) | ජාතික ආරක්ෂාව සහ මහජන සාමය සම්බන්ධයෙන් එවකට පැවති තර්ජනයන්ට මුහුණ දීම සඳහා 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත පනවනු ලැබ ඇත. පසුකාලීනව 2022 අංක 12 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත වශයෙන් එම නීතියට සංශෝධන හඳුන්වා දෙමින් ජාතික ආරක්ෂාව පිළිබඳ පුළුල් නීතියක් ප්‍රකාශ කිරීම සඳහා වන අන්තර්කාලීන පියවරක් අනුගමනය කර තිබේ. ඉන් අනතුරුව, ත්‍රස්තවාදය මැඩපැවැත්වීම පිළිබඳව පනත් කෙටුම්පතක් සකස් කර ඇති අතර, එකී පනත් කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණයේදී අභියෝගයට ලක් කර ඇත. ඒ අනුව, එකී පනත් කෙටුම්පත සඳහා තවදුරටත් සිදුකළ යුතු සංශෝධන හඳුනාගෙන එකී සංශෝධන ඇතුළත් කරමින් නීති කෙටුම්පත් සම්පාදක විසින් සංශෝධිත පනත් කෙටුම්පතක් සකස් කරනු ලැබ ඇත. තවදුරටත් කරුණු අධ්‍යයනය කර එකී පනත් කෙටුම්පත තවදුරටත් වැඩි දියුණු කිරීම පිණිස සුදුසු යෝජනා ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් පත් කිරීම පිණිස ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී (2025-02-19) | උචිත | ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වැනි මර්දනකාරී නීති සංශෝධනය කිරීම හෝ අහෝසි කිරීම සඳහා වන නීතිමය ක්‍රියාවලිය ඉදිරියට ගෙන යමින්, මෙම ක්‍රියාකාරකම ප්‍රතිපත්ති ප්‍රකාශනය සමඟ අනුකූල වන අතර, එමඟින් පොරොන්දු වූ පරිදි සිවිල් අයිතිවාසිකම් ප්‍රවර්ධනය කරයි (එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස්වරයා ද අහෝසි කිරීම අවධාරණය කරයි). |
| 34 | විදේශ කටයුතු | ජාතික ආර්ථික රාමුව තුළ ධනාත්මක ආර්ථික කළමනාකරණයක් අනුගමනය කරමින් අනෙකුත් රටවල් සමඟ ආර්ථික සහයෝගීතාව පුළුල් කිරීමට දේශීය වෙළෙඳපොළ විවෘත කිරීම (220) | කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ මෙහෙයුම් කාලය දීර්ඝ කිරීම පිණිස කොළඹ වරාය නගර සංවර්ධක ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කාලය දීර්ඝ කිරීම (2025-02-24) | අර්ධ වශයෙන් උචිත | ජාත්‍යන්තර ආර්ථික ව්‍යාපෘතියකට සම්බන්ධ ඒකකයක් දීර්ඝ කරයි, නමුත් ක්‍රියාකාරකම පරිපාලනමය වන අතර වෙළඳපොළ විවෘත කිරීම හෝ සහයෝගීතාවය කෙරෙහි සෘජු ක්‍රියාමාර්ගයක් නොගනී. |
| 35 | විදේශ කටයුතු | සාකච්ඡා සහ සංසන්දි කතිකා (Negotiations) කුසලතා, සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රිකභාවය, ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය සහ ජාත්‍යන්තර නීතිය කෙරෙහි අවධානය යොමු කරමින් රාජ්‍යතාන්ත්‍රිකයින් සඳහා පුළුල් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (218)<br>විවිධ කලාපවල දූත මණ්ඩල මුහුණ දෙන විශේෂිත අභියෝගවලට විසඳුම් සෙවීමට පුහුණු සැසි පැවැත්වීම (218)<br>රාජ්‍යතාන්ත්‍රිකයින් සඳහා අඛණ්ඩ ඉගෙනීම සහ වෘත්තීය සංවර්ධනය (218) | දෙරට (ශ්‍රී ලංකාව සහ පිලිපීනය) අතර මිත්‍රත්වය සහ සහයෝගිතාව වර්ධනය කර ගැනීම සහ වැඩි දියුණු කිරීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකාවේ සහ පිලිපීනයේ විදේශ සේවා නිලධාරීන් අතර රාජ්‍යතාන්ත්‍රික ක්ෂේත්‍රයේ අධ්‍යයන, පර්යේෂණ හා පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ විශේෂඥතාවන් හුවමාරු කර ගැනීම ආදිය සඳහා පහසුකම් සැලසෙන පරිදි ශ්‍රී ලංකාවේ බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය සහ පිලිපීන ජනරජයේ විදේශ සේවා ආයතනය අතර අවබෝධතා ගිවිසුමකට එළඹීම (2025-02-24) | අතිශයින් උචිත | හවුල් විශේෂඥතාව සහ පුහුණු වැඩසටහන් සඳහා සහයෝගීතා රාමුවක් ස්ථාපිත කිරීම මඟින් රාජ්‍ය තාන්ත්‍රික පුහුණුව සහ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය වර්ධනය කිරීමේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අරමුණු සඳහා පූර්ණ සහාය දක්වයි. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 36 | විදේශ කටයුතු | ජාත්‍යන්තර නීතිය ශක්තිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම; කලාපීය සහ ගෝලීය ස්ථාවරත්වය, සාමය සහ ආරක්ෂාව; සහ බහුපාර්ශ්වික පද්ධතිය කෙරෙහි කටයුතු කිරීම (ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සිංහල පිටපත තුළ සඳහන්ව නැත. පරිවර්තනයː පැෆ්රල් සංවිධානය විසිනි) | එකී සන්ධාන පත්‍රයට ප්‍රවේශ වීම සඳහා ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා (අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සම්මුතිය සඳහා වන සංශෝධනයට අදාළ සන්ධාන පත්‍රය) (2025-02-24) | උචිත | අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සම්මුතිය යනු ගෝලීය ගුවන් ප්‍රවාහන ආරක්ෂාව, ආරක්ෂාව සහ සහයෝගීතාව ප්‍රවර්ධනය කරන, කලාපීය සහ ගෝලීය ස්ථාවරත්වයට දායක වන ප්‍රධාන ජාත්‍යන්තර නීති රාමුවකි. |
| 37 | විදේශ කටයුතු | ත්‍රස්තවාදය, බෙදුම්වාදය සහ අන්තවාදයේ තර්ජනය තුරන් කිරීම සඳහා අපි අනුගමනය කර ක්‍රියාත්මක කරන්නෙමු (ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සිංහල පිටපත තුළ සඳහන්ව නැත. පරිවර්තනයː පැෆ්රල් සංවිධානය විසිනි) | බීජිං සම්මුතිය බලාත්මක කිරීම පිණිස 1996 අංක 31 දරණ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සඳහා වූ ගුවන් තොටුපොළ වලදී සිදුකරනු ලබන නීති විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියා මැඩ පැවැත්වීම පනතේ පනත් කෙටුම්පතක් සකස් කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කිරීමට හැකිවන පරිදි වත්මන් අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබාදීම (2025-02-24) | උචිත | ත්‍රස්තවාදය සහ ආරක්ෂක තර්ජන සෘජුවම ආමන්ත්‍රණය කරන ජාත්‍යන්තර ගුවන්තොටුපල තුළ නීති විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියා ඉලක්ක කරගත් නීති සම්පාදනය (බීජිං සම්මුතිය) අවසානයකට ගෙන ඒම සහ බලාත්මක කිරීම මෙම ක්‍රියාකාරකමේ අරමුණයි. |
| 38 | විදේශ කටයුතු | රටේ ප්‍රතිරූපය ප්‍රවර්ධනය කිරීමට මෙන්ම මිනිසුන් අතර මිත්‍රත්වය ගොඩනැගීම සඳහා ඒත්තු ගැන්වීම, ආකර්ෂණය සහ සංස්කෘතික හුවමාරුව සඳහා ආගමික රාජ්‍යතාන්ත්‍රිකභාවය ප්‍රවර්ධනය කිරීම (221) | ශ්‍රී ලංකා - පාකිස්ථානු 75 වසරක දීර්ඝකාලීන සබඳතාව සනිටුහන් කරමින් සමරු මුද්දර 02 ක් නිකුත් කිරීමට දෙපාර්ශවය අතර එකඟතාවයකට පැමිණ ඇත (2025-02-24) | උචිත | ශ්‍රී ලංකා-පකිස්ථාන සබඳතා වල 75 වන වසර සැමරීම සඳහා සමරු මුද්දර නිකුත් කිරීම, දෙරට අතර මිත්‍රත්වය සහ හොඳ හිත ප්‍රවර්ධනය කරන සංකේතාත්මක සංස්කෘතික හුවමාරුවකි. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 39 | නීතිය සහ අධිකරණ | ඇප නීතියේ හා ඇප දීමේ ක්‍රියාවලියේ ඇති ගැටලු සොයා බලා ඇප නීතිය යාවත්කාලීන කිරීම (202) | 2025 වර්ෂය තුළදී නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය විසින් අලුතින් හඳුන්වා දීමට අපේක්ෂිත පහත සඳහන් නීති සහ සංශෝධන හඳුන්වා දීමට අපේක්ෂිත දැනට බලාත්මක නීති රජයේ නීති සම්පාදන වැඩසටහන - 2025 ට ඇතුළත් කිරීම.<br><br>හඳුන්වා දීමට අපේක්ෂිත නව නීති:<br><br>ජාතික පානීය ප්‍රජා ජල සංවර්ධන පනත.<br>ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතන පනත.<br>චීන - ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ හා ආදර්ශන මධ්‍යස්ථානය නීතිගත කිරීම සඳහා වන පනත.<br>2018 අංක 23 දරණ බද්ධ නිවාස අයිතිවාසිකම් (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන ද ඇතුළත් කරමින් සහාධිපත්‍ය දේපළ සඳහා පහසුකම් සැලසීම පිණිස වන නව පනත<br><br>සංශෝධන හඳුන්වා දිය යුතු දැනට පවතින නීති:<br><br>2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත.<br>1974 අංක 2 දරණ ජාතික ජලසම්පාදන සහ ජලාප්‍රවහන මණ්ඩල පනත.<br>1946 අංක 13 දරණ නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත.<br>1979 අංක 17 දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත.<br>2008 අංක 36 දරණ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත.<br>1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරිය පනත.<br>2021 අංක 13 දරණ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංසථා (සංශෝධන) පනත.<br>1973 අංක 11 දරණ බද්ධ නිවාස අයිතිවාසිකම් පනත (2025-03-03) | උචිත | නාගරික සංවර්ධනය හා නිවාස ක්ෂේත්‍රයේ පුළුල් නීතිමය වෙනස්කම් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ප්‍රකාශිත අවධානයෙන් ඔබ්බට යන නමුත් ඒවා වක්‍රව සහය විය හැකිය. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 40 | නීතිය සහ අධිකරණ | සුහුරු අධිකරණ ශාලා (Smart Court House) ඇති කිරීමට අවශ්‍ය පියවර ගැනීම සහ අධිකරණ වාර්තා මෘදු පිටපත් (Soft Copies) පවත්වාගෙන යාම (201) | ඉඩමේ අයිතිය රජය සතුව පැවතියදී ඉහත සඳහන් පර්චස් 130 ක ඉඩම් කොටස තුළ ගාල්ල නීතිඥ සංගමයේ අරමුදල් මගින් නීතිඥ කාර්යාල සංකීර්ණයක් ඉදි කිරීම.<br><br>එම සංගමය විසින් ගොඩනැගිල්ල ඉදිකිරීම පිණිස ආයෝජනය කරනු ලබන මුළු මුදල බදු කුලී මුදලින් ආවරණය වන පරිදි වසර 30 ක කාලයකට එකී ගොඩනැගිල්ල නඩත්තු කරමින් භාවිතා කිරීම සඳහා එහි භුක්තිය ගාල්ල නීතිඥ සංගමය වෙත ලබාදීම.<br><br>නීතිඥ වෘත්තියට අදාළව මහජනතාව වෙත සේවාවන් ලබාදීම හැර එම ගොඩනැගිල්ල කිසිදු ආකාරයේ වාණිජ කටයුත්තක් සඳහා යොදා නොගැනීම.<br><br>වසර 30 ක කාලයකින් පසුව ගොඩනැගිල්ලේ භුක්තිය අධිකරණ විෂය භාර අමාත්‍යාංශය වෙත භාරදීම (2025-03-10) | උචිත නොවන | මෙම ක්‍රියාකාරකම් නීතිඥ කාර්යාල අවකාශය සහ නීති සේවා පහසුකම් හා සම්බන්ධ වන අතර, සුහුරු අධිකරණ ශාලා සංවර්ධනය හෝ අධිකරණ වාර්තා ඩිජිටල්කරණය කිරීමේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අරමුණු සමග සම්බන්ධ නොවේ. |
| 41 | විදේශ කටයුතු | ජාතික ආර්ථික රාමුව තුළ ධනාත්මක ආර්ථික කළමනාකරණයක් අනුගමනය කරමින් අනෙකුත් රටවල් සමඟ ආර්ථික සහයෝගීතාව පුළුල් කිරීමට දේශීය වෙළෙඳපොළ විවෘත කිරීම (219) ජාත්‍යන්තර වෙළඳාම සඳහා තීරණාත්මක සේවා සපයන්නෙකු ලෙස ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම. ශ්‍රී ලංකා ආර්ථිකය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් සමඟ ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික වෙළඳ ගිවිසුම් අත්සන් කරන අනෙකුත් හවුල්කරුවන්ගේ කැමැත්ත ඇතිව, නියමිත ඉලක්ක සපුරා ගැනීම සඳහා ඉතිරි වෙළඳ ගිවිසුම් විශ්ලේෂණය කර වැඩි දියුණු කරනු ලැබේ (ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සිංහල පිටපත තුළ සඳහන්ව නැත. පරිවර්තනයː පැෆ්රල් සංවිධානය විසිනි) | ජාතික තීරු බදු ප්‍රතිපත්ති කමිටුව සඳහා වන කාර්යය නිර්ණේය අනුදේශ (Terms of Reference) සහ භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයෙකුගේ ප්‍රධානත්වයෙන් ජාතික තීරුබදු ප්‍රතිපත්ති කමිටුව පත් කිරීම (2025-03-17) | අර්ධ වශයෙන් උචිත | මෙම ක්‍රියාකාරකම ජාත්‍යන්තර වෙළඳාම සහ තීරුබදු වලට සම්බන්ධ වන නමුත් තීරුබදු ප්‍රතිපත්තිය ඍජුව ආමන්ත්‍රණය නොකරයි. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 42 | කාෂිකර්මාන්තය | සාධාරණ මිලට පොහොර ඇතුළු කෘෂි යෙදවුම් ලබා දීම (116) | 2025 යල කන්නයේ කුඹුරු ඉඩම් වල වී වගා කරනු ලබන ගොවීන් සඳහා සහ කුඹුරු ඉඩම් වල වෙනත් ක්ෂේත්‍ර භෝග වගා කරනු ලබන ගොවීන් සඳහා පහත සඳහන් පරිදි පොහොර මූල්‍ය සහනාධාර ලබාදීම පිණිස අනුමැතිය ලබාදීම: 2025 යල කන්නයේදී කුඹුරු ඉඩම් වල සිදු කරන වී වගාව සඳහා හෙක්ටයාරයකට රුපියල් 25,000/- ක් බැගින් උපරිම වශයෙන් හෙක්ටයාර 02 ක් සඳහා කන්න රැස්වීම් වලදී තීරණය කරනු ලබන කුඹුරු ඉඩම් වල සිදු කරන වෙනත් ක්ෂේත්‍ර භෝග වගා සඳහා හෙක්ටයාරයකට රුපියල් 15,000/- ක් බැගින් උපරිම වශයෙන් හෙක්ටයාර 02 ක් සඳහා (2025-03-17) | අර්ධ වශයෙන් උචිත | එය පොහොර සඳහා සහාය ලබාදීමේ යෙදවුමක් ලෙස ප්‍රතිපත්ති ප්‍රකාශනයට සම්බන්ධ වන අතර. සාධාරණ මිල ගණන් සමග කටයුතු නොකරයි. |
| 43 | දූෂණ විරෝධී | මූල්‍ය අවභාවිතාවන්, අල්ලස්, කොමිස් වැනි දූෂිත ක්‍රියාවන් වැළැක්වීම අරමුණු කරගනිමින් නීතිරීති සම්පාදනය කිරීම ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා කටයුතු කිරීම (203)<br>දූෂණය සහ මූල්‍ය අපරාධ මැඩලීමේ නීති සහ අනෙකුත් ව්‍යුහයන් ශක්තිමත් කිරීම සහ විධිමත් කිරීම (227) | 2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනතේ විධිවිධාන පරිදි සාදන ලද 2025 දූෂණ විරෝධී (වත්කම් හා බැරකම් ප්‍රකාශ) නියෝග ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව, එකී නියෝග පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම (2025-03-17) | අතිශයින් උචිත | එය ඔවුන්ගේ දූෂණ විරෝධී නීති සම්පාදන ප්‍රමුඛතා ඍජුව ප්‍රගමනය කරයි. |
| 44 | විදේශ කටයුතු | විශේෂයෙන් ආර්ථික ක්ෂේත්‍රය තුළ ශ්‍රී ලංකාවේ ජාතික අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීමට උපකාරී වන නව අවස්ථා සහ නව ගෝලීය හා කලාපීය වේදිකා ගවේෂණය කිරීම. | බාහිර පාර්ශ්වයකට "ආසියාන්හි ආංශික සංවාද හවුල්කරුවෙකුගේ" තත්ත්වය ලබාගැනීම සඳහා ආසියාන් විසින් දක්වා ඇති ක්‍රියාවලිය අනුගමනය කරමින් 2019 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද අභිප්‍රාය ලිපියට අදාළව පැහැදිලි කාලරාමු සහිත නව වැඩ/ක්‍රියාකාරකම් සැලැස්මක් ශ්‍රී ලංකාජව විසින් ඉදිරිපත් කිරීම (2025-03-24) | අතිශයින් උචිත | ආර්ථික අවශ්‍යතා ප්‍රගමනය කිරීම සඳහා නව කලාපීය වේදිකා සමඟ ක්‍රියාකාරීව සම්බන්ධ වීම සහ බහුපාර්ශ්වික ආර්ථික රාමු සමඟ ශ්‍රී ලංකාවේ ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීම. |
| 45 | දූෂණ විරෝධී | මූල්‍ය අවභාවිතාවන්, අල්ලස්, කොමිස් වැනි දූෂිත ක්‍රියාවන් වැළැක්වීම අරමුණු කරගනිමින් නීතිරීති සම්පාදනය කිරීම ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා කටයුතු කිරීම (203)<br>දූෂණය සහ මූල්‍ය අපරාධ මැඩලීමේ නීති සහ අනෙකුත් ව්‍යුහයන් ශක්තිමත් කිරීම සහ විධිමත් කිරීම (227) | මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම සහ අනෙකුත් අනීතික ක්‍රියාකාරකම් මැඩපැවැත්වීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නෛතික පුද්ගලයන්ගේ අර්ථලාභී අයිතියෙහි පාරදෘශ්‍යභාවය ආශ්‍රිත ඌනතාවයන්ට පිළියම් යෙදීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරන ලද පනත් කෙටුම්පත අංක SC/SD/92/2024 දරන ශ්‍රේෂ්ඨාධිකරණයේ විශේෂ තීන්දුව මත පදනම්ව නීතිපති විසින් ලබාදෙන උපදෙස් පරිදි නැවත සංශෝධනය කරනු ලැබ ඇත (2025-03-24) | උචිත | ජාත්‍යන්තර හොඳම භාවිතයන් සමඟ අනුකූල වන අතර, දූෂණ විරෝධී නීති නවීකරණය කිරීමට සහ දැඩි කිරීමට ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම ඉටු කරයි. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 46 | රාජ්‍ය සේවය | රාජ්‍ය සේවයෙහි සියලු සේවා ශ්‍රේණියයන්ට සහ විවිධ සේවාවන් වෙත නිලධාරීන් බඳවා ගැනීම සහ උසස් වීම් ලබාදීම නිශ්චිත කාල රාමුවකට අනුව සිදු කිරීමට අවශ්‍ය විධිවිධාන (199) | 2025 අයවැය මඟින් රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය කිරීම සඳහා ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මත පදනම්ව 2025-04-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධිත වැටුප් පරිමාණයන්ට අනුව වැටුප් ගෙවීම සඳහා වන විධිවිධාන ඇතුළත් චක්‍රලේඛ උපදෙස් නිකුත් කිරීම සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා සහ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා සැලකිල්ලට ගෙන අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පරිදි තීරණය කරන ලදී:<br>රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනයට අදාළව සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත චක්‍රලේඛ උපදෙස් නිකුත් කිරීම පිණිස රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත බලය පැවරීම.<br>රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම් සහ අනෙකුත් අදාළ ආයතනයන් සඳහා වන චක්‍රලේඛ උපදෙස් නිකුත් කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත බලය පැවරීම (2025-03-24) | අර්ධ වශයෙන් උචිත | නිලධාරීන්ගේ උසස්වීම් පිළිබඳ රාජ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ අඩංගු වේ නම්, මෙම ක්‍රියාකාරකම NPP ප්‍රතිපත්ති ප්‍රකාශනයට අර්ධ වශයෙන් අනුකූල වේ. |
| 47 | රාජ්‍ය සේවය | අවශ්‍යතාවය අනුව නව ආයතන බිහි කිරීම සහ සමාන විෂය පථයන් සහ ක්‍රියාකාරකම් ඇති ආයතනයන් ක්‍රමානුකූලව ඒකාබද්ධ කිරීම සහ අනවශ්‍ය ආයතන අහෝසි කිරීම (198) | උතුරු පළාතේ ජනතාව විශාල වශයෙන් විදේශ ගමන් බලපත්‍ර ඉල්ලුම් කර ඇති බැවින්, ඔවුන් සඳහා කඩිනම් සේවාවක් ලබාදීම (2025-04-01) | අර්ධ වශයෙන් උචිත | අනුකූල වීම රඳා පවතින්නේ ආයතන පිහිටුවීම හෝ ප්‍රතිසංවිධානය කිරීම ක්‍රියාකාරකමට ඇතුළත් වේද යන්න මතය (උදා: නව විදේශ ගමන් බලපත්‍ර කාර්යාලයක් විවෘත කිරීම) ආයතනික වෙනසක් නොමැතිව සේවා වේගය වැඩි දියුණු කිරීම ගැන පමණක් නම් වේ. |
| 48 | විදේශ කටයුතු | දකුණු ආසියාවේ සහ ඒ අවට ආරක්ෂිත සහ සාමකාමී පරිසරයක් පවත්වාගෙන යාම සහතික කිරීම. (219) | ගුණාත්මක භාවයෙන් හෙබි මාධ්‍ය සහ තොරතුරු සාක්ෂරතාව පිළිබඳ නව පුහුණු වැඩසටහනක් හඳුන්වා දීම මඟින් කලාපීය සහයෝගිතාව තවදුරටත් වර්ධනය කර ගැනීම හා 2030 තිරසර සංවර්ධනය පිළිබඳ න්‍යාය පත්‍රයේ දක්වා ඇති ඉලක්ක ඇතුළුව ජාතික සහ කලාපීය ක්‍රියාකාරී සැලසුම් ශක්තිමත් කිරීම අරමුණු කර ගනිමින්, දකුණු ආසියානු ගුරු සංවර්ධන මධ්‍යස්ථානය, යුනෙස්කෝ දකුණු ආසියානු කලාපීය කාර්යාලය සහ ඉන්දිරා ගාන්ධි ජාතික විවෘත විශ්වවිද්‍යාලය අතර ත්‍රෛපාර්ශවික ගිවිසුමක් අත්සන් කිරීම (2025-04-07) | උචිත | එය කලාපීය හවුල්කාරිත්වයන් ශක්තිමත් කරන අතර දකුණු ආසියාවේ සාමකාමී, සහයෝගී සංවර්ධනයට දායක වේ. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලතාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 49 | ඉඩම් | තිරසර භූමි (ඉඩම්) පරිහරණ සැලැස්මක් විද්‍යානුකූලව සකසා ක්‍රියාවට නැංවීම (52) | නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩම් සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා දීර්ඝකාලීන බදු පදනම මත බැහැර කිරීමේදී සුදුසු ආයෝජකයින් තෝරා ගැනීම (2025-04-07) | අර්ධ වශයෙන් උචිත | මෙය සංවර්ධනය සඳහා ඉඩම් වෙන් කිරීම හා සම්බන්ධ වුවද, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීමට කේන්ද්‍රීය වන විද්‍යාත්මකව සංවර්ධනය කරන ලද තිරසාර ඉඩම් පරිහරණ සැලසුම්කරණය පිළිබඳ නිශ්චිත සඳහනක් එහි නොමැත. |
| 50 | නීතිය සහ අධිකරණ | රැඳවියන්ගේ ස්වභාවය, මානසික මට්ටම් ආදිය පිළිබඳ පූර්ණ විශ්ලේෂණයක් කොට ඒ අනුව රැඳවියන් කාණ්ඩ ගත කොට රඳවා තැබීම (210)<br>සුළු වැරදිවලට දඬුවම් ලබන පුද්ගලයින් බන්ධනාගාර ගත නොකොට ප්‍රජා වැඩසටහන් සඳහා යොමු කිරීම (210) | 1999 අංක 46 දරණ ප්‍රජාපාදක විශෝධන පනත සංශෝධනය කිරීම (2025-04-07) | අතිශයින් උචිත | සංශෝධන වල අන්තර්ගතය මත පදනම්ව, සුදුසු විශෝධන වැඩසටහන් සඳහා වැරදිකරුවන් වර්ගීකරණය කිරීම ද එයට ආමන්ත්‍රණය කළ හැකිය. |
| 51 | කලාව සහ සංස්කෘතිය | රාජ්‍ය ලේඛනාගාරය නවීන තාක්ෂණික පහසුකම් සහිත ව ප්‍රතිසංවිධානය කිරීම (42) | ජාතික ලේඛනාරක්ෂක නීතිය සංශෝධනය කිරීම සඳහා යෝග්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස ලේඛන කළමනාකරණය, ලේඛන සංරක්ෂණය සහ අංකිත ලේඛන කළමනාකරණය යන විෂයයන් පිළිබඳ ප්‍රවීණයන්ගෙන් සමන්විත විද්‍යුත් කමිටුවක් පත් කිරීම (2025-04-07) | අතිශයින් උචිත | ජාතික ලේඛනාගාරය නවීකරණය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරයි. ඩිජිටල්කරණය සහ තාක්ෂණය පදනම් කරගත් ප්‍රතිසංස්කරණ කෙරෙහි අවධානය යොමු කරයි. |
| 52 | දූෂණ විරෝධී | 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනතේ 34 වැනි වගන්තිය අනුව සොරාගත් වත්කම් නැවත අයකර ගැනීම සම්බන්ධීකරණය හා දූෂණය වැළැක්වීම සම්බන්ධ ජාත්‍යන්තර සම්මුතීන් ක්‍රියාත්මක කිරීමේ බලධරයා වන කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල් වෙත සම්පූර්ණ බලය පැවරීම සහ අවශ්‍ය පහසුකම් ලබා දීම (202) | අමාත්‍යවරයා විසින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විමසා සාදන ලද නියෝග රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කිරීම (2025-04-21) | අතිශයින් උචිත | රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම යනු අල්ලස් කොමිසමේ අධිකාරියට නීතිමය බලපෑමක් ලබාදීමේ කොටසක් වන අතර, එමගින් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීමට සෘජුවම සහය වේ. |
| 53 | විදේශ කටයුතු | පළාත් සභා, මහා නගර සභා, විශ්ව විද්‍යාල සහ අනෙකුත් ප්‍රධාන රාජ්‍ය ආයතන ආදියෙන්, අනෙකුත් රටවල ඔවුන්ගේ සම පාර්ශ්වයන් සමග සුහද හා අර්ථවත් සබඳතා ඇති කර ගැනීම සඳහා විදේශ සබඳතා කාර්යාල විවෘත කිරීමට පහසුකම් සැලසීමට (රටේ නියම කර ඇති නීති තුළ) ඉල්ලා සිටීම (ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සිංහල පිටපත තුළ සඳහන්ව නැත. පරිවර්තනයː පැෆ්රල් සංවිධානය විසිනි) | වරිපනම් බදු, බලපත්‍ර ගාස්තු, වෙළෙඳ බදු සහ මුද්දර ගාස්තු යන ප්‍රධාන ආදායම් ප්‍රභව 04 ස්වයංක්‍රීයකරණය කිරීමෙන් සමස්ත ආදායම් උත්පාදනය ඉහළ නංවා ගැනීම සඳහා කොළඹ මහ නගර සභාව, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව එක්ව කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය වෙත සංකල්ප පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. ඒ සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 8.5 ක ආධාර මුදලක් ලබාදීමට කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය එකඟතාව පළ කර තිබේ (2025-04-28) | Aligned<br>උචිත | මෙම ක්‍රියාකාරකමට ජාත්‍යන්තර සහයෝගීතාවය සහ අරමුදල් සැපයීම ඇතුළත් වුවද, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් පරිදි විදේශ සබඳතා කාර්යාල පිහිටුවීම හෝ සෘජු රාජ්‍යතාන්ත්‍රික/ජාත්‍යන්තර ආයතනික සබඳතා පෝෂ්‍ය කිරීම ගැන එහි සඳහන් නොවේ. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 54 | බලශක්තිය | තිරසාර බලශක්ති ව්‍යාපෘති සඳහා ජාත්‍යන්තර හවුල්කාරිත්වයන් සහ ආයෝජන ප්‍රවර්ධනය කිරීම මගින් ශ්‍රී ලංකාව පුනර්ජනනීය බලශක්තියේ ප්‍රමුඛයෙක් ලෙස ස්ථානගත කිරීම.<br><br>ගෝලීය පුනර්ජනනීය බලශක්ති මුලපිරීම් වලට සහභාගී වීම සහ හොඳම භාවිතයන් බෙදා හදා ගැනීම. (220) | 2023 - 2042 දිගුකාලීන ජනන ව්‍යාපෘති සැලැස්මට අනුව වර්ෂ 2030 වන විට බලශක්ති අවශ්‍යතාවයෙන් 70% ක් පුනර්ජනනීය බලශක්තියෙන් සපුරා ගැනීම රජයේ ප්‍රතිපත්තිය වේ (2025-04-28) | උචිත | ක්‍රියාකාරකම ජාත්‍යන්තර හවුල්කාරිත්වයන් නිශ්චිතව සඳහන් නොකළද, එය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පුළුල් ඉලක්ක සපුරා ගැනීම සඳහා අඩිතාලම වන පුනර්ජනනීය බලශක්ති වර්ධනය සඳහා ප්‍රත්‍යක්ෂ ප්‍රතිපත්තිමය කැපවීමක් පිළිබිඹු කරයි. |
| 55 | වෙළඳ | ජාත්‍යන්තර වෙළඳාම සඳහා තීරණාත්මක සේවා සපයන්නෙකු ලෙස ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම තුළ ශ්‍රී ලංකා ආර්ථිකය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් සමඟ ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික වෙළඳ ගිවිසුම් අත්සන් කරන අනෙකුත් හවුල්කරුවන්ගේ කැමැත්ත ඇතිව, නියමිත ඉලක්ක සපුරා ගැනීම සඳහා ඉතිරි වෙළඳ ගිවිසුම් විශ්ලේෂණය කර වැඩි දියුණු කිරීම (ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සිංහල පිටපත තුළ සඳහන්ව නැත. පරිවර්තනය: පැෆ්රල් සංවිධානය විසිනි) | කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සහයෝගිතාව සඳහා ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ වියට්නාමයේ කෘෂිකර්ම විද්‍යා ඇකඩමිය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම. දෙපාර්ශවයේ එකඟතාව මත 2010-2011, 2017-2019, 2022-2024 හා 2024-2026 වර්ෂයන් සඳහා ක්‍රියාකාරී සැලසුම් අත්සන් කර ක්‍රියාත්මක කර තිබේ. ඒ අනුව, 2024-2026 ක්‍රියාකාරී සැලැස්මේ එක් අංගයක් ලෙස දෙරටේ ආයතන අතර සහයෝගිතාව වර්ධනය කර ගැනීම සඳහා කටයුතු කිරීමේ හැකියාව පවතී (2025-04-28) | අතිශයින් උචිත | නියමිත ඉලක්ක සපුරා ගැනීම සඳහා අනෙකුත් අත්සන් යොදන හවුල්කරුවන්ගේ කැමැත්ත ඇතිව වෙළඳ ගිවිසුම් විශ්ලේෂණය කර වැඩි දියුණු කිරීමට ප්‍රතිපත්ති ප්‍රකාශනය කැපවී සිටී. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 56 | වෙළඳ | ජාත්‍යන්තර වෙළඳාම සඳහා තීරණාත්මක සේවා සපයන්නෙකු ලෙස ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම තුළ ශ්‍රී ලංකා ආර්ථිකය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් සමඟ ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික වෙළඳ ගිවිසුම් අත්සන් කරන අනෙකුත් හවුල්කරුවන්ගේ කැමැත්ත ඇතිව, නියමිත ඉලක්ක සපුරා ගැනීම සඳහා ඉතිරි වෙළඳ ගිවිසුම් විශ්ලේෂණය කර වැඩි දියුණු කිරීම (ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සිංහල පිටපත තුළ සඳහන්ව නැත. පරිවර්තනයඃ පැෆ්රල් සංවිධානය විසිනි) | ශ්‍රී ලංකාව හා වියට්නාමය අතර වෙළෙඳ සහයෝගිතාව ශක්තිමත් කිරීම සඳහා වියට්නාම වෙළෙඳ ප්‍රවර්ධන ආයතනය සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට යෝජනා වී ඇත. දෙපාර්ශවයට අදාළ වෙළෙඳාම පිළිබඳ තොරතුරු සහ වෙළෙඳපොළ බුද්ධිය හුවමාරු කර ගැනීම, දෙරටේම පැවැත්වෙන වෙළෙඳ ප්‍රදර්ශන, ප්‍රදර්ශන සහ ප්‍රවර්ධන අවස්ථා සඳහා ඒකාබද්ධ සහභාගිත්වය සහ ව්‍යාපාරික නියෝජිත කණ්ඩායම් අතර රැස්වීම් සංවිධානය කිරීම ඇතුළු පුළුල් පරාසයක වෙළෙඳ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සඳහා මෙම අවබෝධතා ගිවිසුම යටතේ අවකාශ සැලසේ. මෙම සහයෝගිතාව මඟින් විශේෂයෙන් සැකසූ ආහාර, ධීවර කටයුතු, ඇඟලුම් සහ අගය එකතු කළ කෘෂිකර්මාන්තයට සැලකිය යුතු වෙළෙඳපොළ අවස්ථාවන් ලබාදෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙටුම්පත් අවබෝධතා ගිවිසුම සඳහා විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ එකඟතාව ලැබී ඇත. ඒ අනුව, අදාළ අවබෝධතා ගිවිසුම වියට්නාම වෙළෙඳ ප්‍රවර්ධන ආයතනය සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය අතර අත්සන් තැබීම පිණිස කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී (2025-04-28) | උචිත | මෙම ක්‍රියාකාරකම් වෙළඳ සබඳතා ශක්තිමත් කිරීමට සහ ශ්‍රී ලංකාවේ ආර්ථිකය ජාත්‍යන්තරව ප්‍රවර්ධනය කිරීමට ක්‍රියාකාරීව සහාය වන අතර, එය වෙළඳ හවුල්කාරිත්වයන් සහ ගිවිසුම් ඉහළ නැංවීම කෙරෙහි වන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අවධානයට ගැලපේ. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 57 | නීතිය සහ අධිකරණ | රජය වෙනුවෙන් නඩු කටයුතු මෙහෙයවීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවෙන් පරිබාහිරව පළාත්බද රජයේ ප්‍රධාන අභිචෝදක කාර්යාල (Directorate of public prosecution) පිහිටුවීම (202) | අධිකරණ පද්ධතිය තුළ සිදුවන ප්‍රමාදයන් වැළැක්වීමේ යාන්ත්‍රණයක් ලෙස රජයේ අභිචෝදක කාර්යාලයක් හඳුන්වා දීමටත්, රජය වෙනුවෙන් නඩු කටයුතු මෙහෙයවීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවෙන් පරිබාහිරව ස්වාධීනව ක්‍රියාත්මක වන රජයේ අභිචෝදක කාර්යාලයක් පිහිටුවීම සහ පළාත්බදව උප කාර්යාල පිහිටුවීමටත් වත්මන් රජයේ මැතිවරණ ප්‍රකාශනය මගින් යෝජනා කර ඇත. අපරාධ යුක්ති ක්‍රමයේ ස්වාධීනත්වය හා විනිවිදභාවය වැඩි දියුණු කිරීම සහ ජනතාවගේ විශ්වාසය දිනාගත හැකිවන පරිදි අපරාධ යුක්ති ක්‍රියාදාමය කඩිනම් කිරීම එමගින් අපේක්ෂා කෙරේ. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරිය විසින් 2024 සැප්තැම්බර් මාසයේදී ශ්‍රී ලංකාව පිළිබඳ ඉදිරිපත් කරන ලද අවසන් වාර්තාව මගින් ද හදිසි අවශ්‍යතාවක් ලෙස සලකා ස්වාධීන අභිචෝදක අධිකාරියක් ස්ථාපිත කිරීම යෝජනා කර තිබේ. ඒ අනුව, එවැනි කාර්යාලයක් ස්ථාපිත කිරීම සඳහා නව නීතියක් හඳුන්වාදීම පිළිබඳව අධ්‍යයනය කර වාර්තා කිරීමටත්, අවශ්‍ය අවස්ථාවන්හිදී දැනට බලපවත්නා නීති සඳහා අවශ්‍ය සංශෝධන හඳුන්වා දීම පිණිස නිර්දේශ ඉදිරිපත් කිරීමටත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු, ජනාධිපති නීතිඥ යසන්ත කෝදාගොඩ මැතිතුමාගේ සභාපතිත්වයෙන් යුතු තාක්ෂණික විශේෂඥ කමිටුවක් පත් කිරීම සඳහා අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී (2025-05-07) | අතිශයින් උචිත | ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සහ ක්‍රියාකාරකම දෙකෙහිම අරමුණ වන්නේ අධිකරණ ප්‍රමාදයන් ඉවත් කිරීම, ස්වාධීන කාර්යාලයක් පිහිටුවීම සහ නීතිපති දෙපාර්තමේන්තුවෙන් වෙන්වීම සහතික කිරීමයි. |
| 58 | විදේශ කටයුතු | ජාත්‍යන්තර ආර්ථිකය සමඟ සම්බන්ධ වීම සහ ආර්ථික ධනය සහ ආරක්ෂාව සැපයීම සඳහා දේශීය ආර්ථිකය ස්ථානගත කිරීම (219) | ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව විසින් එක්ව පිරිනමනු ලබන පූර්ණ අන්‍යෝන්‍ය විශ්වාසය පිළිබඳ කාර්යරාමුව යටතේ යෝජිත ග්‍රිඩ් උපපොළ සංවර්ධනය කිරීම පිණිස ඇමෙරිකානු ඩොලර් මිලියන 60 ක ආයෝජන පැකේජය ලබාගැනීමට සහ ඇමෙරිකානු ඩොලර් මිලියන 10 ක් වූ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය විසින් අනුග්‍රහය ලබාදෙන අවදානමෙන් සුරක්ෂිත කිරීමේ ඇපකර පහසුකම ලබාගැනීමට අදාළව ඉදිරි පියවර ගැනීම (2025-05-07) | අර්ධ වශයෙන් උචිත | මෙම ක්‍රියාකාරකම නැනෝතාක්ෂණය සහ ජෛව තාක්ෂණය භාවිතා කිරීමේදී අර්ධ වශයෙන් අනුකූල වන නමුත් සෞඛ්‍ය විසඳුම් වලට වඩා ආර්ථික වර්ධනයට ප්‍රමුඛත්වය දීමෙන් අරමුණින් වෙනස් වේ. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 59 | විදේශ කටයුතු | සාකච්ඡා සහ සංසන්දි කතිකා (Negotiations) කුසලතා, සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රිකභාවය, ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය සහ ජාත්‍යන්තර නීතිය කෙරෙහි අවධානය යොමු කරමින් රාජ්‍යතාන්ත්‍රිකයින් සඳහා පුළුල් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (218) | බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික පුහුණු ආයතනය සහ බ්‍රසීල ෆෙඩරේටිව් ජනරජයේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ රියෝ බ්‍රැන්කෝ ආයතනය අතර සහයෝගිතාව පිළිබඳ යෝජිත අවබෝධතා ගිවිසුම මගින් රාජ්‍යතාන්ත්‍රිකයින් පුහුණු කිරීම හා පුහුණු වැඩසටහන් සඳහා ඔවුන්ට අවශ්‍ය පහසුකම් සැලසීම, ඔවුන්ගේ අධ්‍යයන හා පර්යේෂණ වැඩසටහන් පිළිබඳ තොරතුරු හා අත්දැකීම් හුවමාරු කරගැනීම, විද්‍යුත් ඉගෙනීමට අදාළ මෙවලම් සහ ජාතික මෙන්ම ජාත්‍යන්තර ප්‍රකාශන පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීම සහ විශේෂයෙන් අන්‍යෝන්‍ය වශයෙන් උනන්දුවක් දක්වන ක්ෂේත්‍ර වල සමීප සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම අපේක්ෂා කරනු ලබයි (2025-05-19) | අර්ධ වශයෙන් උචිත | සෑම පුහුණු විෂයයක්ම නිශ්චිතව ලැයිස්තුගත නොකළත්, රාජ්‍යතාන්ත්‍රික පුහුණුව සඳහා පහසුකම් සැලසීම සහ පුළුල් කිරීම මගින් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අරමුණට මෙම ක්‍රියාකාරකම සහාය දක්වයි. එය රාජ්‍යතාන්ත්‍රික ධාරිතාව ගොඩනැගීමට අර්ථවත් ලෙස දායක වේ. |
| 60 | නීතිය සහ අධිකරණ | රිමාන්ඩ් සිරකරුවන් ලෙස දීර්ඝකාලීනව රඳවා තැබීම වැළැක්වෙන පරිදි අපරාධ යුක්ති ක්‍රමයට සම්බන්ධ ආයතනවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම (210) | අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ මරණ පරීක්ෂණ පැවැත්වීම පිළිබඳව පවතින නීතිමය රාමුව සහ ක්‍රියාපටිපාටි හා පිළිවෙත් වැඩි දියුණු කිරීමට හැකිවනු පිණිස, 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම (මරණ පරීක්ෂණ) (2025-05-19) | අර්ධ වශයෙන් උචිත | දීර්ඝ කාලීන රක්ෂිත බන්ධනාගාරගත කිරීම අඩු කිරීම සඳහා සමස්ත අපරාධ යුක්ති ක්‍රමයෙහි කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම එහි අරමුණයි. දීර්ඝ කාලීන රක්ෂිත බන්ධනාගාරගත කිරීමේ පුළුල් ගැටළුවට එය සෘජුව හෝ පුළුල් ලෙස විසඳුම් ලබා නොදේ, එය විමර්ශන, නඩු පැවරීම්, නඩු විභාගය සහ ඇප ක්‍රියාවලීන්හි ප්‍රමාදයන් ද ඇතුලත් කරයි. |
| 61 | විදේශ කටයුතු | දකුණු ආසියාව තුළ සහ ඒ අවට ආරක්ෂිත සහ සමාකාමී පරිසරයක් පවත්වා ගැනීම සහතික කිරීම. (219) | ශ්‍රී ලංකාව, මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා පැසිෆික් කලාපයේ සාමාජිකයෙකු වශයෙන්, මූල්‍ය ක්‍රියාකාරී කාර්යසාධක බලකාය විසින් සකස් කරන ලද මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ ව්‍යාප්ත මූල්‍යකරණයට එරෙහි ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන් ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට සහ බලාත්මක කිරීමට කැපවී සිටී (2025-05-26) | අර්ධ වශයෙන් උචිත | සියලුම රාජ්‍යයන්ගේ අයිතිවාසිකම් වලට ගරු කරමින් සහ කලාපීය ආරක්ෂාව සහතික කරමින් විවෘත, සියල්ල ඇතුළත් කරන සහ සාමකාමී දකුණු ආසියානු කලාපයක් ප්‍රවර්ධනය කිරීම කෙරෙහි ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම අවධානය යොමු කරයි. එය දකුණු ආසියාවේ සමස්තයෙහි ලා සැලකීම, විවෘතභාවය සහ අන්තර්-රාජ්‍ය සහයෝගීතාවයේ පුළුල් අරමුණු පූර්ණව ආමන්ත්‍රණය නොකරයි. |
| 62 | නීතිය සහ අධිකරණ | ජාත්‍යන්තර නීතිය ශක්තිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම; කලාපීය සහ ගෝලීය ස්ථාවරත්වය, සාමය සහ ආරක්ෂාව; සහ බහුපාර්ශ්වික පද්ධතිය කෙරෙහි කටයුතු කිරීම (ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සිංහල පිටපත තුළ සඳහන්ව නැත. පරිවර්තනය: පැෆ්රල් සංවිධානය විසිනි) | 2024 අංක 49 දරණ විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පනත වෙනත් රටවල නඩු තීන්දු ශ්‍රී ලංකාව තුළ පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම සඳහා විධිවිධාන සලසා ඇත (2025-05-26) | උචිත | ජාත්‍යන්තර නීතිය ශක්තිමත් කිරීම සහ බහුපාර්ශ්වික සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීමේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අරමුණට මෙම ක්‍රියාකාරකම සහය දක්වයි. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 63 | විදේශ කටයුතු | ශ්‍රී ලංකාව ඉන්දියානු සාගරයේ කේන්ද්‍රස්ථානයක් බවට පත්කිරීමට වෙළඳ, සංචාරක සහ ආයෝජන ප්‍රවර්ධනය කිරීම හා ජාත්‍යන්තර හවුල්කරුවන් සහ මිතුරන් සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කිරීම (219) | ශ්‍රී ලංකාව සහ චීනය අතර සුමට ද්විපාර්ශවික වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරී කණ්ඩායමක් ස්ථාපිත කිරීමට යෝජනා වී තිබේ. එමඟින්, ද්විපාර්ශවික වෙළෙඳාමේ ප්‍රයෝජනයට නොගත් විභවයන් විවෘත කිරීම, වෙළෙඳාම ආශ්‍රිත අභියෝග වලට මුහුණ දීම සහ ශ්‍රී ලංකාව සහ චීනය අතර වෙළෙඳාමේ පරිමාව ඉහළ නැංවීම හා ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම අරමුණු කරයි (2025-05-26) | උචිත | ජාත්‍යන්තර වෙළඳ හවුල්කාරිත්වයන් පෝෂ්‍ය කිරීම සහ ඉන්දියානු සාගර කලාපයේ කේන්ද්‍රස්ථානයක් ලෙස ශ්‍රී ලංකාවේ භූමිකාව ප්‍රවර්ධනය කිරීමේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අරමුණට මෙම ක්‍රියාකාරකම සහය දක්වයි. |
| 64 | විදේශ කටයුතු | ශ්‍රී ලංකාව ඉන්දියානු සාගරයේ කේන්ද්‍රස්ථානයක් බවට පත්කිරීමට වෙළඳ, සංචාරක සහ ආයෝජන ප්‍රවර්ධනය කිරීම හා ජාත්‍යන්තර හවුල්කරුවන් සහ මිතුරන් සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කිරීම (219) | ශ්‍රී ලංකාව සහ චීනය අතර සුමට ද්විපාර්ශ්වික වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරී කණ්ඩායමක් ස්ථාපිත කිරීමට යෝජනා වී තිබේ. එමඟින්, ද්විපාර්ශ්වික වෙළෙඳාමේ ප්‍රයෝජනයට නොගත් විභවයන් විවෘත කිරීම, වෙළෙඳාම ආශ්‍රිත අභියෝග වලට මුහුණ දීම සහ ශ්‍රී ලංකාව සහ චීනය අතර වෙළෙඳාමේ පරිමාව ඉහළ නැංවීම හා ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම අරමුණු කර තිබේ. ඒ අනුව, යෝජිත පරිදි ක්‍රියාකාරී කණ්ඩායම ස්ථාපිත කිරීම සඳහා මහජන චීන සමූහාණ්ඩුවේ වාණිජ අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකාවේ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබීම පිණිස වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී (2025-05-26) | උචිත | මෙම ක්‍රියාකාරකම ජාත්‍යන්තර සහයෝගීතාව පෝෂ්‍ය කිරීම සහ හවුල් ආර්ථික වර්ධනයක් ලඟාකර ගැනීම සඳහා වෙළඳාම සහ ආයෝජන ප්‍රවර්ධනය කිරීමේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්කයට සහය වේ. |

## අන්තර්-ක්ෂේත්‍රීය ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 01 | අන්තර් ක්ෂේත්‍රීය | "Clean Sri Lanka" වැඩසටහන ක්‍රියාත්මක කිරීම (ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ ඍජුව දක්වා නැත) | "පෙහොසත් රටක්, ලස්සන ජීවිතයක්" යන නව රජයේ දැක්ම අනුව මෙහෙයවනු ලබන මෙම පරිවර්තනීය මුල පිරීම සාමාජීය, පාරිසරික හා ආචාරධර්මීය පිබිදීමක් ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක කෙරෙනු ඇත (2024-12-02) | අතිශයින් උචිත | සමාජයීය වශයෙන් සවිඥානික, පාරිසරික වශයෙන් වගකියන්නාවූ සහ සදාචාරාත්මකව පදනම් වූ සමාජයක් ගොඩනැගීමේ පුළුල් විෂයපථයකින් යුත් දැක්ම යටතේ, ක්ලීන් ශ්‍රී ලංකා මුලපිරීම බහුවිධ ප්‍රතිපත්ති ප්‍රකාශන තේමාවන්හි උපායමාර්ගික ක්‍රියාත්මක කිරීමකි. එය ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාවේ යෙදවීමේදී ප්‍රමුඛ පෙළේ අනුකූල වීමේ උදාහරණයකි. |
| 02 | අන්තර් ක්ෂේත්‍රීය | "Clean Sri Lanka"මුල පිරීම (ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ ඍජුව දක්වා නැත) | වත්මන් රජයේ 'Clean Sri Lanka' ජාතික ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ උපායමාර්ගික මෙවලමක් ලෙස 2025/26 වර්ෂයේ සිට ජාතික ඵලදායිතා සම්මාන තරගාවලිය පාසල්, රාජ්‍ය, නිෂ්පාදන හා සේවා යන ප්‍රධාන ක්ෂේත්‍රයන් යටතේ පැවැත්වීම (2025-02-19) | උචිත | ජාතික ඵලදායිතා සම්මාන තරගය, විවිධ අංශ හරහා (පාසල්, රජය, නිෂ්පාදන, සේවා) කාර්යක්ෂමතාව, නවෝත්පාදනය සහ යහ භාවිතයන් ප්‍රවර්ධනය කරයි. සම්පත් වල වඩා හොඳ භාවිතය, නාස්තිය අඩු කිරීම සහ රාජ්‍ය අංශයේ කාර්යසාධනය වැඩි දියුණු කිරීම ඇතුළු "Clean Sri Lanka" උපායමාර්ගයේ වඩා පුළුල් අරමුණු සඳහා එය සහාය වේ. |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව |
|---|---|---|---|---|---|
| 03 | අන්තර් ක්ෂේත්‍රීය | ප්‍රතිපත්ති ප්‍රකාශනයේ නිශ්චිත වශයෙන් සඳහන් කර නැත | අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සියලුම රාජ්‍ය ආයතන සහ අදාළ පාර්ශවකරුවන් සමඟ සහයෝගයෙන් දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම - 2025 - 2029 ක්‍රියාත්මක කිරීම.<br><br>"Clean Sri Lanka" වැඩසටහන ශ්‍රී ලාංකික සමාජයේ සදාචාරාත්මක සංවර්ධනයේ ඉහළ මට්ටමකට ඔසවා තැබීමට උත්සාහ කරන බැවින්, සියලුම අංශ ඇතුළත්ව ක්‍රියාත්මක වන ශක්තිමත් ජාතික දූෂණ විරෝධී ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇත.<br><br>දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියෙහි නියම කර ඇති පරිදි ජාතික දූෂණ විරෝධී රාමුවක් සකස් කර ක්‍රියාත්මක කිරීම. එපමණක් නොව ජාත්‍යන්තර වශයෙන් පවතින ඇතැම් බැඳීම් ඉටුකිරීම සඳහා ද ශක්තිමත් දූෂණ විරෝධී රාමුවක් ක්‍රියාත්මක කළ යුතුව ඇත.<br><br>දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ 5 වන වගන්තිය යටතේ වන බැඳීම් වලට අනුකූලව ශ්‍රී ලංකාවේ අල්ලස හෝ දූෂණයට එරෙහිව පළමු ජාතික ක්‍රියාකාරී සැලැස්ම 2019-2023 කාල සීමාව තුළ ක්‍රියාත්මක කරනු ලැබ ඇත.<br><br>එකී ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචනය කරමින්, දේශීය හා ජාත්‍යන්තර පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් 2025-2029 කාලසීමාව සඳහා නව දූෂණ විරෝධී ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබේ. .(2025-03-24) | අතිශයින් උචිත | මෙම ක්‍රියාකාරකම ආයතන හරහා ඵලදායිතාව, වගවීම සහ යහපාලනය දිරිගැන්වීම මගින් "Clean Sri Lanka" සහ දූෂණ විරෝධී අන්තර්-ක්ෂේත්‍රීය උපායමාර්ග ක්‍රියාත්මක කරන අතර එමගින් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ වඩා පුළුල් පාලනය සහ තිරසාර අරමුණු ශක්තිමත් කරයි. |

# ඇමිණුම II- දත්ත විස්තරය: ප්‍රතිපත්ති ප්‍රකාශනය එදිරිව කැබිනට් තීරණ සහ අයවැය
## බහුවිධ-ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව | අයවැය ප්‍රතිපාදන (රු.මි) | කාල සීමාව |
|---|---|---|---|---|---|---|---|
| 01 | සෞඛ්‍යය | දරුවන්ගේ සෞඛ්‍ය හා පෝෂණ තත්වය වර්ධනය කෙරෙන ක්‍රියාකාරකම් (14)<br>ළමුන්ගේ ශාරීරික හා මානසික සමබරතාවන් පවත්වාගෙන යාම සඳහා වැඩසටහන් (16) | පාසල් පෝෂණ වැඩසටහන සඳහා එක් ශිෂ්‍යයෙකු වෙනුවෙන් දෛනිකව දැරිය යුතු මුදල රුපියල් 85/- සිට රුපියල් 110/- දක්වා වැඩි කිරීම පිණිස අධ්‍යාපන අමාත්‍යංශය වෙත අතිරේක ප්‍රතිපාදන සලසා දීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තු වෙත රුපියල් මිලියන 1,800 ක ප්‍රතිපාදන සලසා ගැනීම (2024-11-25) | අතිශයින් උචිත | වැඩි දියුණු කළ අරමුදල් මඟින් ආහාර වේලෙහි ගුණාත්මකභාවය සහ පෝෂණය ඉහළ නැංවිය හැකිය. පැහැදිලිවම මහා පරිමාණ ඉලක්ක කරගත්, බලපෑම් සහිත බෙදාහැරීමේ යාන්ත්‍රණයක් ඇති අතර, ප්‍රතිපත්ති ප්‍රකාශන ඉලක්ක සඳහා සැබෑ මූල්‍ය කැපවීමක් පෙන්නුම් කරයි. | 1800+7500 | 2023-2027 |
| 02 | සෞඛ්‍යය | රාජ්‍ය සෞඛ්‍ය සේවා ආයතනවලට අවශ්‍ය සියලු ම අත්‍යවශ්‍ය ඖෂධ අඛණ්ඩව සැපයීම සහතික කිරීම (27) | රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සහ දේශීය ඖෂධ නිෂ්පාදකයින් වෙතින් අත්‍යවශ්‍ය වෛද්‍ය සැපයීම් ප්‍රසම්පාදනය (2024-02-12) | අතිශයින් උචිත | රජයේ රෝහල් වලට අඛණ්ඩ සැපයුමක් සහ තිරසරභාවය සහ සැපයුම් දාමයේ ස්ථාවරත්වය සඳහා සහාය වේ. ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් ඉලක්කගත ජනගහනය සහ බෙදාහැරීමේ ක්‍රමයට ගැලපේ. | 185000 | 225 |
| 03 | සමාජ ආරක්ෂණය | දැනට අස්වැසුම ප්‍රතිලාභ ලබන අඩු ආදායම්ලාභී පවුල් සඳහා මසකට අවම වටිනාකම රු10,000ක සහනාධාර මුදලක් (66) | දුප්පත් හා අන්ත දිළිඳු සමාජ කාණ්ඩ සඳහා දැනට ගෙවනු ලබන මාසික ප්‍රතිලාභ දීමනාව පිළිවෙලින් රුපියල් 8,500/- සිට රුපියල් 10,000/- දක්වාත්, රුපියල් 15,000/- සිට රුපියල් 17,500/- දක්වාත් වැඩි කිරීම සහ ඒ අනුව සංශෝධිත අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීම (2024-12-02) | අතිශයින් උචිත | මෙම ක්‍රියාකාරකම අඩු ආදායම්ලාභී පවුල් සඳහා ඉලක්කගත මූල්‍ය සහන ලබාදීම සඳහා වන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව පැහැදිලිව හා සෘජුව ක්‍රියාත්මක කිරීමකි.<br>වැඩි කරන ලද මුදල් ප්‍රමාණය සහ ව්‍යාප්තවූ ආවරණය සමඟ සංශෝධිත අස්වැසුම යෝජනා ක්‍රමය, ප්‍රතිපත්ති අනුකූලතාව සහ ප්‍රධාන සමාජ ආරක්ෂණ පොරොන්දුවක් ඉටු කිරීම යන දෙකම නියෝජනය කරයි. | 16158 | 2025 |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව | අයවැය ප්‍රතිපාදන (රු.මි) | කාල සීමාව |
|---|---|---|---|---|---|---|---|
| 04 | ව්‍යවසායකත්වය | ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ ආර්ථික කටයුතු යථාතත්වයට පත්කිරීම හා හිඟ ණය සඳහා සහන සැලසීමට නව සහන බැංකුවක් ස්ථාපිත කිරීම (108) | පසුගිය වසර 04 ක කාලය තුළ ශ්‍රී ලංකාව මුහුණ දුන් ආර්ථික අර්බුදය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට දැඩි ලෙස බලපා ඇති අතර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් විසින් බැංකු වලින් ලබාගත් ණය පියවීමේදී දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදුව ඇති බව වාර්තා වී ඇත.<br><br>ඒ අනුව, 2025-03-31 දින දක්වා පරාටේ නීතිය ක්‍රියාත්මක කිරීම අත්හිටුවීම දීර්ඝ කිරීම, සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රාජ්‍ය හා පෞද්ගලික බැංකු සහ අනෙකුත් රාජ්‍ය ආයතන ඇතුළු සියලුම පාර්ශවකරුවන්ගේ සක්‍රිය දායකත්වයෙන් මෙම ගැටලුව විසඳීමට බහුමාන යාන්ත්‍රණයක් සකස් කිරීම (2024-12-09) | අර්ධ වශයෙන් උචිත | ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍යම ව්‍යවසායයන් (MSMEs) ආරක්ෂා කිරීමේ සහ ඒවාට සහාය දීමේ අරමුණ පැහැදිලිව බෙදාහදාගෙන ඇතත්, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ වඩාත් ව්‍යුහාත්මක, ආයතනික ප්‍රවේශයක් (කැපවූ සහන බැංකුවක් හරහා) අපේක්ෂා කරන නමුත්, කැබිනට් මණ්ඩලයේ ක්‍රියාමාර්ගය ක්‍රියාපටිපාටිමය සහ තාවකාලික වන අතර, ක්ෂණික අවදානම් අවම කිරීම සහ බහු පාර්ශ්වකරුවන් සම්බන්ධීකරණය කර ගැනීම අරමුණු කර ගෙන ඇත. | 5503 | 2020-2024 |
| 05 | කෘෂිකර්මාන්තය | සාධාරණ මිලට පොහොර ඇතුළු කෘෂි යෙදවුම් ලබා දීම (116) | ලෝක ආහාර වැඩසටහන යටතේ මියුරියේට් ඔෆ් පොටෑෂ් පොහොර මෙට්‍රික් ටොන් 55,000 ක් ප්‍රදානයක් වශයෙන් ශ්‍රී ලංකා රජය වෙත ලබාදීම (2024-12-09) | අර්ධ වශයෙන් උචිත | ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සාධාරණ මිලකරණය අවධාරණය කළද, පරිත්‍යාගයක් ලෙස පොහොර ලැබීම ප්‍රසම්පාදන අඩු කිරීමෙන් මෙම ඉලක්කයට සහාය වන අතර, රජයට අඩු පිරිවැයකින් බෙදා හැරීමට හෝ තවදුරටත් සහනාධාර ලබාදීමට ඉඩ සලසයි. | 35000 | 2025 |
| 06 | පශු සම්පත් | කිරි නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා මහා පරිමාණ ගොවිපළ පද්ධතියක් (120) | පුං ගවයන් ආනයන කර ගව ශුක්‍ර නිෂ්පාදනය කරන තෙක් සහිවාල් ගව ශුක්‍ර වඩි 20,000 ක් ඉන්දියාවේ ජාතික කිරි සංවර්ධන මණ්ඩලයෙන් රජයකින් රජයකට ගනුදෙනුවක් ලෙස මිලදී ගැනීම (2024-12-18) | උචිත | එය දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමේ ඉලක්කයට දායක වන අතර, එබැවින් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දිගුකාලීන කෘෂිකාර්මික සංවර්ධන උපායමාර්ගයට අදාළව, ඒ හා සංගතව, එයට සහාය දක්වයි. | 100 | 2025 |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව | අයවැය ප්‍රතිපාදන (රු.මි) | කාල සීමාව |
|---|---|---|---|---|---|---|---|
| 07 | සෞඛ්‍යය | දරුවන්ගේ සෞඛ්‍ය හා පෝෂණ තත්වය වර්ධනය කෙරෙන ක්‍රියාකාරකම් (14)<br><br>ළමුන්ගේ ශාරීරික හා මානසික සමබරතාවන් පවත්වාගෙන යාම සඳහා වැඩසටහන් (16) | එක් දරුවෙකු සඳහා දිනකට වෙන් කර ඇති රුපියල් 60/- ක මුදල් රුපියල් 100/- දක්වා වැඩි කිරීම, සහ "අඩු බර සහිත දරුවන් වැඩි ප්‍රතිශතයක් සිටින පෙර පාසල්" යන නිර්ණායකය පදනම් කරගෙන තෝරා ගනු ලබන මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන/පෙර පාසල් වල එම වැඩසටහන ඉදිරියට ක්‍රියාත්මක කිරීම (2024-12-18) | අතිශයින් උචිත | එය විශේෂයෙන්ම වඩාත්ම අවදානයට ලක්විය හැකි දරුවන් (අඩු බර) අතර, ළමා පෝෂණය වැඩි දියුණු කිරීමට දායක වේ. එය ශාරීරික හා සංජානන සංවර්ධනය සඳහා මූලික කාල පරිච්ඡේදයක් වන පූර්ව මැදිහත්වීම ඉලක්ක කරයි. පෝෂණ සහයෝගය වැඩි කිරීමෙන්, පෝෂණ සහයෝගය වැඩි කිරීමෙන්, එය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සෞඛ්‍ය සහ පෝෂණ තත්ත්වය වැඩි දියුණු කිරීමේ ඉලක්ක සමග අනුකූල වෙමින් මන්දපෝෂණය ආමන්ත්‍රණය කරයි. | 1800+ 100 | 2023-2027 |
| 08 | වෙළඳාම | අන්තර් නෞකාකරණය (Transshipment), අන්තර් ගොඩබෑම් (ඔරබිකද්‍ා), නැවෙන් නැවට භාණ්ඩ මාරු කිරීම (Ship to Ship Cargo Transfer), හා තටාංග මාරුකිරීම් (Cross Docking) පහසුකම් සහිත කාර්යක්ෂම සේවා සපයන කලාපීය ලොජිස්ටික් කළමනාකරණ කේන්ද්‍රස්ථානයක් සඳහා වරාය පහසුකම් දියුණු කිරීම (109) | බහාලුම් නිදහස් කිරීම සඳහා දැනට අනුගමනය කරනු ලබන ක්‍රමවේදයේ කාර්යක්ෂමතාව තවදුරටත් වැඩි දියුණු කරමින් කිසිදු ප්‍රමාදයකින් තොරව වරායෙන් බහාලුම් නිදහස් කිරීම වෙනුවෙන් යෝග්‍ය ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය පියවර ගැනීම (2024-12-23) | අර්ධ වශයෙන් උචිත | එය වරාය සැපයුම් මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමේ පුළුල් ඉලක්කයට සහාය දෙමින් මෙහෙයුම් කාර්යක්ෂමතාව ආමන්ත්‍රණය කරයි. නමුත් එය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් පුළුල් පරාසයක සේවාවන් සම්පූර්ණයෙන්ම සපුරාලන්නේ නැත. | 2500 | |
| 09 | ආහාර සුරක්ෂිතතාව | රාජ්‍ය සෞඛ්‍ය සේවා ආයතනවලට අවශ්‍ය සියලු ම අත්‍යවශ්‍ය ඖෂධ අඛණ්ඩව සැපයීම සහතික කිරීම (27) | මෙරපනම් එන්නත් ග්‍රෑම් 1 න් වයල් 900,000 ක් සපයා ගැනීම සඳහා වන ප්‍රසම්පාදනය පාකිස්ථානයේ M/s Genix Pharma (Pvt) Ltd. සමාගම වෙත පිරිනැමීම (2024-12-30) | අර්ධ වශයෙන් උචිත | සැපයුම්කරු විදේශීය සමාගමක් වුවද, ප්‍රතිපත්ති ප්‍රකාශනය ප්‍රසම්පාදනය දේශීය සැපයුම්කරුවන්ට පමණක් සීමා නොකරයි. එය හුදෙක් මහජන සෞඛ්‍ය ආයතන තුළ අත්‍යවශ්‍ය ඖෂධ අඛණ්ඩව තිබීම අරමුණු කරයි. | 185000 | වත්මන් වසර |
| 10 | සෞඛ්‍යය | රාජ්‍ය සෞඛ්‍ය සේවා ආයතනවලට අවශ්‍ය සියලු ම අත්‍යවශ්‍ය ඖෂධ අඛණ්ඩව සැපයීම සහතික කිරීම (27) | අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත පදනම්ව, ටෙනෙක්ටිප්ලේස් එන්නත් මිලිග්‍රෑම් 40 න් වයල් 9,000 ක් මිලදී ගැනීම, සාරානුකූලව ප්‍රතිචාර දක්වන ලද අවම ලංසුකරු වන M/s ABC Pharma Services (Pvt) Ltd. වෙත පිරිනැමීම (2024-12-30) | අතිශයින් උචිත | SCAPC හරහා පාරදෘශ්‍ය ක්‍රියාපටිපාටි අනුගමනය කරමින් ප්‍රසම්පාදනය සිදු කරන ලද අතර, සාධාරණත්වය සහ පිරිවැය ඵලදායීතාවය සහතික කරමින් සාරානුකූලව ප්‍රතිචාර දක්වන අවම ලංසුකරුට ප්‍රදානය කරන ලදී. මේ අනුව, ප්‍රසම්පාදන ක්‍රියාව පැහැදිලිවම අත්‍යවශ්‍ය ඖෂධයක පැවතීම අරමුණු කරගෙන ඇත. | 185000 | වත්මන් වසර |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව | අයවැය ප්‍රතිපාදන (රු.මි) | කාල සීමාව |
|---|---|---|---|---|---|---|---|
| 11 | ආර්ථිකය | වරාය, ගුවන් තොටුපළ සහ වරාය නගර සැපයුම් දාම කේන්ද්‍රස්ථාන ලෙස වැඩිදියුණු කරමින් කර්මාන්තවලට විදේශ වෙළෙඳපොළට ප්‍රවිශ්ට වීමට පහසුකම් (152) | යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපොළ වෙත නිශ්චිත කාලසටහන්ගත ගමන් වාර ක්‍රියාත්මක කෙරෙන ගුවන් සේවා සඳහා දැනට ක්‍රියාත්මක වන අපගමන බද්තේ 50% ක ගාස්තු අත්හැරීමේ සහනය 2026-01-30 දින දක්වා දීර්ඝ කිරීම<br><br>කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ (රත්මලාන) වෙත නිශ්චිත කාලසටහන්ගත ගමන් වාර ක්‍රියාත්මක කෙරෙන ගුවන් සේවා සඳහා දැනට ක්‍රියාත්මක වන අපගමන බද්දෙන් 50% ක ගාස්තු අත්හැරීමේ සහනය 2025-03-27 දින සිට වසරක කාලයක් දක්වා දීර්ඝ කිරීම.<br><br>මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ වෙත නිශ්චිත කාලසටහන්ගත ගමන් වාර ක්‍රියාත්මක කෙරෙන ගුවන් සේවා සඳහා දැනට ක්‍රියාත්මක වන අපගමන බද්දට අදාළ පූර්ණ සහනය 2024-12-29 දින සිට තවත් වර්ෂයක කාලයක් දක්වා දීර්ඝ කිරීම (2025-01-06) | උචිත | බඳු සහන හරහා ජාත්‍යන්තර ගුවන් සම්බන්ධතාව දිරිමත් කිරීම, සැපයුම් දාම මධ්‍යස්ථාන ලෙස ගුවන්තොටුපළ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ කර්මාන්ත සඳහා ජාත්‍යන්තර වෙළඳපොළ ප්‍රවේශය ඉහළනැංවීම මඟින් මෙම ක්‍රියාකාරකම් ප්‍රතිපත්ති ප්‍රකාශන යෝජනාවට රුකුල් දෙයි. | 1250+3455 | 2024-2026 |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව | අයවැය ප්‍රතිපාදන (රු.මි) | කාල සීමාව |
|---|---|---|---|---|---|---|---|
| 12 | කර්මාන්ත | නිවස්න කලාප, මහල් නිවාස, සේවා, කාර්මික ඉදිකිරීම් ආශ්‍රිතව කසළ කළමනාකරණ වැඩසටහන් (56) | රජයේ මුද්‍රණාලය, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, මැතිවරණ කොමිෂන් සභාව, අධ්‍යාපන අමාත්‍යංශය හා ඒ යටතේ ක්‍රියාත්මක වන රජයේ ආයතන, සියලුම විශ්වවිද්‍යාල, රජයේ සියලුම අමාත්‍යංශ සහ දෙපාර්තමේන්තු වෙතින් බැහැර කරනු ලබන තත්ත්වයෙන් උසස් සුදු කඩදාසි ඇතුළු ඉවතලන කඩදාසි තොග, සීමාසහිත ජාතික කඩදාසි සමාගම විසින් ප්‍රවාහන පහසුකම් සැපයීමේ පදනම මත නොමිලේ සීමාසහිත ජාතික කඩදාසි සමාගම වෙත භාරදීම.<br><br>අනෙකුත් රාජ්‍ය සංස්ථා, මණ්ඩල හා ව්‍යවස්ථාපිත ආයතන සහ රජයට අනුබද්ධිත සියලුම ආයතන වල පවතින ඉවතලන කඩදාසි තොග, ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව අදාළ ආයතන හා සීමාසහිත ජාතික කඩදාසි සමාගම එකඟවන සහනදායී මිලකට එකී සමාගම වෙත භාරදීම (2025-01-06) | උචිත | නිවස්න කලාප, මහල් නිවාස, සේවා සහා කාර්මික ගොඩනැගිලි සඳහා අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් අනිවාර්ය කිරීම මඟින් ක්‍රියාකාරකම ප්‍රතිපත්ති ප්‍රකාශන යෝජනාව ක්‍රියාත්මක කරයි. | 950 | 2022-2025 |
| 13 | නීතිය සහ අධිකරණ | අධිකරණ ක්‍රියාවලියට නවීන තාක්ෂණය හඳුන්වාදීමට පියවර ගැනීම සහ විනිශ්චයකාරවරුන්ට හා කාර්ය මණ්ඩලයට ඒ සම්බන්ධ නිසි පුහුණුව ලබාදීම ආදිය තුළින් අධිකරණ ක්‍රියාවලිය වඩා සුමට හා කාර්යක්ෂම කිරීම (201) | විශේෂ අවස්ථානුගත කරුණු යටතේ සැකකරුට හෝ චූදිතයාට අධිකරණයේ පෞද්ගලිකවම පෙනී සිටින ලෙස නියම කිරීම ඉවත් කිරීම සඳහා, සහ දුරස්ථ සාක්ෂි පටිගත කිරීම සහ විශේෂඥ සාක්ෂිකරුවන් වෙත විද්‍යුත් තැපැල මගින් සිතාසි ලබාදීම සඳහා විධිවිධාන සැලසීම (2025-01-06) | උචිත | ප්‍රතිපත්ති ප්‍රකාශනයේ මූලික අරමුණ සපුරාලන අතථ්‍ය පැමිණීම, දුරස්ථ සාක්ෂි දීම සහ විද්‍යුත් සන්නිවේදනය හරහා අධිකරණ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා නවීන තාක්ෂණය හඳුන්වා දීමෙන් මෙම ක්‍රියාකාරම ප්‍රතිපත්ති ප්‍රකාශනය සමඟ අනුකූල වේ. | 1258 | 2022-2026 |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව | අයවැය ප්‍රතිපාදන (රු.මි) | කාල සීමාව |
|---|---|---|---|---|---|---|---|
| 14 | සමාජ ආරක්ෂණය | සමාජ සජීවීකරණය ඔස්සේ පවුල් සහ කුඩා කණ්ඩායම් මට්ටමින් ගැටලු හඳුනා ගැනීම, විශ්ලේෂණය සහ විසදුම් සඳහා ව්‍යාපෘති හඳුනා ගැනීම (66) | දිවයින පුරා පිහිටි මුළු පාසල් 10,096 අතුරින් ළමුන් සංඛ්‍යාව 300 ට අඩු පාසල් 6,576 ක අස්වැසුම ප්‍රතිලාභී නොවන පවුල් වල සියලුම ළමුන්ට, ළමා සංවර්ධන මධ්‍යස්ථාන වල සිට පාසල් වෙත පැමිණෙන ළමුන්ට සහ පිරිවෙන් වල ඉගෙනුම ලබන ගිහි පැවිදි සිසුන්ට රුපියල් 6,000/- ක් බැගින් වූ ලිපිද්‍රව්‍ය දීමනාව ලබා දීම, සහ එකී දීමනාව වවුචර් පත්‍රයක් මඟින් ලබා දීම. (2025-01-06) | අර්ධ වශයෙන් උචිත | මෙම ක්‍රියාකාරකම, දරිද්‍රතාවය සහ අවදානම අඩුකිරීම සම්බන්ධ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අරමුණුවලට අනුකූලවන නමුත්, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අවධාරණය කර ඇති පුළුල් ගෘහස්ථ විශ්ලේෂණය හෝ ප්‍රජා ව්‍යාපෘති-පාදක ප්‍රවේශය එහි නොමැත. | 90 | 2025 |
| 15 | ව්‍යවසායකත්වය | කුඩා පරිමාණයේ ගොවියන්, නිෂ්පාදකයින්, ව්‍යවසායකයින් සහ ආයෝජකයින් සඳහා මූල්‍ය පහසුකම් සැපයීමට සමුපකාර, සමෘද්ධි හා ප්‍රාදේශීය සංවර්ධන බැංකු කාර්යක්ෂම ලෙස මෙහෙයවීම (105) | කෙටිකාලීන භෝග සහ ගෙවතු වගාවල යෙදෙන සුළු සහ කුඩා පරිමාණ ගොවීන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම පිණිස "සරුසාර" නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය හඳුන්වා දී ඇති අතර, එය ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂයේ සිට මේ දක්වා ක්‍රියාත්මක කරනු ලැබ ඇත. 2025 වර්ෂයේ සිට "සරුසාර" නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය වාර්ෂික වැඩසටහනක් ලෙස මහා භාණ්ඩාගාරයේ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලැබී ඇත (2025-01-27) | අතිශයින් උචිත | ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් පරිදි කලාපීය සංවර්ධන යාන්ත්‍රණයන් හරහා කුඩා පරිමාණ ගොවීන්ට මූල්‍ය අධාර ක්‍රියාත්මක කරයි. | 5503 | 2020-2024 |
| 16 | විදේශ කටයුතු | විශේෂයෙන් ආර්ථික ක්ෂේත්‍රය තුළ ශ්‍රී ලංකාවේ ජාතික අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීමට උපකාරී වන නව අවස්ථා සහ නව ගෝලීය හා කලාපීය වේදිකා ගවේෂණය කිරීම (ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සිංහල පිටපත තුළ සඳහන්ව නැත. පරිවර්තනය: පැෆ්රල් සංවිධානය විසිනි) | චීන රජයේ සහාය ඇතිව ක්‍රියාත්මක කෙරෙන තෝරාගත් රෝහල් වල සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු කඩිනමින් නිම කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘති කාලසීමාව 2025-12-31 දින දක්වා දීර්ඝ කිරීම, ව්‍යාපෘතියේ කටයුතු තෝරාගත් රෝහල් වල සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම (2025-01-27) | අර්ධ වශයෙන් උචිත | එය ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබිඹු කරයි (ගෝලීය වේදිකා ගවේෂණය කිරීම). කෙසේවෙතත්, එය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අවධාරණය කර ඇති පරිදි ආර්ථික අවස්ථා හෝ ආර්ථික ජාතික අවශ්‍යතා කෙරෙහි සෘජුවම අවධානය යොමු නොකරයි. | 19 | 2025 |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව | අයවැය ප්‍රතිපාදන (රු.මි) | කාල සීමාව |
|---|---|---|---|---|---|---|---|
| 17 | ප්‍රවාහනය | කඩිනමින් ප්‍රතිසංස්කරණය කළ යුතු ග්‍රාමීය හා වතු ආශ්‍රිත මාර්ග හඳුනාගෙන ප්‍රමුඛතා ලේඛනයක් සකසා එම ප්‍රමුඛතා ලේඛනය අනුව මාර්ග ප්‍රතිසංස්කරණය කර තිරසාරව නඩත්තු කිරීම (174) | උතුරු හා නැගෙනහිර පළාත්වල යෝජිත ග්‍රාමීය මාර්ග වැඩි දියුණු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම (උතුරු සහ නැගෙනහිර පළාත්වල සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක්ම ආවරණය වන පරිදි උතුරු පළාත තුළ මාර්ග කිලෝමීටර් 1,500 ක් සහ නැගෙනහිර පළාත තුළ මාර්ග කිලෝමීටර් 500 ක් සංවර්ධනය කිරීම) (2025-02-09) | අතිශයින් උචිත | වැඩසටහන සඳහා මාර්ග තෝරා ගැනීම ප්‍රමුඛතා ක්‍රියාවලියක් මත පදනම් වූ බව උපකල්පනය කළහොත්, මෙම ක්‍රියාකාරකම ක්‍රමානුකූල හා ප්‍රමුඛතාගත ග්‍රාමීය මාර්ග අලුත්වැඩියාව සහ නඩත්තුව යන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අභිප්‍රායයට අනුකූල වේ. | 31500+<br>4000+<br>7500+<br>3600 | 2025 |
| 18 | සමාජ ආරක්ෂණය | අඩු ආදායම්ලාභී පවුල්වල ආබාධ සහිත පුද්ගලයින් සඳහා මසකට රුපියල් 10,000ක මූල්‍යාධාරයක (67) | 2025 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු මඟින් වෙන් කරනු ලැබ ඇති ප්‍රතිපාදන තුළ, දැනට බලපවත්නා අස්වැසුම ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ලබා දෙන ප්‍රතිලාභ පහත සඳහන් පරිදි සංශෝධනය කරමින් ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත් කිරීම (2025-03-17) | අතිශයින් උචිත | ආබාධිත පුද්ගලයින්ට ලබාදෙන දීමනාව රුපියල් 10,000 දක්වා ඉහළ නැංවීමෙන් සහ ආවරණය පුළුල් කිරීමෙන් ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූල වේ. | 550 | 2025 |
| 19 | ප්‍රසම්පාදන | රාජ්‍ය සෞඛ්‍ය සේවා ආයතනවලට අවශ්‍ය සියලු ම අත්‍යවශ්‍ය ඖෂධ අඛණ්ඩව සැපයීම සහතික කිරීම (27)<br><br>තිසි තොග පවත්වා ගනිමින් ඖෂධ හිඟය වළක්වා ගැනීම (27) | ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත පදනම්ව, සාරානුකූලව ප්‍රතිචාර දක්වන ලද අවම ලංසුකරු වන ශ්‍රී ලංකාවෙහි M/s Lifecerll Interventions (Pvt) Ltd (Manufacturer - Gennova Biopharmaceuticals Limited, India) වෙත අදාළ කොන්ත්‍රාත්තුව (ටෙනෙක්ටිප්ලේස් 40mg එන්නතින් වයල් 6000 ක් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදනය) පිරිනැමීම (2025-03-17) | අතිශයින් උචිත | හිඟයන් වැළැක්වීම සහ තොග පවත්වා ගැනීම සඳහා අත්‍යවශ්‍ය ඖෂධ මිලදී ගැනීමෙන් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව මෙම ක්‍රියාකාරකම මගින් සෘජුවම ඉටු කරයි. අඛණ්ඩ සැපයුම සහතික කිරීම සඳහා ප්‍රසම්පාදනය ප්‍රධාන පියවරකි. | 185000 | 2025 |
| 20 | සමාජ ආරක්ෂණය | දැනට අස්වැසුම ප්‍රතිලාභ ලබන අඩු ආදායම්ලාභී පවුල් සඳහා මසකට අවම වටිනාකම රු10,000ක සහනාධාර මුදලක් (66) | අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය යටතේ දැනට ගෙවනු ලබන ප්‍රතිලාභවල වටිනාකම් ඉහළ නංවමින් එම යෝජනා ක්‍රමය සංශෝධනය කිරීම (2025-04-01) | අර්ධ වශයෙන් උචිත | වැඩිවීම රුපියල් 10,000 ට වඩා අඩුනම්, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව කරා යන ප්‍රගතිය තමවත් පිළිබිඹු කරන නමුත්,ප්‍රකාශිත ඉලක්කය සම්පූර්ණයෙන්ම සපුරා නොගනී. | 500+1000+1118 | 2025 |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව | අයවැය ප්‍රතිපාදන (රු.මි) | කාල සීමාව |
|---|---|---|---|---|---|---|---|
| 21 | ඉඩම් | තිරසර භූමි (ඉඩම්) පරිහරණ සැලැස්මක් විද්‍යානුකූලව සකසා ක්‍රියාවට නැංවීම (52) | නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩම් සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා දීර්ඝකාලීන බදු පදනම මත බැහැර කිරීමේදී සුදුසු ආයෝජකයින් තෝරා ගැනීම (2025-04-07) | අර්ධ වශයෙන් උචිත | මෙම ක්‍රියාකාරකම සංවර්ධනය සඳහා ඉඩම් වෙන් කිරීම හා සම්බන්ධ වුවද, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීමට කේන්ද්‍රියවන විද්‍යාත්මකව සංවර්ධනය කරන ලද තිරසාර ඉඩම් පරිහරණ සැලසුම්කරණය පිළිබඳ පැහැදිලි සඳහනක් එහි නොමැත. | 2000+100 | 2025 |
| 22 | නිවාස | කොළඹ නගරයේ මුඩුක්කු සහ පැල්පත් නිවාසවල ජීවත්වන ජනතාවට රාජ්‍ය මැදිහත්වීමෙන් සුදුසු නිවාස (32) | දැනට නිවාස ඒකකයක් සඳහා ලබාදෙන රුපියල් 650,000/- ක් වන රජයේ ආධාර මුදල රුපියල් 1,000,000/- ක් දක්වා වැඩි කිරීම පිණිස ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී (2025-04-21) | අර්ධ වශයෙන් උචිත | රජයේ මැදිහත්වීම තුළින් කොළඹ අඩු ආදායම්ලාභී පදිංචිකරුවන්ට දැරිය හැකි මිලකට නිවාස පහසුකම් සැලසීමට ප්‍රතිපත්ති ප්‍රකාශනය කැපවේ. නමුත් ප්‍රදානය වැඩි කිරීම යනු අඩු ආදායම්ලාභී පදිංචිකරුවන්ට නිවාස ලබාගැනීමට උපකාර කිරීම අරමුණු කරගත් පැහැදිලි රජයේ මැදිහත්වීමකි. | 1850 | 2021-2027 |
| 23 | සංචාරක කර්මාන්තය | දේශීය සංචාරක ව්‍යාපාරය රට තුළ ප්‍රමුඛ හා විකල්ප සංචාරක ප්‍රවාහයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය හා, පෞද්ගලික අංශයේ සහභාගිත්වය දිරිමත් කිරීම (146) | නෞකාවන්හි හා කොළඹ වරාය නගරයේ අක්වෙරළ සූදු ක්‍රීඩා ක්‍රියාකාරකම් සහ මාර්ගගත සූදු ක්‍රීඩා ක්‍රියාකාරකම් ඇතුළුව ශ්‍රී ලංකාවේ සූදු ක්‍රීඩා කර්මාන්ත මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් පුළුල් හා පූර්ණ විෂය පථයක් සහිත ස්වාධීන තනි නියාමකවරයෙකු වශයෙන් ක්‍රියා කිරීම (2025-04-21) | උචිත නොවන | සූදුව සංචාරක ව්‍යාපාරයේ කොටසක් විය හැකි වුවද, සූදු මෙහෙයුම් නියාමනය කිරීම ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හෝ දේශීය සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම හා සමාන නොවේ. | 350 | 2025 |
| 24 | ඩිජිටල් ආර්ථිකය | පුරවැසියන්ට විනිවිදභාවයෙන් හා කාර්යක්ෂම සේවා සැපයීම සඳහා ප්‍රතිචාරාත්මක රාජ්‍ය අංශයක් බිහිකිරීම උදෙසා ප්‍රධාන රාජ්‍ය ආයතන ඩිජිටල්කරණය කිරීම (133) | දැනටමත් ආරම්භ කර ඇති සහ ඉදිරියේදී ආරම්භ කිරීමට සැලසුම් කර ඇති ඩිජිටල් පරිවර්තන ව්‍යාපෘති බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි අවශ්‍ය බලතල සහිත ස්වාධීන ආයතනයක් වශයෙන් 'GovTech (Pvt) Limited' නමින් රජය සතු සමාගමක් ස්ථාපිත කිරීම (2025-05-26) | අතිශයින් උචිත | මෙම ක්‍රියාකාරකම, එම ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය කැපවුණු ආයතනික යටිතල පහසුකම් නිර්මාණය කිරීමෙන්, ඩිජිටල් ලෙස විපරිවර්තනය කරන ලද, පුරවැසි කේන්ද්‍රීය රජයක් පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දැක්මට සෘජුවම සහාය දක්වයි. | 30+25 | 2025 |

| අංකය | ක්ෂේත්‍රය/උප ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම | කැබිනට් තීරණය | පොරොන්දුවට ඇති අනුකූලභාවය | උචිතබව | අයවැය ප්‍රතිපාදන (රු.මි) | කාල සීමාව |
|---|---|---|---|---|---|---|---|
| 25 | බදු | බදු අය කිරීමේ කාර්යක්ෂමතාව හා සාධාරණ බව තහවුරු කිරීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුව, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය ඇතුළු අදාළ රාජ්‍ය ආයතනවල මෙහෙයුම් දේශීය අදායම් දෙපාර්තමේන්තුව සමග ජාලගත කිරීම (103) | ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායම් රැස් කිරීමේ යාන්ත්‍රණයේ ප්‍රධානතම වගකීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව යන ආයතන ත්‍රිත්වය මඟින් දරනු ලබයි. වර්තමානයේ එම දෙපාර්තමේන්තු, ඒකාබද්ධ නොවන මෙහෙයුම් ක්‍රියාවලියක් පැවතීම, යාවත්කාලීන නොවූ ක්‍රියාවලීන් හා නීති පද්ධතීන් හේතුවෙන් ඇතිවන අකාර්යක්ෂමතාවන්, ආදායම් නිසි පරිදි අය නොවීම, ඩිජිටල්කරණය සඳහා ඇති නැඹුරුව ප්‍රමාණවත් නොවීම, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී අන්තර් ආයතනික සම්බන්ධීකරණය ප්‍රමාණවත් නොවීම සහ සුපිළිපන්නභාවය පිළිබඳ ගැටලු යන අභියෝග වලට මුහුණ දෙමින් පවතී (2025-05-26) | අර්ධ වශයෙන් උචිත | It only identifies issues but does not indicate steps toward integration or improving efficiency and fairness through that integration.<br><br>එය සිදු කරන්නේ ගැටළු හඳුනා ගැනීම පමණකි. නමුත් ඒකාබද්ධ කිරීම සඳහා හෝ එම ඒකාබද්ධ කිරීම හරහා කාර්යක්ෂමතාව සහ සාධාරණත්වය වැඩි දියුණු කිරීම සඳහා වන පියවර පෙන්වා නොදෙයි. | 5256 | 2014 සිට |

# ඇමිණුම III - දත්ත විස්තරය: ප්‍රතිපත්ති ප්‍රකාශනය, 2025 ජාතික අයවැය යෝජනා සමග සමාලෝචනය

| අංකය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම (පිටු අංකය සහිතව) | අයවැය යෝජනාව (2025 ජාතික අයවැය) | කාර්යක්ෂමතාව/සඵලතාව | ප්‍රධාන කාර්ය සාධක දර්ශක/ය | ව්‍යාපෘති කාල සීමාව | 2025 ප්‍රතිපාදන (රු.මි) | සටහන් |
|---|---|---|---|---|---|---|---|
| 01 | අඩු ආදායම්ලාභී පවුල්වල ගැබිණි මව්වරුන්ට තම ගර්භණී සමයේදී සහ දරු ප්‍රසූතියේ පළමු වසර තුළ පෝෂණ ආහාර පැකේජයක් සඳහා මූල්‍යාධාර (68) | ත්‍රිපෝෂ වැඩසටහන | ගැබිනි මව්වරුන් සහ අවුරුදු 5 ට අඩු ළමුන් අතර ත්‍රිපෝෂ පැකට් බෙදා හැරීම | ත්‍රිපෝෂ පැකට් ලැබූ ළමුන් සංඛ්‍යාව<br>ත්‍රිපෝෂ පැකට් ලැබූ ගැබිනි මව්වරුන් සංඛ්‍යාව | වාර්ෂික | 5,000 | අතිශයින් උචිත අතර 2025 දී සම්පූර්ණ කල යුතුව ඇත |
| 02 | ළමා හා නව යොවුන් වියේ මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය, මත්ද්‍රව්‍ය භාවිතය සහ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා වැඩසටහන් (27) | මානසික සෞඛ්‍ය උපදේශන සහ දැනුවත් කිරීමේ වැඩසටහන | සිසුන් සහ නව යොවුන් වියේ පසුවන්නන් සඳහා මානසික සෞඛ්‍ය දැනුවත්භාවය ලබා දීමට පහසුකම් සැලසීම | පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් ගණන | වාර්ෂික | 250 | අතිශයින් උචිත අතර 2025 දී සම්පූර්ණ කල යුතුව ඇත |
| 03 | සෑම දිස්ත්‍රික්කයකම/පළාතකම පහසුකම් සහිත විස්තීර්ණ හෘද රෝග ඒකකයක්, විස්තීර්ණ පිළිකා සත්කාර ඒකයක්, අක්ෂි සත්කාර ඒකකයක් සහ වකුගඩු සත්කාර ඒකකයක් (26) | අම්පාර දිස්ත්‍රික් මහා රෝහලේ හෘද කැතීටකරණ මධ්‍යස්ථානය ඇතුළුව හෘද පුනර්ජීවන ඒකකය පිහිටුවීම | ඉදිකිරීමට නියමිත ගොඩනැගිල්ලෙහි බිම් මහලෙහි වැඩ නිම කිරීම<br>ඉදිකිරීමට නියමිත ගොඩනැගිල්ලෙහි බිම් මහලෙහි වැඩ නිම කිරීම | ඉදිකිරීමට නියමිත කොටසෙහි සම්පූර්ණ කරන ලැබූ ප්‍රතිශතය | 2021-2026 | 200 | අර්ධ වශයෙන් උචිත අතර අඛණ්ඩව ක්‍රියාත්මක වන වැඩසටහනකි |
| 04 | සෑම දිස්ත්‍රික්කයකම/පළාතකම පහසුකම් සහිත විස්තීර්ණ හෘද රෝග ඒකකයක්, විස්තීර්ණ පිළිකා සත්කාර ඒකයක්, අක්ෂි සත්කාර ඒකකයක් සහ වකුගඩු සත්කාර ඒකකයක් (26) | රත්නපුර ශික්ෂණ රෝහලේ හෘද රෝග සත්කාර සංකීර්ණය ඉදිකිරීම | ඉදිකිරීමට නියමිත ගොඩනැගිල්ලෙහි ව්‍යුහය නිම කිරීම | ඉදිකිරීමට නියමිත කොටසෙහි සම්පූර්ණ කරනු ලැබූ ප්‍රතිශතය | 2024-2027 | 400 | අර්ධ වශයෙන් උචිත අතර අඛණ්ඩව ක්‍රියාත්මක වන වැඩසටහනකි |
| 05 | බෝ නොවන රෝගවල සංකූලතා කල්තියා හඳුනාගෙන පාලනය කිරීම හා ප්‍රතිකාර කිරීමට ප්‍රජා පාදක යාන්ත්‍රණ (24) | ඒඩ්ස් රෝගය මැඩලීම සඳහා වන විශ්ව අරමුදල (ජී.එෆ්.ඒ.ටී.එම්.) | වඩාත් හානිදායක රෝගයක් වන ඒඩ්ස් රෝගයට එරෙහිව සටන් කිරීම සඳහා සැලකිය යුතු පරිදි සම්පත් වැඩි කිරීම<br><br>ආසාදිත පුද්ගලයන් හඳුනාගැනීම සහ ප්‍රතිකාර කිරීම | පවත්වන ලද ජංගම සායන ගණන<br>හඳුනාගත් රෝගීන් සංඛ්‍යාව | 2025-2027 | 284 | අඛණ්ඩව ක්‍රියාත්මකවන වැඩසටහනකි |
| 06 | පෝෂණ තත්වය, මුඛ සෞඛ්‍ය, ක්ෂය රෝග පාලනය, මූල්‍ය සාක්ෂරතාව, මධ්‍යසාර, දුම්කොළ සහ අනෙකුත් මත්ද්‍රව්‍ය වැළැක්වීම සහ තරුණ ප්‍රජාවේ සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා විශේෂ වැඩසටහන් (27) | ක්ෂය රෝගය මැඩලීම සඳහා වන විශ්ව අරමුදල (ජී.එෆ්.ඒ.ටී.එම්.) | වඩාත් හානිදායක රෝගයක්වන ක්ෂය රෝගයට එරෙහිව සටන් කිරීම සඳහා සඳහා සැලකිය යුතු පරිදි සම්පත් වැඩි කිරීම<br><br>ආසාදිත පුද්ගලයන් හඳුනාගැනීම සහ ප්‍රතිකාර කිරීම | පවත්වන ලද ජංගම සායන ගණන<br>හඳුනාගත් රෝගීන් සංඛ්‍යාව | 2025-2027 | 285 | අර්ධ වශයෙන් උචිත අතර අඛණ්ඩව ක්‍රියාත්මක වන වැඩසටහනකි |

| අංකය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම (පිටු අංකය සහිතව) | අයවැය යෝජනාව (2025 ජාතික අයවැය) | කාර්යක්ෂමතාව/සඵලතාව | ප්‍රධාන කාර්ය සාධක දර්ශක/ය | ව්‍යාපෘති කාල සීමාව | 2025 ප්‍රතිපාදන (රු.මි) | සටහන් |
|---|---|---|---|---|---|---|---|
| 07 | බෝ නොවන රෝගවල සංකූලතා කල්තියා හඳුනාගෙන පාලනය කිරීම හා ප්‍රතිකාර කිරීමට ප්‍රජා පාදක යාන්ත්‍රණ (24) | ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහලේ බෝ නොවන රෝග ප්‍රතිකාර පහසුකම් වැඩි දියුණු කිරීමේ වැඩසටහන (ශ්‍රී ලංකා රජය_ජපන් රජය) | ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් පරිදි 2025 ඉලක්කගත ක්‍රියාකාරකම් අවසන් කිරීම | සම්පූර්ණ කරන ලැබූ ප්‍රතිශතය | 2018-2025 | 2,591 | අර්ධ වශයෙන් උචිත අතර අඛණ්ඩව ක්‍රියාත්මක වන වැඩසටහනකි |
| 08 | සිනමාව, ටෙලිනාට්‍ය, සංගීතය වැනි ක්ෂේත්‍රවලට ජාත්‍යන්තර ඇගයීමක් හා වෙළෙඳපොළක් ලබා ගැනීම සඳහා කලාකරුවන් සහ නිෂ්පාදකයින් දිරිගැන්වීම (62) | කලාකරුවන් සඳහා ආධාර | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වාර්ෂික | 52 | අතිශයින් උචිත අතර 2025 දී සම්පූර්ණ කල යුතුව ඇත |
| 09 | මෙම අවකාශය සමඟ සංචාරක කර්මාන්තය බද්ධ කිරීමට අවශ්‍ය වැඩසටහන් සැකසීම (45) | පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක සංරක්ෂණය සහ නඩත්තු කිරීම | 172 ක් සංරක්ෂණය සහ නඩත්තු කිරීම | සංරක්ෂිත ස්මාරක සංඛ්‍යාව | වාර්ෂික | 254 | අතිශයින් උචිත අතර 2025 දී සම්පූර්ණ කල යුතුව ඇත |
| 10 | සෑම ප්‍රධාන නගරයක ම පූර්ණ පහසුකම් සහිත නවීන රංග ශාලා පද්ධතියක් බිහි කිරීම හා පවතින ශාලා ප්‍රවර්ධනය කොට එම ජාලයට ඇතුළත් කිරීම (43) | ජෝන් ද සිල්වා රඟහල අළුත්වැඩියා කිරීම (අදියර I සහ II) | 50% ප්‍රතිසංස්කරණ අවසන් කිරීම | ඉදිකිරීම් ප්‍රතිශතය | 2014-2025 | 500 | අර්ධ වශයෙන් උචිත අතර අඛණ්ඩව ක්‍රියාත්මක වන වැඩසටහනකි |
| 11 | මූල්‍ය දුෂ්කරතා ඇති වැඩිහිටි අය සඳහා මූල්‍ය දීමනාවක් (93) | අඩු ආදායම්ලාභී වැඩිහිටියන් සඳහා මුදල් ආධාර (වයස අවුරුදු 70 ට වැඩි) | වැඩිහිටි පුද්ගලයින් 820,500 ක් සඳහා මුදල් ප්‍රදාන ලබාදීම | මුදල් ප්‍රදාන ලබන වැඩිහිටි පුද්ගලයින් සංඛ්‍යාව | වාර්ෂික | 28,944 | අතිශයින් උචිත අතර 2025 දී සම්පූර්ණ කල යුතුව ඇත |
| 12 | අඩු ආදායම්ලාභී ආබාධ සහිත පවුල් සඳහා ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා මූල්‍ය ආධාර පුළුල් කිරීම (97) | අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගලයන් සඳහා මුදල් ආධාර | ආබාධිත පුද්ගලයින් 185,000 ක් සඳහා මුදල් ප්‍රදාන ලබාදීම | මුදල් ප්‍රදාන ලබන ආබාධිත පුද්ගලයින් සංඛ්‍යාව | වාර්ෂික | 36,900 | අර්ධ වශයෙන් උචිත අතර 2025 දී සම්පූර්ණ කල යුතුව ඇත |
| 13 | අවශ්‍යතා ඇති නිදන්ගත රෝගී පුද්ගලයින්ට අවම වශයෙන් මසකට රුපියල් 10,000 ක මූල්‍යාධාර (68) | නිධන්ගත වකුගඩු රෝගීන් සඳහා මුදල් ආධාර | නිධන්ගත වකුගඩු (CKDU) රෝගීන් 50,000 ක් වෙත මුදල් ප්‍රදාන ලබාදීම සඳහා පහසුකම් සැලසීම | ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව | වාර්ෂික | 2,000 | අතිශයින් උචිත අතර 2025 දී සම්පූර්ණ කල යුතුව ඇත |
| 14 | සුළු හා මධ්‍ය පරිමාණ සමාගම් ලයිස්තු ගත කිරීම පහසුකරවීම, පහසු තොරතුරු වාර්තාකරණය, පාරදෘෂ්‍යභාවය සහ විධිමත් පාලනය සිදුවන කාර්යක්ෂම සහ දියුණු සුරකුම් හුවමාරු මධ්‍යස්ථානයක් ලෙස ප්‍රාග්ධන වෙළඳපොළ ප්‍රසාරණය කිරීම හා වැඩි දියුණු කිරීම (108) | වී මිලදී ගැනීමට අදාළ ඔඩපණ ණය සඳහා පොලී සහනාධාරය | ඔඩපණ ණය ලබාදීම මගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් හරහා වී මිලදී ගැනීම | ලබාදී ඇති ණය ප්‍රමාණය<br>මිලදී ගත් වී ප්‍රමාණය<br>සහභාගී වූ කුඩා සහ මධ්‍යම පරිමාණ මෝල් හිමියන්/සමාගම් සංඛ්‍යාව | වාර්ෂික | 390 | අර්ධ වශයෙන් උචිත අතර 2025 දී සම්පූර්ණ කල යුතුව ඇත |

| අංකය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම (පිටු අංකය සහිතව) | අයවැය යෝජනාව (2025 ජාතික අයවැය) | කාර්යක්ෂමතාව/සඵලතාව | ප්‍රධාන කාර්ය සාධක දර්ශක/ය | ව්‍යාපෘති කාල සීමාව | 2025 ප්‍රතිපාදන (රු.මි) | සටහන් |
|---|---|---|---|---|---|---|---|
| 15 | ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු සඳහා සාමාන්‍ය බැංකු පොලී අනුපාතයට වඩා 5%ක වැඩි පොලී ප්‍රතිශතයක් (67) | ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වන විශේෂ පොලී යෝජනා ක්‍රමය | වැඩිහිටි පුරවැසියන්ගේ මූල්‍ය සුරක්ෂිතතාව වැඩි දියුණු කිරීම | වෙන් කරන ලද අයවැයෙන් අමතර පොලී සහනාධාර සඳහා භාවිතා කරන ලද ප්‍රතිශතය | වාර්ෂික | 25,000 | අතිශයින් උචිත අතර 2025 දී සම්පූර්ණ කල යුතුව ඇත |
| 16 | ප්‍රසම්පාදන, මූල්‍ය, විගණන, ක්‍රමසම්පාදන, පරිපාලන ඇතුළු රාජ්‍ය සේවාවන්හි අභ්‍යන්තර කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා ඩිජිටල් මෙවලම් (199) | ආසිකුඩා තොරතුරු තාක්ෂණික පද්ධතිය පුනරුත්ථාපනය හා නඩත්තු කිරීම | ASYCUDA තොරතුරු තාක්ෂණික පද්ධතිය නඩත්තු කිරීම | ASYCUDA තොරතුරු තාක්ෂණික පද්ධතිය හරහා සපයනු ලබන මූලික සේවාවන් සඳහා ප්‍රවේශය ඇති පුද්ගලයින් සංඛ්‍යාව | වාර්ෂික | 150 | අර්ධ වශයෙන් උචිත අතර 2025 දී සම්පූර්ණ කල යුතුව ඇත |
| 17 | ප්‍රසම්පාදන, මූල්‍ය, විගණන, ක්‍රමසම්පාදන, පරිපාලන ඇතුළු රාජ්‍ය සේවාවන්හි අභ්‍යන්තර කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා ඩිජිටල් මෙවලම් (199) | නව බහාලුම් පරිලෝකන ව්‍යාපෘතිය | Rapiscan පද්ධතිය නඩත්තු කිරීම | Rapiscan පද්ධතිය හරහා සපයනු ලබන මූලික සේවාවන් සඳහා ප්‍රවේශය ඇති පුද්ගලයින් සංඛ්‍යාව | වාර්ෂික | 40 | අර්ධ වශයෙන් උචිත අතර 2025 දී සම්පූර්ණ කල යුතුව ඇත |
| 18 | අන්තර් නෞකාකරණය (Transshipment), අන්තර් ගොඩබෑම් (Transload), නැවෙන් නැවට භාණ්ඩ මාරු කිරීම (Ship to Ship Cargo Transfer), හා තටාංග මාරුකිරීම් (Cross Docking) පහසුකම් සහිත කාර්යක්ෂම සේවා සපයන කලාපීය ලොජිස්ටික් කළමනාකරණ කේන්ද්‍රස්ථානයක් සඳහා වරාය පහසුකම් දියුණු කිරීම (108) | කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය | පළමු අදියරට අදාළ යටිතල පහසුකම් කටයුතු සහ භූමි අලංකරණ කටයුතු සම්පූර්ණ කිරීම<br><br>දෙවන අදියරට අදාළ ප්‍රදේශයේ ඉතිරි යටිතල පහසුකම් සහ භූමි අලංකරණ කටයුතු ආරම්භ කිරීම<br><br>ත්‍රෛපාර්ශ්වික ගිවිසුම ප්‍රකාරව බාහිර උපයෝගිතා සේවා සහ සබඳතා 2025 වර්ෂයේදී අවසන් කිරීම | වැඩකටයුතු සාර්ථකව නිමා කිරීම<br><br>වැඩකටයුතු සාර්ථකව නිමා කිරීම<br><br>සම්බන්ධතාවය සාර්ථකව ස්ථාපිත කිරීම | 2016/01-2027/05 | 1,389 | අර්ධ වශයෙන් උචිත අතර 2025 දී සම්පූර්ණ කල යුතුව ඇත |
| 19 | ආර්ථික ස්ථාවරත්වය සඳහා උපායමාර්ගික ආරක්ෂක පරිසරයක් සහ ස්ථිර පදනමක් නිර්මාණය කිරීම (227) | මූල්‍ය ස්ථාවරත්ව අරමුදල පිහිටුවීම | අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද පරිදි රුපියල් මිලියන 1,000 ක මූලික සංචිතයක් වෙන් කිරීම | අරමුදලේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම | | 500 | අතිශයින් උචිත |
| 20 | මධ්‍යගත තොරතුරු පද්ධතියක් මගින් රාජ්‍ය සේවා සැපයීමේ ගුණාත්මකභාවය සහතික කිරීමට, නියාමනය කිරීමට සහ පරිපාලනය කිරීමට ඒකාබද්ධ සුහුරු පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම (109) | වැය ඒකක ආවරණය වන පරිදි ITMIS වැඩ සටහන ක්‍රියාත්මක කිරීම | වැඩසටහනේ මූලික මොඩියුල ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ කිරීම | ඉතිරිව පවතින වැය ඒකක 8 ITMIS මගින් ආවරණය කිරීම | 2019-2025 | 526 | අතිශයින් උචිත අතර අඛණ්ඩව ක්‍රියාත්මකවන වැඩසටහනකි |

| අංකය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම (පිටු අංකය සහිතව) | අයවැය යෝජනාව (2025 ජාතික අයවැය) | කාර්යක්ෂමතාව/සඵලතාව | ප්‍රධාන කාර්ය සාධක දර්ශක/ය | ව්‍යාපෘති කාල සීමාව | 2025 ප්‍රතිපාදන (රු.මි) | සටහන් |
|---|---|---|---|---|---|---|---|
| 21 | හඳුනාගත් විභවයන්ට අනුකූලව නව කාර්මික කලාප බිහිකරන අතර, මෙම කලාපවල නවෝත්පාදන සහ කාර්මික විවිධාංගීකරණයට අනුබල දීම (152) | විදේශීය ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා ආර්ථික කලාව පිහිටුවීම:<br><br>නව ආර්ථික කලාප (උතුරු, නැගෙනහිර හා දකුණු) | ප්‍රවේශ මාර්ග ඉදිකිරීම, ජල සම්පාදනය හා විදුලිබල සැපයුම් ඇතුළු මූලික යටිතල පහසුකම් සැපයීම | මෙහෙයුම් ආරම්භ කර වසර පහක් ගතවන විට අපනයන ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 1,000 කින් වැඩි කිරීම | 2025-2030 | 100 | අර්ධ වශයෙන් උචිත අතර අඛණ්ඩව ක්‍රියාත්මක වන වැඩසටහනකි |
| 22 | අන්තර් නෞකාකරණය (Transshipment), අන්තර් ගොඩබෑම් (Transload), නැවෙන් නැවට භාණ්ඩ මාරු කිරීම (Ship to Ship Cargo Transfer), හා තටාංග මාරුකිරීම් (Cross Docking) පහසුකම් සහිත කාර්යක්ෂම සේවා සපයන කලාපීය ලොජිස්ටික් කළමනාකරණ කේන්ද්‍රස්ථානයක් සඳහා වරාය පහසුකම් දියුණු කිරීම (109) | ශ්‍රී ලංකාවේ උපායමාර්ගික පිහිටීම උපයෝගී කර ගැනීම | කෙරවලපිටිය රේගු පරීක්ෂණ අංගනයේ සහ බ්ලූමැන්ඩල් භාණ්ඩ සේවා සැපයුම් උද්‍යානයේ මූලික කටයුතු සූදානම් කිරීම සඳහා සහය වීම<br><br>වේයන්ගොඩ අභ්‍යන්තර බහාලුම් අංගනයක් (ICD) ස්ථාපිත කිරීම සඳහා යාන්ත්‍රණයක් හඳුනා ගැනීම, ඉඩම් අත්පත් කර ගැනීම සහ අනෙකුත් මූලික කටයුතු සඳහා සහාය වීම | ප්‍රධාන සේවා සපයුම් යටිතල පහසුකම් ව්‍යාපෘති සංවර්ධනය සහ වැඩි දියුණු කිරීම සඳහා වෙන් කරන ලද අයවැයෙන් උපයෝජනය කරන ලද ප්‍රතිශතය | | 2,500 | අර්ධ වශයෙන් උචිත |
| 23 | නීතිය ක්‍රියාත්මක කරන ආයතන (පොලිසිය, රේගුව, බන්ධනාගාර) සම්පූර්ණයෙන් වගවීම සහතික කරමින් රාජ්‍ය බුද්ධි සේවයේ ඵලදායී ඒකාබද්ධතාවයකින් අධීක්ෂණ පද්ධතිය ප්‍රතිසංස්කරණය කර විධිමත් කිරීම (227) | ආරක්ෂිත මුද්‍රාපටි ඇළවීමේ ව්‍යාපෘතිය (Affix Foolproof Stickers) | නිෂ්පාදන වෙත ස්ටිකර් මිලියන 758 ක් ලබා දීම | නිෂ්පාදකයන් වෙත් ලබා දුන් ස්ටිකර් සංඛ්‍යාව | වාර්ෂික | 1,200 | අර්ධ වශයෙන් උචිත අතර 2025 දී සම්පූර්ණ කල යුතුව ඇත |
| 24 | සෑම නගරයකම සහ උප නගරයකම පාහේ දියුණු පුස්තකාල ඇති කොට සක්‍රිය පාඨක සමාජ පිහිටුවීම (41) | ප්‍රාදේශීය පුස්තකාල නවීකරණය | පරිගණක සහ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ඇතුළු අත්‍යවශ්‍ය පහසුකම් සැපයීමෙන් ප්‍රාදේශීය පුස්තකාල නවීකරණය කිරීම හා එමගින් තොරතුරු හා සම්පත් වෙත ප්‍රවේශය වැඩිදියුණු කිරීම | ප්‍රාදේශීය පුස්තකාල නවීකරණය හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වෙන් කරන ලද අයවැයෙන් උපයෝජනය කරන ලද ප්‍රතිශතය | අයවැය යෝජනාව | 2,000 | අර්ධ වශයෙන් උචිත |
| 25 | හඳුනාගත් විභවයන්ට අනුකූලව නව කාර්මික කලාප බිහිකරන අතර,මෙම කලාපවල නවෝත්පාදන සහ කාර්මික විවිධාංගීකරණයට අනුබල දීම (152) | විදේශීය ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා ආර්ථික කලාප පිහිටුවීම:<br>බිංගිරිය ආර්ථික කලාප ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම | තුන්තොට සහ වතුවත්ත දක්වා කුඩා පාලම/බෝක්කු සම්පූර්ණයෙන් ඉදිකිරීම තුන්තොට සිට හෙට්ටියකොටුව දක්වා වන සම්බන්ධකය තෙක් ඇති සියලුම මාර්ග වැඩ සම්පූර්ණ කිරීම | නව ආයෝජන සඳහා ඉඩම් සහ ආධාරක යටිතල පහසුකම් පවතින බවට සහතික වීම:<br>මෙහෙයුම් ආරම්භ කර වසර පහක් ගතවන විට අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් මිලියන 1,000 කින් වැඩි කිරීම<br>මෙහෙයුම් ආරම්භ කර වසර පහක් ගතවන විට රැකියා අවස්ථා 5,000 ක් උත්පාදනය කිරීම | 2018-2025 | 800 | අර්ධ වශයෙන් උචිත අතර අඛණ්ඩව ක්‍රියාත්මක වන වැඩසටහනකි |

| අංකය | ප්‍රතිපත්ති ප්‍රකාශන ක්‍රියාකාරකම (පිටු අංකය සහිතව) | අයවැය යෝජනාව (2025 ජාතික අයවැය) | කාර්යක්ෂමතාව/සඵලතාව | ප්‍රධාන කාර්ය සාධක දර්ශක/ය | ව්‍යාපෘති කාල සීමාව | 2025 ප්‍රතිපාදන (රු.මි) | සටහන් |
|---|---|---|---|---|---|---|---|
| 26 | නීතිමය කටයුතු සඳහා දරුවන් ප්‍රවාහනයේදී ආරක්ෂිත සහ ගෞරවනීය ප්‍රවාහනය සහතික කිරීම සඳහා ළමා හිතකාමී ප්‍රවාහන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම (83) | ළමා රැඳවියන් සඳහා ප්‍රවාහන පහසුකම් | ආයතනගත දරුවන්ට ආරක්ෂිත, හිතකාමී ප්‍රවාහන පද්ධතියක් ස්ථාපිත කිරීම, අධිකරණ කටයුතු සඳහා ප්‍රවාහනයේදී ආරක්ෂාව, ගෞරවය සහතික කිරීම | ළමා හිතකාමී ප්‍රවාහන පද්ධතිය වෙනුවෙන් යොදවන ලද වාහන සංඛ්‍යාව | - | 250 | අතිශයින් උචිත |
